205 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 205 - இல. 8
**Volume 205 - No. 8**

2011 දෙසැම්බර් 09 වන සිකුරාදා
2011 டிசம்பர் 09, வெள்ளிக்கிழமை
**Friday, 09th December, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

කථානායක අභියෝගතා කුසලාන ක්‍රිකට් තරගය

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විසර්ජන පනත් කෙටුම්පත, 2012 – [පහළොස්වන වෙන් කළ දිනය];**

[ශීර්ෂ 110, 228, 231, 233, 235 (අධිකරණ); ශීර්ෂ 174, 232, 326 (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ); ශීර්ෂ 121, 253-279 (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු); ශීර්ෂ 130, 312-319, 321, (පළාත් පාලන හා පළාත් සභා); ශීර්ෂ 134, 236 (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා)] - කාරක සභාවේදී සලකා බලන ලදී

**කල්තැබීමේ යෝජනාව:**

"ලක්බිම නිවුස්" කර්තෘ රාජ්පාල් අබේනායක මහතා වෙත එල්ල වූ මැර ප්‍රහාරය

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

ஜனாதிபதி வெற்றிக்கிண்ணக் கிரிக்கெட் போட்டி

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2012 : [ஒதுக்கப்பட்ட பதினைந்தாம் நாள்]**

[தலைப்புகள் 110, 228, 231, 233, 235 (நீதி); தலைப்புகள் 174, 232, 326 (புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு); தலைப்புகள் 121, 253-279 (பொது நிருவாக, உள்நாட்டலுவல்கள்); தலைப்புகள் 130, 312-319, 321 (உள்ளூராட்சி, மாகாணசபைகள்); தலைப்புகள் 134, 236 (தேசிய மொழிகள், சமூக ஒருமைப்பாடு)] - குழுவில் ஆராயப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**

'லக்பிம நியூஸ்' பத்திரிகை ஆசிரியர் திரு. ராஜ்பால் அபேநாயக்க மீதான குண்டர்களின் தாக்குதல்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Speaker's Cup Cricket Match

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 2012 – [Fifteenth Allotted Day]

Considered in Committee – [Heads 110, 228, 231, 233, 235 (Justice); Heads 174, 232, 326 (Rehabilitation and Prison Reforms) Heads 121, 253 - 279 (Public Administration and Home Affairs); Heads 130, 312 - 319, 321 (Local Government and Provincial Councils); Heads 134, 236(National Languages and Social Integration)]

ADJOURNMENT MOTION:

Goon Attack on Mr. Rajpal Abeynayake of "Lakbima News"

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2011 දෙසැම්බර් 09වන සිකුරාදා*
*2011 டிசம்பர் 09, வெள்ளிக்கிழமை*
*Friday, 09th December, 2011*

*පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.*
*பாராளுமன்றம் மு. ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 9.30 a. m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### කථානායක අභියෝගතා කුසලාන ක්‍රිකට් තරගය
### சபாநாயகர் வெற்றிக்கிண்ணக் கிரிக்கெட் போட்டி
### SPEAKER'S CUP CRICKET MATCH

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වෙන ක්‍රිකට් තරගය 2011 දෙසැම්බර් මස 11 වන දින සවස 2.00ට ටොරින්ටන් චතුරශ්‍ර ක්‍රීඩා අමාත්‍යාංශ ක්‍රීඩාංගණයේදී පැවැත්වෙන බව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත දැනුම් දෙමි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒකේ umpire ඔබතුමාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක කරන්න ඕනෑ, සාධාරණ විනිශ්චයක් ලබා දෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අපේ පාර්ශ්වය වෙනුවෙන් අපි ඔබතුමාට ඒ සඳහා ගෞරවයෙන් ආරාධනා කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, මම ඔබතුමන්ලාගේ පැත්තට සෙල්ලම් කරන්නම්.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ III වැනි කොටස; 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තුන්වැනි කාණ්ඩයේ I වැනි කොටස; සහ 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ හතරවැනි කාණ්ඩයේ I වැනි කොටස ඉදිරිපත් කරමි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, සභානායකතුමා වෙනුවෙන් "එම වාර්තාව මුද්‍රණය කළ යුතු යැ"යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ (2) වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 සැප්තැම්බර් 16 දිනැති අංක 1723/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය.- [ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා (උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க - உயர் கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Nandimithra Ekanayake - Deputy Minister of Higher Education)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා]

(i) 2006, 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා;

(ii) 2009 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් වාර්තාව;

(iii) 2007 වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2007 වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(v) 2007 වර්ෂය සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(vi) 2008 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vii) 2009 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයීය පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(viii) 2008 සහ 2009 වර්ෂ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තා; සහ

(ix) 2008 සහ 2009 වර්ෂ සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர் - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. A.R.M. Abdul Cader - Deputy Minister of Environment)

ගරු කථානායකතුමනි, පරිසර කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, 2008 වර්ෂය සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් පරිසර කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, අධිකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, 2009 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් අධිකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

# පෙත්සම්
# மனுக்கள்
# PETITIONS

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) පස්යාල, වීරසූරිකන්ද, අංක 19 ඒ දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඒ. සුභාෂිණී ප්‍රියන්තා මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම;

(2) කඩවත, ඉහළ කරගහමුණ, විජයබා පෙදෙස, අංක 326/34 හි පදිංචි පී.ඩී. ඩික්මන් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) නුගේගොඩ, නාලන්දාරාම පාර, අංක 24/1/1 දරන ස්ථානයෙහි පදිංචි යූ.ආර්.බී.වී.කේ. රණසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 1-1199/'11-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය ඇසීමට පෙර ඔබතුමාගේ අවධානය සඳහා කාරණයක් ඉදිරිපත් කරන්න මට අවසර දෙන්න. පත්තරවල දාලා තිබෙනවා, ඊයේ දිනයේ පස් වරු 2.30ට පාර්ලිමේන්තුව කල් තැබුවාය කියලා.

අපට මේ සම්බන්ධයෙන් කථා කරන්න නිශ්චිත වෙලාවක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයේත් කථා කරන්න මන්ත්‍රීවරු සිටිනවා. සවස 2.30ට කියා තිබෙනවා, මේ සභාවේ අපි සිටියේ නැහැයි කියලා. අපට වෙනත් වැඩ තිබෙනවා, ගරු කථානායකතුමනි. සවස 6.30ට අවසන් වන්න තිබෙන පාර්ලිමේන්තුවේ කටයුතු සවස 2.30ට අවසන් වනවාය කියන්නේ පාර්ලිමේන්තුවේම ප්‍රශ්නයක් තිබෙනවාය කියන එකයි. මේ සම්බන්ධයෙන් විශේෂ දෙයක් කරලා තිබෙන්නේ ඇයි? ඔබතුමන්ලා එක්ක සාකච්ඡා කරලා එකඟත්වයකට පැමිණ තිබෙනවා, මේ අය වැය විවාදය පවතින කාලයේ Quorum එකක් නැති වුණත්, අපි ප්‍රශ්න කරන්නේ නැහැයි කියලා. අපට එහෙම කරනවා නම් අපි ආණ්ඩුවටත් කියනවා, වාචික උත්තර දුන්නේ නැත්නම් කරුණාකරලා අය වැයත් සමඟ පරිපූරක ඇස්තමේන්තු සම්මත කරන්න එපාය කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තමුන්නාන්සේ කරුණාකරලා මතක තබා ගන්න, මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනයක් සභාවට දුන්නාම, අදාළ මන්ත්‍රීතුමා මේ සභාවේ නොසිටියොත්, ඒ වෙලාවට කථා කරන්නට කිසි කෙනෙක් නොසිටියොත් සභාවට ඊට එහාට යන්න බැහැයි කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක හරි ගරු කථානායකතුමනි. පස් වරු 6.30ට අවසන් වන්න තිබෙන රැස්වීම -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකර අඩු පාඩුව පිළිගෙන නිවැරදි කර ගන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පස් වරු 6.30ට අවසන් වන්න තිබෙන එක 2.30ට -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පස් වරු 6.30ට අවසන් වන්න තිබෙන රැස්වීම පස් වරු 2.30ට අවසන් කරනවා නම් පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් තිබෙනවා. මෙය, උදේ පාන්දර ඇමතිවරු ප්‍රශ්නවලට උත්තර දෙන්නේ නැතුව ඉන්න අවස්ථාවක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ පිළිබඳව සාකච්ඡා කරන්න මෙය අවස්ථාව නොවෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

සාකච්ඡා කරන්නේ නැති වුණාට අපට මේවා ගැන කථා කරන්න අවශ්‍යතාවක් තිබෙනවා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකරලා ප්‍රශ්නය අහන්න. [බාධා කිරීම්] නිශ්ශබ්ද වන්න. ප්‍රශ්න අංක 1.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේ අයට උත්තර දෙන්න බැරි වුණාම ඒ සම්බන්ධයෙන් වෙලාවක් අරගෙන උත්තර දීම කල් තබනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඔබතුමාගේ ප්‍රශ්නය අහන්නේ නැත්නම් මා ඊ ළඟ ප්‍රශ්නයට යනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මා අහන්නම්. ඔහොම ටොකු දෙන්න ඕනෑ නැහැ. ඔබතුමා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් සොයා බලන්න. එහෙම නැත්නම් මා කියනවා, පරිපූරක ඇස්තමේන්තු ගෙනෙන්න එපාය කියලා. [බාධා කිරීම්] මං පළමුවන ප්‍රශ්නය අහනවා. අපගේත් සහයෝගය ලබා ගන්න ඕනෑ නම් ඒවාත් අපි කියන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හැම දෙයටම අවස්ථාවක් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මහ බැංකුවේ තිබෙන පිස්සුව නවත්වන්න තමයි ඊයේ එහෙම කළේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 1-1199/'11- (1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ඇමතිතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දැන් බලන්න මේ සභාවේ පොල් සංවර්ධන ඇමති නැහැ. එහෙම නම් අපිටත් එළියට යන්න පුළුවන්නේ ඇමති නැහැ කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

අපේ සංවිධායකතුමා ඉන්නවා නේ. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

සංවිධායකතුමා නොවෙයි අපට ඕනෑ, ඇමතියි. [බාධා කිරීම්] ඔබතුමා දන්නවාද, දොඹකරය උඩ ගිහිල්ලා ගල් ගහන එක්කෙනා, පොල් ගහ උඩට ගිහිල්ලා පොල්වලට උත්තර දෙන්න ඕනෑ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අනවශ්‍ය ප්‍රකාශ, අනවශ්‍ය විවාද වැඩක් නැහැ. කරුණාකරලා - [බාධා කිරීම්] ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, -[බාධා කිරීම්] ඔබතුමන්ලා වාඩි වෙන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 2. ගරු බුද්ධික පතිරණ මහතා. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාත් කලබල වෙලා වාගේ. කරුණාකරලා ප්‍රශ්නය අහන්න.

## උතුරු පළාතේ වගා විනාශය : සහනාධාර
## வட மாகாணத்தில் பயிர்களின் அழிவு : மானியம்
## DESTRUCTION OF CROPS IN NORTH : SUBSIDIES

1356/’11

**2. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) උතුරු පළාතේ, වවුනියාව, කිලිනොච්චි, මුලතිව්, මන්නාරම හා යාපනය යන දිස්ත්‍රික්කවල මෙවර මහ කන්නයේ වගා කරන ලද කව්පි, උඳු, මුං සහ පලතුරු හෙක්ටයාර් 9,264ක් වර්ෂාව හා ගංවතුර නිසා විනාශයට පත් වී ඇති බවත්;

(ii) ඉහත පරිදි වගාවන් සහ අස්වැන්න විනාශ වීම නිසා එම ප්‍රදේශවල ගොවීන් දැඩි අපහසුතාවන්ට මුහුණපා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොවීන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සහ නැවත වගා කටයුතු සිදු කිරීම සඳහා සහනාධාර ලබා දීම සඳහා ක්‍රමවේදයක් සකසා තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iii) එම සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வட மாகாணத்தில் வவுனியா, கிளிநொச்சி, முல்லைத்தீவு, மன்னார் மற்றும் யாழ்ப்பாணம் ஆகிய மாவட்டங்களில் இத்தடவை பெரும் போகத்தின் போது 9264 ஹெக்டயர்களில் பயிரிடப்பட்ட கௌபி, உளுந்து, பயறு மற்றும் பழங்கள் மழை மற்றும் வெள்ளப்பெருக்கு காரணமாக அழிவடைந்துள்ளன என்பதையும்;

(ii) மேற்படி பயிர்களும் விளைச்சலும் அழிவடைந்தமை காரணமாக அப்பிரதேசங்களிலுள்ள விவசாயிகள் மிகுந்த சிரமத்தை எதிர்நோக்கியுள்ளார்கள் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி விவசாயிகளின் பொருளாதார நிலையை மேம்படுத்தவும் மீண்டும் பயிர்ச் செய்கை நடவடிக்கைகளை முன்னெடுப்பதற்கும் மானியங்களை வழங்குவதற்கான முறைமையொன்று தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், அந்த முறைமை யாதென்பதையும்;

(iii) குறித்த மானிய முறை நடைமுறைப்படுத்தப்படும் திகதி யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Is he aware that-

(i) 9,264 hectares of cow-pea, black gram, green gram and fruits in the districts of Vavuniya, Kilinochchi, Mullaitivu, Mannar and Jaffna of the Northern Province have been destroyed due to rains and floods; and

(ii) the farmers of the aforesaid areas are faced with severe difficulties as a result of the destruction of their crops and cultivations as stated above?

(b) Will he inform this House-

(i) whether a scheme has been drawn up to grant subsidies to these farmers with the aim of uplifting their economic status and enabling them to resume their cultivation activities;

(ii) if so, what that scheme is; and

(iii) the date on which the aforesaid subsidy scheme will be implemented?

(c) If not, why?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ මේ තත්ත්වය කනගාටුදායකයි. ගරු කථානායකතුමනි, මෙතුමා අහන්නේ මෙවර මහ කන්නය ගැනයි. මෙවර මහ කන්නය තවම වගා කර ගෙන යනවා. මෙවර මහ කන්නයේ කිසිම - [බාධා කිරීමක්]

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මෙවර නොවෙයි. මේක කලින් දුන්නු ප්‍රශ්නයක් ගරු ඇමතිතුමනි.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔබතුමා තවම යල මහ දන්නේ නැහැ. ඒකයි වැරැද්ද.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, මේක පසු ගිය වතාවේ ඉදිරිපත් කරන්න දුන්නු ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, ප්‍රශ්නය ප්‍රමාද වෙලා න්‍යාය පත්‍රයට ඇවිල්ලා තිබෙනවා. ඒක මගේ වැරැද්ද නොවෙයි.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
නැහැ මම පිළිතුර දෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නයේ අඩුවක් තිබෙනවා. කමක් නැහැ ඇමතිතුමා පිළිතුර දෙන්න සූදානම්. හරි, ඇමතිතුමා ප්‍රශ්නයට පිළිතුර දෙයි. [බාධා කිරීමක්]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි:

(අ) (i) මෙවර මහ කන්නයේ (2011/2012) උතුරු පළාතේ වවුනියාව, කිලිනොච්චි, මුලතිව්, මන්නාරම හා යාපනය යන දිස්ත්‍රික්කවල වර්ෂාව හා ගංවතුරින් කව්පි, උඳු, මුං හා පලතුරු වගාවන් හානියක් මේ දක්වා වාර්තා වී නොමැත.

(ii) නමුත් 2010/2011 මහ කන්නයේ වර්ෂාව හා ගංවතුරින් වගාවන් හා අස්වැන්න විනාශ වී යාම හේතුවෙන් ගොවීන් දැඩි අපහසුතාවට මුහුණ පා ඇත.

(ආ) (i) ඔව්.

(ii) ගංවතුරින් හානි වූ ගොවීන්ට අතිරේක ආහාර භෝග හා බිත්තර වී බීජ ලබා දීමේ වැඩසටහන.

(iii) දැනටමත් මෙම සහනාධාර ලබා දී අවසන්ය.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඉදිරිපත් කර සැහෙන කාලයක් ගත වුණත්, ප්‍රශ්නය ප්‍රමාද වී න්‍යාය පත්‍රයට ඇතුළත් වීම ඇමතිතුමා වෙනත් පැත්තකට හැරවීම පිළිබඳව මා කනගාටු වන අතරේ උතුරු ප්‍රදේශයට අදාළව විශේෂයෙන්ම උඳු, කව්පි සහ පලතුරු සම්බන්ධයෙන් මා ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. ඇමතිතුමා, පලතුරු බීජ පිට රටින් ගෙන්වන්න කටයුතු කර තිබෙනවාද? පලතුරු සහ උඳු සම්බන්ධව මොන වාගේ ක්‍රියා මාර්ගයක්ද අරගෙන තිබෙන්නේ?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
පලතුරු කියන්නේ මොනවාද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
විශේෂයෙන්ම මිදි වගාව සහ උඳු වගාව.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
උඳු පලතුරු නොවෙයිනේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පලතුරු වශයෙන් මිදි. ඊට අමතරව ධාන්‍ය වශයෙන් උඳු.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, උඳුවලට අවශ්‍ය කරන සියලුම බීජ ලබා දීලා මේ වර්ෂයේ අපි උඳුවලින් ස්වයංපෝෂිත තත්ත්වයකට එනවා. පලතුරු හැටියට එතුමා මතක් කරන්නේ මිදි. මිදි පැළ වුවමනා තරමක් ලබා ගන්න පුළුවන්. ඒවා අපේ කල්පිටිය මධ්‍යස්ථානයේ සකස් කර තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, යල මහ කන්න සහ ඊසාන, නිරිත දිග මෝසම් වර්ෂාව වෙනස් වෙමින් තිබෙනවා. සාමාන්‍යයෙන් මැයි සිට සැප්තැම්බර් දක්වා නිරිත දිග මෝසමත් නොවැම්බර් සිට පෙබරවාරි දක්වා ඊසාන දිග මෝසමත් කියන වර්ෂා රටාවේ වෙනසක් ඇති වෙලා තිබෙනවා. ඒකත් එක්ක බලාපොරොත්තු නැති ගං වතුර තත්ත්ව සහ නියඟ ඇති වනවා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවත් එක්ක සම්බන්ධීකරණ වැඩ පිළිවෙළක් අමාත්‍යාංශයට තිබෙනවාද, ඒ ඇති වන තත්ත්වයන්ට මුහුණ දෙන්න?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව දිනපතා මේ පිළිබඳ වාර්තාව නිකුත් කරනවා. අපි ඒ වාර්තාව බලා ගෙන ඉන්නේ මොකක්ද වෙන්නේ කියලා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, දිනපතා වාර්තා නිකුත් වුණත්, ඒ වාර්තාවල තිබුණු ගැටලුත් එක්ක පසු ගිය දවස්වල වෙච්ච අකරතැබ්බය අපි දන්නවා.

මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මේකයි. දැන් ගරු ඇමතිතුමා කිව්වා බීජ පිට රටිනුත් ගෙන්වන්න සිද්ධ වුණා කියලා. හදිසි අවස්ථාවකදී ගොවීන් සඳහා නිකුත් කිරීම සඳහා කල් ඉකුත් වන සීමාව රැකෙන පරිදි බීජ සංචිත පවත්වා ගෙන යෑමේ ක්‍රමවේදයක් අමාත්‍යාංශය සතුව තිබෙනවාද? ඒ කොයි විධියටද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
එහෙම එකක් තිබෙනවා ගරු කථානායකතුමනි. ඔබතුමා දන්නවා, කුණ්ඩසාලේ අපේ ශීත ගබඩාවේ අපි තැන්පත් කරලා තිබෙනවා, දළ වශයෙන් එක කන්නයකට අවශ්‍ය කරන බීජ ප්‍රමාණය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ කියන්නේ අමාත්‍යතුමනි, මින් පස්සේ පිට රටින් ගෙන්වන්න අවශ්‍ය නැද්ද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
පිට රටින් ගෙන්වන්න අවශ්‍ය වෙන්නේ උඳු බීජ. මොකද, උඳු විනාශ වුණොත් විනාශ වුණාම තමයි. ආයෙත් ඒවායින් බීජ හදන්න බැහැ. ඒ විධියට උඳු බීජ නැති වුණොත් අපට ගෙන්වන්න වනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
කුරක්කන්?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
කුරක්කන් අපි ළඟ තිබෙනවා.

## වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ උපදේශකයන්: විස්තර
## துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சின் ஆலோசகர்கள்: விபரம்
## ADVISERS UNDER MINISTRY OF PORTS AND HIGHWAYS : DETAILS

1486/'11

3. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයන් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසු ගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබා දී ඇති උපදේශකයන්ගේ නම්, ලබා දී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබා දෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சில் தற்போது சேவையாற்றுகின்ற ஆலோசகர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) இவர்களின் பெயர்கள், கல்வித் தகைமைகள் மற்றும் பொறுப்புகள் யாவை;

(iii) இவர்களுக்குச் செலுத்தப்படும் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் யாவை;

(iv ) கடந்த மாதத்திற்காகச் செலுத்தப்பட்ட அனைத் துக் கொடுப்பனவுகளினதும் கூட்டுத்தொகை எவ்வளவு

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i ) உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள், வழங்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் விபரங்கள் யாவையென்பதையும்;

(ii ) இவர்களுக்கு எரிபொருள் கொடுப்பனவு வழங் கப்படும் எனின், ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்படுகின்ற எரிபொருள் கொடுப்பனவு தனித்தனியாக யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i ) இவர்களுக்கு தொலைபேசி வசதிகள் வழங்கப் படுமெனின், தற்போது தொலைபேசி வசதிகள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(ii ) தொலைபேசிக் கொடுப்பனவுத் தொகை யொன்று வழங்கப்படுமெனின் ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்பட்டுள்ள கொடுப் பனவுத் தொகை தனித்தனியாக எவ்வளவென் பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he state-

(i) the number of advisers who serve in the Ministry of Ports and Highways at present;

(ii) their names, educational qualifications and responsibilities;

(iii) the salaries and allowances paid to them; and

(iv) the total of all the allowances paid during the previous month?

(b) Will he inform this House-

(i) the names of the advisers to whom official vehicles have been provided, the number of official vehicles provided and the details of those vehicles; and

(ii) separately of the fuel allowance provided to each adviser, if they are provided with a fuel allowance?

(c) Will he state-

(i) the names of the advisers to whom telephone facilities have been provided by now if telephone facilities are provided to them; and

(ii) separately of the amount of the telephone allowance paid to each adviser, if they are paid a telephone allowance?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன )
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය කිසිදු උපදේශකවරයකු පත් කර නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(ඇ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

## ජාතික චිත්‍රපට සංස්ථා සභාපති : විස්තර
## தேசிய திரைப்படக் கூட்டுத்தாபனத் தலைவர்: விபரம்
## CHAIRMAN OF NATIONAL FILM CORPORATION : DETAILS

1599/'11

4. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1) :

(අ) (i) ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපතිවරයාගේ සම්පූර්ණ නම හා වයස;

(ii) ඔහු මීට පෙර සේවය කළ ස්ථානය හා තනතුර;

(iii) ඔහුගේ වෘත්තීය පළපුරුද්ද;

(iv) ඔහුගේ වර්තමාන මාසික වැටුප සහ වෙනත් දීමනා;

(v) මීට පෙර ලබා දුන් වෙනත් දීමනා;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වත්මන් සභාපතිවරයා එම තනතුරට පත් කළ බලධාරියා කවුරුන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெகுசன ஊடக, தகவல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய திரைப்படக் கூட்டுத்தாபனத்தின் தலைவரின் முழுப்பெயர் மற்றும் வயது என்ன;

(ii) இவர் இதற்கு முன்னர் சேவையாற்றிய இடம் மற்றும் பதவி எவை;

(iii) இவருடைய தொழில் அனுபவம் எவை;

(iv) இவருடைய தற்போதைய சம்பளமும் ஏனைய கொடுப்பனவுகளும் எவை;

(v) இதற்கு முன்னர் வழங்கப்பட்ட ஏனைய கொடுப் பனவுகள் எவை

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) தற்போதைய தலைவரை அப்பதவிக்கு நியமித்த அதிகாரி யாரென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media and Information:

(a) Will he state -

(i) the full name and the age of the Chairman of the National Film Corporation;

(ii) his previous place of work and the post held by him;

(iii) his professional experience;

(iv) the monthly salary and other allowances paid to him at present; and

other allowances paid to him before this?

(b) Will he inform this House of the name of the person in authority who appointed the present Chairman to that position?

(c) If not, why?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெகுசன ஊடக, தகவல் அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media and Information)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) බිබිලේ අබේසිංහ මුදියන්සේලාගේ ගාමිණී නන්ද කුමාර් අබේසිංහ
අවුරුදු 67.

(ii) මිල්කෝ සමාගම
සභාපති

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

(iii) වසර 29ක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු වශයෙන් අඛණ්ඩව කටයුතු කිරීම. ඉන් අනතුරුව සේවා අවශ්‍යතාව මත විටින් විට රාජ්‍ය සේවයේ වගකීම් දරා ඇත.

(iv) මාසික වැටුප - රුපියල් 60,000යි

දීමනා (මාසිකව)

ඉන්ධන - රුපියල් 14,000යි.

දුරකථන - රුපියල් 11,250යි.

සංග්‍රහ - රුපියල් 7,500යි.

(v) නැත.

(ආ) ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා.

(ඇ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට මාධ්‍ය ගැන ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද? අදාළ වෙයිද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මේකට අදාළ නම් උත්තර දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැත්නම් බැහැ?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
අදාළ නම් උත්තර දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේක ටිකක් ප්‍රසිද්ධ කාරණයක්. පසු ගිය කාලයේ ප්‍රගීත් එක්නැලිගොඩ මහත්මයා පිළිබඳව-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ නැත.

ප්‍රශ්න අංක 5, ගරු රවි කරුණානායක මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඇමතිතුමා කැමැතියි උත්තර දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙමත් බැහැ නේ. හොඳයි, උත්තරය දුන්නා. ප්‍රශ්නය වෙනම අහන්න. ඒ ප්‍රශ්නය ඇමතිතුමාට ඇහිලා උත්තරය දුන්නා. ගරු ඇමතිතුමා ආපසු හයියෙන් උත්තර දෙන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මේ ප්‍රශ්නයට අදාළ නම් උත්තර දෙනවා. එතුමාට අතුරු ප්‍රශ්න තුනක් අහන්න අයිතිය තිබෙනවා. ඒ අතුරු ප්‍රශ්න තුන මේකට අදාළ නම් උත්තර දෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
උත්තර දෙන්නේම නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ නැති ඒවා අහන කොට එහෙම තමයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ මහත්මයා අතුරුදහන් වෙලා කියලා තමයි එතුමාගේ භාර්යාව කියන්නේ. මේ රටේ තිබෙන සාමාන්‍ය මතයත් ඒක. නමුත් හිටපු නීතිපතිතුමා කියලා තිබුණා එතුමා පිට රට ස්ථානයක ඉන්නවා කියලා. ගරු ඇමතිතුමා තැඹිලි ගෙඩිත් අරගෙන ජනමාධ්‍යවේදීන් බලන්න යන්න පුළුවන් තරම් ශක්තියක් තිබෙන කෙනකු නිසා මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්නේ. එතුමා ඉන්න ස්ථානය ඔබතුමාට හරියට කියන්න පුළුවන්ද? මොකද එතකොට තැඹිලි ගෙඩියක්වත් අරගෙන අපට එතුමා බලන්න යන්න පුළුවන්.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මාත් එතුමා ඉන්න තැන හොයනවා. මොකද මටත් ගිහින් එතුමා බලලා එන්න වුවමනාව තිබෙනවා. ඒක දැන ගත්තාම ඔබතුමාට දන්වන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතකොට මේ හිටපු නීතිපතිතුමා කියන්නේ-

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඒ සම්බන්ධව දැනට හොයා ගෙන යනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතකොට හිටපු නීතිපතිතුමා කරපු ප්‍රකාශය ගැන ඔබතුමා මොකක්ද කියන්නේ?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
plastic surgery හරි කරන්න පුළුවන්, ඉන්න තැන හරියටම කිව්වොත්. ඒවා හරියටම හොයලා බලලා කියන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊළඟට, ප්‍රශ්න අංක 5.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මටත් එක කාරණයක් අහන්න තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමාගෙන් මා අහනවා සරත් ෆොන්සේකාට උත්තර දෙන්න එපා කියලා ඒ වාගේ ප්‍රකාශ දීලා තිබෙනවාද කියලා?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එය අදාළ නැත.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සරත් ෆොන්සේකාට උත්තර දෙන්න බැහැ කියලා තිබෙනවාද? එතුමාට මාධ්‍ය පැත්තෙන් වාරණයක් ඇති කර තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ නැත.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි,-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැද්ද ගරු කථානායකතුමනි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කලින් ප්‍රශ්නය ඔබතුමාට අදාළ නැති වුණත් ඔබතුමා අතුරු ප්‍රශ්න තුනක්ම ඇහුවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කියන්නේ ජනමාධ්‍ය ඇමතිතුමාත් වාරණයක් දෙනවා. ගරු කථානායකතුමාත් ඒක censor කරන්න හදනවා නේද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5-1200/'11-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, පිළිතුරු දෙන්න කල් ගන්නේ නැහැ කියලා හිතා ගෙන මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අදත් පාර්ලිමේන්තුව වහන්න හදනවා වාගේ-

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## හැටන්-නුවරඑළිය ප්‍රධාන මාර්ගයේ තලවාකැලේ කොටස : අලුත්වැඩියාව
## ஹற்றன் - நுவரெலியா பிரதான வீதியின் தலவாக்கலை பகுதி : திருத்தம்
## TALAWAKELE AREA ON HATTON-NUWARA ELIYA MAIN ROAD : REPAIRS

1357/ '11

6. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,- (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හැටන්-නුවරඑළිය ප්‍රධාන මාර්ගයේ, තලවාකැලේ ප්‍රදේශයේ මාර්ගය මේ වන විට දැඩි ලෙස අබලන්ව ඇති බවත්;

(ii) එම තත්ත්වය නිසා ගමනාගමනයේදී එම ප්‍රදේශයේ ජනතාව දැඩි දුෂ්කරතාවන්ට මුහුණපාන බවත්,

(iii) දැඩි ලෙස අබලන් වූ එම මාර්ගය ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා බාධාවක් වී ඇති බවත්:

එතුමා දන්නෙහිද?

(ආ) (i) හැටන් - නුවරඑළිය මාර්ගයේ තලවාකැලේ කොටස අලුත්වැඩියා කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) මේ වන විට, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) එම මාර්ගයේ සංවර්ධන කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நுவரெலியா மாவட்டத்தில் ஹற்றன்-நுவரெலியா பிரதான வீதியின் தலவாக்கலை பிரதேசத்திலுள்ள வீதி தற்போது கடுமையாக சேதமடைந்தள்ளது என்பதையும்;

(ii) இந்த நிலைமை காரணமாக போக்குவரத்தின் போது அப்பகுதி மக்கள் பாரிய சிரமத்தினை எதிர்நோக்கியுள்ளார்கள் என்பதையும்;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) கடுமையாக சேதமடைந்துள்ள மேற்படி வீதி பிரதேசத்தின் சுற்றுலாத்துறை மேம்பாட்டுக்குத் தடையாக அமைந்துள்ளது என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) ஹற்றன் -நுவரெலியா வீதியில் தலவாக்கலை பகுதியைத் திருத்தியமைப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) தற்போது அதற்காக நிதி ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) அவ்வாறாயின், அத்தொகை யாதென்பதையும்;

(iv) மேற்படி வீதியில் அபிவிருத்திப் பணிகள் ஆரம்பிக்கப்படும் திகதி யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Is he aware that-

(i) the stretch of road in Talawakele area on the Hatton-Nuwara Eliya main road in Nuwara Eliya District is in a very dilapidated condition;

(ii) as a result, the people of that area face immense hardships when using the above road for transport activities; and

(iii) the severe dilapidated condition of the road has become an obstacle for the promotion of tourism in the area?

(b) Will he inform this House-

(i) whether action will be taken to repair the stretch of road in Talawakele area on the Hatton-Nuwara Eliya main road;

(ii) whether allocations have already been made for that purpose by now;

(iii) if so, the amount that has been allocated; and

(iv) the date on which the development work of this road will be commenced?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, වරාය හා මහා මාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා මේ ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) (i) තලවාකැලේ නගරය ආසන්නයේ ඇති බෝක්කු 88/5 සිට 90/3 දක්වා මීටර් 1300ක කොටස නඩත්තුකොට සංවර්ධනය කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ "ඉහළ කොත්මලේ ව්‍යාපෘතිය" වෙත භාර දී ඇත. පළුදු මකා නඩත්තු කිරීම අවසන් කර ඇත. සංවර්ධනය කිරීමේ කටයුතු 2012 අප්‍රේල් මාසයේ අවසන් කිරීමට සැලසුම් කර ඇත.

(ii) ඔව්. ලංකා විදුලිබල මණ්ඩලයේ "ඉහළ කොත්මලේ ව්‍යාපෘතිය" යටතේ මුදල් වෙන් කර ඇත.

(iii) රුපියල් මිලියන 90කි.

(iv) 2012 ජනවාරි මස ආරම්භ කර 2012 අප්‍රේල් මස අවසන් කිරීමට බලපොරොත්තු වේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, කාලය පිළිබඳවත් සලකා බලා අතුරු ප්‍රශ්නය දෙකයි අහන්නේ. ගරු ඇමතිතුමාට ඒ පිළිබඳව අවධානය යොමු කරන්න පුළුවන් වෙයිද? පළමුවන කාරණය මෙයයි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ හැටන්-නුවරඑළිය ප්‍රධාන මාර්ගයේ තලවාකැලේ කොටස ඉහළ කොත්මලේ බලාගාරයට අදාළ බර වාහන නිතර නිතර පරිහරණය කිරීම නිසා තමයි මෙපමණ අබලන් වෙලා තිබෙන්නේ. තව වැඩි කල් නැහැ. ඒක ඇත්ත. ඒ වන තුරු තාවකාලිකව හෝ පිළියම් යෙදුවේ නැත්නම් මේ මාර්ගයේ ගමන් කරන සංචාරකයන්ට සහ එවැනි වාහනවලටත් විශේෂයෙන් මගී බස්රථවලටත් මෙය අහිතකර ලෙස බලපානවා. එම නිසා තාවකාලිකව ඒ ප්‍රතිසංස්කරණ කටයුතු පටන් අර ගෙන අප්‍රේල් මාසය වන තුරු ඉන්න බැලුවොත් තව මාස 4කට වැඩි කාලයක් ගත වන නිසා යම් පිළියමක් යෙදීම කෙරෙහි අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්නට ඔබතුමාට පුළුවන්කම තිබෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒ පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ මාර්ගයේ ගමන් කිරීම සිදු වනවා. ඒක සම්පූර්ණයෙන් නවත්වලා නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මාර්ගයේ ගමන් කිරීම සිදු වනවා, ගරු කථානායකතුමනි. නමුත් ඒවායේ තිබෙන්නේ අලි බහින වළවල්. මා ළඟ ඡායාරූපයකුත් තිබෙනවා. එම ඡායාරූපයත් පෙන්වන්නට පුළුවන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔය ඡායාරූප පරණයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

නැහැ, නැහැ, අනේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වාහන ගමන් කිරීමට හැකි ලෙස දවස් දෙක තුනකට සැරයක් එය, ව්‍යාපෘතිය මඟින් නඩත්තු කරනවා. මේ කටයුතු හමාර වීමෙන් පසුව, එය ප්‍රධාන පාරක් ලෙස, දියුණුම පාරක් බවට පත් කිරීමට කටයුතු කරනවා. ඔබතුමාත්, මමත් කවුරුත් පිළිගන්නවා, ඉහළ කොත්මලේ ව්‍යාපෘතිය අත්‍යවශ්‍යව තිබෙන ව්‍යාපෘතියක් බව. එහි කටයුතු වෙලාවට අවසන් වන්න ඕනෑ. ඒ නිසා හිමින් හිමින් යනකොට, මේ මාර්ගයේ සුන්දර පරිසරයක් සංචාරකයන්ට දැක බලා ගන්නට පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ කියන්නේ වළවල්වල වැටි වැටී යනකොට -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, වළවල් නැහැ. ගිහිල්ලා බලන්න කෝ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මෙහි වළවල් තිබෙනවා, ගරු කථානායකතුමනි. මා මේ ලකුණු කර ගෙන ආවා. මීට දවස් හයකට කලින් ගත් ඡායාරූපයක් මේ මා ළඟ තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා නුවරඑළියේ පාර්ලිමේන්තු මන්ත්‍රී සංචාරක බංගලාවට ගිහිල්ලා බලන්න කෝ. ඒ හරහා ගියාම, වළවල් නැති බව හොඳට පෙනෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමා කියන්නේ, වළවල්වල වැටි වැටී සෙමින්, සෙමින් යනකොට කොන්දටත් සනීපයි, ඇඟටත් සනීපයි, දිය ඇලිත් බල බලා යන්න පුළුවන් කියලාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්. ලස්සන පරිසරය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මේ වාගේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වන බොහෝ ස්ථානවලට සම්පව ප්‍රවේශ මාර්ගවල සහ ඒ අවට මාර්ගවල මේ තත්ත්වය තිබෙනවා. දක්ෂිණ අධිවේගී මාර්ගයේත් -මාතර සහ ගාල්ල අතර- මේ තත්ත්වය තිබෙනවා. අපි පිළිගන්නවා, ඔබතුමා කියන කාරණයේ යම් සත්‍යතාවක් තිබෙනවා කියලා. එම මාර්ගයේ බර වාහන යනකොට යම් යම් ගැටලු ඇති වන බව ඇත්ත. හැබැයි, අවම වශයෙන් ත්‍රී රෝද රථයකට, යතුරු පැදියකට, සාමාන්‍යයෙන් මඟී බස් රථවලට යන්න පුළුවන් විධියට, නියම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වන තුරු තාවකාලික ප්‍රතිසංස්කරණ කටයුතු අනෙකුත් තැන්වලත් සිදු කරන්න අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්නය කියලා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හොඳමයි. බොහොම ස්තුතියි.

## ඉදි කිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා : ඇමෙරිකානු සංචාරය
நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர் : அமெரிக்க விஜயம்
MINISTER OF CONSTRUCTION, ENGINEERING SERVICES, HOUSING AND COMMON AMENITIES : AMERICAN TOUR

1600/'11

7. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ඉදි කිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා ඇතුළු පිරිස 2011.05.09 හෝ ඊට ආසන්න දිනක යෙදුණු ඇමෙරිකානු සංචාරයේ අරමුණ කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒ සඳහා සහභාගි වූ අයගේ නම් සහ තනතුරු කවරේද;

(ii) ඔවුන් නවාතැන් ගත් ස්ථාන සහ එම ස්ථානයන් සඳහා රජය විසින් දරන ලද වියදම කොපමණද;

(iii) එම සංචාරය වෙනුවෙන් රජය විසින් දරන ලද ගුවන් ගමන්, අභ්‍යන්තර ගමන් බිමන් සහ අනෙකුත් වියදම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම සංචාරය මඟින් ශ්‍රී ලංකාව ලබා ගත් ප්‍රතිලාභ කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම් ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர் உள்ளடங்கிய குழுவினர் 2011.05.09ஆம் திகதியன்று அல்லது அதற்கு அண்மிய தொரு தினத்தில் மேற்கொண்ட அமெரிக்க விஜயத் தின் நோக்கம் யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அதில் கலந்துகொண்டவர்களின் பெயர்களும் பதவிகளும் யாவை என்பதையும்;

(ii) இவர்கள் தங்கியிருந்த இடங்களின் பெயர்கள் மற்றும் அதற்காக அரசாங்கத்தினால் ஏற்கப் பட்ட செலவு எவ்வளவென்பதையும்;

(iii) மேற்படி விஜயத்தின் பொருட்டு அரசினால் ஏற்கப்பட்ட விமானப் பயண, உள்ளகப் பயண செலவுகளும் ஏனைய செலவுகளும் வெவ் வேறாக எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) மேற்படி விஜயத்தின் மூலம் இலங்கைக்கு கிடைத்த நன்மைகள் யாவையென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Will he state the purpose of the tour to America, made by the Hon. Minister of Construction, Engineering Services, Housing and Common Amenities and his entourage on or around 09.05.2011?

(b) Will he inform this House-

(i) of the names and designations of those who partook that tour ;

(ii) their places of accommodation and the expenses borne by the Government on those places ; and

(iii) separately of the expenses borne by the Government on air ticketing, internal travel and other needs in relation to this tour?

(c) Will he state the benefits accrued to Sri Lanka as a result of this tour?

(d) If not, why?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) 2011.05.17 දින එක්සත් ජාතීන්ගේ සංවිධාන මූලස්ථානයේ පැවැත්වුණු 2600වැනි සම්බුද්ධත්ව ජයන්ති සම්මන්ත්‍රණය ඇමතීම.

(ආ) (i) ආචාර්ය අචල උපේන්ද්‍ර ජයතිලක - ගරු අමාත්‍යතුමාගේ පුද්ගලික ලේකම්

(ii) නිව්යෝර්ක් නගරයේ Four Point හෝටලය සහ එහි සිටින ශ්‍රී ලාංකික හිතවතුන්ගේ ස්ථාන.

රජයෙන් කිසිදු වියදමක් නොදරන ලදී.

(iii) මෙම සංචාරය සඳහා රජයේ කිසිදු වියදමක් නොදරන ලදී.

(ඇ) ලෝකයේ බෞද්ධාගමික රටවල් සියල්ලේම සහභාගිත්වයෙන් පැවැත්වූ මෙම සමුළුවට සහභාගි වීම තුළින්, ලෝකයේ බෞද්ධ රටවල් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වැඩි දියුණු වීම.

බෞද්ධාගම වෙනුවෙන් රටවල් අතර සහයෝගිතාව වර්ධනය වීම.

(ඈ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමා, ඔබතුමා ඒ අවස්ථාවට සහභාගි වෙන්න ගිය එක හොඳයි. මා ඔබතුමාගෙන් අහන පළමුවැනි ප්‍රශ්නය මේකයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි සභාපතිවරයා පිළිබඳව ඔබතුමා තුළ විශාල විරෝධයක් තිබුණා, අපේ රටට එරෙහිව කරන සතුරුකම්වලට විරුද්ධව.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මහ ලේකම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්, ඔව්, මහ ලේකම් තමයි. සමා වෙන්න! ඔබතුමා ඒ ස්ථානයට ගිහිල්ලා සම්බුද්ධත්ව ජයන්තියට සම්බන්ධ වීමයි, මහ ලේකම්වරයා සමඟ තිබෙන ප්‍රශ්නයයි අතර යම්කිසි- [බාධා කිරීමක්] මොකද, ලංකාව තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානයට සහ විශේෂයෙන්ම බැන් කී මූන්ට එරෙහිව කටයුතු කරපු කෙනකු විධියට එම භූමියට ගිහිල්ලා ඔබතුමා කටයුතු කිරීම යම්කිසි විධියකට හොඳ නැහැයි කියලා ඔබතුමාගේ හෘදය සාක්ෂියට අනුව තේරෙන්නේ නැද්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ඒකේ කිසිදු නුසුදුසුභාවයක් නැහැ. ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටක්. සාමාජික රටක් හැටියට එම සංවිධානය තවමත් ශ්‍රී ලංකාවේ කටයුතු කරනවා. එතෙක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කටයුතුවලට සහභාගී වීමේ බාධාවක් අපට නැහැ. නමුත් එක්සත් ජාතීන්ගේ සංවිධානය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අනුගමනය කරන යම් යම් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අපට විවේචන තිබෙනවා, විරෝධතා තිබෙනවා. ඒවා සහ එම සංවිධානය සම්බන්ධ වෙනත් අවස්ථාත් පටලවා ගැනීමේ අවශ්‍යතාවක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ සංවිධානයට පරිබාහිරව තවත් සංවිධානයක් ගොඩනඟන්න ඕනෑ කියලා ගරු ඇමතිතුමා පසු ගිය කාලයේ ප්‍රකාශ කරලා තිබුණා. කවදාද ඒක ඉෂ්ට කරන්න කටයුතු කරන්නේ? එක්සත් ජාතීන්ගේ සංවිධානයට සම්බන්ධ වෙලා ඉන්න රටවල් සංඛ්‍යාවට වැඩිය රටවල් ප්‍රමාණයක් ඒකට එකතු කර ගන්න පුළුවන් වෙයි කියලා ඔබතුමා විශ්වාස කරනවාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මොන තේරුමකින් මේ ප්‍රශ්නය මතු කරනවාද කියලා මට තේරෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මම මතයක් ප්‍රකාශ කරලා තිබෙනවා. ඒක ලෝකයේ ඇතැම් රටවල රාජ්‍ය නායකයිනුත් ප්‍රකාශ කර තිබෙන මතයක්. එක්සත් ජාතීන්ගේ සංවිධානය තමන්ගේ විශ්වසනීයත්වය දවසින් දවස පලුදු කර ගන්නා තත්ත්වයක් යටතේ ලෝකයේ විකල්ප සංවිධානයක් බිහි වීමේ අවශ්‍යතාවක් තිබෙනවා කියන මතය ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක ඔබතුමා කරනවාද? ඒකයි මම ඇහුවේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒක මම කරන දෙයක් නොවෙයි. ඒක ලෝකයේ පොදුවේ සිදු විය යුතු දෙයක්. එසේ සිදු විය යුතුයි කියා අපි අදහස් කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා කරනවා කියපු නිසා මම ඇහුවේ. කමක් නැහැ. ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. බෑන් කී මූන් මහත්මයාට එරෙහිව ඔබතුමා මාරාන්තික උපවාසයක් කළා. ඒ උපවාසය කරමින් ඔබතුමා කිව්වේ, ඒ කමිටු සාමාජිකයන් අයින් කළේ නැත්නම් ඔබතුමා මරා ගෙන මැරෙනවාය කියලායි. ඒ කියන්නේ උපවාසයෙන් තමන්ගේ ජීවිතය-

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා හිතුවද මම එල්ටීටීඊ එකේ-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා මරා ගෙන මැරෙන බෝම්බකාරයකු නොවෙයි. ඔබතුමා කිව්වා, ඒක ඉල්ලා අස් කර ගන්නේ නැත්නම් මරාන්තික උපවාසයක් කරලා තමන්ගේ ජීවිතය රට වෙනුවෙන් පූජා කරනවාය කියලා. ඉතින් ඔබතුමා එතැනින් නැඟිට්ටේ ඒ තුන් දෙනා අයින් කළාට පස්සේද, නැත්නම් ඒ තුන්දෙනා තවම ඉන්නවද, ඔබතුමාගේ වැඩ පිළිවෙළට මොකද වුණේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන ප්‍රශ්නයට අදාළද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ප්‍රධාන ප්‍රශ්නයට අදාළද? ඔබතුමා අහන ප්‍රශ්නය ඇමෙරිකානු සංචාරයත් එක්ක තිබෙන සම්බන්ධය මොකක්ද? තමුන්නාන්සේ අහලා තිබෙන්නේ, ඇමෙරිකාවේ කරපු සංචාරයක් ගැනයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එක්සත් ජාතීන්ගේ සංවිධානය ගැනයි මේ ප්‍රශ්නය අහන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒ සංචාරයට තිබෙන සම්බන්ධය මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සංචාරය යන කොට ඔබතුමා මරාගෙන මැරෙන්න කටයුතු-

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මරාගෙන මැරෙන්න කවුද ගියේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සියදිවි හානි කර ගන්න-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීතුමනි, හැම තිස්සේම පාර වරද්දවා ගන්න යන්න එපා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා පාර වරද්ද ගන්නවා නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ප්‍රශ්නයට කට උත්තර නැත.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Yes, what is your point of Order?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, අපේ වරප්‍රසාද ආරක්ෂා කරන පුද්ගලයා වන්නේ ඔබතුමායි. SAITM කියන පුද්ගලික university එකක් සම්බන්ධයෙන් ගැසට් එකක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබුණා. ඒක ගැසට් කරලා තිබුණේ අගෝස්තු මාසයේයි. ඒක අපට දුන්නේ දවස් දෙකකට ඉස්සෙල්ලායි. ඇයි මෙවැනි දේවල් පාර්ලිමේන්තුවට මේ විධියට යටපත් කරලා තිබෙන්නේ? මොකද මේක අගෝස්තු-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම ඒ ගැන සොයලා බලන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඒ වාගේම තවත් වැදගත් දෙයක් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට පත් කර තිබෙනවා. අද International Anti-Corruption Day එක; ලෝකයේම දූෂණයට විරුද්ධව කටයුතු කරන දවස. ඒ නිසයි මම අද මේ සම්බන්ධයෙන් අහන්නේ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාවෙන් ආයතන හතක් පිළිබඳව කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. කරුණාකරලා ඒ ආයතන හතේ තිබෙන දූෂණ- [බාධා කිරීමක්] ඉන්න කෝ. ඔබතුමන්ලා අල්ලස් හා දූෂණ සිදු කරන පට්ටපල් හොරු ටික මිහින් එයාර්, ශ්‍රීලංකන් එයාර් ලයින්, Sri Lanka Ports Authority මේ ඔක්කෝම නම් කරලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ එක නමක්වත් එතැන නැහැ. [බාධා කිරීමක්] මම මේ අහන්නේ අපේ වරප්‍රසාද ආරක්ෂා කරන කථානායකතුමාගෙනුයි; ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආරක්ෂා කරන කථානායකතුමාගෙන් නොවෙයි. මුළු ලෝකයම එය සමරන අද වාගේ දවසක, දූෂණයට විරුද්ධව සටන් කරන අද වාගේ දවසක කරුණාකරලා අපි වෙනුවෙන් ඔබතුමාගේ ශක්තිය මෙහෙයවා පොදු කාරක

[ගරු රවි කරුණානායක මහතා]

සභාවේ වාර්තාව CID එකට යවන්න තිබෙනවා නම් යවන්නය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යවන්නය කියා අපි ඉල්ලනවා. කරුණාකරලා ඒක කරන්න. කරන්න බැරි නම් අපි ගිහිල්ලා ඒ කටයුතු කරන්න අපි බැඳී සිටිනවාය කියන එකත් මතක් කරන්න කැමැතියි. [බාධා කිරීමක්] නිකම් කෑ ගහලා ආණ්ඩුව රකින එක නොවෙයි තිබෙන්නේ, ජනතාව රකින එකයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සාමාන්‍යයෙන් ඒ වාර්තා ලැබුණාම නිසි වෙලාවේදී නිසි තැන්වලට යොමු කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එවලා තිබෙනවා, ගරු කථානායකතුමනි. සුමාන දෙකකට ඉස්සෙල්ලා අපි ඔබතුමාට ඒ වාර්තා ගෙනල්ලා දුන්නා ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ වාර්තා හැම එකක්ම අදාළ තැන්වලට යොමු කරනවා. ප්‍රමාදයක් තිබේ නම් මම සොයා බලන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අද International Anti-Corruption දවසේ ඔබතුමා ඒක කියනවා නේද ගරු කථානායකතුමනි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්, කියනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## විසර්ජන පනත් කෙටුම්පත, 2012
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2012
## APPROPRIATION BILL, 2012

***කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී. - [ප්‍රගතිය: දෙසැම්බර් 08 ]***
***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி :டிசம்பர் 08] [சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்]*

*Considered further in Committee - [Progress: 08th December] [MR. SPEAKER in the Chair]*

**110 වන ශීර්ෂය.- අධිකරණ අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 312,605,000

**தலைப்பு 110.- நீதி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.-செயல்முறைச் செயற்பாடுகள்-மீண்டுவருஞ் செலவு ரூபா 312,605, 000

HEAD 110.- MINISTER OF JUSTICE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 312,605,000

**174 වන ශීර්ෂය.- පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 168,615,000

**தலைப்பு 174.- புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் — மீண்டுவருஞ் செலவு ரூபா 168,615,000

HEAD 174.- MINISTER OF REHABILITATION AND PRISON REFORMS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 168,615,000

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ශීර්ෂ අංක 110, 228, 231, 233, 235, 174, 232 සහ 326 සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 12.30 දක්වා, ශීර්ෂ අංක 121, 253 - 279, 130, 312 - 319, 321,134 සහ 236 සලකා බැලීම අපර භාග 1.00 සිට අපර භාග 6.00 දක්වා. විවාදය ආරම්භ කරන්නේ ගරු විජයදාස රාජපක්ෂ මහතා.

[පූ. භා. 10.02]

**ගරු විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, "2012 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේදී අද දින ඉදිරිපත් කරන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 110, 228, 231, 233, 235, 174, 232 සහ 326 දරන වැය ශීර්ෂයන්ගෙන් එක් එක් වැඩ සටහන්හි සියලුම පුනරාවර්තන වියදම් හා මූල ධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය"යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව විවාදය පවත්වන අද දිනය ජාත්‍යන්තර වශයෙන් ඉතා වැදගත් වන දිනයක්. අද දූෂණ විරෝධී -දූෂණ මර්දන- දිනය. ඒ නිසා අද දිනයේ දී රටේ නීතිය සහ සාමය පිළිබඳව කථා කරන කොට අපට ඉතාමත්ම වැදගත් වන කාරණා කිහිපයක් පිළිබඳවමේ ගරු සභාවේ අවධානය යොමු කරවන්නට මා බලාපොරොත්තු වනවා.

ගරු සභාපතිතුමනි, රටක් සංවර්ධනය වනවාද, රටක් අගාධයට යනවාද කියලා පූර්ව නිමිත්තක්, පූර්ව දර්ශකයක් විධියට භාවිත කරන්න පුළුවන් මිම්මක් තමයි, රටක නීතිය සහ සාමය කොතෙක් දුරට ක්‍රියාත්මක වනවා ද යන කාරණය. ඒ අනුව ගත් කල, අපි දන්නවා ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී රටවල, විශේෂයෙන්ම ලංකාවේ වුණත්, මීට දශක කිහිපයකට කලින්, රටේ නීතිය සහ සාමය ආරක්ෂා කිරීම පිළිබඳව බල මූලය එකට එකතු වෙලා මුළුගැන්විලා තිබුණේ අධිකරණ අමාත්‍යාංශයට බව. අද වන විට බොහෝ අංශ සම්බන්ධව ඒ බලය අධිකරණ අමාත්‍යාංශයෙන් ගිලිහී ගිහිල්ලා වෙනත් වෙනත් ආයතනවලට පැවරිලා විමධ්‍යගත වීමක් වෙලා තිබෙන නිසා අද අධිකරණ අමාත්‍යාංශයට පැවරිලා තිබෙන කාර්ය භාරය ඉතාමත්ම අඩු මට්ටමක පවතිනවාය කියන කාරණය පෙනෙනවා.

අධිකරණ අමාත්‍යාංශය නීතිය සහ සාමය රැකීමේ අංශයෙන් ගත් කල ඉතාමත්ම දුර්වල තත්ත්වයකට පත් වෙලා තිබෙන බවත් අපට පැහැදිලිව කියන්නට සිද්ධ වනවා. විශේෂයෙන්ම අද අධිකරණ අමාත්‍යාංශය නීතිය සහ සාමය ආරක්ෂා කිරීමේ ප්‍රමුඛයා වශයෙන්, බලධාරියා වශයෙන් කටයුතු කරනවාට වඩා යටිතල පහසුකම් සපයන්නා බවට පමණක් පත් වෙමින් තිබෙන බවක් පෙනෙන්නට තිබෙනවා. විශේෂයෙන්ම රටට අවශ්‍ය නීති, ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වගකීම පවතින අධිකරණ අමාත්‍යාංශය, ඒ කාර්යය සිදු කිරීමේ දී පවා කළ යුතු උසස් කර්තව්‍යයන් ඒ ආකාරයටම ඉටු කර ගන්න බැරි තත්ත්වයකට පසු ගිය කාලයේ -පසු ගිය වකවානුවේ- පත් වෙලා තිබුණු බව අපට පැහැදිලිව පෙනෙන්නට තිබුණා. ඔබතුමාට මතක ඇති, මීට කාලයකට පෙර සිවිල් නඩු විධාන සංග්‍රහයට සංශෝධනයක් ඉදිරිපත් කළා. එහිදී අපි පෙන්වා දුන්නා ඒ මුළු සංශෝධනයම නීතියට අනුකූල නැති, මේ රටේ ක්‍රියාත්මක කිරීමට නුසුදුසු තත්ත්වයක පවතිනවා කියලා.

එදා හිටපු අධිකරණ ඇමතිතුමා -ගරු අතාවුද සෙනෙවිරත්න අමාත්‍යතුමා- බොහොම නිහතමානීව ඒක පිළිගත්තා. ඒ වාගේම ඒ තත්ත්වය නිවැරදි කරන්න කටයුතු කළා. ඒ සිවිල් නීතිය සම්බන්ධවයි.

ඊළඟට, අපරාධ නඩු නීතිය සම්බන්ධවත් දැනට මාසයකට දෙකකට පමණ කලින් සංශෝධනයක් ඉදිරිපත් කළා. අපි පෙන්වා දුන්නා, ඒ සංශෝධනය නීතියක් විධියට පාර්ලිමේන්තුවේ සම්මත කරන්න බැරි එකක් බව. එතකොට මේ වාගේ කරුණු දැන දැන පාර්ලිමේන්තුවට ඒවා ඉදිරිපත් කිරීම තුළින්ම අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා යම් කිසි අසාර්ථකත්වයක් අධිකරණ අමාත්‍යාංශය පිටුපස පවතිනවා කියලා. ඒ එක්කම අපි පෙන්වා දුන්නා, අසාර්ථක ව්‍යාපාර රජයට අත් පත් කර ගැනීමේ කාරණයේදී ඒ නීතියේ තිබුණු දුර්වලතා. ප්‍රතිපත්තිමය වශයෙන් ඒක ගන්නවාද නැද්ද කියන කාරණය පසෙක තැබුවත් නීතිය සකස් කිරීමේ බරපතළ දුර්වලතාවන්, කඩා වැටීම්, බිඳ වැටීම් ඒ තුළ දකින්නට තිබුණා. අපි ඒක මේ ගරු සභාවට ඉදිරිපත් කළා.

ගරු සභාපතිතුමනි, අද මේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව මේ රටේ ජනතාවට විශාල සැකයක්, අවිශ්වාසයක් ගොඩ නැඟිලා තිබෙනවා. විශේෂයෙන්ම අධිකරණ පද්ධතිවලින්, නීතිය ක්‍රියාත්මක කරන පොලිසිය වැනි ආයතනවලින් මේ කටයුතු නීතියට අනුකූලව නොකරනවාය කියන මතයක් රට තුළ දැඩි වශයෙන් මේ වන කොට ගොඩ නැඟිලා තිබෙනවා. මේකේ භයානක ප්‍රතිඵල අපි පසු ගිය දවස්වල අත් වින්දා. ගරු සභාපතිතුමනි, උදාහරණයක් විධියට දොම්පේ පොලීසියේ සිද්ධිය ගන්න පුළුවන්. පොලිසිය සැකකරුවෙක් අත් අඩංගුවට ගත්තාට පස්සේ නීතිය ක්‍රියාත්මක කරනවා වෙනුවට එතැන කෲරත්වය, හිංසාවාදය ක්‍රියාත්මක කරලා ජීවිතයක් විනාශ වන තත්ත්වයට පත් වුණා.

දැන් මේ තත්ත්වය යටතේ පොලිසිය නීතිය ක්‍රියාත්මක කරනවාය කියන විශ්වාසය නැති නිසා ඒ ප්‍රදේශවාසීන්මොකද කළේ? ජනතාව ඒක රාශි වෙලා පොලිසියට ගිනි තැබුවා. මේ වාගේම තත්ත්වයක් මතු වෙමින් පැවතුණා, කරන්දෙණිය ප්‍රදේශයේත්. දැන් ඒකෙන් පෙන්නුම් කරන්නේ, රටට දෙන පණිවුඩය වන්නේ මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන නීතිය ක්‍රියාත්මක කරන්නේ නැත්නම්, ජනතාව ඒ අභියෝගය භාර ගන්න සූදානම්ය කියන එකයි. ජනතාව නීතිය ක්‍රියාත්මක කරන්න යනවා. ජනතාව තීරණය කරනවා, වැරැදිකාරයන් කවුද කියලා. ජනතාව තීරණය කරනවා, ඔවුන්ට දෙන්න ඕනෑ දඬුවම මොකක්ද කියලා. ජනතාව ඒක ක්‍රියාත්මක කරනවා. මේකට තමයි කියන්නේ අරාජිකත්වය -anarchy- කියලා. නීතියේ එවැනි බිඳ වැටීමක් සිද්ධ වන කොට රටේ පාලකයින් රටේ ජනතාව පාලනය කර ගන්න බැරි තත්ත්වයකට පත් වනවා. ඒක තමයි සාමාන්‍යයෙන් ලෝකයේ හැම රටකම සිද්ධ වන ක්‍රියාදාමය. ඒ විධියට තමයි පසු ගිය දිනවල මේ රටේත් මේ සිදු වීම් මාලාව තුළ මේ කරුණු ඇති වෙමින් පැවතුණේ. එක පැත්තකින් පොලීසිය නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ගැටලු තිබෙනවා.

ඒ එක්කම පොලිස් දෙපාර්තමේන්තුව ගත්තත් අද විශාල අර්බුදයකයි තිබෙන්නේ. මොකද, ඒ උදවියගේ සුදුස්සන්ට සුදුසු විධියට උසස් වීම්, මාරු වීම් ආදිය ලබා දීම පිළිබඳව බරපතළ ගැටලු තිබෙනවා. පොලීසියේ අවංකව කටයුතු කරන, සුදුසුකම් තිබෙන බොහෝ දෙනාගෙන් වැඩි දෙනෙක් අද අධිකරණවලට යනවා. මොකද, තමන්ගේ උසස් වීම, මාරු වීම සාධාරණ ක්‍රමවේදයක් තුළ සිද්ධ වන්නේ නැති නිසා ඒ උදවියට සිද්ධ වෙලා තිබෙනවා, අධිකරණයේ සහාය පතන්න. ඉතින් ඒ වාගේ කටයුතුවලට ඒ උදවියගේ කාලය විශාල වශයෙන් නාස්ති වන කොට රටේ අනිකුත් නීති ක්‍රියාත්මක කිරීමට පවතින ඉඩකඩ ඒ උදවියගේ අතින් ගිලිහිලා යනවා.

ඒ විතරක් නොවෙයි. නීතිපති දෙපාර්තමේන්තුව පිළිබඳව රටේ විශාල වශයෙන් විවේචන තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමාත් පිළිගන්නවා ඇති, පසු ගිය වකවානුව තුළ නීතිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද, විශේෂයෙන්ම අපරාධකාරයන් සම්බන්ධව චෝදනා පත්‍ර ඉල්ලා අස් කර ගැනීම පිළිබඳ බරපතළ චෝදනා එල්ල වෙලා තිබුණු බව. ජනමාධ්‍ය හරහා අපට ඒවා දැන ගන්නට ලැබුණා. ඒ වාගේ දේවල් රටකට එච්චර -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

Order, please! මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

*අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා සඳහන් කරමින් සිටියේ නීතිපති දෙපාර්තමේන්තුවේ පවතින තත්ත්වය පිළිබඳවයි. අපි දන්නවා, නීතිපති දෙපාර්තමේන්තුවේ අතිබහුතරයක් නිලධාරින් අඩු පහසුකම් කොපමණ තිබුණත්, ඒ අඩු පාඩුකම් මධ්‍යයේ ඉතා මහන්සියෙන් වැඩ කටයුතු කරනවාය කියලා. නමුත් ඉහළ මට්ටමින් ගත් තීරණ සම්බන්ධයෙන් මුළු දෙපාර්තමේන්තුවම අපකීර්තිමත් තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අපට දැඩි විශ්වාසයක් තිබෙනවා, වර්තමාන නීතිපතිතුමිය යටතේ මේ තත්ත්වය නිවැරදි කරලා, මීට පෙර නීතිපති දෙපාර්තමේන්තුවට ජනතාව අතර තිබුණු ගෞරවය, අභිමානය නැවතත් ගෙන ඒමට එතුමියට හැකියාව තිබෙනවාය කියලා. අපි ඒ බලාපොරොත්තුවෙන්, ඒ අපේක්ෂාවෙන් තමයි කටයුතු කරමින් සිටින්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ අධිකරණවල පැවැත්ම පිළිබඳව ජනතාවගේ ආකල්පවල දැඩි පරස්පර විරෝධීභාවයක් තිබෙනවා. අද බොහෝ දෙනෙක් හිතා ගෙන ඉන්නවා මේ අධිකරණ පවතින්නේ නීතිඥවරුන් සහ විනිශ්චයකාරවරුන් වෙනුවෙන් කියලා. මේ අධිකරණ තිබෙන නිසා, විනිශ්චයකාරවරු ඉන්න නිසා, නීතිඥවරු ඉන්න නිසා තමන්ගේ නඩු හබ අධිකරණවලට ගෙන එනවා වාගේ මතයක් තමයි ජනතාව අතර තිබෙන්නේ. මේක මේ රටේ ආකල්පමය වශයෙන් විශාල වෙනසක් සිදු විය යුතු කාරණයක්. මොකද, මේ රටේ අධිකරණ තිබෙන්නේ විනිශ්චයකාරවරුන්ටවත්, නීතිඥවරුන්ටවත් නොවෙයි මේ රටේ ජනතාවටයි. ඒක ජනතාවගේ අයිතියක්. තමන්ගේ ප්‍රශ්න විසඳා ගන්න, යුක්තිය සාධාරණය ඉෂ්ට කර ගන්න අධිකරණ පද්ධතියක් රටක පැවැතීම අත්‍යවශ්‍යයි. හැබැයි ඒ අධිකරණ පද්ධතියේ ක්‍රියාදාමයට මේ විනිශ්චයකාරවරුන්, නීතිඥවරුන් අත්‍යවශ්‍යයි. මොකද, ඒ උදවිය නැතිව මේ කර්තව්‍ය කරන්න බැරි නිසා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කරුණු කිහිපයක් කෙරෙහි විශේෂයෙන්ම ගරු අධිකරණ ඇමතිතුමාගේ අවධානය මම යොමු කරනවා. අද නඩු හබවල පැටලිලා අධිකරණ පද්ධතිවලට එන ජනතාව වෙනුවෙන් තිබෙන පහසුකම් ඉතාම අවමයි. සමහර අධිකරණවල පහසුකමක් ඇත්තේම නැහැ. විශේෂයෙන්ම අද බොහෝ අධිකරණවලට එන ජනතාවට හදිසි අවශ්‍යතාවකට පවා වැසිකිළි කැසිකිළි පහසුකමක්, හදිසි ආහාර පාන ටිකක් ගන්න පහසුකමක් යන ඒ කිසිවක් නැහැ. ඒක නිසා අධිකරණවලට එන ජනතාවගේ හිතේ විශාල වේදනාවක් තිබෙනවා. මොකද, මේ පහසුකම් සියල්ල බොහෝ විට විනිශ්චයකාරවරුන්ට, නීතිඥවරුන්ට සපයනවා, නමුත් අධිකරණයට එන මේ රටේ ජනතාවට ඒ පහසුකම් ලබා නොදීම තුළ ඒ උදවියට විශාල අසාධාරණයක් වෙනවා කියලා. ඒක සාධාරණ සිතුවිල්ලක්. ඒක නිසා රජයකට වග කීමක් තිබෙනවා, මොන ආණ්ඩුව බලයේ හිටියත් ඒ ආණ්ඩුවට වග කීමක් තිබෙනවා ඒ අධිකරණ පද්ධතිවල අත්‍යවශ්‍ය කොටසක් විධියට ඒ ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කරලීම පිණිස පහසුකම් සපයන්න. මේ අධිකරණවලින් විශාල ආදායමක් රජයට ලැබෙනවා.

විශේෂයෙන්ම අපරාධ අධිකරණ පැත්තෙන් බලපුවාම දඩ මුදල් විධියට විශාල ආදායමක් රජයට ලැබෙනවා. සිවිල් අධිකරණවලදී මුද්දර ගාස්තු වශයෙන් විශාල මුදලක් රජයට ලැබෙනවා. හැබැයි දැන් ඒ ඒ අධිකරණ හරහා ලැබෙන ආදායමෙන් සියයට එකක්වත්, සියයට දෙකක්වත් ඒ ආයතනවල නඩත්තුවට, ඒවා පවත්වා ගෙන යෑම සඳහා, ඒවායේ පහසුකම් ලබා දීම සඳහා යෙදවෙන්නේ නැහැ. මෙවර වුණත් මේ සාම්ප්‍රදායිකව ඉදිරිපත් කරලා තිබෙන අය වැය ලේඛනය දිහා බලපුවාම ඒ බව පැහැදිලි වෙනවා. ඒ පහසුකම් ලබා දීම ටිකක් අසීරු බව අධිකරණ අමාත්‍යාංශයට වෙන් කර තිබෙන ඉතා සුළු මුදල් ප්‍රතිශතය -කොටස- දෙස බැලුවාම තේරෙනවා. නමුත් මා මේ ගරු සභාවට මතක් කරන්නේ මේ ප්‍රතිපත්තියේ වෙනසක් පවතින්න ඕනෑ; මේක වෙනස් කරන්න ඕනෑ කියන එකයි. නඩු හබවලට සම්බන්ධ වන උදවියට - litigantsලාට- ප්‍රමුඛත්වය දිය යුතුයි කියන පරමාර්ථයෙන් "Litigants' priority is the first" කියන තේමාව යටතේ විනිශ්චයකාරවරුන්ගේ සංගමය පවා මෙවර ඒ උදවියගේ වාර්ෂික සම්මන්ත්‍රණය පවත්වන්න කටයුතු කර තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව මෙරටේ පාලකයන්ගේ තිබෙන ආකල්පය වෙනස් කරන්න ඒ වාගේ මාතෘකාවක් යටතේ කටයුතු කිරීම සුබදායක විධියට මමත් දකිනවා. හැබැයි, ඒක සාර්ථක කර ගැනීම සඳහා අධිකරණ ඇමතිතුමාට විශේෂ වග කීමක් පවතිනවා.

එතුමා දන්නවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු අපේ රටේ සිවිල් අභියාචනා අධිකරණ බලය විමධ්‍යගත කර තිබෙන බව. ඒ විමධ්‍යගත කිරීම හරහා සිවිල් අභියාචනා නඩු ඇසීම සඳහා අධිකරණ 22ක් වාගේ ප්‍රමාණයක් දැන් රට වටේම පවතිනවා. අධිකරණමය බලය විමධ්‍යගත කිරීම ඉතා හොඳ ප්‍රවණතාවක් විධියට අපි දකිනවා. හේතුව, මේ රටේ අභියාචනා අධිකරණයේ ගොඩ ගැහිලා තිබුණු සිවිල් අභියාචනා ප්‍රමාණය දෙස බැලුවාම ඒවා අපේ ජීවිත කාලයේ කවදාවත් ඉවර කර ගන්න බැරි නඩු කන්දරාවක් බවට පත් වෙලා තිබුණා. මේ විමධ්‍යගත කිරීම හරහා පළාත්බද මහාධිකරණ මඟින් සිවිල් අභියාචනා නඩු විභාග කිරීම හේතුවෙන් ජනතාවට විශාල ප්‍රතිලාභයක් ලැබෙනවා. මොකද, නඩු ප්‍රමාද වීම ඉතාම බරපතළ කාරණයක්. විශේෂයෙන්ම ඉඩම් නඩුවක්, බෙදුම් නඩුවක් සම්බන්ධව අධිකරණයට ඉදිරිපත් වුණාට පසු ඒ ඉඩම සංවර්ධනය කිරීම එතැනින් නතර වනවා. ඒ ඉඩම සම්බන්ධව ගනුදෙනු කිරීම නතර වනවා. ඒ ඉඩම සංවර්ධනය කිරීම සඳහා බැංකුවකින්, පිළිගත් මූල්‍ය ආයතනයකින් ණයක් ගැනීමේ ඉඩකඩ නතර වනවා. ඒ නිසා රටක් දියුණු කිරීම සඳහා පවතින ප්‍රථම සහ මුඛ්‍යතම සම්පත විධියට සලකන ඉඩම් සම්පත භාවිතයට නොගැනීමක් බවට පත් වනවා. සමහර වෙලාවට නඩු කල් යනවා කියන එක ඉතා සුළු දෙයක් විධියට පිට අර්ථයෙන් බැලුවාම අපට පෙනෙන්න තිබෙනවා. නමුත් මේකේ ගැඹුරු අර්ථය ඊට වඩා ඉහළයි. රටක සංවර්ධනය සම්පූර්ණයෙන් අඩාල වනවාද ඉදිරියට යනවාද කියන කාරණය පවා තීරණය කිරීමට මේ නඩු ප්‍රමාදය බලපෑ තිබෙනවාය කියන කාරණය අපි කාටත් පිළිගත හැකි කරුණක්. ඒක නිසා ඒ පළාත්බද මහාධිකරණ හරහා මේ නඩු, විශේෂයෙන්ම අභියාචනා අවසන් කිරීම ඉතා හොඳයි. හැබැයි මේ පෙර සූදානමක් නැතිව කලබලයට ඇති කර ගත්ත ක්‍රමයක්. ඒක නිසා මෙලෙස ආරම්භ කර තිබෙන බොහෝ මහාධිකරණවල පහසුකම් අඩුයි. අපේ හිටපු අධිකරණ ඇමති ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමාත් ඒ බව දන්නවා. එතුමාත් මේ කටයුතු සම්බන්ධයෙන් උනන්දුවෙන් කටයුතු කළා. විශේෂයෙන්ම අලුතින් නිර්මාණය කළ මහාධිකරණ පද්ධතිය අපිළිවෙළට කළ එකක්; ad hoc arrangement එකක්. හැබැයි අවශ්‍යතාවක් මත කරපු එකක්.

අද ඒ මහාධිකරණවල හුඟක් අඩු පාඩුකම් තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත් ගරු අධිකරණ ඇමතිතුමනි, කළුතර සිවිල් අභියාචනා මහාධිකරණයට ගියොත් එහි සේවාදායකයන්ට යන්න එන්න ඉඩ පහසුකම් ඇත්තේම නැහැ. මහාධිකරණයේ කොනක තිබෙන කොරිඩෝ එකක තමයි ඒ අධිකරණය පවත්වා ගෙන යන්නේ. විස්සකට තිහකට වැඩිය එතැනට එකතු වන්න බැහැ. ඒක නිසා නඩුවල පාර්ශ්වකාරයන්ට අධිකරණය ඇතුළට යා ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. එම අධිකරණවල නීතිඥවරුන්ට තම කටයුතු කරන්නට ප්‍රමාණවත් මේස පුටු පවා නැති තත්ත්වයක් තිබෙනවා. ඒ වාගේම කුරුණෑගල මහාධිකරණය ගත්තත් තත්ත්වය එසේමයි. මම නම් වශයෙන් කියන්නේ අධිකරණ ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නයි. එවිට එතුමාට පහසුවනවා, මේ පිළිබඳව සොයා බලන්න. ඒ අධිකරණ පද්ධතිය විශේෂයෙන්ම අභියාචනාධිකරණ විධියට සලකනු ලබන නිසා ඒවා මීට වැඩිය ගෞරවාන්විතව පවත්වා ගෙන යෑම සඳහා සුදුසු පරිදි සුදුසු ස්ථාන ලබා දීම සහ සුදුසු පහසුකම් ලබා දීම කළ යුතුව තිබෙනවා.

මේ සිවිල් අභියාචනා අධිකරණ පද්ධතිය තුළ දකින මූලික අඩු පාඩුවක් තමයි ගරු අධිකරණ අමාත්‍යතුමනි, මේ එකම මහාධිකරණයකටවත් පුස්තකාලයක් නොමැති වීම. ඒ විනිශ්චයකාරතුමන්ලාට, ඒ වාගේම නීතිඥවරුන්ට තමන්ගේ කටයුතු කිරීම සඳහා මූලිකම අවශ්‍යතාව තමයි නීති පුස්තකාලයක් තිබීම.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! Hon. Member, please wind up now. Your time is up.

**ගරු විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. Wijeyadasa Rajapakshe)

The Hon. John Amaratunga will allow me to have five more minutes, which will be deducted from the next speaker's time. - [*Interruption.*]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Okay, I will give him five more minutes.

**ගරු විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. Wijeyadasa Rajapakshe)

ගරු අධිකරණ ඇමතිතුමනි, මම විශේෂයෙන්ම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ අඩු පාඩු පිළිබඳව ඉතාම කඩිනමින් යම් කටයුත්තක් සිද්ධ කෙරෙන්නට ඕනෑයි කියලා. මට දැක ගන්නට ලැබුණා, උතුරු නැඟෙනහිර ප්‍රදේශවල පසු ගිය වකවානුවේ තිබුණු කලබලකාරී තත්ත්වයත් එක්ක අධිකරණ පද්ධති බොහොමයක් බිඳ වැටිලා තිබෙන අන්දම. ඒක නිසා උතුරු නැඟෙනහිර ඒ අධිකරණ පද්ධති පුනරුත්ථාපනය කරලා අවශ්‍ය පහසුකම් ලබා දීමේ විශේෂ වැඩ පිළිවෙළක අවශ්‍යතාවක් පෙනෙනවා.

අපට කියන්න සිද්ධ වෙනවා, විශේෂයෙන්ම අද රටේ ජනතාවගේ ජීවිත සුරක්ෂිතතාව පිළිබඳ ගැටලු මතු වෙලා තිබෙනවා කියලා.

සුදු වෑන්වලින් මිනිස්සු උස්සා ගෙන යෑම පිළිබඳව ගැටලු තිබෙනවා. ඒ වාගේම ජන මාධ්‍යවේදීන්ට සිදු වන හිරිහැර පිළිබඳව බරපතළ ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා නීතිය හා සාමය ක්‍රියාත්මක කිරීමේදී මේ කරුණු සියල්ල පිළිබඳව අවධානය යොමු කිරීමේ වගකීම අධිකරණ අමාත්‍යාංශය වෙත පැවරිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ එක්කම විනිශ්චයකාරවරුන්ගේ වැටුප් පිළිබඳව, විශ්‍රාම වැටුප් -pensions- පිළිබඳව ගැටලු තිබෙනවා. ඒ අය අනෙකුත් වෘත්තීය ආයතන වාගේ වෘත්තීය ක්‍රියා මාර්ගවලට -Trade Union actionsවලට- යන කණ්ඩායමක් නොවෙයි. ගෞරවාන්විත වෘත්තියක් ඉටු කරන උදවිය වන ඒ උදවියගේ වැටුප් සහ විශ්‍රාම දීමනා මේ පාර්ලිමේන්තුවෙන් අනුමත කළොත් ලැබෙනවා. නැත්නම් ඒ පිළිබඳව කවුරුත් උද්ඝෝෂණය කිරීමක් හෝ ඉල්ලීම් කිරීමක් සාමාන්‍යයෙන් සිදු වන්නේ නැහැ. ඒ නිසා ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න සිදු වෙනවා.

අද "ඩේලි මිරර්" පුවත් පතේ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් සුහද ගම්ලත් මැතිතුමා කළ ප්‍රකාශයක සඳහන් කරලා තිබුණා, "විශ්‍රාම ගිය සමහර විනිශ්චයකාරවරුන්ගෙන් රජයට අයිති සමහර දේවල් ලබා ගැනීමට නොහැකි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා" කියලා. ඒ වාගේ දේවල් එච්චර සුබදායක නැහැ. මාධ්‍ය මඟින් රටේ ජනතාවට ඒකෙන් දෙන පණිවුඩයත් එච්චර සුබදායක නැහැ. ඒ නිසා ඒ පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයේ විශේෂ අවධානය යොමු වෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ එක්කම ඉහළ අධිකරණවලට පත් කිරීම්, උසස් කිරීම් යනාදිය සාධාරණව කෙරෙනවාද කියන එක පිළිබඳව මේ රටේ ජනතාවට විශාල අවිශ්වාසයක්, සැකයක් තිබෙනවා. ඒ ඒ ක්ෂේත්‍රවල ඉන්න උදවිය පවා අද මේ කරුණු සාකච්ඡාවට භාජන කරලා තිබෙනවා. විශේෂයෙන්ම මේ තත්ත්වයට හේතු වෙලා තිබෙන්නේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ තිබුණ ව්‍යවස්ථා සභාව අහෝසි කිරීමයි. ඒ හරහා මතු වුණ අවිශ්වාසය, සැකය පිළිබඳ ප්‍රශ්න රාශියක් තිබෙනවා. ඒ නිසා website එකක් දිහා බැලුවත්, වෙනත් ජන මාධ්‍යයක් බැලුවත් අපට පෙනෙනවා අද අධිකරණය විශේෂ වශයෙන් විවේචනයට ලක් වෙලා තිබෙන බව. අද අධිකරණයේ පත්වීම් පිළිබඳව විවේචන, අධිකරණයේ උසස් වීම් පිළිබඳව විවේචන එල්ල වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම ජාතික වැඩ පිළිවෙළක් විධියට අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කරන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටක අධිකරණයක් නොතිබෙනවාට වඩා භයානකයි ස්වාධීන නොවූ අධිකරණයක් පැවතීම. ඒ නිසා පවතින අධිකරණය ස්වාධීන කර ගැනීමේ වගකීම අපි කාටත් තිබෙනවා. විශේෂයෙන්ම ආණ්ඩුවටත් අධිකරණ ඇමතිතුමාටත් ඒ වගකීම තිබෙනවා. ඒ පිළිබඳව ප්‍රසිද්ධ කියමනක් තිබෙනවා. “Edicts are less important than what the lives of the leaders exhibit” කියලා. "රටක පනවනු ලබන නියෝග, නීති එතරම් වැදගත් නැහැ. රටක නීතිය ක්‍රියාත්මක කරන නායකයෝ තමන්ගේ ජීවිතවලින් දෙන ආදර්ශ තරම්."

ඒක නිසා ඒ ආදර්ශය තුළින් නීතිය ක්‍රියාත්මක කිරීම සිදු නොකළහොත්,කොටින්ම කියනවා නම් නීතියට උඩින් කවුරුවත් නැතැයි කියන ප්‍රතිපත්තිය පිළිගෙන කටයුතු නොකළොත් රටක නීතිය සහ සාමය ආරක්ෂා කරන්න බැහැ. ඒ නිසා නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කර ගැනීම -upholding of the Rule of Law- කියන සංකල්පය මේ රටේ ඇති කර නොගත්තොත් අපට මේ නීතිය සහ සාමය ආරක්ෂා කර ගැනීම පිළිබඳව විශාල ප්‍රශ්න මතු වෙනවා. රටක නීතිය සහ සාමය ආරක්ෂා නොවෙනවා කියලා කියන්නේ රටක මොන අංශයකවත් -ආර්ථික අංශයෙන් හෝ සංස්කෘතික අංශයෙන් හෝ සමාජමය අංශයෙන්- දියුණුවක් ඇති නොවනවාය කියන කාරණයයි.

[ගරු විජයදාස රාජපක්ෂ මහතා]

මෙම අය වැය ලේඛනයෙන් මේ සඳහා; විශේෂයෙන්ම අධිකරණ පද්ධතිය, අධිකරණ ක්‍රමවේදය ඉහළ මට්ටමකට ගෙන යෑම සඳහා වෙන් කරපු මුදල් ප්‍රමාණය මදි වුණත්, ඉදිරියේදී මේ පිළිබඳව වැඩි අවධානයකින් කටයුතු කරයි කියන බලාපොරොත්තුව ඇතිව, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුති කරමින් මා නිහඬ වෙනවා.

[மு. ப. 10.25]

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நீதி அமைச்சு, புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீர மைப்பு அமைச்சு என்பவற்றுக்கான நிதி ஒதுக்கீடுகள் பற்றி இங்கே நடைபெறுகின்ற குழுநிலை விவாதத்தில் கலந்து கொண்டு ஒரு சில கருத்துக்களைக் கூறுவதற்குச் சந்தர்ப்பம் அளித்தமைக்கு முதற்கண் எனது நன்றியைத் தெரிவித்துக் கொண்டு, இவ்விரு அமைச்சர்களும் இச்சபையில் இருக்கின்ற சந்தர்ப்பத்திலே ஒரு சில கருத்துக்களைத் தெரிவிக்க ஆசைப் படுகின்றேன். இவ்வமைச்சர்கள் நான் குறிப்பிடும் இப்பிரச் சினைகளை மிகவும் வலுவாக அறிந்தவர்கள், உணர்ந்தவர்கள் என்ற அடிப்படையில் அவற்றைத் தீர்ப்பது தொடர்பாகக் கூடுதலான அக்கறை எடுத்துக்கொள்வார்களென்றும் நிச்சயமாக அவர்களுடைய காலகட்டத்திலே இப்பிரச்சினைகள் தீர்க்கப்படும் என்றும் எதிர்பார்க்கின்றேன்.

இன்று யுத்தம் முடிவடைந்து ஏறத்தாழ 30 மாதங்கள் நிறைவடைந்துள்ளது. முக்கியமாக யுத்த காலத்தில் ஆயிரக்கணக்கான இளைஞர்களும் யுவதிகளும் இராணுவத் தினரிடம் சரணடைந்தார்கள் என்பது எல்லோருக்கும் தெரியும். அரசாங்கம் ஏறத்தாழ 12,000 பேர் சரணடைந்தார்கள் எனத் தெரிவித்திருந்தது. ஆனால், உண்மையாக எவ்வளவு தொகையானவர்கள் சரணடைந்தார்கள் என்றோ, அல்லது அவர்களின் பெயர், விபரங்களோ எந்தவொரு காலகட்டத் திலும் அரசாங்கத்தினால் திட்டவட்டமாக அறிவிக்கப் படவில்லை. இது தொடர்பாக நாங்கள் மேதகு ஜனாதிபதி அவர்களுடனும் அமைச்சர்களுடனும் தொடர்புகொண்டு, சரணடைந்தவர்களின் பெயர், விபரங்களை வெளியிடும்படி பல தடவைகள் கேட்டிருந்தும் இன்றுவரையில் அது வெளியிடப்படவில்லை. அது மாத்திரமல்ல, தமிழ்த் தேசியக் கூட்டமைப்புக்கும் அரசாங்கக் குழுவுக்கும் இடையில் நடைபெற்ற பேச்சுவார்த்தையின்பொழுதும் நாங்கள் இவ் விடயம் தொடர்பாகப் பேசியபொழுது, இவர்களின் பெயர் விபரங்கள் யாவற்றையும் தாங்கள் computerized பண்ணியிருப் பதாகவும் அதனைச் சம்பந்தப்பட்டவர்கள் வந்து பார்வை யிடலாம் எனவும் எமக்குப் பலமுறை கூறியிருந்தார்கள். ஆனால், அவ்விபரம் எமக்கோ அல்லது காணாமற் போனவர்கள், கைது செய்யப்பட்டவர்கள், சரணடைந்தவர்கள் ஆகியோரின் உறவினர்களுக்கோ காட்டப்படவில்லை. தற்போதைய நிலைமை என்னவெனில், LLRC Report மேதகு ஜனாதிபதி அவர்களிடம் கையளிக்கப்பட்டிருக்கிறது. அந்த ஆணைக்குழு உறுப்பினர்கள் பல இடங்களுக்கும் சென்று பல தரவுகளைத் திரட்டியிருக்கிறார்கள். அவர்கள் யாழ்ப்பாணம், மட்டக்களப்பு, வவுனியா, கிளிநொச்சி, முல்லைத்தீவு போன்ற இடங்களுக்கும் சென்றிருக்கிறார்கள். அந்த ஆணைக்குழு விடம ஐயாயிரத்துக்கும் மேற்பட்ட தாய்மார் தமது பிள்ளை களைக் காணவில்லை, தமது கணவன்மாரைக் காணவில்லை என முறைப்பாடு செய்து, அவர்களின் விபரங்களைக் கொடுத்திருக்கிறார்கள்; மனுக்கள் கொடுக்கப்பட்டிருக் கின்றன. ஆனால், இன்றுவரையில் அந்த மனுக்கள் தொடர் பாக எவ்வித பதிலும் கிடைக்காத நிலைமைதான் காணப் படுகிறது.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, யுத்தம் முடிவடைந்து முப்பது மாதங்களுக்குப் பின்னரும்கூட, இந்த நிலைமை இவ்வாறு தொடர்வது ஆரோக்கியமான விடயமல்ல. நிச்சயமாக தமது குழந்தைகள் இருக்கிறார்களா, இல்லையா என்பதைத் தெரிந்துகொள்ள முயற்சிப்பது ஒரு குடும்பத் தினுடைய உரிமை. அதனைச் செய்து கொடுக்க வேண்டியது ஓர் அரசாங்கத்தினுடைய கடமை. ஆனால், அவ்விடயம் தொடர்பாக ஓர் ஆரோக்கியமான தீர்வோ, நடவடிக்கையோ மேற்கொள்ளப்படவில்லை என்பதையே நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். முக்கியமான விடயம் என்ன வென்றால், இராணுவத்தினரிடம் சரணடைந்த ஒரு பகுதியினர் civilian மக்கள்; இன்னொரு பகுதியினர் விடுதலைப் புலிகள் அமைப்பில் போராளிகளாக இருந்தவர்களில் ஒரு பகுதியினர். கிறிஸ்தவ பாதிரியார் தலைமையில் 100க்கு மேற்பட்டவர்கள் - குறிப்பாக பாலகுமாரன், எழிலன் போன்ற அரசியல் பிரிவைச் சேர்ந்தவர்கள் உட்படப் பலர் - சரணடைந்தார்கள். ஆனால், இன்றுவரையில் அவர்கள் தொடர்பான செய்திகளும், அதாவது அவர்கள் உயிருடன் இருக்கிறார்களா? இல்லையா? என்பது தொடர்பாக, எவ்விதமான பதில்களும் இல்லை. அது மாத்திரமல்லாமல், அவர்களுடைய மனைவியருடனோ, குழந்தைகளுடனோ, இனத்தவருடனோ அவர்கள் தொடர்பு கொள்ளக்கூடிய வகையிலான எந்தவொரு சந்தர்ப்பமும் இன்றுவரையில் ஏற்படுத்திக் கொடுக்கப்படவுமில்லை. இன்று நாங்கள் இங்கு இனங்களுக்கிடையில் ஐக்கியத்தை ஏற்படுத் துவது பற்றியும் புரிந்துணர்வைப் பற்றியும் பேசுகின்றோம். ஓர் ஆணைக்குழு அமைக்கப்பட்டு, அதன்மூலம் ஓர் அறிக்கை சமர்ப்பிக்கப்பட்டிருக்கிறது. ஆனால், சாதாரணமாக நான் சொல்கின்ற இந்த விடயங்கள் தொடர்பாகச் சம்பந்தப் பட்டவர்களுக்கு இன்னமும் எந்தவிதமான அறிவுறுத்தல்களும் இல்லை. ஆகவே, கைது செய்யப்பட்டவர்கள் தொடர்பாகக் குறைந்தபட்சம் இந்த நேரத்திலாவது அறிவிக்க வேண்டும் என்று நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். இன்னும் எவ்வளவு பேர் அவர்களது உறவினர்களுக்கு அறிவிக்கப் படாமல் சிறைச்சாலைகளிலே தடுத்து வைக்கப்பட்டிருக் கின்றார்கள் என்பது தொடர்பான விடயங்களை நீங்கள் தயவுசெய்து வெளியிட வேண்டும். அந்த விபரங்களை வெளியிட்டால் மாத்திரம்தான் உண்மையாகவே அந்தக் குடும்பங்களுக்கு நிம்மதி ஏற்படும்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, பூநகரிப் பிரதேசத்தில் இருக்கின்ற இவ்வாறான ஒரு குடும்பத்தை எனக்குத் தெரியும். அந்த வீட்டில் ஒரு தாய் உட்பட நாலு பெண்கள் இருக்கின்றார்கள். அவர்கள் எல்லோருமே விதவைகள். அந்தத் தாய்க்கு இருந்த ஒரே மகன் ஒருநாள் இராணுவத்தால் கைதுசெய்யப்பட்டுக் கொண்டுசெல்லப் பட்டான். ஆனால், இதுவரை அவன் எங்கிருக்கின்றான் என்று அந்தக் குடும்பத்துக்குத் தெரியாது. அந்தக் குடும்பத்துக்கு இரண்டு ஏக்கர் காணி இருக்கின்றது. இன்று அந்தக் காணியில் விவசாயம் செய்யக்கூட ஆட்கள் இல்லாத ஒரு நிலை அந்தக் குடும்பத்துக்கு இருக்கின்றது. நான் இந்த விடயத்தை ஓர் உதாரணத்துக்காகவே இங்கு கூறுகின்றேன். ஆனால், இப்படியான பல்வேறு துர்ப்பாக்கிய சம்பவங்கள் இடம்பெற்றிருக்கின்றன. ஆகவே, தம்மிடம் ஐந்து சதம் காசு இல்லாத சூழ்நிலையிலும்கூட கைது செய்யப்பட்ட தமது உறவினர்கள் எங்கு இருக்கின்றார்கள் என்று தெரியாமல், தொடர்ந்து இராணுவ முகாம்கள், பொலிஸ் நிலையங்கள்,

சிறைச்சாலைகள் என்று அவர்கள் ஏறி இறங்குகின்றார்கள். இருந்தபோதிலும் அதுகுறித்து அந்த மக்களின் பாராளுமன்ற உறுப்பினர்களாகிய நாங்கள்கூட எதுவும் செய்ய முடியாத ஒரு நிலை இருக்கின்றது. இவர்கள் தொடர்பான விபரங்களை இன்னும் எவ்வளவு நாட்களுக்கு நீங்கள் மறைத்து வைத்திருக்கப்போகின்றீர்கள்? ஆகவே, தயவுசெய்து அந்த விடயம் தொடர்பாக நீங்கள் சம்பந்தப்பட்டவர்களுக்குத் தெரிவிக்க வேண்டும். கௌரவ அமைச்சர் அவர்கள் இதனை ஜனாதிபதி அவர்களின் கவனத்துக்குக் கொண்டுவந்தோ அல்லது வேறு ஏதாவது வகையிலோ இது தொடர்பாக நிச்சயமாக ஒரு தீர்க்கமான முடிவுக்கு வரவேண்டும் என்று நான் தாழ்மையுடன் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் ஏறத்தாழ 883 பேர் பல்வேறு சிறைச்சாலைகளிலும் தடுத்து வைக்கப்பட்டிருப்பதாக ஏற்கெனவே மாண்புமிகு தினேஷ் குணவர்தன அவர்கள் இந்தச் சபையிலே கூறியிருக்கின்றார். இதில் விடுதலைப் புலிகளுக்குச் சாப்பாடு கொடுத்தவர்கள் போன்ற பல்வேறுபட்ட சிறிய சிறிய சம்பவங்களுடன் தொடர்புபட்டவர்களும் உட்படுகின்றார்கள். Under the PTA, how many of them have been detained? That is what I ask, nothing else. அவர்களை ஒரு பொது மன்னிப்பு அடிப்படையில் விடுதலை செய்யும்படி நாங்கள் பலமுறை கேட்டிருக்கின்றோம். அரசாங்கத்தின் கூற்றின்படி 250 பேருக்கு மேல் இதுவரை வழக்குத் தொடுக்கப்படாமல் தடுத்து வைக்கப்பட்டிருக்கின்றார்கள் என்று அறிகின்றோம். இதுவரை அவர்கள்மீது எந்தவிதமான குற்றச்சாட்டுக்களும் சாட்டப் படவில்லை. ஆனாலும்கூட, அவர்கள் வருடக்கணக்காகத் தடுத்து வைக்கப்பட்டிருக்கின்றார்கள். இதில் 53 பேருக்கு மேற்பட்டோர் பெண்கள். அவர்களுடன் சில குழந்தைகளும் இருக்கின்றார்கள். இதனைவிட, தமது அன்றாட இயக்கத்துக்கு இன்னொருவரின் துணை தேவையானவர்கள், கை கால் இயங்காதவர்கள் மற்றும் ஊனமுற்றவர்கள்கூட அனுராதபுரம் சிறைச்சாலை மற்றும் கொழும்பு மகசீன் சிறைச்சாலை போன்றவற்றில் தடுத்து வைக்கப்பட்டிருக்கின்றார்கள். ஆனால், உண்மையாகவே கடந்த காலத்தில் இந்த யுத்தத்துக்கு மிகவும் ஆதரவாக இருந்தவர்கள் - இந்தச் சபையில் அடிக்கடி குறிப்பிடப்படுகின்றவர்களான கே.பீ. மற்றும் அமைச்சர் கருணா போன்றவர்கள் - இந்த நாட்டில் முக்கியஸ்தர்களாக வலம்வந்துகொண்டிருக்கின்றார்கள். எனவே, இவ்வாறு சிறிய சிறிய விடயங்களுடன் சம்பந்தப்பட்டவர்கள், ஊனமுற்றவர்கள் மற்றும் பெண்கள் ஆகியோரை எந்தவிதக் குற்றச்சாட்டுக்கள் இல்லாமலும் விசாரணைகள் இல்லாமலும் வருடக்கணக்காகத் தொடர்ந்து தடுத்து வைத்திருப்பது, எந்த வகையில் நியாயமான காரியமாகும் என்பதை நீங்கள் தயவுசெய்து சிந்தித்துப் பாருங்கள்! இது தொடர்பாக நீதி அமைச்சர் அவர்களிடமும் நாங்கள் பேசியிருக்கின்றோம். இந்தச் சிறைக் கைதிகளின் விடுதலை தொடர்பாக அமைச்சர் அவர்கள் ஆக்கபூர்வமான நடவடிக்கைகள் எடுக்க வேண்டும் என்று நாங்கள் விரும்புகின்றோம். இந்த அமைச்சானது, ஏற்கெனவே போதுமான அளவு நிதியைக் கொண்டிருக்காதபோதிலும் அரச செலவில் இவர்களை அநாவசியமாகத் தடுத்துவைத்துக் கொண்டிருப்பது, எந்தவிதத்திலும் ஒரு தேவையான காரியமென்று நான் கருதவில்லை. இவர்களில் பலர் நிச்சயமாக விடுவிக்கப்படக்கூடியவர்கள். அவர்கள்மீது மிக மோசமான குற்றச்சாட்டுக்கள் இல்லாவிடில், அவர்களை விடுதலை செய்வதற்கான உடனடி நடவடிக்கைகளை மேற் கொள்ள வேண்டும்.

சிறைச்சாலைகளில் - அது கொழும்பிலுள்ள மெகசின் சிறைச்சாலையாக இருக்கலாம் அல்லது வெலிக்கடைச் சிறைச்சாலையாக இருக்கலாம் அல்லது நீர்கொழும்புச் சிறைச்சாலையாக இருக்கலாம் அல்லது அனுராதபுர சிறைச்சாலையாக இருக்கலாம் அல்லது கண்டி, போகம்பரை சிறைச்சாலையாக இருக்கலாம் அல்லது ஏனைய சிறைச்சாலைகளாக இருக்கலாம் - இடைக்கிடையே ஏற்பட்ட கலவரங்கள், பிரச்சினைகளில் சிறைச்சாலை அதிகாரிகள் மாத்திரமல்லாது அங்கிருக்கின்ற சிங்களச் சிறைக் கைதிகளும் சம்பந்தப்பட்டிருந்தமை உங்கள் எல்லோருக்கும் தெரியும். இவர்களால் தமிழ் சிறைக் கைதிகள் தாக்கப்படுகின்ற பல சம்பவங்கள் இடம்பெற்றிருக்கின்றன. அண்மையில்கூட, இவ்வாறானதொரு சம்பவம் அனுராதபுரம் சிறைச்சாலையில் இடம்பெற்றுள்ளது. தமிழ்க் கைதிகளிடம் பிரச்சினைகள் அல்லது பிழைகள் இருக்கலாம். அங்கிருப்பவர்கள் எல்லோரும் முற்றுமுழுதாகச் சரியாக நடக்கின்றார்கள் என்று நான் கூறவரவில்லை. எனினும், அவர்களினால் ஒரு சிறிய தவறு நடந்தால், எந்தநேரத்திலும் அவர்கள் சக கைதிகளாலோ அதிகாரிகளாலோ மோசமாகத் தாக்கப்படக்கூடிய சூழ்நிலைதான் அங்கு இருந்து வருகின்றது. இவ்வாறான பல தாக்குதல் சம்பவங்கள் தொடர்ந்தும் நடைபெற்று வருகின்றன. ஆகவே, இவ்வாறான ஒரு சூழ்நிலையிலிருந்து அவர்கள் அனைவரையும் பாதுகாப்பதென்பது ஒரு முக்கியமான விடயமென்று நான் கருதுகின்றேன். இதன் முதற்கட்டமாக அங்கவீனமுற்றவர்கள் மற்றும் பெண்களை விடுவிப்பது தொடர்பில் அரசாங்கம் கூடுதல் கவனம் செலுத்தவேண்டும் என்பது எங்களுடைய முக்கியமான ஒரு வேண்டுகோளாகும்.

அதுமாத்திரமல்ல, தெற்கிலுள்ள சிறைச்சாலைகளில் இருக்கின்ற தமிழ் சிறைக்கைதிகளுக்கு மொழிப் பிரச்சினை யானது ஒரு பாரிய பிரச்சினையாகக் காணப்படுகின்றது. இவ்வாறான கைதிகளை ஏன், நீங்கள் வடக்கு, கிழக்கில் இருக்கின்ற சிறைச்சாலைகளுக்கு மாற்றக்கூடாது? தயவுசெய்து இது தொடர்பில் நீங்கள் சிந்திக்கவேண்டும். அவ்வாறு அவர்களை மாற்றுவதினூடாகப் பல சிக்கல்கள் தீர்க்கப்படுமென நான் கருதுகின்றேன். மொழிப் பிரச்சினை ஏற்படாது; கலவரங்கள் தோன்றாது; அவர்கள் தங்களது உறவினர்களைச் சந்திப்பதற்கான வாய்ப்புக்கள் ஏற்படும். எனவே, தென்பகுதிச் சிறைச்சாலைகளிலுள்ள தமிழ் பேசக்கூடிய கைதிகளை வடக்கு, கிழக்கிலுள்ள சிறைச்சாலை களுக்கு மாற்றுவது மிக முக்கியமானதாகும்.

ஏற்கெனவே, அமுலில் இருந்த அவசரகாலச் சட்டம் நீக்கப்பட்டாலும்கூட, பயங்கரவாதத் தடைச் சட்டமானது இன்னும் அமுலில் இருக்கின்றதென்பது உங்களுக்குத் தெரியும். நேற்று முன்தினம்கூட, முல்லைத்தீவில் ஒருவர் கடத்தப்பட்டார். அதற்குப் பிற்பாடு, அவர் Terrorist Investigation Division இனால் அழைத்துச் செல்லப்பட்டதாக கூறப்பட்டது. அவர் அழைத்துச் செல்லப்பட்டாரா? அல்லது கடத்திச் செல்லப்பட்டாரா? என்பதற்கு அப்பால், நடைமுறை எவ்வாறு இருக்கின்றது என்றால், அவரை வெள்ளை வானில் வந்து அழைத்துச் சென்றிருக்கின்றார்கள். இன்று மேதகு ஜனாதிபதி அவர்கள் இந்தோனேசியாவின் பாலி நகரத்துக்குச் சென்று, இந்த நாட்டினுடைய ஜனநாயகம் பற்றிப் பேசுகின்றார். இந்த நாட்டின் ஜனநாயகம் உலகத்திலேயே மிகவும் பழைமை வாய்ந்ததென்று கூறுகின்றார். ஆனால், இன்று இந்த ஜனநாயக நாட்டில் எவ்வளவோ பிரச்சினைகள் இருக்கின்றன. நாங்கள் யாழ்ப்பாணத்துக்குச் சென்றால், அங்கு எங்களால் பேசமுடியுமா? அளவெட்டியில் தமிழ்த் தேசியக் கூட்டமைப்பைச் சேர்ந்த 05 பாராளுமன்ற உறுப்பினர்களுக்கு என்ன நடந்தது? அதுதொடர்பில் என்ன முடிவு எடுக்கப்பட்டிக்கின்றது என்றால், இதுவரை எதுவுமில்லை என்றுதான் கூறவேண்டும். அவ்வாறே, கடத்திச் சென்றவர்கள் தொடர்பில் ஏதாவது விசாரணைகள் நடைபெற்றிருக்கின்றதா?

[ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා]

என்றால், எதுவுமில்லை. அண்மையில், யாழ். பல்கலைக் கழகத்துக்குள் தலைக்கவசம் அணிந்து வந்தவர்கள் தொடர்பில், அப்பல்கலைக்கழக மாணவர்கள் கூறுவது என்னவென்றால், அவர்கள் - military intelligence unit - இராணுவப் புலனாய்வுத் துறையினைச் சேர்ந்தவர்கள் என்றுதான். அவர்கள் மோட்டார் சைக்கிளில் வந்து பல்கலைக்கழத்திலுள்ள notice board இனை உடைத்து நொறுக்கி, அதிலிருந்த துண்டுப்பிரசுரத்தை எடுத்துச் சென்றதாக அவர்கள் கூறியிருக்கிறார்கள். அவர்கள் எடுத்துச்சென்ற துண்டுப்பிரசுரம் எவ்வாறானதாக இருந்தாலும், அவர்கள் இவ்வளவுதூரம் தான்தோன்றித் தனமாக நடக்கக்கூடிய வகையில், இந்த நாட்டின் நிலைமை இருக்கின்றது என்றால், இங்கே ஜனநாயகம் எந்த அளவுக்கு இருக்கின்றது என்பதை நாங்கள் புரிந்துகொள்ளவேண்டும். உண்மையிலே நாங்கள் ஒரு ஜனநாயகச் சூழலில்தானா வாழுகின்றோம்? தேர்தலொன்று நடைபெற்றுவிட்டால் முழுமையான ஜனநாயகம் தோன்றிவிடுமா? தேர்தல்கள் எந்த முறையில் நடைபெறுகின்றன என்பது வேறு விடயம்.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் மாத்திரமே உள்ளது.

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, நான் இன்னும் சற்று நேரத்தில் முடித்துக்கொள்கின்றேன்.

இறுதியாக நான் மாண்புமிகு நீதி அமைச்சர் அவர்களிடமும் மாண்புமிகு புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர் அவர்களிடமும் விநயமாகக் கேட்டுக்கொள்வது என்னவெனில், சிறைச்சாலைகளில் விசாரணைகளின்றித் தடுத்துவைக்கப்பட்டிருக்கின்ற கைதிகள் இயன்றளவு விரைவில் விடுவிக்கப்படவேண்டும், அல்லது அவர்களுக்கு பொதுமன்னிப்பு வழங்கப்படவேண்டும். அத்துடன், நான் ஏற்கெனவே கூறியதுபோல், அங்குள்ள ஊனமுற்றவர்கள் மற்றும் பெண்கள் விடுவிக்கப்பட வேண்டும்; மிகுதியாக இருக்கின்றவர்கள் வடக்கு, கிழக்கிலுள்ள சிறைச்சாலைகளுக்கு மாற்றப்படல்வேண்டும். இவற்றினை மிக விரைவாக மேற்கொள்ளவேண்டுமென நான் உங்களைத் தாழ்மையுடன் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். நீங்கள் இருவரும் இணைந்து இதற்கான முயற்சிகளை எடுப்பீர்களானால், நிச்சயமாக 2011ஆம் ஆண்டுக்குள் இவற்றுக்கு ஒரு முடிவு கிடைக்கும் என்ற பூரண நம்பிக்கையோடு விடைபெறு கின்றேன். நன்றி.

[පූ.භා. 10.41]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர் )
(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප අද කථා කරන්නේ අධිකරණය පිළිබඳවයි. අධිකරණය, ප්‍රජාතන්ත්‍රවාදී රටක තිබෙන ඉතාම වැදගත් ආයතනයක්. රටේ පාලන කටයුතු ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙළට ගෙන යන්න අපට තිබෙනවා ප්‍රධාන අංශ තුනක්, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය කියලා. අද අප කථා කරන්නේ අධිකරණය පිළිබඳවයි. අපේ ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා වාගේම මමද නිතර කියන්නේ අධිකරණය ජනතාව වෙනුවෙනුයි තිබෙන්නේ කියලායි. ඒ නිසාවෙන්ම මම කියන්නේ නැහැ ජනතා අධිකරණයක් පිහිටුවන්න කියලා. අධිකරණය ජනතාව වෙනුවෙනුයි තිබෙන්නේ. ප්‍රජාතන්ත්‍රවාදී පදනම ආරක්ෂා කරන්න අධිකරණය ඉතාම වැදගත් ආයතනයක්. ඒකට අවශ්‍ය දැනුම, අවශ්‍ය ශක්තිය, අවශ්‍ය පහසුකම් අප සලසා දිය යුතුයි. මහ ජනයා උසාවිය සඳහා නොවෙයි. උසාවිය මහ ජනයා සඳහායි.

නමුත් සාමාන්‍යයෙන් අපේ අධිකරණ පද්ධතිය බොහොම හෙමින් තමයි වෙනස් වන්නේ. එය සාමාන්‍යයෙන් conservativeභාවයක් දරනවා. Radical ගතියක් දරලා වෙනස්කම් කරන්න ඉදිරිපත්වන්නේ නැහැ. නමුත් අද සමාජය, රට, ලෝකය බොහොම සංකීර්ණ තත්ත්වයකයි තිබෙන්නේ. අභ්‍යන්තරයේ ප්‍රශ්න සඳහා රටක් තුළ නීතිරීති තිබෙනවා. ඒ වාගේම ලෝකය දැන් විශ්ව ගම්මානයක් වාගේ ක්‍රියාත්මක වන නිසා ජාත්‍යන්තර නීතිරීති, අධිකරණ ආදියත් තිබෙනවා. ඒ නිසා මේ දෙපැත්තටම ගැළපෙන ආකාරයේ අධිකරණ පද්ධතියක්, වැඩ පිළිවෙළක් කාර්යක්ෂමව පවත්වා ගෙන යෑමට අප ඉදිරිපත් වෙන්න ඕනෑ.

ඒ සඳහා ඊට අවශ්‍ය වන ශක්තිය, ධෛර්ය අපි අධිකරණයට දීලා, යෝජනා ඉදිරිපත් කරලා, ඒවා ක්‍රියාත්මක කරවා ගන්නට අපි උත්සාහ කරන්නට ඕනෑ. විශේෂයෙන්ම ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන නීතිරීති තිබෙනවා. රටක් හැටියට ආගම්වලට, ජාතිවලට, කුලවලට අනුව අපිට නීති හදන්නට බැහැ. එහෙම තිබෙනවා නම් අපි ඒවා වෙනස් කළ යුතුයි. එක රටකට එක නීතියක්, එක ක්‍රමයක් අපි ඇති කරන්නට ඕනෑ. එක උසාවි ක්‍රමයක් අපි ඇති කරන්නට ඕනෑ. දැන් එහෙම නොතිබෙනවා නම් අපි ඒවා වෙනස් කළ යුතුයි. රටක් ප්‍රගතිය කරා යනකොට; දියුණුව කරා යනකොට, ඒ රටට සාමූහික වශයෙන් පිළිගත යුතු නීතිරීති පද්ධතියක් අපි ඇති කරන්නට ඕනෑ. ඒ වැඩ පිළිවෙළට අපි විශේෂයෙන්ම සම්බන්ධ වන්නට ඕනෑ. ඒ යම් යම් නීතිරීති තිබෙන ඒවා වෙනස් කරගෙන ඒ පිළිවෙළට අපි කටයුතු කරන්නට ඕනෑ.

අධිකරණය ගැන ජනතාවගේ පැත්තෙන් අපට ලැබෙන විශේෂම දුක්ගැනවිල්ල තමයි, නඩු ප්‍රමාදය ගැන. මා අධිකරණ ඇමතිවරයා වශයෙන් ටික කාලයක් කටයුතු කරද්දී මා ළඟට ආවා, තරුණයෝ දෙදෙනෙක්. ඒ දෙන්නා ඇවිල්ලා මට කිව්වා, "අපේ සීයාගේ වයස අවුරුදු 95යි, දැන් සීයා පවරපු ඉඩම් නඩුවකට අවුරුදු 48ක් ගත වෙලා තිබෙනවා. සීයා මැරෙන්න ඉස්සර වෙලා මේකට ඉක්මන් විසඳුමක් ලබා දෙන්න උදවු වෙන්න පුළුවන්ද?" කියලා. ඊට පසුව මා එම දෙදෙනාට උපදෙස් දුන්නා, වහාම අග්‍රවිනිශ්චයකාරතුමාට ලියන්න කියලා. ඒක අත්‍යවශ්‍යයෙන් විය යුතු වැඩක්. මේ වාගේ කරුණු රාශියක් තිබෙනවා. එක පැත්තකින් මේ කොළඹ දිස්ත්‍රික්කයේ පාසලක වැඩිහිටි ළමයින් වගයක් අපචාරයේ හැසිරුණා කියලා ඒ නඩුව පවරා තිබෙන්නේ අවුරුදු හතකට පසුවයි. දැන් අධිකරණයට ඉදිරිපත් කරලා නඩුව අහනවා, අවුරුදු හතකට පසුව. දැන් මේකට කොහොමද විසඳුමක් දෙන්නේ? ඒ දරුවන් දැන් වැඩිහිටියන් වෙලා රැකී රක්ෂා කරනවා. ඒ අයට ලජ්ජයි. ඊළඟට අනෙක් ළමයිනුත් දැන් රැකී රක්ෂාවලට යන්න ඔන්න මෙන්න කියා තිබෙනවා. ඒක නිසා ඒ අයත් මේ නම් ප්‍රසිද්ධ කරගෙන නඩුවලට යන්න කැමැති නැහැ. ඉතින් මා ලේකම්තුමාට කිව්වා, මේ නඩුව විවෘත අධිකරණයේ කැඳවන්නේ නැතිව, මේ පිළිබඳව යම් විසඳුමකට යොමු වෙන්න කියලා. මේ ආකාරයට නඩු ප්‍රමාද වීම නිසා නොයෙකුත් අපහසුතා ඇති වනවා. එක් කාන්තාවක් පාසල් යන කාලයේ දූෂණයකට ලක් වෙලා ඒ පිළිබඳ නඩුව අහනවා, අවුරුදු 11කට පසුව.

ඒ ළමයා කසාද බැඳලා දැන් මවු කෙනෙක්. අර ස්වාමි පුරුෂයා ඒ කාන්තාවට බණිනවා, ඒක කිව්වේ නැහැ කියා. ඒ කියාපු ආකාරයේ වචන මා මෙතැන පාවිච්චි කරන්නේ නැහැ. නමුත් එහෙම කිව්වා. දැන් පවුල කැඩෙනවා. ඒ තැනට දැන් ඇවිත් තිබෙන්නේ. එම නිසා අපට වුවමනා කරනවා, ඉක්මනින් නඩු විසඳීමට වැඩ පිළිවෙළක්. මා කියන්නේ නැහැ නඩු ක්ෂණිකව විසඳන්න ඕනෑය කියා. දෙපාර්ශ්වයේම කරුණු අහලා සාධාරණ කාලයක් තුළ මේවා විසඳීම අවශ්‍යයි. දෙපාර්ශ්වයේම කරුණු සාකච්ඡා වෙන්න ඕනෑ, දෙපාර්ශ්වයේම සතුටට හේතුවන ආකාරයට.

නඩු විසඳීම ඉක්මන් කිරීම අවශ්‍ය වෙනවා. මේ නඩු ප්‍රමාදය අද ඊයේ ඇති වෙච්ච එකක් නොවෙයි. මේ ආණ්ඩු කාලයේ ඇති වෙච්ච එකක් නොවෙයි; හතළිස් අවට නිදහස ගත්තාට පස්සේ ඇති වෙච්ච එකකුත් නොවෙයි; දීර්ඝ කාලීනව උසාවි තුළම පැළපදියම් වෙලා තිබෙන පිළිවෙළක් තමයි මේ නඩු ප්‍රමාද වීම. එම නිසා මේකෙන් ඉදිරියට යන්නේ කොහොම ද කියන එකට තමයි අප ප්‍රතිකර්ම යොදන්නට ඕනෑ කර තිබෙන්නේ. දීර්ඝ කාලීනව නඩු ඇසීමේ ප්‍රමාදය අධිකරණ ක්‍රමය තුළින්ම උපන් දෙයක් වාගේ තමයි අද තත්ත්ව තුළ පවතින්නේ.

ඒ කාලයේ අග්‍ර විනිශ්චයකාරතුමාත් එක්ක සාකච්ඡාවකට ගිහින් මම යෝජනා කළා, "ඇමති කෙනෙකුට වඩා protocol තත්ත්වයක් තිබෙන්නේ අග්‍ර විනිශ්චයකාරතුමාට; එම නිසා ඔබතුමා මේ නඩු විසඳීම සඳහා පියවර ගන්න" කියා. ඒ සඳහා අවශ්‍යම අංශ පහක් විතර සහභාගි කරවා ගන්න වනවා. එක්කෙනෙක් තමයි අග්‍ර විනිශ්චයකාරතුමා. උසාවි පාලනය පිළිබඳව එහි නායකත්වය දරන ප්‍රධාන නිලධාරියා හැටියට නඩු කැඳවන්න එතුමා සිටින්න ඕනෑ. ඊළඟට, නීතිපතිතුමා, පොලිස්පතිතුමා, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්, රස පරීක්ෂක. මේ අය තම තමන්ට කැමැති සහ තිබෙන පහසුකම් අනුව, තිබෙන වෙලාවල් අනුව ඒවා සාමාන්‍ය සිදුවීම් පාලන ක්‍රමය හැටියට උසාවි පද්ධතියේ ක්‍රියාත්මක වීම යෝග්‍ය නැහැ. මොකද මිනිස්සු පීඩා විඳිනවා; ගෙදර භාර්යාවන් දුක් විඳිනවා; දරුවෝ දුක් විඳිනවා. එම නිසා මේක ඉක්මන් විසඳුමකට යොමු කරන්නට ඕනෑ. එතුමා රැස්වීමක් කැඳෙව්වා. ඒ රැස්වීමේදී මම කිව්වා, හරියට අධිකරණය ක්‍රියාත්මක වෙන්නේ,

"දුන්න දූනු ගමුවේ
ඊතල කිතල ගමුවේ
රාළ මීගමුවේ
මුවෙක් ඇඬුවයි සබරගමුවේ"

වාගෙයි කියා. නීතිපති, නීතිපතිට ඕනෑ විධියට කරනවා. රස පරීක්ෂක, රස පරීක්ෂකට පුළු පුළුවන් හැටියට කරනවා. පොලිස්පති නැතුව,පොලිස් දෙපාර්තමේන්තුව නැතුව මේවා කරන්න බැහැ. ඒකාබද්ධ වෙලා සාමූහික උත්සාහයක් ඒ සඳහා කෙරෙන්නේ නැහැ. ඒ නිසා මම කිව්වා, මාසයකට සැරයක් හෝ මාස දෙකකට සැරයක් හෝ මාස තුනකට සැරයක් හෝ අග්‍රවිනිශ්චයකාරතුමාගේනායකත්වයෙන් රැස්වීමක් කැඳවිය යුතුයි කියලා. ඒක පිළිගත්තා. ඒක අවශ්‍ය වෙන්නේ මොකටද? නඩු 17,000ක් විතර ඒ දවස්වල රස පරීක්ෂක ළඟ තිබුණා. නඩු කියන්නේ, පරීක්ෂා කරන්න ඉදිරිපත් කරපු ද්‍රව්‍ය, භාණ්ඩ. ඒ කටයුතු කවදාද කරන්න පුළුවන් කියලා තීන්දුවක් නැහැ. පුළු පුළුවන් හැටියට කෙරෙනවා. ඒ සඳහා අවශ්‍ය නිලධාරින් ලබා දීලා ඒ කටයුතු ඉක්මන් කරන වැඩ පිළිවෙළකට යොමු කරන්න ඕනෑ. ඒක නිසා මම එවැනි සාකච්ඡාවල වැදගත්කම පෙන්වලා දුන්නා.

මේ තත්ත්වය තවත් ලිහිල් කරන වැඩ පිළිවෙළක් හැටියට අතිරේක උසාවි කිහිපයක්, ඒ කියන්නේ additional courts කිහිපයක් අවුරුදු 3කට ඇති කරන්න මම යෝජනා කළා. උසාවියේ නඩු තොගයක්, අටලක්ෂයක් විතර ගොඩ ගැහිලා තිබෙනවා. ඒවා ඉක්මනින් විසඳෙන්න ඕනෑ. නැත්නම් සාධාරණ යුක්තිය ඉෂ්ට වෙන්නේ නැහැ. ඒක නිසා අවුරුදු 3කට අතිරේක උසාවි ව්‍යාපෘතියක් -project එකක්- ඇති කරන්න ඕනෑ කියලා මම යෝජනා කළා. එතකොට භාණ්ඩාගාරයේ පිරිසක් අය වැය සාකච්ඡාවකට ආවා. අය වැය ලේඛනයේ මුදල් පුළුවන් තරම් අඩු කරලා, කපලා, හරිගස්වලා දෙන කල්පනාව තමයි භාණ්ඩාගාරයෙන් ආපු පිරිසට තිබුණේ. ඉතින් මම කිව්වා, නඩු මෙච්චර ප්‍රමාණයක් තිබෙනවා, තොගයක් ගොඩ ගැහිලා තිබෙනවා, ඒවා ඉවර කරන්න කියලා.

ඊ ළඟට, එක දවසකට 40,000ක් විතර ජනතාව නඩු සඳහා උසාවිවලට එනවා. දවස් 20ක් නඩු ඇහුවොත් ලක්ෂ කීයක් එනවාද? අවුරුද්දකට කෝටි කීයක් එනවාද? එම නිසා ඒ පැය ගණන නාස්ති වීම ජනාධිපතිතුමාගේ සංවර්ධන සංග්‍රාමයටත් විශාල හානියක්. ඒක නිසා උසාවියේ තිබෙන නඩු ටික ඉවර කරන්න ඕනෑ. මේ අවුරුද්දට මේ මුදල, ඊ ළඟ අවුරුද්දට මේ විධියට, ඊ ළඟ අවුරුද්දට මෙහෙම. ඒ විධියට අවුරුදු තුනට මුදල් දෙන්න කියලා යෝජනා කළා. එතකොට ඇවරයි, දැවරයි, තුන් ඇවරයි කියලා මේ නඩු තොගය ඉවර කිරීමේ යෝජනාවක්, අදහසක් තමයි මම ඉදිරිපත් කරන්න යෙදුණේ. ඒක ඒ නිලධාරින් පිළිගත්තා. "අපටත් ඒ විධියේ නඩු තිබෙනවා, අවුරුදු 10, 12 ගත වෙච්ච නඩු අපටත් තිබෙනවා, නමුත් ඒ නඩු ඉවර කිරීම ගැන කවුරුවත් අදහසක් ඉදිරිපත් කරලා තිබුණේ නැහැ,

මේක හොඳ අදහසක්, එය ක්‍රියාත්මක කරන්න ඕනෑ" කියා පිළිගත්තා. ඒ නිසා එය අය වැය ලේඛනයටත් ඉදිරිපත් කළා. 2011 අය වැය ලේඛනයේ 78වන අංකය හැටියට අතිරේක උසාවි පිහිටුවන්න කටයුතු කරනවාය කියන යෝජනාව අපේ අතිගරු ජනාධිපතිතුමා මේ සභාවට ඉදිරිපත් කෙරුවා. අතිරේක උසාවි පිහිටුවීම ක්‍රියාත්මක කරන්නේ කෙටි කාලයකටයි; අවුරුදු තුනකටයි. ඒක project එකක්. ඒක ක්‍රියාත්මක කළොත් මේකේ ප්‍රතිඵලය බොහොම වැදගත් වනවා කියලා තමයි මම කල්පනා කරන්නේ. ඒක ඉක්මනින් ක්‍රියාත්මක කළොත් හොඳයි.

ඊළඟට, උසාවි ප්‍රමාණය වැඩි කිරීම ගැන බලන්න. උසාවි ප්‍රමාණය වැඩි කිරීම යටතේ මහාධිකරණ, දිස්ත්‍රික් අධිකරණ, මහේස්ත්‍රාත් අධිකරණ ඇති කෙරුවා. බොහොම අපහසුකම් මැද්දේ උසාවි 60ක් පිහිටුවන්න ගැසට් කළා. අපේ අධිකරණ අමාත්‍යාංශයේ අදාළ ලේකම්වරු ඇතුළු පිරිස බොහොම වෙහෙස වෙලා මේ කටයුතු සිදු කළා. විශේෂයෙන්ම අරන්දල මහත්මයා මේ පිළිබඳව බොහොම මහන්සි වෙලා කටයුතු කළා. මම කිව්වා, "අභවල් දවසට මට මේක ගෙනැවිත් දෙන්න, මම ජූ 12 වෙන කල් අමාත්‍යාංශයේ ඉන්නවා, මම මේක මේක අත්සන් කරලා, 2010 දී හය මාසයක් සඳහා තිබුණු අය වැය ලේඛනයට ජූලි මාසයේ 8 වැනි දා මට කථා කරන්න තිබෙනවා" කියලා. අනේ ඒ මහත්වරුන් ඒක කරලා ගෙනැත් දුන්නා. මම ඒක අත්සන් කෙරුවා. ඒ නිසා උසාවි 60ක් එක පැන් පාරෙන් ගැසට් කරලා තිබෙනවා. ඉක්මන් විසඳුමක් වශයෙන් ඒවා දැන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වෙනවා. ඒ සෑම පැතිවලටම ඒ විධියේ වැඩ පිළිවෙළක් අපි ඇති කරන්නට යෙදුණා. ඊට අමතරවත් තව උසාවි කිහිපයක් ඇති කළා. හෝමාගම වාණිජ මහාධිකරණයක් ඇති කරන්න අපි යෝජනා කරලා ඒකට තවත් වැඩි පුර එකතු කරන්නත් අපි කටයුතු කළා. මේ කාරණා දෙක, ඒ කියන්නේ මේ අධිකරණ වැඩ කිරීමයි, අතිරේක උසාවි ටික පිහිටුවලා නඩු ටික ඉවර කිරීමයි එක්ක අපට පුළුවන්කම ලැබෙනවා සාමාන්‍ය පිළිවෙළට මේ කටයුතු කර ගෙන යන්න.

අපේ මහේස්ත්‍රාත් උසාවිවල නඩු ගොඩාක් තිබෙනවා. ඒවා කල් දාන්න සෑහෙන පැය ගණනක් ගත කරනවා. ඒ වෙනුවට වෙනම නීතිඥ මහත්මයෙක් පත් කරන්න කියලා මම යෝජනා කළා. අග්‍ර විනිශ්චයකාරතුමා ඒක පිළිගෙන, එංගලන්තයේත් ඒ වෙනුවෙන් මාස්ටර් රෝලර් කියලා කෙනෙකු ඉන්නවා කියලා

[ගරු අතාවුද සෙනෙවිරත්න මහතා]

ප්‍රකාශ කරන්න යෙදුණා. මේ ආකාරයට අනෙක් උසාවිවලත් නඩු විසඳුම් කාර්යක්ෂම කරන්න ඒ විනිශ්චයකරුවන් දැනුවත් කරන, පුහුණු කරන, බහුශ්‍රැත දැනුමක් ඇති කරන පුහුණු විද්‍යාලයක් පටන් ගැනීම පිළිබඳව මම යෝජනා කරන්න යෙදුණා. එවැනි විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම තුළින් අපට ඒ කටයුතු කරන්න පුළුවන් වෙයි.

මෙතුමා කියන්න යෙදුණා, අපේ රැඳවියන් පිළිබඳ ප්‍රශ්නය. ඒ කාලයේ බන්ධනාගාර භාරව හිටපු අපේ ඇමතිතුමා ඒ අයත් එක්කාසු කර ගෙන ගිහින් ඒ අය පෙන්වලා, යම් යම් ජීවා විභාග කරලා, යම් යම් අය නිදහස් කරලා, දෙමවුපියන්ටත් සම්බන්ධ කරන්න කටයුතු කළා. ඒ අනුව දැන් සිටින අය සම්බන්ධයෙනුත් ඒ අන්දමින් කටයුතු කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ඒ සඳහාත් අපි උත්සාහ කරනවා. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු කරන්න අපේ ඇමතිතුමා බොහොම මහන්සියක් දරනවා. ඒ අනුව ඒ කටයුතු කෙරෙනු ඇතැයි මා විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කොච්චර වෙලාවක් ලැබෙනවාද?

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Member, you have nine minutes.

[පූ.භා.10.56]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධිකරණ විෂය පිළිබඳව සාකච්ඡා කරද්දී අධිකරණයේ ස්වාධීනත්වය, අධිකරණයේ ගුණාත්මකභාවය, අධිකරණයේ කාර්යක්ෂමතාව කියන කාරණා තුන ගැනම අවධානය යොමු කළ යුතු වෙනවා. මේ ගරු සභාවේදී අපි බොහෝ දුරට සාකච්ඡා කරන්නේ සමාජය තුළ අධිකරණයේ ස්වාධීනත්වය ගැනයි. අධිකරණයේ ස්වාධීනත්වය ගැන බරපතළ ගැටලුවක් තිබෙනවා. හැබැයි මේ ගැටලුව ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව කියන සාධක දෙකත් සමඟ එකට බැඳී පවතිනවා. විනිශ්චයකාරවරයකු කෙරෙහි මතු වන්නා වූ විවිධාකාර අයුතු බලපෑම්වලින් මිදෙන්නට -එක්කෝ විධායකයෙන් වෙන්න පුළුවන්, එක්කෝ ව්‍යවස්ථාදායකයෙන් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් සිවිල් සමාජයෙන් එන බලපෑමක් වෙන්න පුළුවන්- කාර්යක්ෂමව නිවැරදි තීන්දුවකට එළඹෙන්නට අවශ්‍ය ශක්තිය ලබා දෙන්නේ ඒ විනිශ්චයකාරවරයාට ලැබෙන පුහුණුව හරහායි.

හිටපු අධිකරණ අමාත්‍ය ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමා සඳහන් කළා, එතුමා ඒ අමාත්‍ය ධුරය දරන කාලයේ විනිශ්චයකාරවරුන්ගේ ආයතනය -Sri Lanka Judges' Institute- ඉතා ඉහළ මට්ටමකට පත් කිරීමට සාකච්ඡා තිබුණාය කියා. තවමත් අපේ රටේ විනිශ්චයකාරවරුන්ගේ ආයතනය ඉතා කෙටි කාලීන, ප්‍රමාණවත් නොවන, අල්ප පුහුණුවක් දෙන ආයතනයක් වෙලා තිබෙනවා. අවුරුදු තුනක් වාගේ ඉතාමත් කෙටි වෘත්තීය අත් කීමක් ඇති නීතිඥ වරුන් සහ නීතිඥවරියන් තමයි අද මහෙස්ත්‍රාත්වරුන් වශයෙන් වෘත්තියට බැඳෙන්නේ. සමාජයේ තිබෙන විවිධාකාර ප්‍රශ්න පිළිබඳව, නීතිය පිළිබඳව සහ විනිශ්චයකාරවරයකු සතු විය යුතු විවිධාකාර වූ දැනුම සහ ගුණාංග පිළිබඳව ඔවුන් තුළ ඇත්තේ ඉතා අල්ප දැනුමක්. ඉතා කෙටි කාලීන පුහුණුවකින් පසුව රටේ දුෂ්කරම ප්‍රදේශවලට ඔවුන්ගේ ආරම්භක පත්වීම් දෙනවා. ඊට පසුව ඒ එක් එක් විනිශ්චයකාරවරු ඔවුන්ට හිතෙන විධියට, ඔවුන් කල්පනා කරන විධියට, ඔවුන්ගේ දැනුමේ පමණට, ඔවුන්ට ඇසුරු කරන්න ලැබෙන අනික් විනිශ්චයකාරවරුන් සීමිත පිරිසකගේ අවවාද, අනුශාසනා අනුව හැඩ ගැහෙනවා. මේක සුදුසු වන්නේ නැහැ. මගේ යෝජනාව වන්නේ දැනට තිබෙන විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වෙනුවට විශ්වවිද්‍යාලීය මට්ටමේ පුහුණුවක් ලබා දෙන, පශ්චාත් උපාධි මට්ටමක පුහුණුව ලබා දෙන පුළුල් පරාසයක කටයුතු කරන්න පුළුවන් විනිශ්චයකාරවරුන්ගේ ආයතනයක් පිහිටුවන්නය කියායි. යම් විනිශ්චයකාරවරයෙක් තමන්ගේ වෘත්තීය ආරම්භ කරන්න කලින් ඒ මූලික සුදුසුකම් මත බඳවා ගැනීම කළාට පසුව අඩුම ගණනේ වසර දෙකකවත් පූර්ණ කාලීන පශ්චාත් උපාධි මට්ටමේ පුහුණුවක් ලබා දීමෙන් පසුව පමණක් විනිශ්චයකාර වෘත්තියේ යෙදවිය යුතුය කියා මා යෝජනා කරනවා. මේ විධියට කටයුතු කරන රටවල් ආසියාවේ තිබෙනවා; යුරෝපයේ තිබෙනවා. ඒ රටවල ආදර්ශය අරගෙන මේ කටයුත්ත කළොත් විනිශ්චයකාරවරුන් පිළිබඳව අද පවතින ආකල්ප වෙනස් කර ගන්න පුළුවන්කම ලැබෙනවා විතරක් නොවෙයි, කාර්යක්ෂම, ගුණාත්මක නඩු තීන්දු ලබා ගැනීමටත් හැකියාවක් ලැබෙනවා.

විශේෂයෙන්ම විනිශ්චයකාරවරුන්ට ප්‍රමාණවත් විදේශීය පුහුණුවක් නොලැබීම ගැන ලොකු දුක් ගැනවිල්ලක් තිබෙනවා. විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ මට්ටම උසස් කරලා දේශීය පුහුණුව ප්‍රමාණවත් ලෙස ලබා දෙන ගමන් විදේශීය පුහුණුව සඳහා ශිෂ්‍යත්ව ලබා දීමේදී ප්‍රමාණවත් ලෙස, සාධාරණ ලෙස පැතිරී යන ආකාරයට ඒ යෝජනා ක්‍රියාත්මක විය යුතුයි මා යෝජනා කරනවා.

විශේෂයෙන්ම ඇප ලබා දීම පිළිබඳ කටයුතුවලදී අපරාධ අධිකරණ ක්ෂේත්‍රයේ විශාල ගැටලුවක් තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (5) ව්‍යවස්ථාව අනුව වරදකරු කරන තුරු සෑම සැකකරුවකුම නිර්දෝෂී බවට වූ පූර්ව නිගමනය මතයි කටයුතු කළ යුතු වන්නේ. එනම් ඔවුන්ට අභිංසකයන් ලෙස සැලකිය යුතුයි. ඔවුන්ගේ නිදහස අනවශ්‍ය ලෙස සීමා නොකළ යුතුයි. අපේ රටේ තිබෙන ඇප පනත සංකීර්ණයි. ඒ වාගේම ඒ ඇප පනතින් බලාපොරොත්තු වුණු අරමුණ ඉෂ්ට වුණේ නැහැ. එක් වරක් ඇප පනත සංශෝධනය කළත් ඒ ඇප පනතට කථානායකවරයා අත්සන් නොකිරීම නිසා ඒ සංශෝධනත් ඉවත් වී ගියා. නැවත එම සංශෝධන ගෙනාවේත් නැහැ. විවිධ විවිධ පනත්වල ඇප පිළිබඳව විවිධ විවිධ ස්ථාවරයන්, විවිධ මට්ටම් පවතිනවා. ඒ නිසා මුළු රටටම ඇප පිළිබඳ තනි නීතියක් සහිත තනි පනතක් අලුතින් ගෙන එන ලෙස මා යෝජනා කරනවා.

තවත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. පාර්ලිමේන්තුව ව්‍යවස්ථා කෙටුම්පත් කළත් එක එක විනිශ්චයකාරවරු තමන්ගේ හිතුමනාපයට, ලෝකය ගැන තමන් දකින විධියට, හිතුවක්කාර විධියට ඇප කාර්ය පටිපාටිය අනුගමනය කරනවා. එක විනිශ්චයකාරවරයෙක් ඉක්මනින් ඇප නඩු විභාග කරනවා. තව විනිශ්චයකාරවරයෙක් වුවමනාවෙන්ම එය ප්‍රමාද කරලා බොහෝ දීර්ඝ දින දීලා ඇප පිළිබඳ විමසීම් ගන්නවා. තවත් විනිශ්චයකාරවරයෙක් ඇප දෙන්නේම නැහැ. තවත් විනිශ්චයකාරවරයෙක් ඇප දීම පිළිබඳව ලිහිල්ව කටයුතු කරනවා. මේ එකම තත්ත්වයක්වත් සුදුසු වන්නේ නැහැ. ඒ නිසා මා යෝජනා කරන්න කැමැතියි, විශේෂයෙන්ම මහේස්ත්‍රාත්වරුන්ට අදාළව ඇප දීම පිළිබඳව රීති මාලාවක් අධිකරණ සේවා කොමිෂන් සභාව මැදිහත් වෙලා සකස් කළ යුතුයි කියලා. ඒ රීති මාලාවේ දැක්වෙන ප්‍රමිතීන් අනුව, උපදෙස් අනුව

මහේස්ත්‍රාත්වරුන් කටයුතු කළ යුතුයි. ඒ වාගේම මහාධිකරණයට සහ අභියාචනාධිකරණයට ඇප දීමේ බලයට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136(1) (ඇ) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණ රීති ඇප පිළිබඳව පනවන්නට පුළුවන්කම තිබෙනවා. එක් එක් විනිශ්චයකාරවරයා ඇප දීමේ දී අනුගමනය කළ යුතු ප්‍රමිතීන් පිළිබඳව රීති මාලාවක් පනවන්න කියලා මම යෝජනා කරනවා. එතකොට මුළු රටේ ඉන්න සෑම විනිශ්චයකාරවරයෙක්ම එකම ලෙසට එකම ප්‍රමිතියට කටයුතු කරයි කියලා අපට අපේක්ෂා කරන්න පුළුවන්කම ලැබෙනවා.

අපි ඉගෙන ගන්නවා,"නීතිය නොදැනීම සමාවට කරුණක් නොවෙයි"කියලා. ගරු අධිකරණ ඇමතිතුමනි, නීතිය නොදැනීම සමාවට කරුණක් නොවෙයි කිව්වාට, අද මේ රටේ නීතිය දන්නේ කවුද? මේ රටේ නීතිය දන්නේ නීතිඥවරුන් වීමට ඉගෙන ගන්නා ඉතා සීමිත පිරිසක් පමණයි. මේ රටේ අතිමහත් බහුතරය නීතිය දන්නේ නැහැ. නීතිය නොදැනීම සමාවට කරුණක් නොවෙයි නම් රජයට යුතුකමක් තිබෙනවා, රටේ සෑම පුරවැසියකුටම ප්‍රමාණවත් ලෙස රටේ සාමාන්‍ය නීතිය උගන්වන්න. එක අතකින් විධිමත් අධ්‍යාපනය හරහා මේක කරන්න පුළුවන්. අනෙක අවිධිමත් අධ්‍යාපනය හරහා කරන්න පුළුවන්. විධිමත් අධ්‍යාපනය සඳහා වූ උපාධි මට්ටමෙන් නීතිය පිළිබඳව ඉගැන්වීමේ ආයතන තිබුණත්, පාසල් මට්ටමේදී නීතිය උගන්වන්නේ නැහැ. මම නිතර නිතර මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. පාසල් විෂයයක් හැටියට -සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විෂයයක් හැටියට- නීති විෂයය ඇතුළත් කරන්න. විද්‍යාව, ගණිතය, උගන්වනවා වාගේ, ඉංග්‍රීසි භාෂාව, සිංහල භාෂාව උගන්වනවා වාගේ සමාජය තුළ ජීවත් වන්න අවශ්‍ය වන අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව මූලධර්මයන් උගන්වන නීතිය පිළිබඳ පාඨමාලාවක් සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විෂය නිර්දේශයට ඇතුළත් කරන්න කියලා මා යෝජනා කරනවා.

ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රම පිළිබඳව අපි අවධානය යොමු කරලා තිබෙනවා. සමථ මණ්ඩල පිළිබඳව අපි විශාල අවධානයක් යොමු කරලා තිබෙනවා. මේ අය වැයෙන් රුපියල් මිලියන 100ක ප්‍රමාණයක් ඒ සඳහා වෙන් කර තිබෙනවා. නමුත් අද සමථ මණ්ඩල ක්‍රියාත්මක වන්නේ ඉතාම දුෂ්කර, අසීරු තත්ත්වයකිනුයි. සමථ මණ්ඩලයකට නිශ්චිත කාර්යාලයක් නැහැ. ඒ නිසා මම යෝජනා කරන්න කැමැතියි සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම සමථ මණ්ඩල කාර්යාලයක් වෙනමම පිහිටුවන්න කටයුතු කරන්න කියලා. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සහ පරිපාලන ක්‍රියා මාර්ග ඉක්මනින් ගෙන එන්නය කියලා මා යෝජනා කරනවා. කථා කරන්න බොහෝ දේවල් තිබුණත් ඉතාම සීමිත කාලයක් ලැබී තිබෙන නිසා මීට වඩා කථා කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මට කාලය ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි.

[පූ. භා. 11.04]

**ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு லக்ஷமன் வசந்த பெரேரா)
(The Hon. Lakshman Wasantha Perera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින නීතිය හා යුක්තිය ඉටු කරලීමේ අමාත්‍යාංශය හා ඒ අමාත්‍යාංශයෙන් නීතිය හා යුක්තිය ඉටු කරලීමෙන් අපරාධ සඳහා දඬුවම් විඳින සිරකරුවන් සම්බන්ධ වන අමාත්‍යාංශයත් ඒකාබද්ධව පැවැත්වෙන විවාදයට සහභාගි වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වනවා.

ශ්‍රී ලංකාවේ අධිකරණ ඉතිහාසය අරගෙන බැලුවාම 1801 බ්‍රිතාන්‍ය පාලන සමය දක්වා ඉතා ඈත අතීතයක් කරා ගමන් කරනවා. 1833 වාගේ කාල වකවානුවක තමයි අප නිසියාකාර අධිකරණ ක්ෂේත්‍රයක් කරා ගමන් ඇරඹීමක් සිදු වෙලා තිබෙන්නේ. එහි ප්‍රතිඵලය විධියට තමයි කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ තුළින් මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයක් පිහිටුවා නඩු කියන්නන්ට පහසුවෙන් යුක්තිය කරා ළඟා වීමත්, විශාල මුදලක් වැය නොකරමින් නඩු කීමේ අවස්ථාවක් ලබා දීමත් මූලික අරමුණ හැටියට දක්වා මේ අධිකරණ පද්ධතිය සකස් කරලා තිබෙන්නේ. එසේ සකස් වූ අධිකරණ පද්ධතිය කාලයාගේ ඇවෑමෙන් දීර්ඝ ඉතිහාසයක් සමඟ ඇවිල්ලා 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලින් පසු අද වන කොට රටේ ශ්‍රේෂ්ඨාධිකරණ, අභියාචනාධිකරණ හා වෙනත් මහාධිකරණ විනිශ්චයකාරවරුන් පත් කිරීමේ බලය ව්‍යවස්ථාවෙන්ම රටේ නායකත්වයට - විධායකයට- හිමි වෙලා තිබෙනවා. ඒ බලයත් එක්ක ඇරඹුණු අධිකරණ ක්‍රියාවලිය තුළ මේ වන කොට අපේ රටේ ජනතාවට යුක්තිය හා නීතිය ඉටු කරලීමට අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා දරන ප්‍රයත්නය අපි මේ අවස්ථාවේදී අගය කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මා විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, අපේ හිටපු අධිකරණ අමාත්‍ය ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමාත් ඒ වාගේම වර්තමාන අධිකරණ අමාත්‍ය ගරු රවුෆ් හකීම් මැතිතුමාත් එම අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, මාතලේ දිස්ත්‍රික්කයේ අධිකරණ සංකීර්ණයක් ඉදි කිරීම සම්බන්ධයෙන් කළ කැප කිරීම වෙනුවෙන්. නොබෝදා පැවැති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙන් අපි අනුමත කළා මහාධිකරණය, දිසා අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය හා කාති අධිකරණය යන අධිකරණ සියල්ලම එකම ඒකකයක ස්ථාපිත කිරීම සඳහා සියලුම ගොඩනැඟිලි සහිත අක්කර දෙකක වාගේ ඉඩමක් ලබා දීමට. මේ අවස්ථාවේදී මා ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානයට යොමු කරනවා, කඩිනමින් එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා, ඇමතිතුමාගේ අනුමැතියෙන් ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණ චාරිකාවක් කළා. එතුමා ඉතාම සෑහීමකට පත් වුණා, එම ස්ථානය අධිකරණ සංකීර්ණයක් සඳහා හොඳම තත්ත්වයේ පසු වෙනවාය කියා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකාව ගත්තාම ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය හා අනෙකුත් මහාධිකරණ 33ක් වාගේම පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ 18කුත්, දිසා අධිකරණ 84කුත්, මහේස්ත්‍රාත් අධිකරණ 104කුත්, සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ 32කුත් ඒ වාගේම කම්කරු විනිශ්චය සභා 38කුත් කාති අභියාචනාධිකරණය හා කාති අධිකරණ 64කුත් වශයෙන් සමස්ත ශ්‍රී ලංකාව තුළ අධිකරණ 373ක් පමණ ක්‍රියාත්මක වෙනවා. ජනාධිපති නීතිඥ ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා අධිකරණවල පහසුකම් නොමැතිකම පිළිබඳව. අභියාචනාධිකරණ නඩු විශාල වශයෙන් හිර වෙලා තිබෙන අවස්ථාවක 2010 අංක 10 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත ගෙනැල්ලා මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව 75ක් දක්වා වැඩි කරලා ඉතාම කාර්යක්ෂම අධිකරණ ක්‍රියාවලියක් ඇති කිරීමයි අපේ රජයේ අරමුණ වෙලා තිබුණේ. අද ඒක ඉටු කර ගෙන තිබෙනවා; ඉටු කර ගෙන යමින් පවතිනවා.

අද අපේ අධිකරණ අමාත්‍යාංශය ජනතාවට අවශ්‍ය වන්නා වූ නීතිය හා යුක්තිය පසිඳලීම සඳහා අධිකරණ ක්ෂේත්‍රයේ විවිධ නීති ක්‍රම සංශෝධනය කරලා තිබෙනවා. අපි දන්නවා පීඩාකාරී ආයුධ (සංශෝධන) පනත යටතේ අභියාචනාධිකරණයට තිබුණු ඇප දීමේ බලය අද මහාධිකරණයටත් ලබා දීලා තිබෙන බව. ඒ වාගේම සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා ආරාවුලකදී සමථකරණය සඳහා සලකා බලන මූල්‍යමය වටිනාකම රුපියල් 25,000 සිට 2,50,000 දක්වා වැඩි කරන්න බලාපොරොත්තු වනවා. ඒ වාගේම අද අප රටේ අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන් යන දෙපාර්ශ්වයම ආරක්ෂා කිරීම

[ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා]

සඳහා පනත් කෙටුම්පත් සකස් කරමින් පවතිනවා. ඒ වාගේම සිවිල් නඩු කටයුතු, ළමයින්ගේ භාරකාරත්වය, නඩත්තුව, උරුමකාරත්වය සම්බන්ධව වාගේම මාතෘත්වය හා පිතෘත්වය තහවුරු කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේදයක් භාවිතා කරමින් ජාන පරීක්ෂාව සඳහා අවශ්‍ය නීතිරීති සකස් කරලා තිබෙනවා.

ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන්, ළමා අපයෝජන සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ පවරන නඩුවලදී බොහෝ විට අපි දැකලා තිබෙනවා, ස්වාමියා බන්ධනාගාරගත වනවා, භාර්යාව දරුවනුත් එක්ක නිවසේ ඉන්නවා. එයට හේතුව, දණ්ඩ නීති සංග්‍රහය යටතේ එම ස්වාමියාට දඬුවම් පමුණුවා තිබීමයි. නමුත් ස්වාමිපුරුෂයාට භාර්යාවත් සමඟ ජීවත් වීමේ අයිතිය ලබා දීම සඳහා අද වන කොට එම නීති සංශෝධනය කරන්න කටයුතු කරමින් යනවා. අද වන කොට අධිකරණ සංකීර්ණයන් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 100ක් වැනි මුදලක් වෙන් කරමින් අධිකරණ ක්ෂේත්‍රය නව යුගයක් කරා ගෙන යෑම සඳහා අතිගරු ජනාධිපතිතුමා මේ රටේ අපරාධ නඩු පිළිබඳ විශේෂ උනන්දුවක් දැක් වූ නීතිඥවරයකු වශයෙන් එතුමාට තිබෙන පළපුරුද්දත් එක්ක අද කටයුතු කර ගෙන යනවා. 2011 වර්ෂයේදී විතරක් අපි අධිකරණ 16ක් ඉදි කර ගෙන යන අතර ඉන් කිහිපයක කටයුතු අවසන් වෙලා තිබෙනවා. 2012 වර්ෂයේදී ප්‍රධාන අධිකරණ සංකීර්ණ තුනක් සහ අධිකරණ 28ක් ඉදි කිරීමට අපි බලාපොරොත්තු වනවා.

ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා වාගේ අද අපි රජයක් වශයෙන් තේරුම් ගෙන තිබෙනවා, අධිකරණවල තිබෙන පහසුකම් වැඩිදියුණු කරමින් ජනතාවට නීතිය හා යුක්තිය පසිඳලීම සඳහා ඉතාම කෙටි මාර්ගයකින් අධිකරණ කටයුතු සඳහා සහභාගි වන්න අවස්ථාව ඇති කර දීමේ අවශ්‍යතාව. අපි දන්නවා, ළඟදී මාතලේ නාඋල ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණයක් පිහිටු වූ බව. මීට පෙර කිලෝමීටර් 65ක්, 70ක් ගෙවලා තමයි ජනතාව අධිකරණ කටයුතු සඳහා දඹුල්ල ප්‍රදේශයට එන්නේ. නමුත් අද ඒකෙන් අයින් කරලා ලග්ගල කලාපයට ආවරණය වන පරිදි නාඋල ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණයක් පිහිටුවා තිබෙනවා. ජනතාව ගැන හිතලා, ජනතාවට නීතියේ පහසුකම් ලබා දීලා, ජනතාව වෙනුවෙන් කටයුතු කරන්න වත්මන් රජය කටයුතු කර තිබෙන බවයි අපට කියන්න අවශ්‍ය වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. සමථ මණ්ඩල පනත ගැන අපේ අජිත් පෙරේරා මන්ත්‍රීතුමා කථා කළා. සමථ මණ්ඩල තුළින් පසු ගිය අවුරුද්දේ විතරක් ආරාවුල් 25,000කට අධික ප්‍රමාණයක් නිරාකරණය කරලා තිබෙනවා. එම නිසා මේ ගැන ජනතාවගේ විශ්වාසයක් තිබෙනවා. හැබැයි යම් යම් අඩු පාඩු තිබෙනවා. අපි ඒවා පිළිගන්නවා. සමහර විට ඒ අදාළ පාර්ශ්වයන් සමථ මණ්ඩලයට ඉදිරිපත් නොවී අනික් පාර්ශ්වය නැවත නඩු මහට බැස්සවීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට යම් පාර්ශ්වයකට හැකියාව තිබෙනවා. ඔවුන් එහිදී සමථ මණ්ඩලයට නොයා, ඒක පැහැර හැර, අදාළ පාර්ශ්වයන් නැවත වරක් අසරණ කිරීම සඳහා කරන උත්සාහය වැළැක්වීම සඳහා නීති සකස් කළ යුතු කාලය එළඹිලා තිබෙනවාය කියන එකයි අපේ විශ්වාසය වන්නේ. දිවයින පුරාම සමථ මූල මණ්ඩල 302ක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඒ සඳහා 7,000ක පමණ පිරිසක් ස්වේච්ඡාවෙන් කටයුතු කරනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் வசந்த பெரேரா)
(The Hon. Lakshman Wasantha Perera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අලුත් නැමියාවක් ඇති කරලා, එය පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වශයෙන් නම් කරලා තිබෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் வசந்த பெரேரா)
(The Hon. Lakshman Wasantha Perera)
ඉස්සර බන්ධනාගාර රැඳවියන් සිරකරුවන් වාගේ තබා ගැනීමටයි උත්සාහ කළේ. අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා රුපියල් මිලියන 500ක් වැනි මුදලක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ලබා දෙමින්, බන්ධනාගාර, පුනරුත්ථාපන මධ්‍යස්ථාන බවට පත් කිරීමට ගෙන යන ක්‍රමවේදය අපි අගය කළ යුතුයි කියන එක ප්‍රකාශ කරමින්, මට මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

[பு.ப. 11.14]

**ගරු සිල්වෙස්ත්‍රි අලන්ටින් මහතා**
(மாண்புமிகு சில்வேஸ்திரி அலன்றின்)
(The Hon. Silvastrie Alantin)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சின் நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்திலே, பாராளு மன்ற கலரியிலே அமர்ந்திருக்கின்ற முன்னாள் போராளிகளை வரவேற்றவனாக என்னுடைய உரையை ஆரம்பிக்கின்றேன். சரணடைந்த முன்னாள் போராளிகள் கிட்டத்தட்ட 10,000 பேர் இந்த அரசினால் புனர்வாழ்வளிக்கப்பட்டுத் தங்களுடைய குடும்பங்களோடு இணைக்கப்பட்டிருக்கிறார்கள். அதேபோல், இவர்களும் நாளை விடுதலை செய்யப்படப்போகிறார்கள். அதற்காக மேதகு ஜனாதிபதி அவர்களுக்கும் புனர்வாழ் வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர் மாண்புமிகு சந்திரசிறி கஜதீர அவர்களுக்கும் எனது மன மார்ந்த நன்றியைக் கூறிக்கொள்கின்றேன்.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
உலகத்திலேயே இது ஓர் அற்புதமான நிகழ்வு! புனர்வாழ்வளிக்கப்பட்டவர்கள் ஒரு பாராளுமன்றத்துக்கு வரவழைக்கப்பட்டார்களென்றால் இதுதான் முதல்தடவை! அவர்களுடைய எதிர்கால நலனை முன்னிட்டு அவர்களுக்கு நாங்களும் எங்களுடைய நன்றியையும் நல்வாழ்த்துக்களையும் தெரிவித்துக்கொள்கின்றோம்.

**ගරු සිල්වෙස්ත්‍රි අලන්ටින් මහතා**
(மாண்புமிகு சில்வேஸ்திரி அலன்றின்)
(The Hon. Silvastrie Alantin)
தங்களுடைய குடும்பங்களோடு இணைக்கப்படுகின்ற முன்னாள் போராளிகளுடைய வாழ்வாதாரங்களை மேம் படுத்துவதற்கு அரசாங்கம் கூடுதலான நிதியைச் செலவழித்து, அவர்களுடைய கஷ்ட, துன்பங்களை நீக்குவதோடு, அவர்கள் தங்கள் குடும்பங்களிலே நல்லமுறையில் வாழ்வதற்ககான

சூழலையும் உருவாக்க வேண்டும். கடந்த 30 வருடங்களுக்கும் மேலாக யுத்த்தினால் பாதிக்கப்பட்ட எங்களுடைய பிர தேசங்கள் இப்பொழுதுதான் அபிவிருத்திகளைக் கண்டு வருகின்றன. புனர்வாழ்வளிக்கப்பட்டுச் செல்கின்ற அவர்கள் அங்கே தங்களுடைய குடும்பங்களோடு ஒன்றாக வாழக்கூடிய சூழலில் அவர்கள் தங்களுடைய சுதந்திரமான வாழ்க்கை யையும் பார்த்துக்கொள்ள வேண்டியவர்களாக இருக்கிறார்கள். அவர்கள் சுபிட்சமான வாழ்க்கையை வாழ்வதற்கு இந்த அரசாங்கம் அவர்களுக்கு எல்லா வழிகளிலும் உதவி, ஒத்தாசை களை வழங்குமென்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. ஏனைய பிரதேச மக்கள் எவ்வாறு வாழ்கின்றார்களோ, அதேபோன்று இவர்களது வாழ்க்கையும் அமைவதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டுமென்பதிலே நாங்கள் உறுதியாக இருக்கின்றோம். அவர்களுடைய வாழ்வு சீர்செய்யப்பட வேண்டும். முன்னாள் போராளிகள் என்றோ, பயங்கரவாதிகள் என்றோ அவர்களைப் பார்க்காமல், ஏனைய மக்களைப் போன்றே பார்க்க வேண்டும். அவர்கள் பலவித மான துன்பங்களோடும் கஷ்டங்களோடும் வாழ்ந்தவர்கள். அந்தப் பிரதேசங்களுக்குச் சென்று மீண்டும் தங்கள் உறவுகளோடு சந்தோசமான வாழ்க்கையை வாழ்வதற்கு இந்த அரசாங்கம் அவர்களுக்கான வாழ்வாதார உதவிகளைச் செய்ய வேண்டுமென்று கேட்டுக்கொள்வதோடு, அவர்களுடைய எதிர்காலம் சுபிட்சமானதாக அமையவேண்டுமென்றும் வாழ்த்தி, எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! I wish to announce that this House cordially welcomes the Parliamentary Delegation from Australia led by the Hon. Maria Vamvakinou, Member of Parliament, now present at the Speaker's Gallery.

The next speaker is the Hon. Lakshman Kiriella. You have nine minutes.

[පූ. භා. 11.18]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු අධිකරණ ඇමතිතුමනි, මම ප්‍රථමයෙන්ම කියන්න ඕනෑ මධ්‍යම පළාතේ ඉන්න මරණ පරීක්ෂකවරුන්ට මාස 10කින් දීමනා ගෙවලා නැති බව. Coroners in the Central Province have not been paid for 10 months. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා.

අපේ රවුෆ් හකීම් ඇමතිතුමා පසු ගිය ජනාධිපතිවරණයේදී සරත් ෆොන්සේකා මැතිතුමා මේ රටේ ජනාධිපති විය යුතුයි කියන මතයේ තමයි හිටියේ. එතුමා වැඩ කළේ සරත් ෆොන්සේකා මැතිතුමාට. ඒත් එතුමා කොහොම හරි ආණ්ඩුවට ගිහිල්ලා දැන් අධිකරණ ඇමති වෙලා ඉන්නවා. ඒ ගැන අපි ඔබතුමාට සුබ පතනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසු ගිය මාසයේ මම දැක්කා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා ජනාධිපති ලේකම්වරයාට ලියුමක් ලියා තිබෙනවා, "මෙන්න මේ පුද්ගලයාට සමාව දෙන්න" කියලා. යම් කිසි පුද්ගලයකුට සමාව දෙන්න කියලා ඉල්ලීමක් කරලා තිබෙනවා. ඉතින් මම ගරු රවුෆ් හකීම් මැතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ, ඔබතුමා පසු ගිය ජනාධිපතිවරණයේදී වැඩ කරපු සරත් ෆොන්සේකා මැතිතුමාටත් නිදහස දෙන්න කියලා ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ලිපියක් යවන්න ජනාධිපතිතුමාට. ඒක ඔබතුමාගේ යුතුකමක්. ඔබතුමා නියෝජනය කරන පළාත තමයි නැඟෙනහිර පළාත. [බාධා කිරීම්] හරි, හරි. [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! Hon. Lalith Dissanayake, please sit down. - [*Interruption.*] Hon. Member, you carry on with your speech.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Please do not disturb me.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසු ගිය මැතිවරණයේදී උතුරු පළාතේ ජනතාවයි නැඟෙනහිර පළාතේ ජනතාවයි කිව්වේ සරත් ෆොන්සේකා මේ රටේ ජනාධිපති විය යුතුයි කියලා. රවුෆ් හකීම් ඇමතිතුමා නියෝජනය කරන පළාතත් කිව්වේ සරත් ෆොන්සේකා මැතිතුමා ජනාධිපති විය යුතුයි කියලා. ඔබතුමාට වරමක් තිබෙනවා නැඟෙනහිර පළාතේ ජනතාවගෙන්. ඔබතුමාගේ බලතල ප්‍රකාරව සරත් ෆොන්සේකා මහතාට සමාව ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ වෛරී දේශපාලනය නවත්වන්න ඕනෑ. සරත් ෆොන්සේකා මැතිතුමාගෙන් පළිගන්නවා. විරුද්ධවාදීන්ගේ දේපොළ පවරා ගන්නවා. අපේ දයා ගමගේ මහතාගේ දේපොළ පවරා ගන්න හදනවා. හිටපු අග්‍රවිනිශ්චයකාර සරත් එන්. සිල්වා මැතිතුමාගෙන් පළිගන්නවා. මොකක්ද මේ? මොකක්ද මේක රටක්ද? විරුද්ධවාදීන්ගෙන් පළිගන්න, රටේ නීතිය විරුද්ධවාදීන්ට පමණක් ක්‍රියාත්මක වන මේ පළිගැනීමේ දේශපාලනය වහාම නවත්වන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රවුෆ් හකීම් මැතිතුමාගේ පසු ගිය අවුරුදු පහම, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනුවෙන් කෑ ගැහුවා. In the last five years you said that the Seventeenth Amendment should be there. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ රටට අවශ්‍යයි කියලා රවුෆ් හකීම් මැතිතුමා කිව්වා. එතකොට දැන් මොකක්ද වුණේ?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ෆොන්සේකා මහත්තයාට යුද්ධ කරන්න බැහැ කිව්වේ මෙතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ඕනෑම ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන් කිව්වේ,- [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සරත් ෆොන්සේකා,- [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Lalith Dissanayake and Hon. Azwer, both of you please sit down.- [*Interruption.*] Do not disturb him.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හරි, හරි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,- [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
කරුණාකරලා වාඩි වෙන්න කෝ. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා කිව්වා, මා ඒ කාලයේ කරපු ප්‍රකාශයක් ගැන. මා එතුමාට කියන්න කැමැතියි, ගොන් විධියට යුද්ධ කරපු නිසා තමයි ජාත්‍යන්තර යුද අපරාධ චෝදනා තිබෙන්නේ කියලා. හරියට යුද්ධ කළා නම් ඕක එන්නේ නැහැ. ගොන් විධියට කරපු නිසා තමයි යුද අපරාධ චෝදනා තියෙන්නේ. අන්න ඒක මතක තියා ගන්න. [බාධා කිරීම්] ගොන් විධියට වැඩ කළ නිසා තමයි. [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අපේ සජිත් ප්‍රේමදාස මහත්මයාගේ තාත්තා මහ මඟ මැරුවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්] මාවනැල්ලේ පල්ලිය ගිනි තිබ්බා. [බාධා කිරීම්] යුද අපරාධ චෝදනා තිබෙනවා, 40,000ක් සිවිල් වැසියන් මැරුවා කියා. ඒක අප නොවෙයි කියන්නේ. වැඩේ වැරදුණු නිසා තමයි ඕක වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්] ඒක දැන්වත් පිළිගන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු ඇමතිතුමා අවුරුදු ගණනාවක් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කෙරුවා; සම්මන්ත්‍රණ ගැන කථා කෙරුවා. ඇත්ත වශයෙන්ම ආණ්ඩුවට තුනෙන් දෙකේ බලය හම්බ වුණේ මුස්ලිම් කොංග්‍රස් එක නිසයි. [බාධා කිරීමක්] ජනතාව දුන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ ජනතාව ආණ්ඩුවට තුනෙන් දෙකේ බලයක් දුන්නේ නැහැ. පාර්ලිමේන්තු මැතිවරණයේදී ආසන 142යි හම්බ වුණේ. ජනතාව තුනෙන් දෙකේ බලයක් දුන්නේ නැහැ. ජනතාව තුනෙන් දෙකේ බලයක් දුන්නා නම් -අර 1977 දී ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට වාගේ, 1970 බණ්ඩාරනායක මැතිනියට වාගේ- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කළාට කමක් නැහැ. ජනතාව තුනෙන් දෙකේ බලයක් දුන්නේ නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අන්න එම නිසා මා කියනවා - [බාධා කිරීම්] වාඩි වෙන්න. මොකද, ඔච්චර තරහා යන්නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක පාර්ලිමේන්තුව. [බාධා කිරීම්] අහගෙන ඉන්න තමුන්නාන්සේලාට ඉවසීම තියෙන්න ඕනෑ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Azwer, please allow the Hon. Member to speak. Why are you disturbing him? - [*Interruption.*] Hon. Member, you carry on.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සරත් ෆොන්සේකා හොඳයි කියා, මේ රටේ ජනාධිපති වන්න ඕනෑ කියා, අවුරුදු ගණනාවක් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හොඳයි කියා එතුමා ආණ්ඩුවට ගියාට පසු දැන් කියනවා, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හොඳ නැහැයි කියා. ඇත්ත වශයෙන්ම දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනස් කළ යුතුයි. මොකද, මේකෙන් අධිකරණය, පොලීසිය, රාජ්‍ය සේවා කොමිසම, නීතිපති දෙපාර්තමේන්තුව ආදී සෑම ආයතනයක්ම විධායකය යටතේ තිබෙන්නේ. තමුන්නාන්සේලා කැමැතිද, විධායකය යටතේ තිබෙන අධිකරණයකට? විධායකය යටතේ තිබෙන පොලීසියකට තමුන්නාන්සේලා කැමැතිද? පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපි ලජ්ජා වන්න ඕනෑ. තමුන්නාන්සේලා අත ඉස්සුවා, අධිකරණයේ ස්වාධීනත්වය නැති කරන්න; පොලීසියේ ස්වාධීනත්වය නැති කරන්න; රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය නැති කරන්න. ලජ්ජා වන්න ඕනෑ. [බාධා කිරීම්] ලජ්ජයි. [බාධා කිරීම්] පාර්ලිමේන්තු මන්ත්‍රීවරුද? [බාධා කිරීම්] ලජ්ජයි. මේ විධියට තමයි කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එම නිසා මා කියනවා දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, සංශෝධන කළ යුතුයි කියලා. තමුන්නාන්සේලා මොනවා කිව්වත් මේ රටේ ජනතාවගෙන් අහන්න. සියයට 99ක් කියනවා, සරත් ෆොන්සේකා මැතිතුමා නිදහස් කළ යුතුයි කියා. [බාධා කිරීම්] සියයට 99ක්. මා තමුන්නාන්සේලාට කියනවා, ජනතාවගේ සාපයට ලක් වන්න එපා කියා. [බාධා කිරීම්] ජනතාවගේ සාපයට- [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! A point of Order is being raised by the Hon. Azwer. - [*Interruption.*] Hon. Lalith Dissanayake, කරුණාකර, වාඩි වන්න. [*Interruption.*] Hon. Azwer, what is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නීතිඥයෙක් වන මෙතුමා නීතිය ගැන දන්නේ නැතුවයි කථා කරන්නේ. සරත් ෆොන්සේකා මහත්මයාව නිදහස් කරන්න බැරක් හුසේන් ඔබාමා ළඟට යන්න ඕනෑ නැහැ. අතිගරු ජනාධිපතිතුමා ළඟට ගියා නම් ඒක නිකම්ම සිදු වනවා. ඇයි, යන්නේ නැත්තේ?

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

That is not a point of Order. Hon. Member, you carry on with your speech. - [*Interruption.*]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Deputy Chairman, 99 per cent of the people of this country - if you do a survey you will find it and so many people have done it - have said that Mr. Sarath Fonseka should immediately be released. No one accepts the judgment. He is considered a political prisoner by the entire world community.- [*Interruption.*] In Sri Lanka, in the European Union and in the United States of America, he is considered a political prisoner.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

Mr. Deputy Chairman, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! A point of Order is being raised by the Hon. Leader of the Opposition.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Sir, can you ask them to allow the Hon. Member to speak? They can reply later. Sir, his point is that the Prisons Ordinance does not make provision for political prisoners like Sarath Fonseka. It is only for people who are convicted of normal offences. Where are you going to keep political prisoners? - [*Interruption.*]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Okay. Hon. Lakshman Kiriella, you continue with your speech.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, please give me two or three minutes extra.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

I can only give the time allotted to you.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

They are disturbing me. - [*Interruption.*]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Azwer, please sit down. Do not disturb.- [*Interruption.*]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Deputy Chairman, there is an element of doubt in the judgment given in Mr. Sarath Fonseka's case because one judge has said that he is totally innocent. So, in a situation like that, the Minister can intervene. One judge has said that he is innocent. - [*Interruption.*] So, the Minister can intervene and use his powers under the law to give Mr. Sarath Fonseka a pardon. Please do that. You will be remembered.

මම මේ අයට කියන්න කැමැතියි, මෙලොව උසාවියෙන් බේරුණාට, පරලොව උසාවියෙන් බේරෙන්න බැහැයි කියලා, මේ ගොල්ලෝ කරන වැරදිවලට. මෙලොව උසාවියෙන් බේරෙන්න පුළුවන්, පරලොවත් උසාවියක් තිබෙනවා. There is a heavenly court also. අන්න ඒක මතක තියා ගන්න. [බාධා කිරීමක්] ලජ්ජා නැතුව හැම එකකටම අත උස්සනවා. ලජ්ජා නැද්ද? [බාධා කිරීමක්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Lalith Dissanayake, please sit down. - [*Interruption.*]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

අපි හමුදාවේ ඉන්න කොට අහිංසක කෙල්ලෝ දූෂණය කළේ නැහැ. අපි කැත වැඩ කරලා නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

හැම එකකටම ලජ්ජා නැතුව අත උස්සනවා. [බාධා කිරීමක්] ලජ්ජායි. [බාධා කිරීමක්] ඔය ගොල්ලෝ මොන මන්ත්‍රීලාද? [බාධා කිරීම්] I am ashamed of these people. Are they Members of Parliament? They are not Members of Parliament. They are lamp posts; they are signposts. They just raise their hands for everything. ලජ්ජයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ද? හැම එකකටම අත උස්සනවා. ලජ්ජයි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Member, please wind up.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාව මම අවසන් කරනවා.

[மு.ப. 11.31]

**ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹகீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)
*பிஸ்மில்லாஹிர் றஹ்மானிர் றஹீம்.*

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்று எனது பொறுப்பிலுள்ள நீதி அமைச்சின் நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு பேசிய உறுப்பினர்களின் விமர்சன ரீதியான, ஆக்கபூர்வமான கருத்துக்களுக்கு முதற்கண் என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். பார்வையாளர் கலரியிலே அமர்ந்து மிக முக்கியமான இந்த விவாதத்தைப் பார்வையிடுவதற்கு முன்னாள் விடுதலைப் புலிகள் இயக்கத்தின் நூற்றுக்கு மேற்பட்ட பெண் போராளிகளுக்குச் சந்தர்ப்பம் வாய்த்திருக்கிறது. இந்தச் சந்தர்ப்பத்தில் இலங்கைப் பாராளுமன்றத்தின் சார்பிலும் இலங்கை அரசாங்கத்தின் சார்பிலும் ஜனாதிபதி அவர்களின் சார்பிலும் அவர்களை வரவேற்பதில் நான் பெருமகிழ்ச்சியடைவதுடன், அவர்களுக்கு ஒரு சில விடயங்களைக் குறிப்பிட்டுக் கூற விரும்புகின்றேன். இதுவரை காலமும் ஆயுத ரீதியாகவும் வன்முறை ரீதியாகவும் செயற்பட்ட நீங்கள், இன்று பாராளுமன்றத்திலே ஒரு வித்தியாசமான சூழலில் - பார்வையாளர் கலரியிலே - இருக்கின்றீர்கள். இந்த நாட்டிலே இனங்களுக்கிடையிலான பிரச்சினைக்குத் தீர்வைக் காண்பதற்கு கடந்த காலங்களில் ஏதோ ஒரு வகையில் எத்தனித்தீர்கள். இப்பொழுது யுத்தம் முடிவுக்கு வந்த பின்னணியில் இயல்பு வாழ்க்கைக்கு மீண்டும் நீங்கள் திரும்பவேண்டுமென்ற நோக்கிலே புனர்வாழ்வு முகாம்களிலே உங்களுக்கு உற்சாகமும் தைரியமும் வழங்கப்பட்டு, வெவ்வேறு தொழிற்றுறைகளில் பயிற்சிகளும் வழங்கப்பட்டன. எனது உரைக்கு முன்பு இங்கே வாதப்பிரதிவாதங்கள் நிகழ்ந்ததை நீங்கள் அவதானித்திருப்பீர்கள். அந்த வகையில், ஒரு ஜனநாயக நாட்டிலே சமூகங்களுக்கிடையில் பிரச்சினைகள் வரும்பொழுது இவ்வாறான ஜனநாயக நடைமுறையின் மூலமாக அவை தீர்க்கப்படலாம்; ஆயுதங்களைப் பாவிக்காமல், வன்முறைகளைப் பிரயோகிக்காமல், பேச்சுவார்த்தைமூலம் தீர்வுகளை எட்டலாம் என்பதற்கான ஒரு முன்னுதாரணமாக நீங்கள் இந்த அவையைக் கருதவேண்டுமென்று நான் உங்களிடம் கேட்டுக்கொள்கின்றேன். அதன்மூலம் ஒரு வன்முறைக் கலாசாரத்துக்கு மீண்டும் போகாமல் நாங்கள் எல்லோரும் இந்த நாட்டிலே இருக்கின்ற உள்ளகப் பிரச்சினைகளுக்கான தீர்வைக் காண்பதற்கு நம்பிக்கையுடன் உழைக்க வேண்டும். நீங்களும் இயல்பு வாழ்க்கைக்குத் திரும்பி ஒரு முன்னுதாரணமான வாழ்வை மீண்டும் உங்களுடைய குடும்பத்தினரோடு ஆரம்பிக்கின்ற பொழுது, இந்த நாட்டின் சுபிட்சத்துக்காக எல்லாச் சமூகங்களும் ஒருசேர உழைக்கின்ற ஒரு சூழல் உருவாகும்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இந்த நாட்டின் நீதித்துறைக்குப் பொறுப்பான அமைச்சர் என்ற வகையிலே இந்த நாட்டின் நீதி நிர்வாகத் துறையிலே காத்திரமான மாற்றங்கள் உருவாக வேண்டும் என்ற ஓர் அடிப்படையில் அதற்கான நடவடிக்கைகளை எடுப்பதற்கு நான் முயற்சித்துக் கொண்டிருக்கின்றேன். இன்று பேசிய எதிரணி உறுப்பினர்களில் ஒருசிலர் இந்த நாட்டிலே சிறைச்சாலைகளில் இருக்கின்ற நிலைவரங்கள் சம்பந்தமாகக் குறிப்பிட்டார்கள். சிறைச்சாலைகளுக்குப் பொறுப்பான அமைச்சர் அதற்குப் பதில் கூறுவார் என்று நான் நினைக்கின்றேன். நீதித்துறையைப் பொறுத்தமட்டிலே இன்று சிறையிலே வாடுகின்ற சந்தேக நபர்கள் மற்றும் கைதிகளுக்கு நீதி நிர்வாகத் துறையினூடாக எவ்வாறான தலையீடுகளைச் செய்து துரித நிவாரணங்களைப் பெற்றுக் கொடுக்க முடியுமோ, அவ்வாறான அத்தனை நடவடிக்கைகளையும் எடுப்பதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம் என்பதையும் இங்கு நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

Hon. Deputy Chairman, it is important that we, in today's Discussion, concentrate on some of the advances that have been made in the recent past, particularly when it comes to judicial administration and in introducing and implementing new sets of legal reforms to strengthen the judicial sector in this country. In that regard, I must at the very outset, thank His Excellency the President for having considered some of the alternate dispute resolution mechanisms that have to be strengthened and for having provided in the Budget, a proposal to set up an International Neutral Arbitration Centre in Sri Lanka. As a matter of fact, this Government and its policy of treating this country as a hub for a variety of different activities, such as maritime air as well as commercial and knowledge hub, a combination of all these factors, would certainly be strengthened by trying to transform Sri Lanka into a place where we can have a very neutral international arbitration centre. As a matter of fact, countries in the region like Singapore and Hong Kong have developed this service industry, the international arbitration industry, into a multi-billion dollar earning sector. Therefore, this is a very timely move by His Excellency the President. On the advice of our Ministry he has included this proposal to set up an International Arbitration Centre in Colombo and this, as you all know, is a fast-improving alternate dispute resolution mechanism. Therefore, I would like to thank His Excellency the President and the Ministry of Finance and Planning for having considered this proposal and having included it in the Budget.

Furthermore, three acres of land has been allocated close to the Supreme Court Complex, in the former BCC Company land, to set up a complex in which we will include the International Arbitration Centre, as well as the courthouses which presently are situated - particularly the original courts - the District Courts and the High Courts, if possible the Magistrate's Courts together with also the Attorney-General's Department and the Legal Draftsman's Department. I believe this new court complex should ease the space constraints that we presently are faced with in Hulftsdorp. As we all know, the Superior Court Complex where even my Ministry is situated, is housing the Superior Courts, that is, the Supreme Court and the Court of Appeal, whereas, the District Court of Colombo, the High Courts which have been set up - the Civil Appellate High Courts as well as the Commercial High Courts - are all housed in colonial court buildings in Hulftsdorp, which are now becoming

white elephants when it comes to maintenance purposes. Therefore, it is time that we convert those premises into a heritage building area and provide modern facilities for courthouses in the City of Colombo. Therefore, I must thank His Excellency the President for having allocated three acres of land as a Budget Proposal to set up this new court complex where a variety of other institutions will also be accommodated. I propose to set up a steering committee involving the heads of all these institutions, so that we will plan out and execute this proposal to set up a new Court Complex in Colombo.

Having said that, Hon. Deputy Chairman - during the limited time available to me - since a Delegation of Australian Members of Parliament are in the Gallery today, I must very particularly say that our Ministry is very thankful to the Australian Government in assisting us to bring out a Sentencing Policy Act, which we would be presenting to Parliament early next year in order to fulfil an important need that was felt badly throughout the history of our legal and judicial sector.

Indeed, we are grateful to the assistance rendered by the Department of the Attorney-General of Australia in formulating the policy background to this law. Once this law is introduced, there will be a firm guideline to be followed by the judiciary in imposing sentences and punishments so that the process will assume a unique uniformity throughout the courts of the entire country. We have also taken certain other important initiatives to strengthen the judicial sector, particularly when it comes to disposal of cases. In fact, His Excellency the President, in his Budget Speech, referred to the laws delays and the need to address the issue of laws delays and have generously-provided funds to the Supreme Court, in order to see that the laws delays are minimized and certain action is taken to expeditiously dispose of cases that are piling up in our court system. Towards that, Her Ladyship, the Chief Justice is giving leadership to try and improve the facilities in the Court Houses, particularly digitizing our procedures in the courthouses, computerizing the court registries and also the hearing in our court system. In that regard, I believe we will soon be able to also introduce the new amendments that are sought to be introduced to the Civil Procedure Code, where we will be able to introduce certain novel schemes such as the judicial mediation and we will be also having another tier of judges called Master of Rolls and Recorders who will be functioning, both at the levels of Magistrate's Court level and the District Courts level, where they would be able to handle the pre-trial issues and ease the pressure on the trial judges, which will go very much towards easing the pressure in our court system and towards expediting the disposal of cases.

In that regard, I must also thank our Secretary, Mr. Suhada Gamlath and his team for having painstakingly working day and night with a variety of legal experts to try and finalize the reforms in that regard. And, I am sure early next year, I would be able to introduce those amendments to the Civil Procedure Code, which would certainly be a revolutionary change in our system which will embody some of the features that were there in the original AJL - Administrative Justice Law - which was a controversial law at that time, but, subsequently it was felt by the legal fraternity that certain features of the law would have certainly improved the backlog situation in our court system.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! Hon. Minister, please, wind up now.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Yes, I am in the process of winding up, Hon. Deputy Chairman. There is a variety of issues to which I have to respond. There had been a few issues raised about prisoners being given pardon. There was a request by my learned Friend, the Hon. Lakshman Kiriella, that I recommend a pardon to General Sarath Fonseka. There is a procedure that we follow in our Ministry. If at all, we are to recommend a pardon, a request has to be made by the prisoner or his family and if that request is made to my Ministry, certainly this matter will be considered. Having said that, I will conclude my remarks.

Thank you.

[පූ. භා. 11.45]

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා මේ වතාවේ අය වැය ලේඛනයත් සමඟ ඉදිරිපත් කළ ලියවිලි අනුව උසාවිවල නඩු 6,50,000ක් තිබෙනවා කියලා කියැවුණා. ලංකාවේ හැටියට නඩු 6,50,000ක් කියන්නේ අඩුම ගණනේ එක නඩුවකට 5 දෙනෙකු සිටියොත් 30,00,000ක් හැම වෙලාවේම උසාවිවල රස්තියාදු වන තත්ත්වයක් තිබෙනවා. ඒ විධියේ තත්ත්වයක් ඇති වීම වැළැක්වීම සඳහා 1972 දී ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මැතිතුමා අධිකරණ ඇමතිවරයා හැටියට උසාවියේ සාක්ෂි අහනවා වෙනුවට ලිඛිත සාක්ෂි අර ගෙන නඩු ඉක්මන් කරන ක්‍රමයක් ගෙනාවා. ඒ වැඩ පිළිවෙළ ටිකක් කල් ක්‍රියාත්මක වුණත්, ඉන් පසුව උසාවිවලින් ඒ ක්‍රමය නැති වුණා. ඒ නිසා නඩු ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. කොහොම නමුත් මේ විධියට නඩු තිබෙන එක රටේ සංවර්ධනයට බලපානවා වාගේම ජනතාවට අසීරුතාවන් ඇති වෙන්නත් හේතු වෙනවා. දෙමවුපියන්, වැඩිහිටියන් නඩුවලට සම්බන්ධ වීම නිසා දරුවන්ට මානසික වශයෙන් අපහසු තත්ත්වයන් ඇති වෙනවා. ඒ ගැන කල්පනා කරලා මේ නඩු ප්‍රමාණය හැකි ඉක්මනින් අඩු කර ගන්නට උත්සාහ ගත යුතුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මම කල්පනා කරන්නේ වැඩිපුර සමථ මණ්ඩල පිහිටුවා, අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් පත් කරන විනිශ්චයකාරවරුන් ලවා දැන් තිබෙන උසාවි ගොඩනැඟිලිවල පමණක් නොවෙයි වෙනත් තාවකාලික ස්ථානවලත් උසාවි පවත්වලා මේ නඩු ප්‍රමාණය අවසන් කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් හොඳයි කියලායි. දැනට තිබෙන ගොඩනැඟිලිවල පමණක් නොවෙයි වෙනත් ස්ථානවලත්

[ගරු දි.මු. ජයරත්න මහතා]

උසාවි පවත්වන්න පුළුවන්. මේ නඩු අවසන් කිරීම සඳහා එක් දිස්ත්‍රික්කයකට උසාවි 10ක් 15ක් ඇති කළත් කමක් නැහැ. මේ විධියේ වැඩ පිළිවෙළක් ඇති කරනවා නම් හොඳයි කියලා මම කල්පනා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟ කාරණය මේකයි. බොහෝ වෙලාවට මේ සභාවේ අධිකරණය විවේචනයට ලක් කරනවා. ඒක හොඳ වැඩක් නොවෙයි. පාර්ලිමේන්තුවට පුළුවන්කමක් නැහැ ජනතාව පාලනය කරන්න. ජනතාව පාලනය කරන්නේ පොලීසිය සහ අධිකරණයයි. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න ඕනෑ. නොයෙක් අවස්ථාවලදී පාර්ලිමේන්තුවේ නීතියටත් විරුද්ධව මන්ත්‍රීවරු කථා කරන බව පේනවා. උසාවියේ නඩුවක් තියෙද්දී පාර්ලිමේන්තුවේදී ඒ ගැන කථා කරන්නට පුළුවන්කමක් නැහැ. එහෙම කථා කරන අවස්ථාත් තිබෙනවා. ඒක සම්පූර්ණයෙන් වැරදියි. විශේෂයෙන් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් වන ඔබතුමන්ලා තමයි එහෙම කරන්නේ. ඒ විධියට ක්‍රියා කරන එක සම්පූර්ණයෙන් වැරදි ක්‍රියාවක් කියලා මම කියනවා. උසාවිය ශ්‍රේෂ්ඨත්වයෙන් තබා ගන්නට ඕනෑ. එහෙම නැත්නම් සමාජය ගොඩ නඟන්නට පුළුවන්කමක් ඇති වන්නේ නැහැ. බුද්ධිමත් දේශපාලනඥයින් හැටියට ඒ තත්ත්වය ගැන කල්පනා කරන්නට ඕනෑ කියලා මම ප්‍රකාශ කරනවා. තමන් ඡන්ද ප්‍රමාණයක් අරගෙන පාර්ලිමේන්තුවට ආව නිසා මේ රටේ තිබෙන එවැනි ආයතන දුර්වල තත්ත්වයට පත් කරන ආකාරයෙන් කථා කිරීම සම්පූර්ණයෙන් වැරදි ක්‍රියාවක්. අධිකරණය සැබෑ තත්ත්වයෙන් තබා ගන්නට ඕනෑ.

පොලීසියත් ඒ වාගේ තත්ත්වයට තියා ගන්නට ඕනෑ. ඒ තුළින් තමයි පාලනය හරියාකාරව කර ගෙන යන්න පුළුවන් වන්නේ. පාර්ලිමේන්තුව තුළින් ඒවා ක්‍රියාත්මක කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට මම යෝජනා කර සිටින තවත් කාරණයක් තිබෙනවා. මේ රටේ භික්ෂූන් වහන්සේලාගේ නඩුත් පොදු අධිකරණයේ තමයි අහන්නේ. ඒ නිසා භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් වෙනම අධිකරණයක් පිහිටු වීම සඳහා වුවමනා කරන සැලසුම් සකස් කරලා, ඒ සම්බන්ධයෙන් නීති සම්පාදනය කරලා තිබෙනවා. මම එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා මේ සභාවට ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් නව උසාවි සංකීර්ණයක් හදනවා. එහෙම වුණාම ඒ නඩු වෙනම අහන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට, බන්ධනාගාර සම්බන්ධයෙන් කථා කරන විට ගරු චන්ද්‍රසිරි ගජදීර ඇමතිතුමා බොහොම දක්ෂ අන්දමින් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන යන බව කියන්නට ඕනෑ. ඊට ඉස්සර අපේ ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමාත් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. දැනට බන්ධනාගාර ගත වෙලා ඉන්න අයවලුන්ට ආගමික වශයෙන් හැඟීමක් ඇති කරලා, ආධ්‍යාත්මික දියුණුවක් ඇති කිරීමට වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. ඒ ගැන අපි බොහොම සන්තෝෂ වෙනවා. අද ඕස්ට්‍රේලියාවේ සිට පැමිණි නියෝජිතයන් පිරිසක් සහභාගි වෙලා ඉන්නවා, ඒ අංශය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගැනීම සඳහා.

සුළු වැරදිවලට සම්බන්ධ වුණු අය, සුළු මුදලක් ගෙවා ගන්න බැරි වුණු අය සිර බාරයේ ඉන්නවා. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා මේ අයවලුන්ට ණය සහනයක් ලබා දීලා ඒ අය නිදහස් කරන වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. මම කල්පනා කරන්නේ මේ සිරකරුවන් ජාතික ආර්ථික සංවර්ධනය සඳහා යොදවනවා නම් බොහොම හොඳයි කියලායි. සිරකරුවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ අය ආර්ථික සංවර්ධනයට යොදා ගැනීම සඳහා නොයෙක් විධියේ ගොවි පොළවල් ඇති කරලා ඔවුන් ඒ කටයුතුවල යෙදවීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම් ඒ අයගේ පවුල්වලටත් හොඳයි. ඒ වාගේම රටේ ආර්ථිකයටත් හොඳයි. නැත්නම් අතිවිශාල සංඛ්‍යාවක් අද හිර ගෙවල්වල ඉන්නවා. සමහර වෙලාවට එක හිර ගෙදරට එක පුද්ගලයා හතර පස් වතාවක් යනවා. මේවා ගැනත් කල්පනා කරලා බලන්න ඕනෑ. මෙහෙම අයවලුන් ආපහු එළියට දමන්න හොඳ නැහැ. ඒ ගොල්ලෝ පණ තිබෙන කල්ම හිර භාරයේ තියන එක තමයි හරි. එහෙම නැත්නම් එක වතාවක් හිර භාරයට ගිය අය නැවත නැවත එහි යනවා. දැන් හිර ගෙවල්වල දෙන කෑම බීම සෑහෙන ප්‍රමාණයකින් හොඳයි. මම ඒක දන්නවා. ඒ කෑම බීම හොඳ නිසා තමන්ගේ ගෙවල්වල ඉඳ ගෙන කාලා බීලා ජීවත් වෙනවාට වඩා හොඳයි හිර ගෙදර කියලා කල්පනා කරලා සමහර පුද්ගලයෝ එතැනට යනවා වෙන්න ඇති කියලායි මම හිතන්නේ. ඒ නිසා ඒ ගොල්ලෝ එහෙම හිර භාරයේම තබන ගමන් ඒ ගොල්ලන්ගෙන් සමාජයට විශාල ප්‍රයෝජනයක් අරගන්න වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් හොඳයි කියලායි මම කල්පනා කරන්නේ.

ඊළඟට, මහනුවර බන්ධනාගාරය දැනට තිබෙන තැනින් වෙනස් කරලා කුණ්ඩසාලේ ප්‍රදේශයට ගෙන යාමට සූදානම් කර තිබෙනවා. ඒ ගැන මම බෙහෙවින් සන්තෝෂ වෙනවා. එතකොට මහනුවර නගරය මීට වඩා දියුණු තත්ත්වයකට පත් කරන්න පුළුවන්. ගරු අධිකරණ ඇමතිතුමාට මම මේ කාරණය ඉදිරිපත් කළා. ඉංග්‍රීසිකාරයින්ගේ කොලනි කාලයේදී තමයි ගම්පොල උසාවිය ඇති කළේ. ඒ වාගේම විනිශ්චයකාරතුමාගේ බංගලාව හැදුවේත් ඒ කාලයේයි. අද ඒ බංගලාව තෙමෙනවා. උසාවියේ ඉන්න ජනතාවට වාගේම එහි පැමිණෙන අනික් අයටත් මිදුලේවත්, වත්තේවත් ඉන්න බැරි තරමට ඉඩ පහසුකම් මදි වෙලා තිබෙනවා. ඒ ගොඩනැඟිලි කැඩිලා බිඳිලා විනාශයට පත් වෙලා තිබෙනවා. විනිශ්චයකාරවරුන් ගිහිල්ලා ඒ උසාවිය බැලුවා; ඒ ගොඩනැඟිලි බැලුවා. ඒ සම්බන්ධයෙන් අක්කර පහක භූමියක් අත් පත් කරගෙන තිබෙනවා. ඒ ඉස්සරහාපිට පොඩි ඉඩම් කැබැල්ලක් තිබෙනවා. ඒ ඉඩම අයිති එක්කෙනාත් ඒක රජයට දෙන්න කැමැතියි. ඒකත් අරගෙන එතැන නවීන උසාවියක් පිහිටුවන්න කියලා මා යෝජනා කළා. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ වැඩ පිළිවෙළ ගැන කල්පනා කරලා බලලා ඒ උසාවිය පිළියෙල කරන්න කියලා. මොකද අතිවිශාල ජනතාවකට ඒක ප්‍රයෝජනවත් වෙනවා.

ඒක කොයි තරම් දුරට ක්‍රියාත්මක වෙලාද කියලා මම දන්නේ නැහැ. ඒක බලලා තිබෙනවා. පරීක්ෂා කරලා තිබෙනවා. ලියුම් ලියලා තිබෙනවා. ඔක්කොම ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ තත්ත්වය තුළ ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා නම් බොහොම හොඳයි. ඒ එක්කම මම දැක්කා සවුදිඅරාබි උසාවියේ දෙන නඩු තීන්දු අනුව වේත් පහරවල් 500ක් ගහලා තිබෙන ආකාරය. අපේ රටේ නම් එහෙම තත්ත්වයක් එන්නේ නැහැ. අපේ රටේ මේ දඬුවම් මදි නිසාවත් මේ වාගේ වැරැදි තත්ත්වයක් වෙනවාද කියලා කල්පනා කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේ සියලු කාරණා ගැන කල්පනා කරලා උසාවිවල තත්ත්වය වැඩිදියුණු කිරීමටත්, ඒ වාගේම බන්ධනාගාරත් දියුණු තත්ත්වයට පත් කිරීමටත් කටයුතු කරන්න කියලා මම ඔබතුමාට බොහොම කරුණාවෙන් මතක් කරනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

The next speaker is the Hon. Jayantha Ketagoda. Order, please! The Hon. Alhaj A.H.M. Azwer will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[පූ.භා. 11.54]

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු අගමැතිතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. එතුමා කිව්වා කන්න බොන්න දැන් මිනිස්සු නිතරම හිරේට යනවා කියලා. ඒක ඇත්ත. එළියේ ඉන්න කොට කන්න නැති හින්දා අද ජනතාව කල්පනා කරනවා වැරැදි කරලා හිරේට ගියොත් හිර බත් ටිකක්වත් කන්න පුළුවන් වෙයි කියලා. ඒ තරමට අද මේ රටේ ආර්ථිකය කඩා ගෙන වැටිලා තිබෙන්නේ. ඒ වාගේම බන්ධනාගාරයේ වැඩ කරන නිලධාරින් අද මැසිවිලි නඟනවා ඒ අයගේ overtime එක, batta එක විශේෂයෙන්ම නිවාඩු දිනවලට දෙන ඒ වැටුප මාස හතරකින් ගෙවලා නැහැ කියලා. අතිගරු ජනාධිපතිතුමා මෙවර අය වැය කථාවේදී කිව්වා ලබන ජනවාරි මාසයේ ඉඳලා පඩියට සියයට 10ක දීමනාවක් දෙනවා කියලා. මේ දීමනාව දෙන්නේ කොහොමද? මේ බන්ධනාගාරවල වැඩ කරන නිලධාරින්ට overtime එක, batta එක මාස හතරක් තිස්සේ ගෙවන්න බැරි වුණු ආණ්ඩුවක් සියයට 10ක දීමනාවක් ගෙවනවා කියලා මෙතැනට ඇවිල්ලා මහා උජාරුවෙන් කියනවා. ඒක තමයි තත්ත්වය. අද එක පැත්තකින් අක්කර 45ක විතර භූමි භාගයක පිහිටා ඇති, අවුරුදු දෙසිය ගණනකට ආසන්න ඉතිහාසයක් තිබෙන වැලිකඩ හිර ගෙදර විකුණන්න යනවා. අද ඒකේ ඉන්න හිර කාරයෝ ටික ටික එහාට මෙහාට යවනවා. ඉඩමක් දැක්කොත් ඒක විකුණන්න කල්පනා කරනවා වටිනාකම දැනිලා. බොරැල්ලේ තිබෙන ප්‍රධාන ප්‍රදේශයක් තමයි හිර ගෙදර තිබෙන ඔය අක්කර 45. ඒකටත් දැන් ලබන අවුරුද්දේ අවසානය වෙන කොට වැඩේ දෙන්නයි යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව ඉඩමක් තිබෙනවා. ඒ බොරැල්ලේ කනත්ත. ඒකත් විශාල ඉඩමක්. මළවුන්ට තමයි නැඟිටලා මේකට සටනක් දෙන්න වන්නේ. බොරැල්ල කනත්තත් විකිණීමේ කාර්ය භාරය මා හිතන්නේ ඊළඟ වසර වෙන කොට කරයි කියලායි. ඒ විධියට මේ රටේ තිබෙන ඉඩම් ටික මං කොල්ල කන්න හදන්නේ. අද ආණ්ඩුව මහා පරිමාණයෙන් -බිලියන ගණන් - ණය ගන්නවා. ආණ්ඩුවට මහා පරිමාණයෙන් ණයට වැඩ කරන්න අද රජයේ සේවකයන්ට සිදු වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයකට අද මේ රට පත් වෙලායි තිබෙන්නේ. ගරු අගමැතිතුමනි, අඩු මිලට දුන් 90ට තිබුණු විදුලි ඒකක ප්‍රමාණය 30ට බස්සලා මේ රටේ ජනතාවට මේ අය වැය යන අස්සේ විශාල ජීවන බරක් දෙන්න සූදානම් වෙලායි තිබෙන්නේ.

මම ඒ එක්කම ප්‍රකාශ කරන්න කැමැතියි, අද එස්.එල්. ගුණසේකර මැතිතුමා "Lore of the Law and Other Memories" කියලා නීතිය පැත්තෙන් පොතක් එළි දක්වන බව. එතුමාගේ ඒ පොතේ 169,170,171 කියන පිටු ඔබතුමන්ලාගේ දැන ගැනීම පිණිස මම හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒ පොතේ එතුමා කියනවා, මෙන්න මෙහෙම. 1974 දී නීතිපති දෙපාර්තමේන්තුවෙන් අයින් වෙලා අවුරුදු ගණනාවකට පස්සේ එතුමාගේ මිත්‍රයෙක් හමු වෙනවාලු. කවුද මේ? ජනාධිපති නීතිඥ ඩී.එස්. විජේසිංහ මහත්මයා. එතුමාත් එක්ක කථා කරන වෙලාවේ එතුමා කියනවාලු, "අපට කෝට්ටේ ලොකු පාර්ලිමේන්තු සංකීර්ණයක් හම්බ වෙලා තිබෙනවා. ඒ පාර්ලිමේන්තු සංකීර්ණය හම්බ වෙනවාත් එක්කම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වැළලිලා යනවා." කියලා. ඊළඟට කියනවා, "අපට උපරිමාධිකරණ ගොඩනැඟිලි සංකීර්ණයක් ලැබෙන්න තිබෙනවා. ඒ එක්කම අපේ යුක්තිය ඉටු කිරීමත් වැළලිලා යාවි" කියලා. ජනරාල් සරත් ෆොන්සේකාට එරෙහිව එම නඩුවේ කථා කරන ජනාධිපති නීතිඥතුමා තමයි මේ පොතේ එහෙම කියන්නේ.

ඊළඟ පිටුවේ එතුමා කියනවා, එතුමාට හම්බ වනවාලු, වාණිජ මහාධිකරණයේ තරුණ නීතිඥවරයෙක්. එතුමා අහනවාලු, "කොහොමද සර්, අලුත්කඩේ, එදාට වඩා අද වෙනස මොකක්ද?" කියලා. එතකොට එස්.එල්. ගුණසේකර මැතිතුමා කියනවා, "එදා වායු සමීකරණ තිබුණේ නැහැ. විදුලි සෝපාන තිබුණේ නැහැ. Photocopy machines තිබුණේ නැහැ. කැමරා හයි කරලා තිබුණේ නැහැ. උසාවිය ඇතුළේ වතුර පොකුණු හරි ගස්සලා ලස්සන කරලා තිබුණේ නැහැ. නමුත් එදා යුක්තිය ඉෂ්ට වුණා" කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

නැහැ, මට විනාඩි 10ක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

නැහැ, නැහැ, තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

මට විනාඩි 10ක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

නැහැ. නැහැ. විරුද්ධ පාර්ශ්වයෙන් වැඩියෙන් අරන් තිබෙන නිසා වේලාව කපලා තිබෙනවා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

ජනරාල්තුමාට එරෙහිව කථා කරන නීතිඥතුමාගේ පොත එළි දක්වන වෙලාවේ එතුමා කියනවා, දේශපාලනයට එහෙම නැත්නම් ගැත්තන්ට හිස නමලා මේ රටේ නඩු තීන්දු දෙන කොට මේ රටේ ජනතාව ඒ ගැන කථා කරනවා, එදා එහෙම කථා කළේ නැහැයි කියලා. එහෙම නම් මේ රටේ නීතිය ඉටු වීම ගැන අද ජනතාව තුළ විශාල අවිශ්වාසයක් තිබෙනවා. ජනතාවගේ බදුවලින් යැපෙන මේ ආයතනවල නීතිය හරියට ක්‍රියාත්මක කළේ නැත්නම් ජනතාව මේ අධිකරණ ක්‍රියාදාමයටත් පාංශුකූලය දෙන දවස ඈතක් වන්නේ නැහැයි කියන එක ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ නිසා යුක්තිය, සාධාරණය ඉෂ්ට වීමේ කාර්ය භාරය ක්‍රියාත්මක කිරීමේ වගකීම මේ පාර්ලිමේන්තුව භාර ගනු ඇතැයි කියා මම මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මීළඟට, ගරු සජිත් ප්‍රේමදාස මහතා. මිනිත්තු හතරයි ඔබතුමාට තිබෙන්නේ.

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[පූ. භා. 11.59]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉතාමත්ම සීමාසහිත කාලයක් තිබෙන නිසා මම ඉතා ඉක්මනින් කථා කරන්න බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරිපත් කර ඇති අය වැය කථාව තුළ කියැවෙනවා, ආශ්චර්යවත් ශ්‍රී ලංකාවක් ගැන; නව ශ්‍රී ලංකාවක් ගැන; සෞභාග්‍යවත් ශ්‍රී ලංකාවක් ගැන. විශේෂයෙන්ම බන්ධනාගාර ක්ෂේත්‍රයේත්, ඒ වාගේම අධිකරණ ක්ෂේත්‍රයේත් ආශ්චර්යයන් දෙකක් ගැන ඉතාමත්ම කෙටියෙන් කථා කරන්න මම ලැහැස්තියි.

විශේෂයෙන්ම මුදල් අමාත්‍යවරයාගේ කථාවේදී කියැවුණා, රාජ්‍ය සේවකයන්ගේ වැටුප සියයට 10කින් වැඩි කරනවායි කියලා. එය එසේ වුවත්, 2011 වර්ෂයේ බන්ධනාගාර සේවකයන්ට ඒ අරුණලු උදා වෙලා නැහැ. සැප්තැම්බර් මාසයේ සිට මේ දක්වා අතිකාල දීමනා ගෙවලා නැහැ, මේ ආශ්චර්යවත් ශ්‍රී ලංකාවේ. රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින දීමනා දීලා නැහැ, මේ ආශ්චර්යවත් ශ්‍රී ලංකාවේ. ගමන් වියදම් ගෙවලා නැහැ; සංයුක්ත දීමනා ගෙවලා නැහැ; නිල නිවාස කුලී ගෙවලා නැහැ; විදුලිබල දීමනා ගෙවලානැහැ. මෙන්න ආශ්චර්යවත් ශ්‍රී ලංකාව! හැබැයි, පදනම් විරහිත උත්සව සඳහා, එහෙමත් නැත්නම් වෙනත් අනවශ්‍ය ඉදි කිරීම් කටයුතු සඳහා, උසස් නිලධාරින්ගේ නිල රථ මිල දී ගැනීම සඳහා, නිල නිවාස අලංකාර කර ගැනීම සඳහා ඕනෑ තරම් මුදල් වැය කරනවා. නමුත් මේ බන්ධනාගාර ක්ෂේත්‍රයට ශක්තිය ලබා දෙන බන්ධනාගාර නිලධාරින්ගේ වැටුප් ප්‍රශ්නය, මේ දීමනා ප්‍රශ්නය විසඳන්න බැරි ආණ්ඩුව කොහොමද කියන්නේ සියයට දහයකින් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කරනවා කියලා?

මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි, 1987 සිට 2010 දක්වා ගත් කල, රැඳවුම්කරුවන්ගේ සහ සැකකරුවන්ගේ ප්‍රමාණය 12,180 සිට 24,815 දක්වා සියයට 103.73කින් වර්ධනය වෙලා තිබෙන බව. හැබැයි, ඒ කාල වකවානුව තුළ බන්ධනාගාර නිලධාරින්ගේ වර්ධනය 4,602 සිට 5,236 දක්වා සියයට 13.77ක වැඩි වීමක් පමණයි වෙලා තිබෙන්නේ. රැඳවුම්කරුවන්ගේ ප්‍රමාණය මේ තරම් ශීඝ්‍ර වනකොට බන්ධනාගාර නිලධාරින් වැඩි ප්‍රමාණයක් බඳවා ගැනීම සුදුසු නැද්ද කියලා මම තමුන්නාන්සේගෙන් අහන්න කැමැතියි. බන්ධනාගාර ක්ෂේත්‍රය ගැන මම එපමණයි කියන්නේ.

මම අධිකරණ ඇමතිතුමාගේ අවධානයට යොමු කරන අනෙක් කාරණය මේකයි. මේ ආශ්චර්යවත් ශ්‍රී ලංකාවේ, නවීකරණයට, උද්දීපනයට ලක් වන මේ ශ්‍රී ලංකාවේ හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ දීමනාව ගෙවන්න බැරි ආණ්ඩුවක් තමයි තිබෙන්නේ. 2010 සැප්තැම්බර් මාසයේ ඉඳලා ඒ අයගේ රුපියල් පන්සියයේ දීමනාව ගෙවන්න බැරි ආණ්ඩුවක් තමයි, රජයේ සේවකයන්ගේ වැටුප් සියයට දහයකින් වැඩි කරනවාය කියලා කථා කරන්නේ. ඒ හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ සංගමය ඉදිරිපත් කර තිබෙන ලිපි ලේඛන මම **සභාගත*** කරනවා.

අවසාන වශයෙන් මම කියන්න ඕනෑ ඔබතුමාගේ අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරිතුමා සඳහන් කරන කාරණයක්. එතුමා මේ විධියට කියා තිබෙනවා.

"2010 වසරට රුපියල් මිලියන තිස්පහක ප්‍රතිපාදන ඇස්තමේන්තු කර ඇතත්, රුපියල් මිලියන පහළොවයි ලබා දීලා තිබෙන්නේ."

පැහැදිලිවම ගණකාධිකාරිතුමා එතුමාගේ ලිපියෙන් කියනවා භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් මුදල් ලබා දෙන්නේ නැති බව. ඒ නිසා විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරලා, මහා ලොකුවට ආශ්චර්යවත් කියන ශ්‍රී ලංකාවේ තිබෙන මේ බරපතළ ප්‍රශ්න ටික ඉක්මනින් විසඳන්න කියන ඉල්ලීම කරමින්, මගේ විනාඩි හතරේ කථාව මම අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ. භා. 12.03]

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යයට ඉහළින් මැරයන් කුඩුකාරයන් ආරක්ෂා කරන යුගයක, මේ රට බේරා ගත් ජනරාල් සරත් ෆොන්සේකා මහතා හිර කර ගෙන අඩුම තරමින් එතුමාට වෛද්‍ය පහසුකම් ටිකවත් ලබා නොදී තළා පෙළා දමා ඇති අවස්ථාවක තමයි මා මේ ගරු සභාව අමතන්නේ. අද මේ රටේ නීතියක් තිබෙනවාද? එදා ලෝකයේ හොඳම හමුදාපතිවරයා විධියට මේ ආණ්ඩුව, මේ ඇමතිවරු නම් කළ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අද කරන දේවල් දිහා බලද්දී නීතිය වෙනුවට මේ රටේ අවනීතිය ක්‍රියාත්මක වන බව හොඳටම පැහැදිලියි

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පැහැදිලිව පෙනෙන්නේ නීතියේ පාලනයක් නැතිව දේශපාලකයන්ගේ හිතුවක්කාර පාලනයක් මේ රටේ ක්‍රියාත්මක වනවා කියන එකයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

සිහි බුද්ධියක් තිබෙන කිසිම කෙනෙකුට ඒක පිළිගන්නට බැහැ. [බාධා කිරීම්]

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අගමැතිතුමා.

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒ සඳහා appeal එකක් තිබෙනවා උසාවියේ. Appeal තිබෙන නිසා ඒ ගැන කථා කරන්නට බැහැ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්ථාවර නියෝගවලට පටහැනිව යමක් තිබෙනවා නම් ඒවා **හැන්සාඩ්** වාර්තාවෙන් ඉවත් කරනවා. [බාධා කිරීම්]

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
පාර්ලිමේන්තුවේ කථා කරන්නට බැහැ, උසාවියේ තිබෙන නඩුවක් සම්බන්ධයෙන්. ඒක වැරදියි. [බාධා කිරීම්] Standing Orders වලට අනුව, උසාවියේ තිබෙන කාරණයක් සම්බන්ධයෙන් මේ සභාවේ කථා කිරීම වැරදියි.[බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්ථාවර නියෝගවලට පටහැනිව යමක් තිබෙනවා නම් ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා. [බාධා කිරීම්] Order, please! Hon. Members, do not disturb your own speaker.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඊට පෙර විවිධ චෝදනා මත දඬුවම් ලබා දුන්,- [බාධා කිරීමක්]

ඇත්තටම ඒක හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ වැඩක්. [බාධා කිරීම්]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Hon. Dayasiri Jayasekera, do not disturb your own Member. - [*Interruption.*] Hon. Sujeewa Senasinghe, do not disturb your own Member.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
පෞද්ගලික හිතවත්කමක් තිබෙද්දී ඒක මුළුමනින්ම අමතක කරලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කටයුතු කරන්න පුළුවන්ද? ඒ එක්කම අනෙක් පැත්තෙන් ෆොන්සේකා මැතිතුමා මේ සියලු චෝදනාවලට නිවැරදිකරු කියලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*
මොන තරම්ද කියලා බලන්න. බහුතර තීන්දුවට එරෙහි තීන්දුවක් තිබුණාම සාමාන්‍යයෙන් ඒක අධිකරණයේ ප්‍රකාශ කරන්න ඉඩ දෙනවා.[බාධා කිරීම්] නමුත් අඩුම ගණනේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*
[බාධා කිරීම්]

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මා කියනවා, මේවා හැන්සාඩ්ගත කරන්න එපා කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒ පිළිබඳව මා නියෝගයක් දුන්නා.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
අද ලංකාවේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පිළිබඳ විශ්වාසය මුළුමනින්ම බිඳවැටිලා ඉවරයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නම් ඕනෑම වැරැදි වැඩක්, මිනී මැරුමක් කරලා බේරෙන්න පුළුවන්. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Dayasiri Jayasekara, there has to be orderliness in the conduct of every Member.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
ආණ්ඩු විරෝධී නම් ඒ පුද්ගලයාට දෙයියන්ගේම පිහිටයි. නීතිය ඉදිරියේ සමානව සැලකීම වෙනුවට අද තියෙන්නේ වෙනස් සැලකීමක්. අද තිබෙන්නේ රජයට පක්ෂ හා විපක්ෂ අයට දෙවිධියකට සලකන ක්‍රමයක්. රජය කරන ඕනෑම ක්‍රියාවකට එහෙයිකම් කරන, ගැතිකම් කරන, ආණ්ඩු ගැති හෙන්වයියලාට දේශ ප්‍රේමී ලේබලය අලවන, ආණ්ඩුවේ වැරැදි විවේචනය කරන, පෙන්වා දෙන, රටේ පොදු මහ ජනතාවගේ සුබ සිද්ධිය උදෙසා පෙනී සිටින, කථා කරන උදවියට දේශද්‍රෝහී ලේබලය ඇලවීමේ කාර්ය පටිපාටියයි අද තිබෙන්නේ.

මා ඉහතින් සඳහන් කළ පරිදි ජනරාල්තුමා විශ්‍රාම ගියාට පසු රජයට පක්ෂව සිටියා නම්, අද ඔහු සිටින්නේ වැලිකඩ බන්ධනාගාරයේ ජම්පරයක් ඇඳ ගෙන නොව, කරදිය වළල්ලෙන් එපිට ඈත සීතල රටක තානාපති වරප්‍රසාද ලබන තානාපතිවරයකු

[ගරු පාලිත තෙවරප්පෙරුම මහතා]

ලෙස නැත්නම් අමාත්‍යාංශයක ලේකම්වරයකු ලෙස අතිසුඛෝප‍භෝගී ජීවිතයක් ගත කරමින් බව රට කරවන ඇත්තන්ට රහසක් වුවද, මේ පුංචි රටේ නුවණ ඇති මිනිසුන්ට එය කිසි විටෙක රහසක් හෝ අරුමයක් නොවේ. බලන්න, අවුරුදු ගණනක් තිස්සේ මිනී මැරුම් චෝදනාවට යටත්ව සිටි කැස්බෑව ආසනයේ දේශපාලන බලවතා හිටිහැටියේ ඒ සියලු චෝදනාවලින් නිදහස් කළා. ඊළඟට, අපේ මිත්‍ර දුමින්ද සිල්වා මන්ත්‍රීතුමාට දක්වපු සැලකිලි දිහා බලන්න. පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත්ව තිබියදීත් එතුමාට කිසිම දෙයක් වුණේ නැහැ. සමුපකාරයේ මුදල් ලක්ෂ 10ක් වංචා කරපු තවත් දේශපාලන බලවතෙක් නිදොස් කොට නිදහස් කළා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හමුදාවට අවි ආයුධ මිල දී ගැනීමේදී සිදු වුණා යයි කියන වංචා, දූෂණ, අක්‍රමිකතා ගැන සොයන්න 2007 දී පත් කළ ශිරානි තිලකවර්ධන කොමිසමේ වාර්තාව එළියට දැම්මේ නැත්තේ ඇයි? ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකළේ ඇයි? ඒ ගැන අහද්දී ජාතික ආරක්ෂාවේ නාමයෙන් ඒ වාර්තාව ඉදිරිපත් කරන්නේ නැහැ කියලා ආණ්ඩුව කියනවා. ජාතික ආරක්ෂාව කියන කාරණය අද මේ ආණ්ඩුවට කෝකටත් තෛලය වෙලා ඉවරයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
එහෙම පත් කළ කොමිසමක වාර්තාව එළියට දමන්න ආණ්ඩුව බය ඇයි? මේ කොමිසම පත් කළේ බැන් කී මූන් නොවෙයි; එක්සත් ජාතීන්ගේ සංවිධානය නොවෙයි. ඒ කොමිසම පත් කළේ ජනාධිපතිතුමා. ඒ කොමිසමේ හිටියේ ඩොලර් කාක්කෝ හෝ කොටි ඒජන්තවරුන් නොවෙයි. ඒ කොමිසමේ හිටියේ මේ රටේ විනිසුරුවරුන්. රටේ ජනාධිපතිතුමා පත් කළ දේශීය කොමිසමක වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම රටේ ආරක්ෂාවට ප්‍රශ්නයක් වන්නේ කොහොමද? ඉතා පැහැදිලියි, ඒ වාර්තාව එළියට දමන්නේ නැත්තේ රජයට සම්බන්ධ ප්‍රබලයන් කිහිප දෙනෙකුගේ නම් ඒ දූෂිත ගනුදෙනුව සම්බන්ධව සඳහන්ව තිබෙන නිසායි. එහෙම නැත්නම් මේ වාර්තාව ආණ්ඩුව එළියට දමන්නේ මඟුල් බෙර ගහලායි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව මිනිත්තුවක් දෙන්න.

අගමැතිතුමා කිව්වා අද මිනිසුන් සිර ගෙදරට යන්නේ කෑම ටික කන්න කියලා. මේ රටේ තිබෙන අවනීතිය නිසා, මාත් මාස නවයහමාරක කාලයක් හිරේට දමලා හිටපු පුද්ගලයෙක්. [බාධා කිරීමක්] ඔබතුමා අහගන්න. මම හිර ගෙදර සිටිද්දී උදේ පාන්දර යනවා කිරි හොද්ද ගන්න. අපිට කිරි හොද්ද බෙදුවා. කිරි හොද්දේ අඩියේ හිටියේ තඩි පූසෙක්. [බාධා කිරීමක්] ඒ කිරි හොද්ද කන්න තමයි මිනිස්සු හිරගෙදරට යන්නේ. තමුන්නාන්සේලා නිකම් මේ බත් කන එක ගැන කථා කරන්න එපා, බොරුවට. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, අවසන් කරන්න. அடுத்ததாக மாண்புமிகு மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன் அவர்கள் உரைநிகழ்த்துவார். உங்களுக்கு ஐந்து நிமிடங்கள் ஒதுக்கப் பட்டிருக்கிறது.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
What is your point of Order?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමාගේ කථාවේ ඉතිරි කොටස **සභාගත*** කරන්නය කියා ඉල්ලා සිටිනවා.

[பி. ப. 12.09]

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் இந்தச் சபைக்குள் வரும்பொழுது, இன்று இச்சபையின் 'கலரி'க்குத் முன்னாள் தமிழ்ப் போராளிகளை முதன்முறை யாகக் கொண்டுவந்திருப்பதாக முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர் ஒருவர் என்னிடம் கூறியிருந்தார். அவர்களைப் பார்த்தபோது எனக்கு மிகுந்த மனவருத்தம் ஏற்பட்டது. ஏனெனில், நாங்கள் இச்சபைக்கு அழகாக உடைகளை அணிந்து வந்திருக்கும்பொழுது, அந்தத் தமிழ்ப் போராளி களைத் தனியாக வேறுபடுத்தி இனங்கண்டுகொள்ளும் விதத்திலே white uniform போட்டு, அந்த uniform இன் பின்னால் பெயர்ப்பட்டி ஒட்டி, அவர்களைப் பாரபட்சம் காட்டி அழைத்து வந்திருக்கிறீர்கள். உண்மையிலே அவர்கள் தமிழ்ப் போராளிகள் அல்ல; அவர்கள் தமிழ்ப் பிள்ளைகள் - எமது சகோதரிகள். இச்சபையிலே இருக்கின்ற எவரினதும் சகோதரிகள், பிள்ளைகள் அங்கே இல்லை. உங்களுடைய பிள்ளைகள் அந்த நிலையில் இருந்திருந்தால்தான் உங்களுக்கு அந்த நிலைமை புரிந்திருக்கும். அந்த நிலைமை உங்களுக்குப் புரியாதபடியால்தான், முன்பு போராளிகளின் தளபதியாக இருந்தவருக்கு நீங்கள் 'கோட்-சூட்' போட்டு இன்று இச்சபையில் பிரதி அமைச்சராக வைத்திருக்கிறீர்கள். அதேமாதிரி இந்தப் பெண் பிள்ளைகளுக்கும் முன்னுரிமை கொடுத்திருக்க வேண்டும். அவர்களை எங்களுடையதும் உங்களுடையதும் பிள்ளைகள் - சகோதரிகளாகக் கருதி, அவர்களை வேறுபடுத்திக் காட்டாது, அவர்களுக்குச் சிவில் உடை அணிவித்து இச்சபைக்குக் கூட்டிக்கொண்டு வருமாறு அந்தப் பிரதியமைச்சராவது சொல்லியிருக்கலாம். நாங்கள் அனைவரும் ஒரே நாட்டில் ஒரே தலைவருக்குக்கீழ் ஒரே சமூகத்தில் ஒரு தாய் வயிற்றுப் பிள்ளைகள்போல் வாழ்பவர்கள். எமது தமிழ் மக்களை ஏன் இவ்வாறு பிரித்துக் காட்டுகின்றீர்கள்? இச்சபையிலே இருக்கின்ற நீதித்துறைக்

---

***** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

குப் பொறுப்பான முஸ்லிம் அமைச்சர் அவர்கள் எத்தனை பெண்களை விடுதலை செய்திருக்கிறார் என்பதை தெரிவிக்க அவரால் முடியுமா? எத்தனையோ தமிழ்ப் பெண் பிள்ளைகள் இன்றும் கைதிகளாகவே இருக்கிறார்கள். இந்தத் தமிழ் பேசும் அமைச்சர் அவர்கள் இதுவரையில் ஒரு தமிழ்ப் பெண் கைதியைக்கூட விடுதலை செய்வில்லை.

புனர்வாழ்வு அளிக்கப்பட்ட முன்னாள் பெண் போராளி களை முதன்முறையாக இச்சபைக்கு அழைத்து வந்திருக் கிறீர்கள்; நீங்கள் அவர்களைக் கைது செய்யாமல் விட்டிருந் தாலும் அவர்களால் இச்சபைக்கு வரமுடியும். அதாவது, கிளிநொச்சி, யாழ்ப்பாணம் மற்றும் முல்லைத்தீவு மாவட்டங் களைச் சேர்ந்த அவர்கள் படித்துப் பட்டம் பெற்று, அங்கிருந்தே பாராளுமன்ற உறுப்பினர்களாகத் தெரிவு செய்யப்பட்டு வருவார்கள். அப்படிப்பட்ட திறமைசாலிகளான பிள்ளைகளை நீங்கள் எங்களைப்போல தலைவாரி, உடை அணிந்து சாதாரணமான தோற்றத்துடன் கொண்டுவர வில்லையே! அவர்கள் முன்னாள் போராளிகள் என இச்சபைக்கும் ஊடகங்க ளுக்கும் இனங்காட்டுவதற்காக அவர்களுடைய தலைமயிரை வெட்டி மொட்டை அடித்து, வேறுபடுத்தி இனங்காணக்கூடிய வாறான தோற்றத்துடன் கொண்டு வந்திருக்கின்றீர்கள். [இடையீடு] நீங்கள் ஒரு தமிழ்பேசும் அமைச்சராக இருந்து கொண்டு இவர்களை இந்தத் தோற்றத்துடன் பார்த்துக் கொண்டிருக்கிறீர்கள். அவர்களுக்கு உடை வாங்கிக் கொடுப் பதற்கு உங்களிடம் பணமில்லாவிடில் எங்களிடம் அதற்குரிய நிதியைக் கேட்டிருக்கலாம். நாங்களே அவர்களுக்கு உடுப்பு வாங்கிக் கொடுத்துக் கூட்டிக்கொண்டு வந்திருப்போம். நானும் ஒரு பெண்ணாக இருப்பதனால் அவர்களை இந்தத் தோற்றத்தில் பார்ப்பதையிட்டு மிகவும் மனவருத்தப் படுகின்றேன். ஆனால், இங்கேயுள்ள முஸ்லிம் உறுப்பினர் ஒருவர் அதனை வரவேற்கிறார்; இப்படிச் செய்வது மன்னிக்க முடியாத குற்றம். நான் இச்செயற்பாட்டை வன்மையாகக் கண்டித்து, எனது பேச்சைத் தொடர்கின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

அந்தப் பிள்ளைகள் தொடர்பாக இவ்வளவு நேரமும் பேசினீர்கள். உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் மட்டுமே எஞ்சியுள்ளன.

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் பேசுவதற்கு அமைச்சருடைய நேரத்தில் சற்று நேரம் ஒதுக்கித் தாருங்கள்!

யுத்தம் நிறைவடைந்து இரண்டரை வருடங்கள் பூர்த்தியாகி யுள்ளபோதிலும் நாட்டிலுள்ள சிறைச்சாலைகளில் தடுத்து வைக்கப்பட்டுள்ள தமிழ் அரசியல் கைதிகள் தமது எதிர்காலம் குறித்துச் சிந்திக்க முடியாத நிலையிலே தடுத்து வைக்கப் பட்டுள்ளனர். கொழும்பு புதிய மகசீன் சிறைச்சாலை, வெலிக் கடைச் சிறைச்சாலை, வெலிக்கடைச் சிறைச்சாலைப் பெண்கள் பிரிவு, அனுராதபுரம் சிறைச்சாலை, வவுனியா சிறைச்சாலை, யாழ்ப்பாணம் சிறைச்சாலை உட்படப் பல சிறைச்சாலைகளில் 600க்கு மேற்பட்ட தமிழ் அரசியல் கைதிகள் தொடர்ந்தும் தடுத்து வைக்கப்பட்டுள்ளனர். இவர்களில் பலருக்கு எதிராக எவ்வித வழக்கும் தாக்கல் செய்யப்படாத நிலை காணப்படுகின்றது. வேறு பலருக்கு எதிராக வழக்குகள் தாக்கல் செய்யப்பட்டுள்ளபோதிலும் விசார ணைகள் தாமதமாகிச் செல்லும்நிலை காணப் படுகின்றது. வேறு பலர் விசாரணையோ, விடுதலையோ எதுவுமின்றித் தடுத்து வைக்கப்பட்டுள்ளனர். இத்தகைய அரசியல் கைதிகளை விடுதலை செய்வதற்கு நீதியமைச்சானது எத்தகைய நடவடிக்கையை எடுத்துள்ளது? என்று கேட் கின்றேன். நீண்ட காலமாக விசாரிக்கப்பட்டு வருகின்ற தமிழ் அரசியல் கைதிகள் தொடர்பான பெருமளவிலான வழக்கு களைத் துரிதப்படுத்துவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். இந்த அரசியல் கைதிகளின் விடுதலை தொடர்பாக நீதியமைச்சு உரிய திட்டங்களை வகுத்துச் செயற்பட வேண்டும். விசாரணை எதுவுமின்றி 15 வருடங்களுக்கும் அதிகமான காலம் சிறைச்சாலைகளில் தடுத்து வைக்கப் பட்டிருக்கும் தமிழ் அரசியல் கைதிகள் பலர் இருக்கின்றனர். இதேபோன்று வெலிக்கடை பெண்கள் சிறைச் சாலையில் பல வருடங்களாகத் தடுத்து வைக்கப்பட்டுள்ள பெண் அரசியல் கைதிகளையும் நான் பார்வையிட்டுள்ளேன். நாட்டில் நிலவிய யுத்த சூழ்நிலையின் காரணமாக இவர்கள் கைது செய்யப்பட வேண்டிய நிலை ஏற்பட்டது. ஆனால், தற்பொழுது யுத்தம் முடிவடைந்து நாட்டில் சுமுகநிலை தோன்றியுள்ள நிலையில், தடுத்து வைக்கப்பட்டுள்ள தமிழ் அரசியல் கைதிகள் அனைவரும் விடுவிக்கப்பட வேண்டும். இந்தக் கைதிகளை விடுதலை செய்வதற்கான நடவடிக் கைகளை நீதியமைச்சு படிப்படியாக மேற்கொள்ள வேண்டும். யுத்தத்தின்பொழுதும் அதன் பின்னரும் கைது செய்யப்பட்ட மற்றும் சரணடைந்த முன்னாள் போராளிகள் புனர்வாழ்வு அளிக்கப்பட்டு விடுவிக்கப்பட்டு வருகின்றமை வரவேற்கத் தக்க நடவடிக்கை யாகும். இதேபோல் தம்மையும் விசேட திட்டத்தின்கீழ் விடுவிக்க வேண்டும் என்பதே அந்தத் தமிழ் அரசியல் கைதி களின் கோரிக்கையாகும். எனவே, இவ் விடயத்தில் நீதி அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டும் என்று நான் கேட்டுக் கொள்கின்றேன்.

அனுராதபுரம் சிறைச்சாலையில் தடுத்து வைக்கப்பட்டுள்ள தமிழ் அரசியல் கைதிகள்மீது கடந்த மாதம் 27ஆம் திகதி தாக்குதல் நடத்தப்பட்டுள்ளது. சிறைக் காவலர்களினால் கைதிகள்மீது நடத்தப்பட்ட இந்தத் தாக்குதல் கண்டிக்கத் தக்கதாகும். அங்கு தடுத்து வைக்கப்பட்டுள்ள தமிழ் அரசியல் கைதிகளில் ஊனமுற்றவர்களும் உள்ளனர். இவர்கள்மீதும் தாக்குதல் நடத்தப்பட்டுள்ளது. இத்தகைய தாக்குதல்கள் சிறைச்சாலைகளில் இடம்பெறாதவாறு பார்த்துக்கொள்வது அரசாங்கத்தின் கடமையாகும்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

நன்றி. உங்களுடைய உரையை முடிக்கவும்.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

නැහැ, නැහැ. ඉවර නැහැ; තව තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

உரையாற்றும்போது அரியாசனக் கட்டளையைப் பின்பற்ற வேண்டும். மற்றவர்கள் சொல்வதைக் கேட்கக்கூடாது. எனவே, இப்பொழுது உங்களுடைய பேச்சை முடித்துக்கொள்ளுங்கள்!

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

சிறைச்சாலைகளில் தமிழ் அரசியல் கைதிகளின்மீது நடத்தப்படும் தாக்குதலானது தொடர்ந்து நடைபெற்று வருகிறது. தமிழ் அரசியல் கைதிகள் முன்னர் பல தடவைகள் களுத்துறைச் சிறைச்சாலையில் தாக்கப்பட்டனர். சிறைச்சாலை களில் இவ்வாறான தாக்குதல்கள் தொடர்வதை அரசாங்கம் அனுமதிக்கக்கூடாது. அனுராதபுரம் சிறைச்சாலையில் -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
நல்லது, உங்களுடைய உரையை முடித்துக்கொள்ளுங்கள்!

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
நேரம் போதாமையால், இத்துடன் எனது உரையை நிறுத்துகின்றேன். நன்றி.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු චන්ද්‍රසිරි ගජදීර ඇමතිතුමා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මිනිත්තු 14ක් තිබෙනවා.

[අ. භා. 12.15]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon.Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු විජයකලා මහේස්වරන් මන්ත්‍රීතුමිය හරි වේදනාවෙන් කථා කළා. මා කියන්න කැමැතියි, එතුමිය සතුටු වෙන්න ඕනෑ කියලා. මොකද, වෙනම රාජ්‍යයක් ඉල්ලලා, වෙනම පාර්ලිමේන්තුවක් ඉල්ලලා, වෙනම උසාවියක් ඉල්ලලා, වෙනම පොලීසියක් ඉල්ලලා සටන් කරපු තරුණ තරුණියන් අද ස්ව කැමැත්තෙන් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා, මේ සභා ගර්භයේ මේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශය ගැන, අප අදහස් හුවමාරු කර ගන්නා විධිය ගැන බලා ගෙන සිටියා. ගරු විජයකලා මහේස්වරන් මන්ත්‍රීතුමියනි, ඔබතුමිය බොහෝ සෙයින් කනගාටු වුණා. පසු ගිය කාලයේ ආයුධ ගත්තු මේ තරුණ තරුණියන්12,000කට ආසන්න සංඛ්‍යාවක් අපේ භාරයේයි සිටියේ. මේ අය නිවැරැදි විධියට පුනරුත්ථාපනය කිරීමේ ප්‍රතිඵලය තමයි අද දකින්න තිබෙන්නේ. මා හිතන හැටියට, ලෝක ඉතිහාසයේ කවරම තැනකවත් නොවන සිද්ධියක් අද වුණේ. තමන්ගේ ආණ්ඩුවට එරෙහිව ආයුධ ගත්තු තරුණ තරුණියන් අද පාර්ලිමේන්තුවට අර ගෙන ඇවිල්ලා, මෙන්න අපේ පුනරුත්ථාපන ක්‍රියාවලියේ හැටි බලා ගන්නය කියලා, අතිගරු ජනාධිපතිතුමාගේ ආණ්ඩුව ලෝකයට ආදර්ශයක් දුන්නා. ඒ නිසා ඔබතුමන්ලා මේ ආදර්ශය ගැන සතුටු වෙන්න ඕනෑ.

අපි පසු ගිය කාලයේ මේ අය කඳවුරු මානසිකත්වයෙන් ඉවත් කළා; කඳවුරුවලින් එළියට ගත්තා. අපේ බන්ධනාගාර ප්‍රතිපත්තියත් ඒකයි. මෙය කඳවුරු තුළ සිර කරන්නේ නැතිව මානසික නිදහස දෙන වැඩ පිළිවෙළක්. අපි උතුරේ අය දකුණට ගෙන ගියා; දකුණේ අය උතුරට අර ගෙන ගියා. ඒ මඟින් අපි ජාතීන් අතර තිබුණු අවිශ්වාසය නැති කළා; මිත්‍රත්වය ගොඩ නඟන්න ක්‍රියා කළා. ඒ නිසා මා කියන්න ඕනෑ, අද මේ දරුවන් ඒ මධ්‍යස්ථානවල ඉතා දක්ෂ විධියට හොඳින් පුහුණු වන බව.

අපි පුහුණු ඒකක 19ක් ක්‍රියාවට නඟලා තිබෙනවා. ඒ දරුවන් පුහුණු වෙන කොට, ඒ අයගේ ආර්ථිකය සවිමත් කරන්න අපි වෙනම ණය වැඩ පිළිවෙළක් සැලසුම් කරලා තිබෙනවා. මම අහනවා, ලංකා ඉතිහාසයේ සියයට හතරක පොලියකට ණය දීපු අවස්ථාවක් තිබෙනවාද කියලා. පළමුවැනි වසර ණය ගෙවීමෙන් නිදහස්. පොලිය විතරයි ගෙවන්නේ. දස අවුරුදු කාලයක ආපසු ණය ගෙවීමේ ක්‍රියාවලියට අපි මේ අය යොමු කරලා ආර්ථික වශයෙන් සවි බල ගන්වලා තිබෙනවා. ඒ නිසා ගරු මහේස්වරන් මන්ත්‍රීතුමියට මම කියනවා, මේ පිටවෙච්ච සියලු දෙනා අපි අද යළි එකතු කර තිබෙන බව. ක්‍රීඩා ක්ෂේත්‍ර තුළ, කලා ක්ෂේත්‍ර තුළ-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමා,-

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මගේ කාලය ගන්න එපා, ගරු මන්ත්‍රීතුමා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Are you giving way, Hon. Minister? You have limited time.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමා, තමුන්නාන්සේ කියපු පොලිය අර රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි වීම වාගේ එකක්ද?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු මන්ත්‍රීතුමා, මම ඒකට උත්තර දෙන්නම් ඔබතුමාට. අනාගත නායකයකු වෙන්න බලා ගෙන ඉන්න ඔබතුමා වාගේ කෙනෙක් මගේ විනාඩි 14 කොල්ල කන්න එපා. මා කියන්න කැමැතියි, අප ගෙන ගිය ඒ ක්‍රියාවලිය තුළ අද විශාල පිබිදීමක් තිබෙන බව. ඒ තරුණ කොටස් ආයෙත් දකුණට එනවා. පාපන්දු කණ්ඩායම, ක්‍රිකට් කණ්ඩායම, වොලි බෝල් කණ්ඩායම දකුණට එනවා. ඒ කණ්ඩායම් එනවා පමණක් නොවෙයි. ජාතික සංචිතයට ඒ අය තෝරා ගන්න වැඩ පිළිවෙළක් ක්‍රීඩා අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධ වෙලා අපි මේ මාසයේ ආරම්භ කරලා තිබෙනවා. එහෙම තමයි, අපේ දරුවන්ට වාගේයි අප සලකන්නේ. අපේ ගරු විජයකලා මන්ත්‍රීතුමියටත්, අපේ අනෙකුත් ගරු මන්ත්‍රීවරුන්ටත් මම කියනවා, වේදනාව දැනෙන්න තිබුණේ අද නොවෙයි කියා. ඒ දරුවන් බලෙන් අර ගෙන ගිහින් තුවක්කුව කරට දීපු වෙලාවේ, ඒ දරුවන් බංකර් තුළ කඳුළු හල හලා වේදනාවෙන් හිටපු වෙලාවේ තමයි දුක් වෙන්න තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය පාසල් අධ්‍යාපනයට යොමු කරන්න අපි කටයුතු කළා. පාසල් අධ්‍යාපනය කඩාකප්පල් වෙච්ච දරුවන් සාමාන්‍ය පෙළ සමත් කරවන්න, උසස් පෙළ අධ්‍යාපනය ලබා දෙන්න අපයි ක්‍රියා කරලා තිබෙන්නේ. 426 දෙනෙක් උසස් පෙළ විභාගයට වාඩි වුණා, ගියඅවුරුද්දේ. 222 දෙනෙක් විෂයයන් තුනම සමත් වුණා. විශ්වවිද්‍යාලයට ගිය අයත් ඉන්නවා. ඒ අතර වෛද්‍ය පීඨයට ගිය අයත් ඉන්නවා. මේක තමයි රජයක් හැටියට අපේ වගකීම. බාර වූ සියලු දෙනාම අපේ රැකවරණයේ තියා ගෙන, විනාශ කරන්නේ නැතිව, මානව දයාවෙන් යුක්තව ඔවුන්ගේ හදවත් වෙනස් කරලා අපි ඔවුන් මේ රටේ වටිනා සම්පතක් විධියට පරිවර්තනය කරලා තිබෙනවා. ගරු විජයකලා මහේස්වරන් මන්ත්‍රීතුමියනි, ඒ නිසා ඔබතුමිය අපට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. හැඟීම් බරව කල්පනා කරන්න එපා. මේ ක්‍රියාවලිය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා ගත්තු උත්සාහය අපි අගය කරනවා. අපේ පුනරුත්ථාපන කාර්යාංශය ගත්තු වෙහෙස අපි අගය කරනවා. අපට පෙරාතුව පටන් මේ පුනරුත්ථාපන ක්‍රියාවලිය ගෙන ගිය ගරු ඩිව් ගුණසේකර

ඇමතිතුමා ඇතුළු අමාත්‍යාවරුන්ට සහ පුනරුත්ථාපන කාර්යාංශයේ සියලු දෙනාටම අපේ ගෞරවය අපි පිරිනමනවා. මම මීට වඩා ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ වැඩ පිළිවෙළට සහභාගි වෙච්ච කෙනෙක්. තල් රුප්පාවෙන් පොල් රුප්පාවට යන ගමනේදී ඔබතුමා මරදානේ දුම්රිය නැවතුම් පොළේදී මේ අය ආමන්ත්‍රණය කළා. කොයි තරම් සහෝදර බැම්මකින් යුක්තව උතුර දකුණු එකතු කරන්න අපි ක්‍රියා කළාද කියලා ඔබතුමා දන්නවා. නමුත් මම කියන්න කැමැතියි, ඒක වෙනස් කරන්න ජාතිවාදී, අවස්ථාවාදී බලවේග ක්‍රියා කරනවා කියලා.

පසු ගිය දවස්වල අනුරාධපුර බන්ධනාගාරයේ සිද්ධියක් වෙන්න ගියා. අපේ නිලධාරින්ට අපි ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. ඇත්ත තමයි, අපට ප්‍රමාණවත් නිලධාරින් සංඛ්‍යාවක් හිටියේ නැහැ. පසු ගිය 27වැනිදා මහවිරු දිනය සමරන්න හැදුවා. මහවිරු දිනය සැමරුවා නම් මොකක්ද වෙන්නේ? නැවත වරක් මේ රටේ බෙදීමක්, කලු ජූලියක් බන්ධනාගාර තුළින් පටන් ගන්නේ. ඒ බෙදුම්වාදී ඉරණම වෙනස් කරන්න අපේ නිලධාරින් දක්ෂ වුණා. ඒ අවස්ථාවේ අත් අඩංගුවට ගත් ජංගම දුරකථන අතර 3G වර්ගයේ තාක්ෂණයෙන් ඉතාම ඉහළ දුරකථන තිබුණා. බටහිර බලවේගත් එක්ක සම්බන්ධ වෙලා -සමහර බලවේග තමුන්නාන්සේලා නොදන්නවා වෙන්න පුළුවන්- යළිත් වරක් ජාතිවාදී ගිනි සුළු අවුළුවන්න ක්‍රියා කර ගෙන යනවාය කියන එක අපි තේරුම් අරන් තිබෙනවා. අපි ඔක්කෝම එකතු වෙලා ඒකට විරුද්ධ වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම බන්ධනාගාර ක්ෂේත්‍රයේ නැවුම් වෙනසකට අපි ආරම්භයක් තියලා තිබෙනවා. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා විශාල මුදලක් අපට වෙන් කරලා තිබෙනවා. බන්ධනාගාර නගරයෙන් පිටතට ගෙනි යන්න ගත්ත ක්‍රියාවලියට තවත් රුපියල් මිලියන 500ක් දුන්නා.

අද බන්ධනාගාරවලට එන දුප්පත් අහිංසක මිනිස්සු වැඩි දෙනෙක් එන්නේ දඩ ගෙවා ගත නොහැකිවයි. ඒ අය වෙනුවෙන් මුදලක් වෙන් කරලා, ඒ අයගේ භාරකරුවන්ට ඒ මුදල් දීලා, ඒ අය නැවත වරක් සමාජ ක්‍රියාවලියට එකතු කරලා ආර්ථිකයට දායක කර ගන්නා වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒක තමයි අපේ ප්‍රජා විශෝධන ක්‍රියාවලිය. අපේ ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ශක්තිමත්. අපි ඒ අය ජාතික ආර්ථිකයට සම්බන්ධ කර ගෙන ආර්ථිකය සවිමත් කරන වැඩ පිළිවෙළකට ගෙන යමින් තිබෙනවා. ඒක තමයි අද බන්ධනාගාර තුළ ඇති වෙච්ච වෙනස. බන්ධනාගාර තුළ අඩු පාඩුකම් තිබෙනවා. නිලධාරින්ගේ හිඟයක් තිබෙනවා. සමහර ප්‍රශ්නවලට විසඳුම් සොයන්න නම් නව තාක්ෂණය ගලපාගන්න ඕනෑ. පද්ධති ක්‍රමය දියුණු කරන්න ඕනෑ. අපි ඒවා පිළිගන්නවා. වෙනස් කළ යුතු දේවල් හුඟක් තිබෙනවා. පරිපාලනමය වශයෙන්,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දීමනා, දීමනා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ දීමනාත් මේ මාසයේ අන්තිම වෙන්න ඉස්සෙල්ලා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න ඕනෑ පරිසරය තුළින් වෙනසක් කරන්න අපි අද වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙන බව. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! He is not giving way.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
පරිසර බන්ධනාගාර ආරම්භ කරන්න, සංචාරක බන්ධනාගාර ආරම්භ කරන්න අපි සැලසුම් කරලා තිබෙනවා විතරක් නොවෙයි, ඔවුන්ගේ මානසිකත්වය වෙනස් කරන්න අවශ්‍ය විධිමත් වැඩ පිළිවෙළක් බන්ධනාගාර තුළ අරගෙන යනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, go to your seat, please.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒක නිසා පසු ගිය කාලයේ තිබුණු හුඟක් අඩු පාඩු අපට වෙනස් කරන්න පුළුවන්කම තිබුණා. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Go to your seat and raise your point of Order.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
සමහර රුදවියන් මේ කෙටි කාලය තුළ,- [බාධා කිරීමක්] අපට තිබුණු චෝදනා හුඟක් අඩුයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Yes.What is your point of Order, Hon. Sajith Premadasa?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මාධ්‍යවලින් ලැබුණු චෝදනා විතරක්,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, point of Order. [බාධා කිරීමක්] කවදාද දීමනා ටික දෙන්නේ? ඇමතිතුමා, හරියට දිනය කියන්න. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

There is no point of Order in what you are saying. - [*Interruption.*] Please sit down.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ඒ විමර්ශනය තුළින් අපි නිවැරදි තීන්දු ගත්තා. දිය යුතු දඬුවම ඉහළ සිට පහළට අපි හරියට අරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා නිලධාරින්ගේ විශ්වාසයක් තිබෙනවා. තමුන්නාන්සේලා මොනවා කිව්වත්, ඒ දීමනා දෙනවා. ඒක අපි වළක්වන්නේ නැහැ. ඒ නිලධාරින්ට දීමනා විතරක් නොවෙයි, ඔවුන් ප්‍රබෝධවත් කරන වැඩ පිළිවෙළක්, නිසි වෙලාවට උසස්වීම් දෙන, දක්ෂයා ඉස්සරහට ගෙන යන වැඩ පිළිවෙළක් බන්ධනාගාර ක්ෂේත්‍රය තුළ හදලා ඉවරයි. ඒ නිසා බන්ධනාගාරයට ඕවා දාලා නිලධාරින් පොළඹවා ගන්න බැරි බව මම කියනවා. [බාධා කිරීමක්]

සරත් ෆොන්සේකා මැතිතුමා ගැන කියැවුණා. ඒ නිසා මම කියන්නට ඕනෑ, සරත් ෆොන්සේකා මැතිතුමා බන්ධනාගාරය තුළ හොඳම සැප විඳින බව. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නායකයෙක් නම්, මම රිමාන්ඩ් එක ඇතුළේ හිටියා නම් මම කන්නේ අනෙක් රැඳවියන් ගන්නා ආහාර. මම ඉන්නේ ඒ කුටිවල. වෙනම විශේෂ ඒකකයකට, සෞඛ්‍ය ආරක්ෂිත වැඩ පිළිවෙළකට යන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහු හැමදාම පෞද්ගලික රෝහලට එක්ක යනවා. අධිකරණය විසින් නියම කරන ඒවා පමණක් නොවෙයි, එතුමා ඉල්ලන දේත් අපි දීලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Yes. What is your point of Order, Hon. Dayasiri Jayasekara?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මම අහන්න කැමැතියි,- [බාධා කිරීමක්] ඇමතිතුමා, ඒ විධියට සැප විඳින්නේ සරත් ෆොන්සේකාද, කේපී ද කියලා මම අහන්න කැමැතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

That is not a point of Order. Hon. Minister, you may continue.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

එතැන ඉඳ ගෙන මාධ්‍යයට අදහස් දෙන්න යනවා නම් ඒවා වැරැදියි. බන්ධනාගාරයේ ඉන්න කෙනෙකුට මාධ්‍යයට ප්‍රකාශයන් කරන්නට අයිතියක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බන්ධනාගාර ආඥාපනත යටතේ ඒවා දඬුවම් කරන්න පුළුවන් වැරැදි.

මාධ්‍යයට ප්‍රකාශ කරනවා; උසාවියට යනවා. මාධ්‍යයටත් සදාචාරාත්මක වග කීමක් තිබෙනවා, ඒ වාගේ කෙනෙකු අමාරුවේ නොදා ඉන්න. කොමසාරිස් ජනරාල්වරයාට පුළුවන් ඒ වෙනුවෙන් නීතිමය විධියට ක්‍රියා කරන්න. නමුත් ඒ විනය කැඩුවා වුණත් අපි ඔහුව අර ගෙන යනවා. අපට කිව්වාම අසනීපයි කියලා, අපි පෞද්ගලික රෝහලටත් ගෙන යනවා. ඒ යන කොටත් මාධ්‍යයට ප්‍රකාශ කරනවා. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please!

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ඒ නිසා තමුන්නාන්සේලා කාටවත් කියන්න පුළුවන්කමක් නැහැ, සරත් ෆොන්සේකා මැතිතුමා- [බාධා කිරීමක්] එතුමා හිරකරුවෙකු හැටියට, වරදකරුවෙකු හැටියටයි ඉන්නේ කියලා. [බාධා කිරීම්] නැහැ, දේශපාලන නොවෙයි. අපට ඔහු වරදකරුවෙක්. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Sajith Premadasa, I believe you can lead the others well. - [*Interruption.*] To have Order in the House, I believe you can lead the other Members well. - [*Interruption.*]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

තමුන්නාන්සේලා කියන හිරිහැර කිරීම්, වෙනස්කම් අපේ බන්ධනාගාරයන් තුළ නැහැයි කියලා අප කියනවා. එහෙම නැහැයි කියා අපි කියනවා. එතුමා වෙනුවෙන් සමහර ගරු මන්ත්‍රීතුමන්ලා පෙනී සිටින්නේ බොරුවටයි. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් කැමැතියි, එතුමා හිරේ ඉන්නවා නම්. [බාධා කිරීම්] ඔව්, ඉන්නවා නම්, කැමැතියි. මම කියන්න කැමැතියි, බන්ධනාගාරය තුළ ඔය කියන නායකකම් අපට නැහැයි කියලා. අපට කවුරුත් එකයි. බන්ධනාගාරය තුළ ඉන්න කවුරුත් අපට එකයි. අපි කාටත් බන්ධනාගාරය ඇතුළේ සාධාරණ විධියටයි සලකන්නේ. තමුන්නාන්සේලාට නායකකම් තිබෙන්න පුළුවන්. නමුත් අපට බන්ධනාගාරය තුළ නායකකම් නැහැ. අපට කවුරුත් එකයි. ඒ හැම කෙනෙකුට, රටේ පවතින සාධාරණ නීතිය අනුව, සාධාරණ යුක්තිය අනුව කටයුතු කර තිබෙනවා. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Hon. Sajith Premadasa, you know the Standing Orders well. Let the Minister continue his speech.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ඒ නිසා අපි කාටත් සමානව සලකන ප්‍රතිපත්තියක් යටතේ තමයි බන්ධනාගාරයේ කටයුතු කර ගෙන යන්නේ. කාටත් සමාන ප්‍රතිපත්තියක් යටතේ එක් කෙනෙකුට නොවෙයි, කිසිම කෙනෙකුට විශේෂ හිරිහැර කරන ප්‍රතිපත්තියක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ ඇත්තේ නැහැ. කාටත් සමාන විධියට

සලකනවා. ඒක නිසා තමයි අද ඒවා ඇතුළේ දූෂණ අඩු වෙලා තිබෙන්නේ. ඒ අයගේ විශ්වාසයක් ගොඩ නැඟිලා තිබෙනවා. රැඳවියන් විශ්වාසයකින් ඉන්නවා, අපේ ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළ නිසා. ඔබතුමා දන්නවා, පසු ගිය කාලය තුළ අපි ඔවුන්ගේ කුසලතා දියුණු කරන්න කොහොමද ක්‍රියා කළේ කියලා. පාපන්දු කණ්ඩායම් හදලා තිබෙනවා. නැටුම් කණ්ඩායම් හදලා තිබෙනවා. ආගමික මෙහෙවර ඉස්සරහට ගෙන යන්න ක්‍රියා කරලා තිබෙනවා.

මම කියන්නම්, ඉතාම වැදගත් සිද්ධියක්. ලංකා ඉතිහාසයේ නොවෙයි, ලෝක ඉතිහාසයෙත් බන්ධනාගාරයක් ඇතුළත ඇස් දන් දීමේ වැඩ පිළිවෙළකට පෙළඹුණා නම් ඒ පළමු වැනි වතාවට මේ වසරේයි. ඒකටත් තෝරා ගත්තෙත් අතිගරු ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තියයි. දහස් ගණනක් රැඳවියන් සිය කැමැත්තෙන් ඇවිල්ලා ඇස් දන්දීමේ පොරොන්දු පත්‍ර භාර ගත්තා. මේක තමයි වෙනස. මේ වෙනස තමයි අපට අවශ්‍යා. මේක තමයි අපේ පුනරුත්ථාපන ක්‍රියාවලියේ වැදගත්කම. ඒ නිසා අද අපේ රටට ගැළපෙන, අපේ සංස්කෘතියට ගැළපෙන, අපේ සදාචාරයට ගැළපෙන පුනරුත්ථාපන ක්‍රියාවලියක් අපි මේ සියලු ක්ෂේත්‍ර තුළ කරගෙන යනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ඒ අංශ හතරටම පැවරිච්ච වගකීම තමයි පුනරුත්ථාපනය ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම. ඒ වෙනුවෙන් ඒකාබද්ධ වැඩ පිළිවෙළක් -එක අංශයක් එක විධියකට නොවෙයි, සමස්ත වැඩ පිළිවෙළක්- යටතේ කටයුතු කරන අවස්ථාවේ අතිගරු ජනාධිපතිතුමා විශේෂ අනුග්‍රහය දැක්වීම අප විශේෂයෙන්ම අගය කළ යුතුයි. ඒ වාගේම මුදල් අමාත්‍යාංශය, අපි ගැන, අපේ ක්‍රියා මාර්ගය ගැන, ආර්ථික වශයෙන් බන්ධනාගාරය ස්වයං යැපුම් මට්ටමකට ගෙන එන්න ගත්තු උත්සාහය අගය කරමින් මෙවර දක්වපු විශේෂත්වය අපි අගය කරනවා. ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, කොමසාරිස් ජෙනරාල්තුමා ඒ වාගේම අනෙකුත් සියලුම කාර්ය මණ්ඩලවල සියලු නිලධාරින්ට අපේ ස්තුතිය මේ අවස්ථාවේදී පිරිනමමින් අපි ඉදිරියේදී ගෙන යන වැඩ පිළිවෙළ සාර්ථක කරන්න, එකට එකතු වෙලා සහයෝගයෙන් වැඩ කටයුතු කරන්න සියලු දෙනාටම ආරාධනා කරමින්, සාමයෙන් පිරි රටක් තුළ එකට සහජීවනයෙන් ජීවත් වීමේ අවස්ථාව උදා කර ගන්න, ජාතිවාදී බලවේග පරාජය කරන්න ආරාධනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

"110 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 312,605,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය"යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

110 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 40,795,000

"110 වන ශීර්ෂයෙහි 01වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 40,795,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය"යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

110 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**228 වන ශීර්ෂය.- අධිකරණ පරිපාලනය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 3,005,565,000

"228 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 3,005,565,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

228 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 671,693,000

"228 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 671,693,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය"යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

228 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**231 වන ශීර්ෂය.- ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 8,790,000

"231 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 8,790,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය"යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

231 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 610,000

"231 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 610,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

231 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**233 වන ශීර්ෂය.- රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 80,165,000

"233 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 80,165,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

233 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 105,300,000

"233 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 105,300,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

233 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**235 වන ශීර්ෂය.- නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 10,875,000

"235 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 10,875,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

235 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 1,000,000

"235 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

235 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 110, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 312,605,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 110, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள் -மூலதனச் செலவு ரூபா 40,795,000

"தலைப்பு 110, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 40,795,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 110, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 228.- நீதிமன்ற நிருவாகம்**

நிகழ்ச்சித்திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 3,005,565,000

"தலைப்பு 228, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 3,005,565,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 228, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 671,693,000

"தலைப்பு 228, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 671,693,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 228, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 231.- கடன் இணக்கச்சபைத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள் -மீண்டுவருஞ் செலவு ரூபா 8,790,000

"தலைப்பு 231, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 8,790,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 231, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 610,000

"தலைப்பு 231, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 610,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 231, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 233.- அரசாங்க பகுப்பாய்வாளர் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 80,165,000

"தலைப்பு 233, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 80,165,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 233, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள் -மூலதனச் செலவு ரூபா 105,300,000

"தலைப்பு 233, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 105,300,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 233, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 235.- சட்ட ஆணைக்குழுத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 10,875,000

"தலைப்பு 235, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 10,875,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 235, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள் -மூலதனச் செலவு ரூபா 1,000,000

"தலைப்பு 235, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 1,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 235, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 312,605,000, for Head 110, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 110, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 40,795,000

Question, "That the sum of Rs. 40,795,000, for Head 110, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 110, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 228. - COURTS ADMINISTRATION

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 3,005,565,000

Question, "That the sum of Rs. 3,005,565,000, for Head 228, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 228, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 671,693,000

Question, "That the sum of Rs. 671,693,000, for Head 228, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 228, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 231. - DEPARTMENT OF DEBT CONCILIATION BOARD

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 8,790,000

Question, "That the sum of Rs. 8,790,000, for Head 231, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 231, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 610,000

Question, "That the sum of Rs. 610,000, for Head 231, Programme 01, Capital Expenditure, be inserted in the Schedule " put and agreed to.

Head 231, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 233. - DEPARTMENT OF GOVERNMENT ANALYST

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 80,165,000

Question, "That the sum of Rs. 80,165,000, for Head 233, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 233, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 105,300,000

Question, "That the sum of Rs. 105,300,000, for Head 233, Programme 01, Capital Expenditure, be inserted in the Schedule " put and agreed to.

Head 233, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 235. - DEPARTMENT OF LAW COMMISSION

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 10,875,000

Question, "That the sum of Rs. 10,875,000, for Head 235, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 235, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 1,000,000

Question, "That the sum of Rs. 1,000,000, for Head 235, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 235, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

"174 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.168,615,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

174 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩ සටහන - මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 104,450,000

"174 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.104,450,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

174 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**232 වන ශීර්ෂය.- බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 3,532,555,000

"232 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. රු.3,532,555,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

232 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 428,000,000

"232 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 428,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

232 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**326 වන ශීර්ෂය.- ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 67,830,000

"326 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 67,830,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

326 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 20,550,000

"326 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 20,550,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

326 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 174, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 168,615,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 174, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -மூலதனச் செலவு ரூபா 104,450,000

"தலைப்பு 174, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 104,450,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 174, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 232.- சிறைச்சாலைகள் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -மீண்டுவருஞ் செலவு ரூபா 3,532,555,000

"தலைப்பு 232, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 3,532,555,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 232, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -மூலதனச் செலவு ரூபா 428,000,000

"தலைப்பு 232, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 428,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 232, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 326.- சமூக அடிப்படையிலான சீர்திருத்தத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -மீண்டுவருஞ் செலவு ரூபா 67,830,000

"தலைப்பு 326, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 67,830,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 326, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -மூலதனச் செலவு ரூபா 20,550,000

"தலைப்பு 326, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 20,550,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 326, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 168,615,000, for Head 174, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 174, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 104,450,000

Question, "That the sum of Rs. 104,450,000, for Head 174, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 174, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 232.- DEPARTMENT OF PRISONS

Programme 01.- Operational Activities - Recurrent Expenditure Rs. 3,532,555,000

Question, "That the sum of Rs. 3,532,555,000, for Head 232, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 232, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 428,000,000

Question, "That the sum of Rs. 428,000,000, for Head 232, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 232 Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 326.- DEPARTMENT OF COMMUNITY BASED CORRECTIONS

Programme 01.- Operational Activities - Recurrent Expenditure Rs. 67,830,000

Question, "That the sum of Rs. 67,830,000, for Head 326, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 326, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 20,550,000

Question, "That the sum of Rs. 20,550,000, for Head 326, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 326 Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The Sitting is suspended till 1.00 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி. ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமைவகித்தார்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.*

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Now, we take up the Votes of the Ministry of Public Administration and Home Affairs - Heads 121, 253-279, Votes of the Ministry of Local Government and Provincial Councils - Heads 130, 312-319, 321 and the Votes of the Ministry of National Languages and Social Integration - Heads 134 and 236. I call upon the Hon. Wasantha Aluwihare to move the cut.

121 වන ශීර්ෂය.- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 485,725,000

**தலைப்பு 121.- பொதுநிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01 .- செயல்முறைச் செயற்பாடுகள் -மீண்டுவருஞ் செலவு ரூபா 485,725,000

HEAD 121.- MINISTER OF PUBLIC ADMINISTRATION AND HOME AFFAIRS

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 485,725,000

**130 වන ශීර්ෂය.- පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 181,660,000

**தலைப்பு 130.- உள்ளூராட்சி மாகாண சபைகள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.-செயல்முறைச் செயற்பாடுகள் -மீண்டுவருஞ் செலவு ரூபா 181,660,000

HEAD 130.- MINISTER OF LOCAL GOVERNMENT AND PROVINCIAL COUNCILS

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 181,660,000

**134 වන ශීර්ෂය.- ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩ සටහන - පුනරාවර්තන වියදම,
රු. 119,550,000

**தலைப்பு 134.- தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -மீண்டுவருஞ் செலவு ரூபா 119,550,000

HEAD 134.- MINISTER OF NATIONAL LANGUAGES AND SOCIAL INTEGRATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 119,550,000

[අ. භා. 1.02]

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2012 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින සාකච්ඡා වන "121, 253 - 279, 130, 312-319, 321, 134 සහ 236 යන ශීර්ෂවලට අදාළ අමාත්‍යාංශ සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල හා ආයතනවල සියලුම පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය"යි මම යෝජනා කරමි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින සාකච්ඡා වන වැය ශීර්ෂ අතරින් පළාත් පාලන හා පළාත් සභා විෂයය යටතේ කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වනවා. පළාත් සභා ක්‍රමයට වයස අවුරුදු 23ක් පමණ වන නමුත් තවමත් ළදරු වියේ පසු වන පළාත් සභා ක්‍රමයක් තමයි අපේ රටේ තිබෙන්නේ. මේ පළාත් සභා ක්‍රමය ආරම්භ කළේ ඉන්දු-ලංකා සාම ගිවිසුමේ ප්‍රතිඵලයක් හැටියටයි. හිටපු ජනාධිපති දිවංගත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ ඇති කර ගත් සාම ගිවිසුමත් එක්ක ඉන්දියාවට අවශ්‍ය වෙලා තිබුණා, බලය විමධ්‍යගත කිරීම සඳහා පළාත් සභා ක්‍රමය ඇති කරන්න. ඒ නිසා එදා ඒ ද්‍රවිඩ ජනතාවගේ ඉල්ලීම මත 1987 දී මේ ක්‍රමය ස්ථාපිත කළා. එදා සිට අද දක්වා බැලූ විට මම ඉස්සෙල්ලා කියපු විධියට මේ පළාත් සභා ක්‍රමයට වයස අවුරුදු 23ක් වුණත් තවම ළදරුවෙක් වාගෙයි. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාවලට දිය යුතු බලතල තවමත් ලැබී නැහැ.

මට මතකයි, එදා 1988 පළාත් සභා මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය ඊට ඉදිරිපත් වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණත් ඉදිරිපත් වුණේ නැහැ. එදා පළාත් සභා ක්‍රමය දැඩි විවේචනයකට ලක් වුණා. ඒ අය පළාත් සභා ක්‍රමය අනුමත කළේ නැහැ. රටේ උද්ඝෝෂණ ඇති කළා. අන්තිමට ඒ අය මොකක්ද කිව්වේ? පළාත් සභාව සුදු අලියෙක්ය කිව්වා. ජනතා විමුක්ති පෙරමුණ අදටත් ඒ ප්‍රකාශය කරනවා. එදා 1988 දී එක්සත් ජාතික පක්ෂයත්, මහජන පක්ෂයත් ඉදිරිපත් වෙලා පළාත් සභාව පිහිටෙව්වා. ඒ මැතිවරණයෙන් පසුව පළාත් සභාව අවුරුදු පහක් ඒ ප්‍රදේශවල ග්‍රාමීය සංවර්ධනය සඳහා කටයුතු කළා. ඒ අවුරුදු පහ අවසන් වුණායින් පසුව ඊළඟ පළාත් සභා මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණත්, අනිත් පක්ෂත් කල්පනා කළා, අපිත් පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වෙන්න ඕනෑය කියා. මොකද, ඒ කාල සීමාව තුළදී පළාත් සභා බලය විමධ්‍යගත කර තිබුණු විධියට ග්‍රාමීය සංවර්ධනය සඳහා තමයි ඒ කටයුතු ක්‍රියාත්මක වුණේ.

[ගරු වසන්ත අලුවිහාරේ මහතා]

කලින් වතාවේ උද්ඝෝෂණය කරපු අය, පළාත් සභා එපා කියපු අය, පෙළපාළි ගියපු අය, පළාත් සභා අවශ්‍යයි කියා දෙවන වතාවේදී පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණා. එහෙම ඉදිරිපත් වුණාම ඒ අයට අවස්ථාවක් ලැබුණා තමන් නියෝජනය කරන ප්‍රදේශ පළාත් සභා අරමුදල්වලින් සංවර්ධනය කරන්න.

එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ යන පක්ෂ සියල්ලම ඉදිරිපත් වෙලා ඒ පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන්න කටයුතු කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එදා මේ පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරලා බලාපොරොත්තු වුණේ මොකක්ද? පළාත් සභාවලට ලැබිලා තිබෙන බලය, නැවත පළාත් සභාවලට ගන්න ඕනෑ කියලා එදා සියලුම පක්ෂ එකතු වෙලා කථා කළා. මධ්‍යම ආණ්ඩුවෙන් ඒවා ඉල්ලුවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නමුත් කියන්න කනගාටුයි එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබුණ කාලයේත් ඒ ලබා දුන්න බලය, සමහර විෂයයන්වල බලය මධ්‍යම ආණ්ඩුවට පවරා ගත්තා කියන එක. අද දක්වා පළාත් සභාවලට තිබෙන බලතල මධ්‍යම රජයට පවරා ගන්නවා. ඇයි, මේවා මධ්‍යම රජයට පවරා ගන්නේ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොලිස් බලතලත්, ඉඩම් බලතලත් දෙන්න කියලා ඉන්දියාව බලපෑම් කරනවා. රජය කියනවා ඒවා දෙන්න විධියක් නැහැ, දෙන්න බැහැයි කියලා. ඒ බලතල දෙන්න බැරි නම් අඩු ගණනේ සෞඛ්‍ය, අධ්‍යාපනය, කෘෂි කර්මාන්තය සම්බන්ධ බලතල ටිකවත් දෙන්න ඕනෑ. රේඛීය අමාත්‍යාංශයෙන්, මධ්‍යම ආණ්ඩුවෙන් ඒ සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගන්න පුළුවන්. ඒ අය මේවා ක්‍රියාත්මක කරන්නේ කොයි විධියට ද කියලා බලන්න පුළුවන්. නමුත් ඒ බලතල සියල්ලම මධ්‍යම ආණ්ඩුව යටතේ තියා ගෙන තමයි අද මේ පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක වන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විධියට ක්‍රියාත්මක වන විට ඒ විෂයයන්වලට තිබෙන අසාධාරණකම් මොනවාද කියලා අපි බලන්න ඕනෑ. විශේෂයෙන් ග්‍රාමීය විදුලිය සඳහා ඉතිහාසයේ හැම දාම අය වැය තුළින් විදුලිබල මණ්ඩලයට මුදලක් වෙන් කර තිබුණා. නමුත් සමහර පළාත් සභාවලට 2012 වර්ෂය සඳහා ශතයක්වත් වෙන් කරලා නැහැ. මෙහෙම වන්නේ පළමුවැනි වතාවටයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2011 -මේ වර්ෂයේ දී- විදුලිබල විෂයයට රුපියල් මිලියන 53ක් වෙන් කරලා තිබුණා. ඒ වාගේම නිවාස විෂයයට 2012 වර්ෂයට මුදල් වෙන් කරලා නැහැ. මේ වර්ෂයට රුපියල් මිලියන 6ක් වෙන් කරලා තිබුණා. සමෘද්ධිලාභීන්ට නිවසක වහලයක් තනා ගන්න, එහෙම නැත්නම් තහඩු ටිකක් ලබා දෙන්න අද මධ්‍යම පළාත් සභාවේ නිවාස විෂයයට මුදල් වෙන් කරලා නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. කල්පනා කරලා බලන්න. එක පැත්තකින් විදුලිබල විෂයය සඳහා 2012 වර්ෂයට මුදල් නැහැ. මධ්‍යම ආණ්ඩුවෙන් තමයි අද ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ සියලු යෝජනා මධ්‍යම ආණ්ඩුවට යවන්න ඕනෑ. පළමුවැනි වතාවට තමයි මේ විදුලිබල විෂයයට මුදල් වෙන් කරලා නැත්තේ.

"ඇයි මේ මුදල් වෙන් කරලා නැත්තේ?" කියලා මට සැකයක් තිබෙනවා. මහ ඇමතිතුමා ගැන විශ්වාසයක් නැද්ද? එහෙමත් නැත්නම් විෂය භාර ඇමතිතුමා ගැන විශ්වාසයක් නැද්ද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඒ ගැන අවධානය යොමු කරවනවා. මේවා ගැන අවධානය යොමු කළේ නැත්නම් තවදුරටත් මේ පළාත් සභා අකර්මණ්‍ය වනවා. පළාත් සභාවලට දෙන්න තිබෙන බලතල දෙන්න. එතකොට මධ්‍යම ආණ්ඩුවට හුඟක් පහසු වනවා. අද ඉදිරිපත් කරන වැය ශීර්ෂ 2012 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන්න නම්, ඒ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන්න නම්, මේවා හරි ඉලක්කවලට යන්න නම්, පළාත් සභාවලට මුදල් ලබා දිය යුතුයි. මුදල් ලබා දීලා විතරක් මදි. ඒවායේ කළමනාකරණය ගැනත් බලන්න ඕනෑ. මොන වාගේ කළමනාකරණයක් තිබෙනවාද, මේ මුදල්වලින් දූෂණ අක්‍රමිකතා සිදු වනවාද කියන ඒවා ගැනත් සොයන්න ඕනෑ. එහෙම නැත්නම් මේ ක්‍රියාත්මක කරන පළාත් සභා ක්‍රමයෙන් එලක් වන්නේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. බලය විමධ්‍යගත කරලා, මහ ජන නියෝජිතයෝ පත් කරලා මේවා ක්‍රියාත්මක කරන්න නම් අද මේ රජයට පුළුවන් පළාත් සභාවලට ඒ බලතල ලබා දෙන්න.

එහෙම නැත්නම් මේ බලය විමධ්‍යගත කිරීම සම්බන්ධයෙන් ඉන්දියාවෙන් තවතවත් බලපෑම් එනවා. ඒ නිසායි ඒ ලබා දෙන්න තිබෙන බලතල සම්පූර්ණයෙන්ම ලබා දෙන්නය කියලා මම අද මේ වෙලාවේදී මතක් කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභාවක විශේෂයෙන් පළාත් සභා අමාත්‍යාංශය විසින් අලුතින් නීතියක් ගෙනෙන්න ඕනෑ. මොකක්ද ඒ නීතිය? දැන් බලන්න, පළාත් සභාවේ මහ ඇමති සමුළුව තිබෙනවා; ආණ්ඩුකාරතුමන්ලාගේ සමුළු තිබෙනවා; ප්‍රාදේශීය සභා සමුළුත් තිබෙනවා. වියදම් කරන්නේ කාගේ මුදල්ද? වියදම් කරන්නේ පළාතේ බදු ගෙවන ජනතාවගේ මුදල්. ඒ මුදල්වලින් තමයි ඒවාට වැය කරන්නේ. එහෙම නම් අපට මේක නීතියක් හැටියට ගෙනෙන්න බැරි ඇයි? මේක නීතියක් හැටියට ගෙනෙන්න පුළුවන්. පළාත් සභා අමාත්‍යාංශය සියලු පළාත් සභා එක්ක එකතු වෙලා මේක සාකච්ඡා කරලා මහ ඇමති සමුළු, ආණ්ඩුකාරතුමන්ලාගේ සමුළු සඳහා අය වැයෙන් මුදලක් වෙන් කරන්න ඕනෑ. එහෙම මුදලක් වෙන් කරන්නේ නැති වෙන කොට, ඒවාට වැය ශීර්ෂයක් නැති වෙන කොට මොන වාගේ දූෂණ, අක්‍රමිකතා සිදු වෙනවාද කියලා දන්නේ නැහැ. ඒ පළාත් සභාවේ ගන්න තීරණ, යෝජනා කරන තීරණ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. සමුළුවලදී මහ ඇමතිවරු සියලු දෙනා එකතු වෙලා තීරණ ගන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසු ගිය කාලයේ මහ ඇමති සමුළු තිබුණා. එහිදී කථා කළේ මොනවාද? එහිදී ඉදිරිපත් කළ එක් යෝජනාවක් මම කියන්නම්:

"ඉරිදා සහ පෝය දිනවල ටියුෂන් පන්ති අත් හිටුවීමට සියලු පළාත් සභා අතර පොදු ප්‍රතිපත්තියක්"පෝය දිනයට දවසම, ඉරිදාට දවල් 12.00 වන තුරු පන්ති නැහැ. ප්‍රධාන අමාත්‍යාංශ සමුළුවේදී යෝජනා කරනවා. දැන් මේ යෝජනාව කොහෙද ක්‍රියාත්මක වෙන්නේ? ඒකයි මම කියන්නේ මේ සමුළු නීත්‍යනුකූල කළ යුතුයි කියලා. එහෙම නීත්‍යනුකූල කළේ නැත්නම් කාගේ මුදල්ද වැය කරන්නේ? දැන් ප්‍රාදේශීය සභාවත් සභාපතිවරුන්ගේ සමුළු තියන්න පටන් අරගෙන තිබෙනවා. ඒ නිසා මම මතක් කරන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙන්න මේවා හරියට ක්‍රියාත්මක කරන්න නම් නීති සකස් කළ යුතුයි කියලා. බාගෙට බලය විමධ්‍යගත කරලා පළාත් සභාවට යන්නය කියා යවනවාට වැඩිය හොඳයි අපි මේ නීතිය හදන එක. අද ආණ්ඩුවට තුනෙන් දෙකක බලයක් තිබෙනවා. ඒ බලයත් එක්ක පළාත් සභාවල මේ කටයුතු හරියට ක්‍රියාත්මක කරන්න අමාත්‍යාංශය තුළින් වැඩ කටයුතු කළොත් සාර්ථක ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් කියලා මා හිතනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභාවේ සභානායක තනතුරක් තිබෙනවා; ආණ්ඩු පක්ෂ සංවිධායක තනතුරක් තිබෙනවා; විපක්ෂ නායක තනතුරක් තිබෙනවා; විපක්ෂයේ ප්‍රධාන සංවිධායක තනතුරක් තිබෙනවා. මේවාට දීමනාත් ගෙවනවා. නමුත් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මේවා ඇතුළත් වෙලා නැහැ. විපක්ෂ නායක තනතුරක් නැහැ; සභානායක තනතුරක් නැහැ. මේ තනතුරු එකක්වත් අද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් වෙලා නැහැ. පනතකට ඇතුළත් වෙලා

නැහැ. නමුත් දීමනා ගෙවනවා. එක එක පළාත් සභාවල එක එක දීමනා ගෙවනවා. නමුත් මේවා හරියට ක්‍රියාත්මක වෙන්නේ නැති නිසා මෙන්න මේවා ගැන අවධානය යොමු කරන්නය කියලා මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම තමයි දූෂණ සහ අක්‍රමිකතා. අද සෑම පළාත් පාලන ආයතනයකම දූෂණ සහ අක්‍රමිකතා සිදු වෙනවා. පළාත් සභාවල දූෂණ සහ අක්‍රමිකතා සිදු වෙනවා. දැන් අපි කෝප් වාර්තාව ගත්තොත් ආයතන 48ක දූෂණ අක්‍රමිකතා සිදු වෙලා තිබෙනවා. එතකොට මේ නිලධාරින්ට විරුද්ධව පියවර ගන්නවාද, නැද්ද කියන එක තීරණය කරන්න වෙනවා. දැන් මෙතැනින් තීරණය කරන්නේ නැති නිසා, ඒ සඳහා තිබෙන අනෙක් ආයතනය තමයි පළාත් සභා ආයතනය. නමුත් ඒ ආයතනයේත් දූෂණ අක්‍රමිකතා සිදු වෙනවා; විගණන වාර්තා ඉදිරිපත් වෙලා තිබෙනවා. නමුත් වැඩක් නැහැ; ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපි මේ උත්තරීතර සභාවල කොයි තරම් කථා කළත්, ඒවා ක්‍රියාත්මක වන්නේ නැහැ. මේවා ක්‍රියාත්මක වනවා නම් ආණ්ඩු පක්ෂයටත් හොඳයි; විපක්ෂයටත් හොඳයි. ක්‍රියාත්මක වීම තිබෙන්න ඕනෑ. රාජ්‍ය නිලධාරින් මෙවැනි වැරදි වැඩ කරන කොට මේ අයට විරුද්ධව පියවර ගත යුතුයි. එහෙම පියවර ගත්තොත් විතරයි ආණ්ඩුවකට ගමන් කරන්න පුළුවන්; හොඳ ප්‍රතිඵල ලබා ගන්න පුළුවන්. එහෙම නැත්නම් ප්‍රතිඵල ලබා ගන්න බැරි වෙනවා.

අද මම එක උදාහරණයක් කියන්න ඕනෑ. මධ්‍යම පළාතේ දිගන ක්‍රීඩාංගණය සම්බන්ධයෙන් මා ගිය අවුරුද්දේ අය වැය විවාදයේදීත් කථා කළා. 2008, 2009 වර්ෂවලදී කොයි තරම් මුදලක් වෙන් කරලා තිබුණාද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙන් කරලා තිබුණු මුදල රුපියල් 13,45,90,200යි. එක දූෂණයක්, එක අක්‍රමිකතාවක් ගැනයි මා මේ කියන්නේ. පළාත් සභාවට වෙලා තිබුණු පාඩුව පිළිබඳව විගණන වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. පාඩුව කීයද, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි? පාඩුව විතරක් රුපියල් 2,94,61,450යි. ඒ, පාඩුව විතරක්. කාගේද මේ සල්ලි? පළාතේ ඉන්න අය ගෙවන බදු මුදල් එක්ක තමයි පළාත් සභාව සෙල්ලම් කරන්නේ. මේ නිලධාරින්ට විරුද්ධව පියවර ගන්න බැරි ඇයි? COPE වාර්තාවෙන් චෝදනා ලබන නිලධාරින්ම තමයි අද පළාත් සභාවලත් ඉන්නේ. එක නිලධාරියකුට විරුද්ධව කටයුතු කළොත් හොඳ ප්‍රතිඵල ලබා ගන්න පුළුවන්කමක් තිබෙනවාය කියලා මා හිතනවා. ඉතින් ඒවා ක්‍රියාත්මක වන්නේ නැහැ. එක දූෂණයක් ගැනයි මා මේ කථා කළේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම තමයි, පළාත් පාලන ආයතන. පළාත් පාලන ආයතනය ජනතාවට සමීප සේවාවක් කරනවා. පළාත් පාලන ආයතන ආරම්භ කළේ දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමායි. එතුමා තමයි ඒ පළාත් පාලන ක්‍රමය ආරම්භ කළේ. 1988 භීෂණ යුගයක් තිබුණු කාලයේ, එදා ඡන්දයක් ඉල්ලන්න බැරි අවස්ථාවක මා ඉදිරිපත් වෙලා, නිතරගයෙන් ප්‍රාදේශීය සභාවේ සභාපති බවට පත් වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා බැලුවේ මොකක්ද? විශේෂයෙන් ග්‍රාමීය මට්ටමේ ජනතාවට යම් සේවාවක් කරන්න කිට්ටුම ආයතනය තමයි ප්‍රාදේශීය සභාව. ඒ ප්‍රාදේශීය සභාවට බලතල දීලා, ඒ ප්‍රාදේශීය සභාවේ සභාපතිට, උප සභාපතිට, එහි මන්ත්‍රීවරුන්ට වගකීම් පැවරුවා. තමන්ගේ කොට්ඨාසයේ, ඒ ප්‍රදේශයේ යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම ඒ අයට ලැබුණා.

එපමණක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මට මතකයි, දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා සෑම පළාත් පාලන ආයතනයකටම යන්ත්‍රෝපකරණ -ඩෝසරයක්, ට්‍රැක්ටරයක්, ලොරියක්- ඒකක ඇති කරලා දුන්නු බව. මේ ඒකක ඇති කරලා දුන්නේ ඇයි? ඒ ප්‍රාදේශීය සභාවේ ග්‍රාමීය මට්ටමේ සංවර්ධනය සඳහායි. මෙන්න මේ ආකාරයෙන් මෙය දිගටම ක්‍රියාත්මක කළා නම් මා හිතන හැටියට විශාල සේවාවක් ඒ ප්‍රදේශය තුළ සිදු වනවා. දැන් අපි ඒ කටයුතු භාර දෙන්නේ කාටද? කොන්ත්‍රාත්කාරයන්ට තමයි භාර දෙන්නේ. සමහර විට සමහර මන්ත්‍රීවරුනුත් වෙනත් නම්වලින් ඒ කොන්ත්‍රාත් ලබා ගන්නවා. අන්න දූෂණය සහ අක්‍රමිකතාව. අද ඒවා හරියට ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ යන්ත්‍රණය හරියාකාරව ක්‍රියාත්මක වන්නේ නැහැ. අඩු පාඩුකම් රැසක් තිබෙනවා. ඒවා ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවන්න මා කැමැතියි, ගරු ඇමතිතුමනි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. උදාහරණයක් වශයෙන් මා පළාත් පාලන ආයතන දෙකක් ගන්නම්. පළාත් පාලන ආයතනවලට අමාත්‍යාංශයෙන් ණය දීලා තිබෙනවා. දේශීය ණය සංවර්ධන අරමුදල කාර්ය සාධන වාර්තාවේ සඳහන් වනවා, සුපිරි වෙළෙඳ සංකීර්ණ ඉදි කිරීමට මාතලේ මහ නගර සභාවට ණයක් දීලා තිබෙනවාය කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ ණය දීලා තිබෙන්නේ 2004.03.31වන දිනයි. දීලා තිබෙන ණය මුදල රුපියල් 9,89,01,988.94යි. එතකොට බලන්න, ගෙවීමට ඇති හිඟ මුදල කොපමණද කියලා. ගෙවීමට තිබෙන හිඟ මුදල රුපියල් 8,69,73,492.50යි. මේ පළාත් පාලන ආයතනවල කොයි තරම් ණය මුදලක් ගෙවන්න තිබෙනවාද? ඒ පිළිබඳව අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවනවා. මේ සම්බන්ධයෙන් යම් පියවරක් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වාගේම හැම පළාත් පාලන ආයතනයකම කළමනාකරණයේ දුර්වලකම් තිබෙනවා. සභාපතිට ඕනෑ කරන, සුදුසුකම් නැති ලේකම්වරයකු පත් කර ගන්නවා. ඒ ලේකම්වරයා තමයි සභාපති කියන කියන විධියට වැඩ කරන්නේ. මේවාට ඉඩ තබන්න එපා, ගරු ඇමතිතුමනි. දක්ෂ, සුදුසුකම් තිබෙන ලේකම්වරුන් පත් කර ගන්න. පත් කර ගෙන ඒ අය කළමනාකරණය කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 1.21]

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ වචන කිහිපයක් කථා කරන්න මා බලාපොරොත්තු වනවා. ඇත්ත වශයෙන් අපි දන්නවා, දීර්ඝ කාලයකට පස්සේ මේ රටේ දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියක් අද ක්‍රියාත්මක වනවාය කියලා. මේ සංවර්ධන ක්‍රියාවලිය ඔස්සේ අපේ රට ආසියාවේ දියුණුම රට බවට පත් කිරීමේ බලාපොරොත්තුවක්, ඉලක්කයක් අපට තිබෙනවා. මේ ඉලක්කය සපුරා ගැනීම සඳහා අපේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය අද විශාල කාර්ය භාරයක් කරට අරගෙන කටයුතු කරනවා. අපේ දිස්ත්‍රික් පරිපාලනය සහ ප්‍රාදේශීය පරිපාලනය මේ රටේ සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම අතිනුත්, ඒ වාගේම ඒවා ක්‍රියාත්මක කිරීම අතිනුත් විශාල කාර්ය භාරයක් ඉෂ්ට කරනවා.

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මම මතක් කරන්නට ඕනෑ, අද මේ රජය යටතේ ක්‍රියාත්මක කරන "ගම නැඟුම", "මහ නැඟුම" හා "දිවි නැඟුම" වැනි සංවර්ධන වැඩ පිළිවෙළවල් සාර්ථක කර ගන්න අපේ දිස්ත්‍රික් ලේකම්වරු, ඒ වාගේම ප්‍රාදේශීය ලේකම්වරු විශාල කැපවීමකින් කටයුතු කරන බව. ඒ නිලධාරින්ට සහාය දීම සඳහා, මේ වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා කටයුතු කරන අනෙකුත් නිලධාරින් මනා කළමනාකරණ හැකියාවන් ඇති නිලධාරින් බවට පත් කරන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම මානව සම්පත් සංචිත අඛණ්ඩව සංවර්ධනය කරමින් රජයේ නිලධාරින් සංවර්ධන ක්‍රියාදාමය සඳහා සුදුසුකම් ලත්, හැකියාව තිබෙන කාර්යක්ෂම නිලධාරින් බවට පත් කරලා ඒ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරවන්න අවශ්‍ය පියවර අපි ගනිමින් තිබෙනවා. මූලික වශයෙන් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අපි කරුණු කීපයක් දැනට අනුගමනය කරනවා. ජනතාවගේ පහසුව සඳහා පවතින කාර්යාල ක්‍රමය සරල කිරීම අපි මූලිකව කර ගෙන යනවා. ඒ වාගේම රජයේ නිලධාරින්ගේ අඛණ්ඩ සංවර්ධනය සඳහා, ඒ අයගේ ක්‍රියාකාරිත්වය, ඒ අයගේ අවබෝධය, ඒ අයගේ ආකල්ප සංවර්ධනය කරමින් මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ ප්‍රමුඛ අවධානයකින් කටයුතු කරන්නට අපි දැනට පියවර අරගෙන තිබෙනවා.

රාජ්‍ය සේවාව නවීකරණය කිරීම සඳහා තොරතුරු සන්නිවේදනය හා නවීන තාක්ෂණය යොදා ගැනීමත් අපි කර ගෙන යනවා. මම මතක් කරන්න ඕනෑ, මේ අවස්ථාවේ විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේත්, ඒ වාගේම අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආශ්‍රිතවත් නව තාක්ෂණය යොදා ගනිමින් ජනතාවට වුවමනා සේවාව දැඩි කාර්යක්ෂමතාවකින් ලබා ගන්නට හැකි වාතාවරණයක් අපි සකස් කර ගෙන යන බව. ඒ වාගේම ගම් මට්ටමේ සිට දිස්ත්‍රික්ක හා ජාතික මට්ටමේ පරිපාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා වූ යටිතල පහසුකම් අපි සංවර්ධනය කරනවා. ඒ එක්කම වඩා ඵලදායී ලෙස, මහ ජන හිතකාමී ලෙස රාජ්‍ය සේවා ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමත් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි 2011 දී මේ වැඩ පිළිවෙළ ආරම්භ කරලා එහි මූලික කාර්යයන් අපගේ මූලික වගකීමක් වශයෙන් සලකා අමාත්‍යාංශය මඟින් ඉෂ්ට කරලා, අද බොහොම සාර්ථක ප්‍රතිඵල ලබා ගෙන තිබෙනවා. දැනට තාක්ෂණය හඳුන්වා දී තිබෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගියොත් - විශේෂයෙන්ම බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අයට- තමුන්ට වුවමනා උප්පැන්න සහතිකයක්, ඒ වාගේම වෙනයම් බලපත්‍රයක් විනාඩි කීපයකින් ලබා ගන්න පුළුවන්. මීට පෙර සමහර විට ඒ කාර්යයක් සඳහා ජනතාවට හත් අට වතාවක් ඒ කාර්යාලවලට යන්න සිද්ධ වෙලා තිබුණා. අද ඒ තත්ත්වය නැති කරලා තිබෙනවා. අද හැම කෙනෙකුටම තමුන්ගේ කටයුතු පහසුවෙන් කර ගැනීමේ හැකියාව තිබෙනවා.

බොහෝ ආයතනවල වැඩ පියවර අධ්‍යයනය කොට අදාළ සේවා කඩිනමින් ලබා දීම සඳහා පුරවැසි ප්‍රඥප්තිය වැඩසටහන නව සංකල්පයක් යටතේ හඳුන්වා දීමටත්, පෙරටු කාර්යාල -front desks- මඟින් කඩිනමින් සේවා ඉටු කර දීමටත් විශේෂ අවධානයකින් කටයුතු කර ගෙන යනවා. මම මෙතැනදී පැහැදිලිව කියන්නට ඕනෑ, මේ පහසුකම් අපි ජනතාවට සලසනවා වාගේම රාජ්‍ය සේවයේ මානව සම්පත් කළමනාකරණය හා සංවර්ධනය පිළිබඳව, ඒ කියන්නේ නිලධාරින්ගේ තිබෙන ගුණාත්මකකම වැඩි කරන්න පසු ගිය වකවානුව තුළ අපගේ අමාත්‍යාංශය සුවිශේෂ කාර්ය භාරයක් ඉෂ්ට කර තිබෙන බව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම පසු ගිය කාලය තුළ විශාල වශයෙන් නිලධාරි හිඟයක් අපේ කාර්යාලවල තිබුණා. දීර්ඝ කාලයක් රජයේ කාර්යාලවල රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ, ඒ කියන්නේ සාමාන්‍ය ලිපිකරු මට්ටමේ ඇබෑර්තු 5,000කට ආසන්න ප්‍රමාණයක් තිබුණා. දැනට ඒ තනතුරුවලට අපි 4,000කට ආසන්න පිරිසක් පත් කරලා තිබෙනවා. ඒ නිසා අද අපට නිලධාරි හිඟය බොහෝ දුරට අවම කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම 2010-2011 වර්ෂවල රජයේ ආයතනවල තිබුණු ඉංජිනේරු පුරප්පාඩු 350ක් වෙනුවෙන් නව ඉංජිනේරුවන් බඳවා ගන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම අපේ අමාත්‍යාංශ යටතේ ගැනෙන තාක්ෂණ සේවයේ පුරප්පාඩු බොහොමයක් සම්පූර්ණ කරන්නටත් අපිට පුළුවන්කම ලැබුණා. ඊ ළඟට, සුළු සේවකයන්, රියැදුරන්, කාර්යාල සහයකයන් 700ක පමණ කණ්ඩායමක් බඳවා ගෙන රට පුරාම තිබෙන කාර්යාලවලට ඒ අය පත් කරලා ඒ කාර්යාලවල තිබුණු නිලධාරි හිඟය, සේවක හිඟය නැති කරන්න අපි කටයුතු කරලා තිබෙනවා.

විශේෂයෙන්ම මෙතැනදී මතක් කරන්න ඕනෑ, උතුරු නැඟෙනහිර කාර්යාල පිළිබඳව. ද්‍රවිඩ භාෂාවෙන් කටයුතු කරන කාර්යාලවල බරපතළ ලෙස ඒ නිලධාරින්ගේ හිඟයක් තිබුණා. අපි ඒක නැති කරන්න කටයුතු කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් වචනයක් දෙකක් කියන්න මා බලාපොරොත්තු වනවා. කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින් වශයෙන් 503 දෙනෙක් උතුරු නැඟෙනහිර ප්‍රදේශයට පත් කරලා තිබෙනවා. සිංහල භාෂාවෙන් වැඩ කරන්න නිලධාරින් 20 දෙනකු පත් කරලා තිබෙනවා. ද්‍රවිඩ භාෂාවෙන් වැඩ කරන්න නිලධාරින් 480 දෙනකු පත් කරලා තිබෙනවා. ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කරන්න 3 දෙනකු පත් කරලා තිබෙනවා. මේ අනුව උතුරු නැඟෙනහිරට කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින් 503 දෙනෙක් පත් කරලා තිබෙනවා.

මා තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. පසු ගිය දවස්වල අපේ ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කර තිබුණා, අපේ රජය සිංහල නිලධාරින් පත් කරන්න පටන් අරගෙන තිබෙනවා කියලා. ඇත්ත වශයෙන්ම ඒක පදනම් විරහිත චෝදනාවක්. එතුමා ඒ චෝදනාව එල්ල කළේ මේ නිසා වෙන්න ඇති. පසු ගිය දවස්වල අපි මන්නාරම දිස්ත්‍රික්කයට සිංහල නිලධාරියෙක් පත් කළා; මොණරාගල දිස්ත්‍රික්කයට ද්‍රවිඩ නිලධාරියෙක් පත් කළා. අපි ඒකෙන් අදහස් කළේ ජාතීන් දෙක අතර සමඟිය ඇති කිරීම, අන්‍යෝන්‍ය අවබෝධය ඇති කිරීම තුළින් සේවය කාර්යක්ෂම කිරීමයි. එතුමන්ලා ඒක වරදවා තේරුම් අරගෙන තිබෙනවා. ඒ නිසා කියනවා, දිගින් දිගටම මේ විධියට නිලධාරින් පත් කරනවා කියලා. නමුත් මා කියන්න ඕනෑ, සිංහල නිලධාරින් සිංහල ප්‍රදේශවලටත් ද්‍රවිඩ නිලධාරින් ද්‍රවිඩ ප්‍රදේශවලටත් සීමා කරන ප්‍රතිපත්තියක් මේ රජය අනුගමනය කරන්නේ නැති බව. මොකද, රජයේ සේවකයා මුළු රටේම පොදු සේවකයකු වශයෙන් සියලු ජන කොටස් අතර සේවය කළ හැකි නිලධාරියකු විය යුතුයි කියන ප්‍රතිපත්තිය තමයි අපි අනුගමනය කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම 2007 ජූලි මාසයෙන් පසු රජයේ සේවයට බැඳුණු සියලුම නිලධාරින් දෙවන භාෂාවක් ඉගෙන ගන්න ඕනෑ. ඒ කඩඉම් විභාගයෙන් සමත් වන්න ඕනෑ. ඒ කියන්නේ සිංහල නිලධාරින් දෙමළ භාෂාවත්, දෙමළ නිලධාරින් සිංහල භාෂාවත් සමත් වන්න ඕනෑ, 2007 ජූලි මාසයේ පළමුවන දාට පසු රජයේ සේවයට බැඳුණු අය. අපි මේ ප්‍රතිපත්තිය අනුගමනය කළේ ඒ අයට කොයි ප්‍රදේශයේ වුණත් සේවය කරන්න හැකියාවක් තිබෙන්න ඕනෑ නිසායි. මා මේ කාරණයත් මතක් කරන්න ඕනෑ.

Sir, there is a letter written by Mr. Somapala Gunadheera. He is a very senior Public servant who held

the position of GA, Trincomalee, for a long time. He has gathered some experience by being in the Eastern Province. He is a Sinhalese officer but worked in the Eastern Province to the satisfaction of everybody. I would like to quote a paragraph from his letter. This is what he says, I quote:

"It is that knowledge of Tamil that helped me later to work among the Tamil residents in the jungles of Thennamaravadi, Tirumangalai and Sampur without the help of an interpreter, when I was GA, Trincomalee. I am aware of several other Sinhala GAs of the North who acquitted themselves with distinction despite the accident of their birth. Similarly language was no bar to Tamil GAs who worked in the South with remarkable success. Sivagnanam of Hambantota and Sivanandan of Matara and Galle come readily to my mind.

However the crux of the matter is not linguistic competence. To my mind, the decision to exchange GAs between the North and the South is one of the most far-sighted policy initiatives taken of late. Exchange of envoys is a symbolic gesture of bilateral

amity. Such exchange is bound to bridge the yawning gap between the North and the South with cross cultural fertilization. The leadership training gained through the initiative is bound to generate remarkable understanding and rapport between

the communities. Speaking for myself, it is my direct association with he North and the East that has created in my heart the deep concern and sympathy for the lot of the Tamils, which is reflected in the articles published in my ethnic Confrontation and National Integration in Sri Lanka."

He is the gentleman who has written the book, "Ethnic Confrontation and National Integration in Sri Lanka". Such an experience has been acquired by this officer, a Sinhalese officer working in Trincomalee and now he advocates the appointment of these officers irrespective of community differences.

මේ කාරණය මා පැහැදිලි කර කිව්වා. මේ කාරණයට යම් යම් වැරදි තීන්දු වැරදි අර්ථ නිරූපණයන් දෙන්න සමහර දේශපාලනඥයෝ තැත් කරනවා. ඇත්ත වශයෙන්ම මා මතක් කරන්න ඕනෑ, මන්නාරමට අපි පත් කරපු දිස්ත්‍රික් ලේකම්වරයා නැත්නම් දිසාපතිවරයා ගිහින් ඔහු පළමුවෙන්ම සියලුම රජයේ සේවකයන්ට දෙමළ භාෂාවෙන් කථා කර තිබෙනවා. ඔහුගේ කථාව අහලා ඒ අය ඉතාමත්ම සතුටු වෙලා තිබෙනවා. මේ පත්වීම ගැන ඒ ප්‍රදේශය නියෝජනය කරන අපේ මන්ත්‍රීවරයකුගේ -අපේ ඇමතිවරයකුගේ- යම් යම් මතයන් තිබුණා. නමුත් ඒ නිලධාරියා ගිහින් වැඩ ආරම්භ කර වැඩ කර ගෙන යන්න පටන් ගත්තාම, ඒ සම්බන්ධව එතුමා අද ප්‍රශංසාවෙන් කථා කරනවා. [බාධා කිරීමක්] Wait, wait. You can reply to me later.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මොණරාගලට ද්‍රවිඩ නිලධාරියෙක් පත් කළා. ඒක සිංහල ප්‍රදේශයක්. සියයට 90ක්ම සිංහල ජනතාව ජීවත් වන ප්‍රදේශයක්. අද ඒ නිලධාරියාත් ඉතාමත්ම හොඳින් වැඩ කර ගෙන යනවා. ඒ නිලධාරියා මොණරාගලට ගිය වෙලාවේ විශාල උත්සවයක් තියලා හින්දු ආගමේ චාරිත්‍ර අනුව ඔහුව පිළිඅරගෙන එහි ජනතාව අද ඔහු සමඟ අත් වැල් බැඳගෙන කටයුතු කරනවා. මේක තමයි වෙන්න ඕනෑ. ජාතික සමඟියක් ඇති වන්න නම් ජනතාව අතර අන්‍යෝන්‍ය අවබෝධයක් තියෙන්න ඕනෑ. අපි දකුණට සීමා වෙලා ජීවත් වෙනවා. ඒ වාගේම උතුරේ ජනතාව උතුරට සීමා වෙලා ජීවත් වනවා. එතකොට අන්‍යෝන්‍ය අවබෝධයක් ඇති වන්නේ නැහැ.

මේ වර්ෂයේ අපි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ -SLAS- නිලධාරින් 70 දෙනෙක් පමණ බඳවා ගත්තා. ඒ නිලධාරින් cadet officersලා වශයෙන් මාසයක් යාපනයේ කටයුතු කරන්න දැම්මා. ඒ, යාපනයේ ජනතාව සමඟ මිශ්‍ර වන්න; ඒ අයගේ වුවමනා එපාකම් හඳුනා ගන්න. ඒ අයගේ ගති, සිරිත් විරිත් හඳුනා ගන්න පුළුවන් වන විධියට ඒ අයගේ නිවෙස්වල පදිංචි වෙලා ඒ නිලධාරින්ට යාපනය දිස්ත්‍රික්කය තුළ මාසයක් ගත කරන්න අවස්ථාව ලබා දුන්නා.

ඇත්ත වශයෙන්ම කොයි තරම් දුරට මේ කටයුත්ත සාර්ථක වුණාද කියලා කියනවා නම් -සිවිය හුහක් අය ගැහැනු ළමයින්- මේ අය හවසට තමන්ගේ කාර්යාල ඇරිලා බස් එකෙන් ඒ නවාතැනට එන කොට බස් එකෙන් බහින තැනට තමන් නැවතිලා ඉන්න ගෙදර ද්‍රවිඩ දෙමව්පියන් ඇවිල්ලා ඉන්නවා, ඒ දරුවාව ගෙදරට කැන්දා ගෙන යන්න, හැම දාම. මෙන්න මේ විධියේ සම්බන්ධතාවක් ගොඩ නැඟුණා. ඒ අයගේ විශාල ප්‍රශංසාවක් ලැබුණා, මේ කැඩෙට් නිලධාරින්ගේ හැසිරීම් ගැන, ඒ අයගේ අවබෝධය ගැන. ඒ වාගේම අන්‍යෝන්‍ය වශයෙන් ඇති වන මිත්‍රත්වය ගැන ඇත්ත වශයෙන්ම ඒ දෙපාර්ශ්වයටම අද සතුටක් ඇති වනවා. ඉතින් මේක තමයි ජාතික සමඟියක් ඇති කිරීමට ඉවහල් වන වැඩ පිළිවෙළ. අන්න ඒක මුල් කර ගෙන තමයි අපි මේ නිලධාරින් පත් කළේ කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ.

නිලධාරි හිඟය ගැන කථා කරලා තිබුණා. නිලධාරින් වශයෙන් අපි පත් කරලා ඉන්න සංඛ්‍යාව ගැන මම කිව්වේ ඒ නිසයි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Minister, you have one more minute.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
Yes, Sir, I will table the rest of my speech because it is lengthy.

විශේෂයෙන්ම පසු ගිය යුද්ධ කාලයේ අඩ පණ වෙලා තිබුණු සිවිල් පාලනය නැවත ඇති කරන්න අවශ්‍ය යටිතල පහසුකම් සියල්ලම වාගේ අපි හදලා තිබෙනවා. දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනඟලා තිබෙනවා, ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනඟලා තිබෙනවා, ඒ අයට වුවමනා වාහන ආදිය ඒ වාගේම භෞතික සම්පත් අපි සපයලා තිබෙනවා, අපි මානව සම්පත් සපයලා තිබෙනවා. අපට වුවමනා කරන්නේ ඒ ජනතාවටත් අඩු නැතුව මේ සිවිල් පාලනය හරහා මේ රජයේ තිබෙන සියලුම පහසුකම්, ඒ වාගේම පරිපාලනය හරහා ලබා දිය හැකි ඵල ප්‍රයෝජන ලබා දෙන්න. ඒ සඳහා අවශ්‍ය පියවර අපි පසු ගිය කාලය තුළ අරගෙන තිබෙනවා. ඒ වාගේම ඉදිරි කාලයේදීත් අපි බලාපොරොත්තු වනවා, අවශ්‍ය කරන ඒ පහසුකම් ඒ ප්‍රදේශවලටත් රටේ අනෙකුත් ප්‍රදේශවලටත් ලබා දෙන්න.

මම විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ, මේ නව තාක්ෂණ පහසුකම් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබා දීලා මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාමීය ජනතාවට සිදු වන සේවය විධිමත් කරන්න, කාර්යක්ෂම කරන්න කටයුතු කරන බව. අද බොහෝ වේලාවට අපි දන්නවා, නාගරික ප්‍රදේශවල මේ කාර්යක්ෂමතාව අපට හඳුන්වා දෙන්න පුළුවන්කම ලැබුණත්, ගම්බද ප්‍රදේශවලට මේ පහසුකම ලබා දෙන්න පුළුවන්කම ලැබුණේ නැහැ කියලා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Minister, please wind up now.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කාල වේලාව මදි නිසා මගේ කථාවේ ඉතිරි කොටස මා **සභාගත*** කරනවා.

මෙම සියලු කටයුතු අප විසින් ඉටු කිරීමට බලාපොරොත්තු වන්නේ දැනටමත් බොහෝ ප්‍රතිසංවිධානයන්ට භාජනය වී ඇති හා භාජනය වෙමින් පවතින රාජ්‍ය සේවාව තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා බව සඳහන් කිරීමට කැමැතියි. සමස්තයක් වශයෙන් සලකන්නේ නම් අපගේ රාජ්‍ය සේවා පද්ධතිය තුළ විශේෂ හැකියාවන් සහ කුසලතා පවතින අතර, තවදුරටත් දියුණු කළ යුතු අංශ හා ක්ෂෙත්‍රයන් පවතින බව සඳහන් කළ යුතු වනවා. මෙම තත්ත්වයන් වඩා ශුභවාදී හා ඵලදායී ලෙස වෙනස් කිරීම සඳහා මාගේ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් හා ලේකම්තුමා ඇතුළු සියලු කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහයෝගය පිළිබඳව මා බෙහෙවින් ස්තුතිවන්ත වනවා මෙන්ම අපගේ අමාත්‍යාංශයේ කටයුතු වැඩි දියුණු කිරීමටත්, අවශ්‍ය පරිදි නිවැරදි කර ගැනීමටත් එම නිලධාරි මහත්වරුන් ලබා දුන් ශක්තිය හා ධෛර්යය පිළිබඳවත් ස්තුතිවන්ත වනවා. I will also **table*** the letter written by Mr. Somapala Gunadheera who was at one time the GA of Trincomalee.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி:*
*Rest of the speech tabled*

සමාජයේ යම් යම් කොටස් මෙම රජයේ සීඝ්‍ර සංවර්ධන ක්‍රියාදාමය පිළිබඳ කුමන විධියේ අසුභවාදී මතයන් ප්‍රකාශ කරනු ලැබුවත් වර්තමානයේ සුවිශාල සංවර්ධනයක් මේ රටේ සිදුවෙමින් පවතින බව සැම දෙනෙකුටම දැක ගැනීමට පුළුවන්. දකුණේ මෙන්ම උතුරේ හා නැගෙනහිර සිදුවෙමින් පවතින සීඝ්‍ර සංවර්ධන ක්‍රියාදාමය මෑත ඉතිහාසය තුල කිසිදු රජයකින් ඉටු කිරිමට නොහැකි වූ බව අද වැඩි දෙනා පිළිගනු ලබන සත්‍යයක්. නොයෙක් දේශපාලන මතධාරීන් කුමන විධියේ විවේචන මෙමු රජය වෙත එල්ල කරනු ලැබුව ද මේ රටේ පොදු ජනතාව මෙම රජය පිළිබඳ අති මහත් විශ්වාසයක් තබා ඇති බව පසු ගිය සියළු මැතිවරණ වලදී ඔප්පු වී ඇති කාරණයක් බව මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමතියි.

මෙම සුවිශාල සංවර්ධන කාර්යයේදී රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ කාර්යය භාරය අති මහත් බව මා ප්‍රකාශ කරන්නේ ඉතාමත් සතුටින්. අපගේ අමාත්‍යාංශය යටතේ පවතින දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන යාන්ත්‍රණය මෙම රජයේ ඉතා මූලික සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳ වගකීමෙන් කටයුතු කරනු ලබන ප්‍රධාන ශක්තියක් බවට පත් වී තිබෙනවා. රජයේ සංවර්ධන ක්‍රියාදාමය ගම් මට්ටම දක්වා රැගෙන යාම සඳහා වූ ගම නැගුම, මග නැගුම, දිවි නැගුම ආදී සංවර්ධන වැඩ පිළිවෙලවල් සාර්ථක කර ගැනිමට දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් කරනු ලබන මනා සම්බන්ධීකරණය සාර්ථක යථාර්ථයක් බව පෙනෙන්නට තිබෙනවා. අපගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සමස්ථ මානව සම්පත් ශක්තිය වඩා ඉහල මට්ටමකින් කළමනාකරණය කිරීමටත් එම මානව සම්පත් සංචිතයන් අඛණ්ඩව සංවර්ධනය කරමින් රජයේ නිලධාරීන් සංවර්ධන ක්‍රියා දාමයේ වඩා ඵලදායි යෙදවීමක් ලෙස පරිවර්තනය කිරීමට අපගේ අමාත්‍යාංශය කටයුතු යොදා තිබෙනවා.

මූලික වශයෙන් අපගේ අමාත්‍යාංශයේ කටයුතු සංවිධානය කිරීමේ ක්‍රියාදාමයේ දී ප්‍රධාන ක්ෂේත්‍රයන් කිහිපයක් යටතේ [illegible] සංවිධානය කර ගැනීමට අප කටයුතු කර තිබෙනවා. එම ප්‍රධාන උපාය මාර්ග කිහිපයක් ඔබ තුමන්ලාගේ දැන ගැනිම සඳහා හා මා සඳහන් කිරීමට කැමතියි.

1. ජනතාවගේ පහසුව සඳහා පවතින කාර්යාල ක්‍රම, වැඩපියවරයන් සරල කිරීම.

2. රජයේ නිලධාරීන්ගේ අඛණ්ඩ සංවර්ධනය සඳහා මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ ප්‍රමුඛ අවධානයකින් කටයුතු කිරීම.

3. රාජ්‍ය සේවාව නවීකරණය කිරීම සඳහා වැඩි වශයෙන් තොරතුරු සන්නිවේදන හා නවීන තාක්ෂණය යොදා ගැනීම.

4. ගම් මට්ටමේ සිට දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ පරිපාලන පද්ධතිය ශක්තිමත් කිරිම සඳහා වූ යටිතල පහසුකම් සංවර්ධනය.

5. වඩා ඵලදායී ලෙස මහජන හිතකාමී ලෙස රාජ්‍ය සේවා ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම.

6. සේවා සැපයීම ප්‍රමිතිකරණය සඳහා වූ උපාය මාර්ග හඳුනා ගැනීම, ක්‍රියාත්මක කිරීම සහ සහතික කිරීම සහ රාජ්‍ය සේවාවන්හි විනිවිදභාවය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

ඉහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ 2011 වසරේ දී පහත සඳහන් මූලික කාර්යය භාරයන් අපගේ අමාත්‍යාංශය මඟින් ඉටු කර ඇති බව මා විශේෂයෙන් අවධාරණය කිරිමට කැමතියි.

රජයේ සේවාවන් මහජනතාවට කඩිනමින් සැපයීම සඳහා විවිධ කළමනාකරණ ප්‍රවේශයන් ඔස්සේ රාජ්‍ය සේවයන් සරල කිරීමටත් රාජ්‍ය සේවය වඩා මහජන හිතකාමී ලෙස පරිවර්තනය කිරිමටත් විවිධ කළමනාකරණ ප්‍රවේශයන් අපගේ අමාත්‍යාංශය විසින් හඳුන්වා දී තිබෙනවා.

පසුගිය වසර කිහිපය තුල ආයතන සංග්‍රහයේ සිදු කරන ලද සංශෝධනයන් එකතුවක් ලෙස එළි දක්වා තිබීමෙන් විවිධ රාජ්‍ය ආයතනවල ආයතනික ගැටළු සරල කිරීම සඳහා අප කටයුතු කර තිබෙනවා.

බොහෝ ආයතනවල වැඩ පියවරයන් අධ්‍යයනය කොට අදාල සේවාවන් කඩිනමින් ලබාදීම සඳහා පුරවැසි ප්‍රඥප්තිය වැඩසටහන නව සංකල්පයක් යටතේ හඳුන්වාදීමටත්, පෙරටු කාර්යාල (front desk) මඟින් කඩිනමින් සේවාවන් ඉටු කර දීම සඳහාත් විශේෂ අවධානයෙන් කටයුතු කර තිබෙනවා. රාජ්‍ය සේවාවන් ප්‍රමිතකරණය සඳහා දේශීය හා විදේශීය අරමුදල් මඟින් කරනු ලැබූ කළමනාකරණ යෙදවීම් යටතේ බොහෝ ආයතන ඉහල ඵලදායීතාවයකින් යුක්තව පවත්වාගෙන යාමට හැකියාව ලැබී තිබෙනවා. දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල බොහොමයක් පසුගිය කාලය තුල මෙම ක්‍රමවේදයන් ඔස්සේ ජාත්‍යන්තර ප්‍රමිති සහතික ලබා ගැනීම දක්වා දියුණු කිරීමට අපට හැකියාව ලැබී තිබෙනවා.

රාජ්‍ය සේවයේ මානව සම්පත් කළමනාකරණය හා සංවර්ධනය පිළිබඳ පසුගිය වකවානුව තුල අපගේ අමාත්‍යාංශය සුවිශේෂ කාර්යය භාරයක් ඉටු කර තිබෙනවා. දීර්ඝ කාලයක් රජයේ කාර්යාලවල පැවති කළමනාකාර සහකාර සේවයේ ඇබෑර්තු 4500 ක පමණ ප්‍රමාණයක් නව බඳවාගැනීම් යටතේ සම්පූර්ණ කිරිමට අපට හැකියාව ලැබී තිබෙනවා. එමෙන්ම රියදුරු, කාර්යාල කාර්යය සහායක සේවාවල පුරප්පාඩු 700 ක් පමණද ශ්‍රී ලංකා පරිපාලන සේවය, ඉංජිනේරු සේවය ආදී මාණ්ඩලික ශ්‍රේණිවල පුරප්පාඩු සම්පූර්ණ කිරිමටද අපට හැකියාව ලැබුණා. 2010, 2011 වසරවල රජයේ ආයතනවල ඉංජිනේරු පුරප්පාඩු 350 ක් නව ඉංජිනේරුවරුන් බඳවා ගැනිම මඟින් සම්පූර්ණ කර ඇති අතර තාක්ෂණ සේවයේ පැවති පුරප්පාඩු බොහොමයක් සම්පූර්ණ කිරිමට ද අපට හැකියාව ලැබුණා.

එසේම උතුරු නැගෙනහිර පවතින ද්‍රවිඩ මාධ්‍යයෙන් කටයුතු කළ හැකි පරිපාලන සේවා නිලධාරි පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මූලික කටයුතු දැනටමත් සංවිධානය කර තිබෙනවා. දිවයිනේ පවතින 3500 ක් පමණවන ග්‍රාම නිලධාරි පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මූලික කටයුතු සියල්ල සිදු කොට ඇති අතර 2012 අප්‍රේල් මාසය වන විට එම සියලු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අප කටයුතු කරමින් යනවා.

---

***** කථාව අවසානයේ පළ කර ඇත.**
* *உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
* *Produced at end of speech.*

සමස්ථ රාජ්‍ය සේවය පිළිබඳ සමාජය තුළ තිබූ අයහපත් පිළිගැනීම වෙනුවට වඩාත් සුහදායි ආකල්ප සහිත යාන්ත්‍රණයක් බවට පත් කිරීම සඳහා මගේ නායකත්වය යටතේ සුවිශාල පරිවර්තනයක් දැනට සිදු වී තිබෙනවා. රාජ්‍ය සේවය වඩා කාර්යක්ෂම බවත් වෙනදාට වඩා මහජන හිතෛෂී බවත් දැනට පිළිගැනෙමින් පවතිනවා. මෙම තත්ත්වය තවදුරටත් ශක්තිමත් කිරීම සහ රාජ්‍ය නිලධාරීන්ගේ පුහුණුව හා ධාරිතා සංවර්ධනය පිළිබඳ අප කැපවීමෙන් කටයුතු කර තිබෙනවා.

රජයේ සෑම නිලධාරියෙකුටම තම සේවා ස්ථානයෙන් ලබා ගත හැකි පුහුණුවීම් සඳහා පහසුකම් ලබා දීමේ වැඩපිළිවෙලවල් හා පහසුකම් අප ඇති කර තිබෙනවා. රාජ්‍ය සේවය තුළ පරිගණක භාවිතය අතිශයින් ඉහළ ගොස් ඇති අතර එම පහසුකම් තුළින් සේවා ස්ථානය තුළ පරිගණක පුහුණුව සඳහා අවස්ථාවන් අතිශයින් පුලුල් වී පවතිනවා.

මාණ්ඩලික මට්ටමේ නිලධාරින්ගේ පුහුණු අවස්ථාවන් වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නවීකරණයන් සිදුකරමින් පවතිනවා. විශේෂ ධාරිතා සංවර්ධන වැඩසටහන් මඟින් පරිපාලන නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනයටත් පශ්චාත් උපාධි මට්ටමේ පහසුකම් ලබා ගැනීමටත් අවශ්‍ය පහසුකම් සලසා දී තිබෙනවා. මාණ්ඩලික ශ්‍රේණිවල නිලධාරීන් සඳහා විදේශ අධ්‍යයන චාරිකා 275 ක් පමණ අප පසුගිය වසරේදී ඇති කර දී තිබෙනවා. මෙරට විශ්ව විද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දීමේ වැඩපිළිවෙලක් ද අප ක්‍රියාත්මක කරනු ලබනවා.

අතිගරු ජනාධිපතිතුමාගේ මහ පෙන්වීම යටතේ ඉන්දියාවේ සිවිල් සේවා පුහුණු ආයතනය වැනි ජාත්‍යන්තර පිළිගැනීමක් පවතින සිවිල් සේවා පුහුණු ආයතනයක් නුවරඑළිය ප්‍රදේශයේ ඉදිකිරීම සඳහා අප සැළසුම් සකස් කරමින් සිටිනවා.

මාණ්ඩලික මට්ටමේ නොවන නිලධාරීන්ගේ පුහුණු කටයුතු විධිමත් කිරීම සඳහා අප විසින් විවිධ පියවර ගෙන ඇති අතර මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ පුහුණු අවස්ථාවන් දිස්ත්‍රික් මට්ටමින් විමධ්‍යගත කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ පුහුණු ආයතන කිහිපයක් අප විසින් ස්ථාපිත කරනු ලැබ තිබෙනවා. මේ යටතේ නිලධාරීන් 12,000 කට අධික ප්‍රමාණයක් විවිධ විෂයන් යටතේ පුහුණු කිරීම සඳහා රුපියල් මිලියන 14 ක් පමණ මුදලක් අප විසින් මෙම වසර තුළ වැය කරනු ලැබ තිබෙනවා.

රාජ්‍ය සේවය තුළ තොරතුරු තාක්ෂණ භාවිතය වැඩිදියුණු කිරීමටත් එමඟින් මහජනතාවට සපයන සේවාවන් වඩා කඩිනමින් ඉටු කර දීමටත් විවිධ වැඩසටහන් අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් වෙනත් ආයතන සමඟ ඉටු කිරීම සඳහා අපට හැකියාව ලැබී තිබෙනවා. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සමඟ ඒකාබද්ධව දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 200 ක් පමණ e-BMD වැඩසටහන යටතේ මහජනතාවට අදාළ උප්පැන්න සහතික පිටපත් ආදිය කඩිනමින් ලබා ගැනීම සඳහා වූ ක්‍රමවේදයන් අප ක්‍රියාත්මක කර තිබෙනවා.

එසේම e-Divisional Secretariat වැඩසටහන යටතේ මහජන සේවාවන් ක්ෂණිකව ලබාදීම සඳහා අවශ්‍ය වූ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අප කටයුතු කරමින් සිටිනවා. ඒකාබද්ධ සේවාව වැනි අන්තර් අමාත්‍යාංශ මානව සම්පත් කළමනාකරණය සඳහා පහසුකම් සලසන e-HRM වැඩසටහන මඟින් නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්, උසස් වීම් ආදී කටයුතු කඩිනමින් ඉටු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් අප ඇති කර තිබෙනවා. එමෙන්ම ආයතන තුළ පරිගණක ජාල ගත කිරීම්, තොරතුරු පද්ධති පවත්වාගෙන යාම, ලිපි ගනුදෙනු හා තීරණ ගැනීම් විද්‍යුත් තැපැල භාවිතය මඟින් සිදු කිරීම් ආදී තොරතුරු තාක්ෂණ පහසුකම් හා භාවිතාවන් රාජ්‍ය සේවය තුළ අප ස්ථාපිත කර තිබෙනවා. ලක්ෂ 5කට අධික විශ්‍රාම වැටුප් ලබන්නන්ගේ තොරතුරු පරිගණකගත කරන ලද e-pension ව්‍යාපෘතිය මඟින් විශ්‍රාමිකයින් සඳහා අවශ්‍ය සේවාවන් කඩිනමින් ඉටු කර දීම සඳහා අවශ්‍ය පහසුකම් අප විසින් සලසා දී තිබෙනවා.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින සුවිශාල ආයතන පද්ධතියේ අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමටත්, ඒවා මහජන හිතකාමී ආයතන ලෙස පවත්වාගෙන යාමටත්, අප විශාල කාර්යයභාරයක් ඉටු කර තිබෙනවා. දිවයිනේ සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල පෞද්ගලික මට්ටමේ ආයතන මෙන් වඩා ආකර්ශනීය මට්ටමකින් වැඩිදියුණු වී තිබෙනවා. මෙම ආයතනවලට අවශ්‍ය ගොඩනැගිලි පහසුකම්, පරිගණක පහසුකම්, ගෘහ භාණ්ඩ, වෙනත් යටිතල පහසුකම් ඉතා ඉහළ මට්ටමකින් ලබා දීමට අපට හැකියාව ලැබුණා. සුනාමි ඛේදවාචකය තුළින් විනාශ වී ගිය සියළුම යටිතල පහසුකම් කුවේට් රජයේ අරමුදල් යටතේ නැවත ප්‍රතිසංස්කරණ කිරීමටත් නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 40ක් පමණ නැවත අළුතින් ඉදිකිරීමට අපට හැකියාව ලැබී තිබෙනවා. උතුරු හා නැගෙනහිර ප්‍රදේශයේ සිවිල් පාරිපාලනය නැවත ස්ථාපිත කිරීමටත්, ඒවාට අවශ්‍ය පහසුකම් ඉතා ඉක්මනින් දේශීය හා විදේශීය අරමුදල් යටතේ නැවත ගොඩනැඟීමටත් අපට හැකියාව ලැබී තිබෙනවා. උතුරු ප්‍රදේශයේ සිදුවන සුවිශාල සංවර්ධන වැඩසටහන් දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලබන අතර, සිවිල් පරිපාලනය සඳහා වූ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ මිලියන 1000කට ආසන්න මුදලක් වැය කිරීමටත් අදාළ සංවර්ධන කටයුතු 2012 වසරේදී අවසන් කිරීමටත් අප සැලසුම් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි,

මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ තවදුරටත් කාර්යක්ෂම හා මහජන හිතකාමී රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා 2012 අයවැය යටතේ අපගේ අමාත්‍යාංශයේ ඵලදායි වැඩපිළිවෙල තවදුරටත් ඉදිරයට ගෙන යාම සඳහා හැකියාවක් ලැබී ඇති බව ප්‍රකාශ කිරීමට කැමතියි. පසුගිය වසරවල අප විසින් ක්‍රියාවට නගනු ලැබූ විවිධ මානව සම්පත් කළමනාකරණ, සංවර්ධන හා සැලසුම් ක්‍රමවේද තවදුරටත් ඉදිරියට ගෙනයාම සඳහා අප දැනටමත් සැලසුම් සකස් කර තිබෙනවා. රාජ්‍ය සේවා කළමනාකරණ ක්‍රමෝපායන් වැඩිදියුණු කරමින් රාජ්‍ය සේවය සපයනු ලබන වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ආදිය සඳහා අවශ්‍ය කුසලතා සහිත මානව සම්පත් සැපයීමේ වගකීම තවදුරටත් ශක්තිමත් කිරීමට අප කටයුතු කරනු ලබනවා. සෞඛ්‍ය සේවය යටතේ ක්‍රියාත්මක කළමනාකරණ සහකාර සේවය දැනටමත් ඒකාබද්ධ සේවාවන්ට අන්තර්ග්‍රහණය කර ඇති අතර ඉදිරියේදී දුම්රිය කළමනාකරණ සේවාවද ඒකාබද්ධ සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ අවශ්‍යතාවයද හඳුනාගෙන තිබෙනවා. මේ මඟින් අදාළ සේවාවන්වල වඩා ඵලදායි ස්ථානමාරු හා උසස්වීමේ හැකියාවක් අදාළ රාජ්‍ය සේවකයන්ට ලබා දීම අපගේ අරමුණයි. එයට අමතරව ඉදිරි වසර තුළ ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අවශ්‍ය සියළුම තාක්ෂණ නිලධාරීන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම, ග්‍රාම නිලධාරි අවශ්‍යතා සම්පූර්ණ කිරීම හා මාණ්ඩලික නොවන අනෙකුත් නිලධාරීන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිළිබඳවද අපගේ ප්‍රමුඛ අවධානය යොමු වී තිබෙනවා.

රාජ්‍ය නිලධාරීන්ගේ සහජ කුසලතා නවීන යුගයට සරිලන පරිදි දියුණු කිරීම සඳහා නව පුහුණුවීම් ක්‍රම හඳුන්වාදීම සඳහා අපගේ අවධානය යොමු වී තිබෙනවා. විශේෂයෙන්ම ග්‍රාම නිලධාරීන්, මාණ්ඩලික නොවන මට්ටමේ නිලධාරීන්ගේ පුහුණුව සඳහා විශේෂ අවධානයකින් කටයුතු කරමින් වඩා මහජන හිතකාමී රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණයක් ශක්තිමත් කිරීම සඳහා අප සැලසුම් සකස් කර තිබෙනවා. රජයේ සංවර්ධන ඉලක්කයන් ගම තුළට ගෙන යාමේදී අප අමාත්‍යාංශය යටතේ ඇති ග්‍රාම නිලධාරී පරිපාලනය වඩා ශක්තිමත් කිරීම සඳහා අපගේ ඉල්ලීම පරිදි මෙවර අයවැයෙන් ඔවුන්ට විශාල සහන රැසක් ලබා දීමට අප කටයුතු කර තිබෙනවා. ඉදිරියේදී සියළුම ග්‍රාම නිලධාරීන් සඳහා කාර්යාල පහසුකම් වැඩි දියුණු කිරීමටත්, සේවා පියස සංකල්පය තවදුරටත් ශක්තිමත් කරමින් ග්‍රාමීය ප්‍රදේශ තුළ සියළුම රාජ්‍ය සේවාවන් එකම ස්ථානයකින් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම පිළිබඳ අප විශේෂ අවධානය යොමු කර තිබෙනවා.

මා මීට කලින් සඳහන් කර ඇති පරිදි රාජ්‍ය සේවකයින් සඳහා තොරතුරු තාක්ෂණ භාවිතය ඉහළ නැංවීම සඳහා දැනටමත් ක්‍රියාත්මක තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතින් හා උපාය මාර්ග තවදුරටත් පවත්වාගෙන යමින් රාජ්‍ය සේවය කාර්යක්ෂම යාන්ත්‍රණයක් බවට පත් කිරීමට අප කටයුතු කරනු ලබනවා. මෙම වසර තුළ e-BMD ක්‍රමය තවදුරටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 75ක් සඳහා අළුතින් ඇතුලත් කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලකින් මහජනතාවට අවශ්‍ය සිවිල් ලියාපදිංචි කටයුතු ඉටු කර ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීමටත් අප සැලසුම් කිර තිබෙනවා. දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වෙබ් අඩවි නවීකරණය කිරීමෙන් බොහෝ සේවාවන් අන්තර්ජාලය ඔස්සේ ලබා ගැනීම සඳහා පහසුකම් ඇති කර දීමට දැනටමත් කටයුතු කරමින් පවතිනවා.

**ගරු කථානායකතුමනි,**

රාජ්‍ය සේවාව වඩා ඵලදායීව පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය සේවා ආයතන සඳහා අවශ්‍ය යටිතල පහසුකම්, උපකරණ ආදිය නිසි පරිදි සපයාදීම සඳහා අප පසුගිය වසරවල දරණ ලද උත්සාහය තව දුරටත් ඉදිරියට ගෙන යාමට අප සැලසුම්කර තිබෙනවා. මේ යටතේ රජයේ නිලධාරීන්ගේ නිවාස ප්‍රශ්නය විසඳීම, කැප්පෙටිපොළ සමූළ නිවාස ඉදි කිරීම සඳහා පෞද්ගලික අංශය සමඟ අවශ්‍ය කටයුතු යෙදීමටත්, දැනට අමාත්‍යාංශය යටතේ ඇති සමූළ නිවාස 104 ක් අළුත්වැඩියා කිරීම සඳහාත්, 2012 වසර තුල සැලසුම්කර තිබෙනවා. පසුගිය වසරවල අප අමාත්‍යාංශය යටතේ ඇති සංචාරක බංගලා රජයේ නිලධාරීන්ගේ විවේකය

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

ගත කර ගැනීම සඳහා ජනප්‍රිය ස්ථාන බවට පත් වී ඇති අතර මේ මගින් රුපියල් මිලියන 30 ක පමණ ආදායමක් ද ලබා දීමට අපට හැකියාව ලැබී තිබෙනවා. 2011 වසරේදී මෙම සංචාරක නිවාසවල තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා විශේෂයෙන් කටයුතු කරනු ලැබූ අතර 2012 වසරේදී සියළු සංචාරක බංගලා වැඩි දියුණු කිරීමටත් නව සංචාරක බංගලා කිහිපයක් ඉදි කිරීම පිළිබඳවත් අපගේ සැලකිල්ල යොමු වී තිබෙනවා.

රාජ්‍ය සේවාවන් වඩා සැලසුම් කිරීම සඳහා අවශ්‍ය වූ ප්‍රතිපත්ති සංශෝධනය කිරීමටත් නව ප්‍රතිපත්ති හඳුන්වා දීම පිළිබඳවත් අප ඉදිරි වසර වලදී විශේෂ අවධානයකින් කටයුතු කිරීමට අදහස් කරනු ලබනවා.

මේ යටතේ ආයතන සංග්‍රහය ද්‍රවිඩ බවට පරිවර්තනය කිරීම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සරල කිරීම, චක්‍රලේඛ සංශෝධන වෙනුවට සංක්ෂිප්ත හා ඒකාබද්ධ චක්‍රලේඛ නිකුත් කිරීම ආදී රාජ්‍ය සේවාවන්ට බලපාන ආයතනික උපදේශන සේවා වඩා පහසු කිරීමට ඉදිරි වසරේදී හැකියාව ලැබෙනවා.

සියළුම රාජ්‍ය සේවාවන් සඳහා සේවා ව්‍යවස්ථාවන් සංශෝධනය කිරීමටත් වඩා ඵලදායී ලෙස සේවා ව්‍යවස්ථාවන් සකස් කිරීම පිළිබඳවත් ලබන වසරේදී විශේෂ අවධානයකින් කටයුතු කිරීමට අප අදහස්කරනු ලබනවා. රාජ්‍ය සේවා ප්‍රතිපත්ති මඟින් වඩා විනිවිද භාවයෙන් යුත් රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීම සඳහා නිපුණතා හා කුසලතා පදනම් කර ගත් විවෘත බඳවාගැනීමේ ක්‍රමවේදයක් මඟින් රාජ්‍ය සේවාව ශක්තිමත් කිරීම පිළිබඳ අප තවදුරටත් සැලකිල්ලෙන් යුතුව කටයුතු කරන බව සඳහන් කිරීමට කැමතියි. රාජ්‍ය සේවාවන් තුල පැවතිය හැකි දූෂණය, නාස්තිය, අවම කිරීම සඳහා අභ්‍යන්තර විගණන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු යෙදීමටත් දිස්ත්‍රික් මට්ටමේ අභ්‍යන්තර විගණක ඒකක ශක්තිමත් කිරීමටත් අප කටයුතු කිරීමට බලාපොරොත්තු වන අතර සංවර්ධන ක්‍රියාදාමයේදී ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජා පසුවිපරම් කමිටු යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිළිබඳව අපගේ අවධානය යොමු වී තිබෙනවා.මේ යඟින් සිදුවිය හැකි බොහෝ අක්‍රමිකතා අවම කිරීමටත් රාජ්‍ය සම්පත් වඩා ඵලදායීව භාවිතා කිරීම සඳහා ප්‍රජා දායකත්වය ඉහළ නැංවීමට හැකියාව ලැබෙනු ඇතැයි මා විශ්වාස කරනවා.

***සභාමේසය මත තබන ලද ලිපිය:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட கடிதம் :*
*Letter tabled:*

## Sinhalese Government Agents for the North

December 4, 2011, 8:18 pm

I refer to R. M. B. Senanayake's opinion on the above subject in The Island of the 3rd inst. I am prepared to accept his statement, '..in the past .... Sinhalese Government Agents in the North merely passed examinations in Tamil' were it only a confession. I for one had only a smattering of Tamil when I was posted to Jaffna as a Cadet in 1957. The working environment helped me to clear in six months both examinations in Tamil for which a grace period of ten years was given.

It is that knowledge of Tamil that helped me later to work among the Tamil residents in the jungles of Thennamaravadi, Tirumangalai and Sampur without the help of an interpreter, when I was GA, Trincomalee. I am aware of several other Sinhala GAs of the North who acquitted themselves with distinction despite the accident of their birth. Similarly language was no bar to Tamil GA's who worked in the South with remarkable success. Sivagnanam [illegible] of Hambantota and Sivanandan of Matara and Galle come readily to my mind.

However the crux of the matter is not linguistic competence. To my mind, the decision to exchange GAs between the North and the South is one of the most far-sighted policy initiatives taken of late. Exchange of envoys is a symbolic gesture of bilateral amity. Such exchange is bound to bridge the yawning gap between the North and the South with cross cultural fertilization. The leadership training gained through the initiative is bound to generate remarkable understanding and rapport between the communities. Speaking for myself, it is my direct association with the North and the East that has created in my heart the deep concern and sympathy for the lot of the Tamils, which is reflected in the articles published in my Ethnic Confrontation and National Integration in Sri Lanka.

**Somapala Gunadheera**

**නියෝජ්‍ය සභාපතිතුමා** (8th Start)
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

அடுத்து, மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன் அவர்கள். உங்களுக்கு 13 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளன.

[பி.ப. 1.38]

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

எனக்கு 15 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருப்பதாக அறிந்தேன். பரவாயில்லை!

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, நான் இங்கு தமிழ் மொழி அமுலாக்கல் தொடர்பான சில விடயங்களை முன்வைத்து, என்னுடைய பேச்சினை ஆரம்பிக்க விரும்பு கின்றேன். தமிழ்மொழி (விசேட ஏற்பாடுகள்) சட்டமானது, 1958ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 28ஆம் திகதி பாராளுமன்றத்தில் கொண்டுவரப்பட்டு, எட்டு வருடங்களுக் குப் பின்னர் 1966இல் தமிழ்மொழி விசேட அமுலாக்கல் தொடர்பான regulations உருவாக்கப்பட்டது. அதில் என்ன குறிப்பிடப்பட்டிருக்கின்றது என்றால், It states,

"1. (a) In the Northern and Eastern Provinces for the transactions of all Government and Public business and the maintenance of public records.

(b) In all correspondence between a person educated in Tamil with any official or between any local authority in the Northern and Eastern Provinces which conducts its business in the Tamil language and any official in his official capacity.

2. For all orders, Proclamations, rules, by-laws, regulations and notifications made or issued under any written law and all other publications, circulars and terms issued or used by the Government, Public Corporations and Statutory Institutions."

நான் இங்கு ஏன் இதனைக் குறிப்பிட்டேன் என்றால், எனக்கு முன்பு பேசிய அமைச்சர் மாண்புமிகு ஜோன் செனெவிரத்ன அவர்கள் மன்னாரில் ஒரு சிங்கள அரச அதிபர் நிமிக்கப்பட்டிருப்பது தொடர்பாகக் குறிப்பிட்டார். இலங்கை சுதந்திரம் அடைந்ததற்குப் பிற்பாடு, அம்பாறை மாவட்டம் என்றதொரு மாவட்டம் உருவாகியதிலிருந்து இன்றுவரை, 74 சதவீதம் தமிழ் பேசும் மக்கள் வாழுகின்ற அந்த மாவட்டத்தில் ஒரு தமிழரோ அல்லது தமிழ் பேசும் முஸ்லிமோ அரச அதிபராக நியமிக்கப்படவில்லை. இவ்வளவுதூரம் சிங்கள - தமிழ் ஒற்றுமையைப் பற்றியும் ஒருங்கிணைப்பைப் பற்றியும் பேசுகின்றவர்கள் ஏன் இதனைச் செய்யவில்லை? ஏற்கெனவே நான் குறிப்பிட்டதுபோன்று மன்னார் மாவட்டத்தில் மாத்திர மல்ல, 74-75 சதவீதமான தமிழ் பேசும் மக்கள் வாழுகின்ற திருகோணமலை மாவட்டத்திலும் இதுவரை ஒரு தமிழ் பேசும் அரச அதிபர் நியமிக்கப்படவில்லை. நீங்கள் பேசுகின்ற பொழுது மிகவும் இனிமையான வார்த்தைகளைப் பேச முடியும்; இனங்களுக்கு இடையில் ஐக்கியத்தைப் பற்றிப்பேச முடியும். ஆனால், செயற்பாடு என்று வருகின்றபொழுது அது அவ்வாறு இடம்பெறுவது இல்லை. இன்று மன்னாரில் அரச

அதிபராக நியமிக்கப்பட்டிருக்கின்ற சிங்கள இனத்தைச் சேர்ந்த உத்தியோகத்தர் ஓரளவு தமிழ் பேசக்கூடியவராக இருக்கலாம். ஆனால், அவர் administration - நிருவாக விடயத்தில் தனக்குக்கீழ் இருக்கின்ற அதிகாரிகளுடன் தமிழில் செயலாற்ற முடியுமா? அவரால் தமிழ் மொழிமூலம் முழுமையான நிருவாகத்தைச் சிறப்பாக நடத்தமுடியுமா? நீங்கள் சொல்லு கின்ற Tamil Language (Special Provisions) Act என்ன சொல்கின்றது? தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சரவர்கள் இதுதொடர்பில் என்ன கருத்துக்களைக் கொண்டிருக்கின்றார் என்று நாங்கள் அறிய விரும்புகின்றோம்.

இது மாத்திரமல்ல, யுத்தம் முடிவடைந்து 30 மாதங்கள் கடந்துள்ள நிலையிலும் வடக்கு, கிழக்கு மாகாண மக்கள் அதன் தாக்கங்களிலிருந்து மீளாத நிலையிலும் யுத்தத்தின் வடுக்கள் ஆறாத நிலையிலும் வாழ்ந்துகொண்டிருக்கிறார்கள். அங்கு நிரந்தர வீடுகள் இன்றி, வாழ்வாதாரங்கள் இன்றி, மக்கள் மீளக்குடியமர முடியாத நிலையிலும் பாதுகாப்பற்ற நிலையிலும் இருந்துகொண்டிருக்கின்றார்கள். அதற்கும் மேலாக, அங்கு இன்னும் உயர் பாதுகாப்பு வலயங்கள் - high security zones - என்ற தடைசெய்யப்பட்ட பிரதேசங்கள் காணப்படுகின்றன. இவற்றை நீக்கி, மக்களுக்கு நம்பிக்கை யளிக்கும்வகையில் முன்னுதாரணமாக நடக்கவேண்டிய இன்றைய சூழ்நிலையில், உங்களுடைய priority என்னவாக இருக்கிறது என்று பாருங்கள்!

"நடப்பவை எல்லாம் நடக்கட்டும்; நாங்கள் சிங்கள அதிகாரிகளை அங்கு கொண்டுசென்று நியமிப்போம்" என்றவாறு நீங்கள் செயற்படுவதைத் தமிழ் மக்கள் உடனடி யாக ஏற்றுக் கொள்ளக்கூடிய மனோநிலையில் இல்லை. உண்மையாகவே இந்தப் பிரச்சினைகளுக்குத் தீர்வு கண்டு, ஓர் ஐக்கியம் உருவாக்கப்பட்ட பின்னர் அங்கு சிங்கள அதிகாரி களைப் பதவியில் அமர்த்துகின்றபட்சத்தில் யாரும் அதுகுறித் துக் கேள்வி கேட்கப்போவது கிடையாது. ஆனால், யுத்தம் முடிவடைந்து, அந்த மக்கள் என்ன செய்வதென்று தெரியாமல் இன்னமும் பல்வேறு பிரச்சினைகளுக்குள் சிக்கித் திணறிக் கொண்டிருக்கின்ற சூழ்நிலையில், நீங்கள் செய்கின்ற இவ் வாறான விடயங்களை அவர்கள் ஏற்றுக்கொள்வதாக இல்லை.

கௌரவ அமைச்சர் அவர்களே, இன்று அங்கு என்னென்ன நடைபெறுகின்றது என்று பாருங்கள்! அங்கு தமிழ் மக்களு டைய சொந்தக் காணிகளில் இன்னமும் இராணுவத்தினர் குடிகொண்டிருக்கின்றார்கள். கிளிநொச்சியில் பரவிப் பாஞ்சான் என்ற அந்த முழுக் கிராமமுமே இராணுவக் குடியிருப்பாகத்தான் இருக்கின்றது. The people there own their deeds. They have the permits. வடக்கு, கிழக்கிலுள்ள பல இடங்களில் இன்னமும் இராணுவம் அகற்றப்படாமல் அந்த நிலங்கள் இராணுவத்தால் அபகரிக்கப்பட்டிருப்பதைப்பற்றி நான் ஏற்கெனவே இந்தச் சபையில் கூறியிருக்கின்றேன். இதேபோன்று வடக்கு, கிழக்கிலுள்ள சிங்களக் குடியேற்றங்கள் பற்றியும் நான் ஏற்கெனவே உங்களுக்குச் சொல்லியிருக் கின்றேன். ஒன்பதாயிரம் சிங்கள மக்களைக் கொண்டிருக்கின்ற வெலிஓயா, இன்று முல்லைத்தீவு மாவட்டத்துடன் சேர்க்கப் பட்டிருக்கின்றது. நீங்கள் அது தொடர்பாக எனக்கும் ஒரு கடிதம் எழுதியிருக்கின்றீர்கள். உண்மையில் என்ன நடைபெறு கின்றது? தனித் தமிழ் மாவட்டமாக இருந்த முல்லைத்தீவு மாவட்டத்துக்குள் ஒன்பதாயிரம் சிங்கள மக்கள் ஓர் இரவுக்குள் - overnight - கொண்டு வரப்பட்டிருக்கின்றார்கள். என்ன காரணத்துக்காக? ஆனால், நான் இதைப்பற்றிப் பேசினால் நீங்கள் இனவாதம் என்பீர்கள்! நிச்சயமாக இல்லை. நாங்கள் கூறுவதை நீங்கள் ஆராய்ந்து பார்க்க வேண்டும். தமிழ் மக்களுடைய உரிமைகளுக்காக ஒரு யுத்தம் நடந்தது. யுத்தம் முடிவுக்குக் கொண்டுவரப்பட்டாலும் இதுவரை அந்த இனப் பிரச்சினைக்குத் தீர்வு காணப்படவில்லை. அந்தத் தீர்வுக்கான பேச்சுவார்த்தையும் இழுபறி நிலையில் போய்க்கொண்டிருக் கின்றது. இப்படியான ஒரு சூழ்நிலையில், பிரச்சினைக்கு ஒரு தீர்வைக் கண்டு, அந்த மக்கள் நிம்மதியாக வாழக்கூடிய ஒரு நிலைமையை உருவாக்கிய பிற்பாடு, உங்களுடைய அதிகாரி களை அங்கு அனுப்புவீர்களாக இருந்தால் அதுகுறித்து யாரும் கேள்வி கேட்கப்போவது கிடையாது. அதேநேரம் நீங்கள் சொல்வதுபோன்று மூன்று பாஷைகளிலும் வல்லமை மிக்க வர்கள் வடக்கிலும் கிழக்கிலும் பணிபுரிவார்களாக இருந்தால் அதைப்பற்றியும் யாரும் கேள்வி கேட்கப்போவது கிடையாது. ஆனால், இன்றிருக்கின்ற நிலைமை அப்படியா? தயவுசெய்து பதில் சொல்லுங்கள்!

இலங்கையில் ஏறத்தாழ 26 வீதம் தமிழ் பேசும் மக்கள் வாழ்கின்றார்கள். அதேநேரம் இன்று 94 வீதமான சிங்கள மக்கள் நாட்டில் அரசாங்க நிர்வாக நடவடிக்கைகளில் ஈடுபட்டிருக்கின்றபோதும் எஞ்சிய ஆறு சதவீதமான தமிழ் பேசும் மக்களே இந்தச் சேவையில் இருக்கின்றார்கள். அதாவது வடக்கு, கிழக்கில் நாலு வீதம்; ஏனைய இடங்களில் பார்த்தால் இரண்டு வீதம். ஆகவே, இதில் எவ்வளவுதூரம் பாகுபாடு காட்டப்படுகின்றது என்பதை நீங்கள் முதலில் பாருங்கள்! பொலிஸ் திணைக்களத்தை எடுத்துக் கொள்ளுங்கள்! அது 98 சதவீதம் சிங்கள உத்தியோகத்தர் களைக் கொண்டதாக இருக்கின்றது. இராணுவத்தை எடுத்துக் கொள்ளுங்கள்! இராணுவத்தில் 99 சதவீதம் சிங்கள வர்கள்தான் இணைக்கப்பட்டிருக்கின்றார்கள். இந்தப் பாகு பாட்டைச் சுட்டிக்காட்டினால் நாங்கள் இனவாதம் பேசுவதாக நீங்கள் கூறுகின்றீர்கள். நிச்சயமாக இனவாதம் அல்ல. நீங்கள் இனங்களுக்கிடையில் இணக்கப்பாட்டை உருவாக்க வேண்டுமாக இருந்தால், இனங்களுக்கிடையில் சமத்துவத்தை உருவாக்க வேண்டுமாக இருந்தால், இந்த விஷயங்களில் மாற்றம் கொண்டுவர வேண்டும். குறைந்தபட்சம் ஓர் இன விகிதாசார ரீதியிலாவது இந்த நியமனங்களை வழங்க வேண்டும். அதாவது அந்த மக்களுக்கு உரித்தான வேலை களை நீங்கள் அவர்களுக்குக் கொடுப்பதற்குத் தயாராக இருக்க வேண்டும். ஆனால், அந்த விடயங்களை நிறைவேற்று வதை விடுத்து, ஓர் இன ஒற்றுமையை உருவாக்குவதற்கான முயற்சிகளில் ஈடுபடுவதாக பேச்சளவில் மட்டும் கூறுகின் றீர்கள்.

2009ஆம் ஆண்டு நடைபெற்ற SLAS examination இல் தமிழ் பேசுபவர் எவரும் தெரிவு செய்யப்படவில்லை என்பதும் அதற்குப் பிற்பாடு தமிழ் பேசும் மக்களை உள்வாங்குவதற்காக இன்னுமொரு SLAS examination க்கான gazette notification வெளியானது என்பதும் உண்மை. நான் அதற்கு கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றி சொல்லக் கடமைப்பட்டிருக் கின்றேன். ஆனால், தமிழ் பேசும் உத்தியோகத்தர்களை உள்வாங்குவதற்கென விண்ணப்பம் கோருவதற்கு முன்பாக, 2010ஆம் ஆண்டு இன்னுமொரு SLAS examination நடந்தது. 30 வயதுக்குள் தாங்கள் அந்தப் பரீட்சையை எழுதியாக வேண்டும் என்ற காரணத்துக்காகவும் தமிழ் பேசும் மக்களை மாத்திரம் உள்வாங்குவதற்கான ஒரு SLAS examination நடத்தப்படுமென்பது தெரியாததனாலும் தமிழ் பேசும் பரீட் சார்த்திகள் கொஞ்சப் பேர் அந்த இடைப்பட்ட காலத்தில் வந்த அந்த SLAS examination க்குத் தோற்றிவிட்டார்கள். ஆனால், இப்பொழுது தமிழ் பேசும் மக்களுக்கான அந்தப் பரீட்சையில் வயதெல்லையை 28 இலிருந்து 30 ஆக அதிகரித்திருக்கின்ற போதிலும், SLAS examination க்கு ஒருவர் இரண்டு தடவைதான் தோற்ற முடியும் என்பதனால் ஏறத்தாழ 100 பரீட் சார்த்திகள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். தமிழ் மொழிமூல

[ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා]

விண்ணப்பதாரிகளை உள்வாங்குவதற்கான பரீட்சைக்கான gazette notification வெளிவருவதற்கு முன்பாகவே, அவர்கள் இரண்டாவது தடவையாகவும் அந்தப் பரீட்சைக்குத் தோற்றி விட்டார்கள். எனவே, தமிழ் மொழிமூல விண்ணப்பதாரி களுக்கான அந்தப் பரீட்சைக்கு அவர்களால் மூன்றாவது முறையாகத் தோற்ற முடியாது. ஏறத்தாழ 100 பேர் இதனால் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். இது தொடர்பாகப் பாதிக்கப் பட்டவர்கள் எனக்கு ஒரு கடிதத்தையும் அனுப்பியிருக் கிறார்கள். அவர்களையும் நீங்கள் இந்தப் பரீட்சையை எழுதுவதற்கு அனுமதித்தால் நாங்கள் நன்றியுள்ளவர்களாக இருப்போம். தயவுசெய்து நீங்கள் இதனைக் கவனத்தில் எடுத்துக்கொள்ள வேண்டும். அந்த கடிதத்தை நான் உங்களுக்குத் தருகிறேன். அது தொடர்பாக உங்களால் நடவடிக்கையெடுக்க முடியுமாக இருந்தால் நிச்சயமாக சிறப்பானதாக இருக்கும்.

நான் இங்கு உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சு தொடர்பான இன்னுமொரு விடயம் பற்றியும் பேச வேண்டும். சம்பந்தப்பட்ட அமைச்சர் அவர்களும் இங்கு இருக்கின்றார். மாகாண சபை உறுப்பினர்கள் மக்களால் தெரிவுசெய்யப் படுகின்றனர். அந்த மாகாண சபைகளுக்கு ஏதோ சில அதிகாரங்களும் கொடுக்கப்பட்டிருக்கின்றன. அந்த அடிப்படையில் மாகாண சபை அதற்கான அமைச்சுக்களையும் உருவாக்கிக்கொள்கின்றது. Board of Ministers என்று நாங்கள் ஆங்கிலத்திலே சொல்கின்றோம். அந்த மாகாண அமைச்சுக் களுக்கு அதிகாரங்கள் இருந்தாலும், எல்லாவற்றையும் தானே செய்பவராக - Executive Governor - ஆக அங்கிருக்கின்ற ஆளுநர் இருக்கின்றார். Board of Ministers பொம்மைகள் போன்றிருக்கின்றனர்; அவர்களுக்கு எந்தவித அதிகாரங்களும் கொடுக்கப்படுவதில்லை. ஆளுநர் நேரடியாகச் செயலாளர் களைக் கூப்பிட்டு அவர்களூடாகத் தானே கருமமாற்று கின்றார். எந்த வேலையாக இருந்தாலும் - அது உத்தியோகம் வழங்குவதாக இருக்கலாம், ஏனைய அலுவல்களாக இருக் கலாம் - தானே எல்லாவற்றுக்கும் தகுதிவாய்ந்தவர்; தனக்கே அதிகாரம் இருக்கின்றதென்ற தோரணையில் ஆளுநர் நடந்துகொள்கின்றார். நிச்சயமாக கௌரவ அமைச்சருக்கும் அது தெரிந்திருக்கும். கிழக்கு மாகாணத்தில் இதுதான் நடந்துகொண்டிருக்கின்றது. ஆகவே, அப்படியொரு அதிவல்லமை வாய்ந்த ஆளுநர் - Executive Governor - இருந்தால் Board of Ministers அங்கு எதற்காக? தேர்தல் என்ன காரணத்துக்காக? மக்கள் ஏன் அவர்களைத் தெரிவு செய்ய வேண்டும்? மக்களால் தெரிவு செய்யப்பட்டவர்கள் அதனைச் செய்ய முடியாவிட்டால் எதற்காக அந்தச் சபையை உருவாக்க வேண்டும்? அங்கு ஆளும் கட்சி மற்றும் எதிர்க் கட்சியைச் சேர்ந்தவர்கள் எல்லோரும் இணைந்து அந்த Governor க்கு எதிரான ஒரு நம்பிக்கையில்லாத் தீர்மானத்தை நிறைவேற்றி யதுடன், அது சம்பந்தமாக ஜனாதிபதிக்கு அறிவித்தும்கூட, அதே Governor தான் இன்று வரையும் அங்கு செயற்பட்டு வருகின்றார்.

வடக்கு மாகாணத்தைப் பாருங்கள்! வடக்கு மாகாணத்தில் மாகாண சபை கிடையாது. அங்கு எந்தக் காலத்தில் மாகாண சபை வரும் என்பதும் தெரியாது. கிழக்கு மாகாணத்தில் யுத்தம் முடிவடைந்து இரண்டு நாட்களுக்குள் மாகாண சபைத் தேர்தல் அறிவிக்கப்பட்டது. ஆனால், வடக்கு மாகாணத்தில் யுத்தம் முடிந்து 30 மாதங்கள் கடந்துவிட்டபோதிலும் அங்கு இன்னும் மாகாண சபைத் தேர்தல் நடத்தப்படவில்லை. அரசாங்கம் விரும்பினால்தான் அது அங்கு நடக்கும்; அரசாங்கம் விரும்பா விட்டால் அது நடக்காது. இதுதான் இன்றிருக்கின்ற நிலைமை! அங்கு தேர்தலில் தெரிவு செய்யப்பட்ட பாராளுமன்ற உறுப்பினர்கள் இருக்கின்றார்கள். ஆனால், வட மாகாண ஆளுநர் வடக்கு மாகாண நிலைமைகள் தொடர்பாகவோ அல்லது வடக்கு மாகாண அபிவிருத்திகள் தொடர்பாகவோ என்றாவது ஒருநாள் அந்தப் பாராளுமன்ற உறுப்பினர்களைக் கூப்பிட்டுப் பேசியிருக்கின்றாரா என்றால் நிச்சயமாக இல்லை. தேவையென்றால் ஆளும் தரப்பில் இருக்கின்ற ஒருசிலருடன் பேசியிருக்கலாம். ஆனால், வடக்கு மாகாணத்தில் தமிழ்த் தேசியக் கூட்டமைப்புப் பாராளுமன்ற உறுப்பினர்கள்தான் பெரும்பான்மையாக இருக்கின்றார்கள். அங்கு கச்சேரிகளில் நடைபெறுகின்ற progress review meeting மற்றும் development meeting ஆகிய எதற்குமே அவர்கள் அழைக்கப் படுவதில்லை. நாங்கள் இங்கு இன ஒற்றுமையைப் பற்றிப் பேசுகின்றோம். ஆனால், அங்கு இருக்கின்ற ஆளுநர் முழுக்க முழுக்க தமிழ் மக்களுக்கு விரோதமாக நடக்கின்றார்.

கௌரவ அமைச்சர் அவர்களே! நான் இன்னுமொன் றையும் சொல்கின்றேன். அதாவது, வடக்கு மாகாண Governor அவர்களினாலும் அங்குள்ள ஓர் அமைச்சரினாலும் நேர்முகப் பரீட்சைகள் நடத்தப்படாமலேயே பல்வேறுபட்ட பதவிகளுக் கான நியமனங்கள் அங்கு வழங்கப்படுகின்றன. இதனால் குறித்த பதவிகளுக்கான நேர்முகப்பரீட்சை நடத்தப்பட்டவர் களுக்கு நியமனம் வழங்குவது நிறுத்தப்பட்டு, தாங்கள் விரும்பியவர்களுக்கு அந்த நியமனங்களை வழங்குகின்ற மிக மோசமான, அராஜகத்தனமான போக்கு அங்கு காணப் படுகின்றது. நாங்கள் இதைப்பற்றிப் பேசினால் யாரும் அதனைக் காது கொடுத்துக் கேட்கத் தயாரில்லை. காரணம், வடக்கின் ஆளுநர் ஓர் Army Commander; கிழக்கின் ஆளுநர் ஒரு Navy Commander. இவர்கள் ஜனாதிபதிக்குத் தேவை யானவர்களாக இருப்பதால்தான் ஜனாதிபதி அவர்கள்மீது எந்தவிதமான நடவடிக்கையும் எடுப்பதாக இல்லை.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා (පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா - உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சர்)

(The Hon. A.L.M. Athaulla - Minister of Local Government and Provincial Councils)

நீங்கள் ஆளுநர் தொடர்பாகப் பேசினீர்கள். உண்மையில் அங்குள்ள Board of Ministers மற்றும் ஏனையவர்கள் எழுத்து மூலம் இது தொடர்பாக ஏதாவது குறைபாடுகள் தெரிவித் திருந்தால் அதனைப் பற்றிப் பார்க்க முடியும். ஆனால், அவர்கள் எல்லோரும் மிகவும் நல்லுறவுடன் இருக்கின்றார்கள்.

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**

(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)

(The Hon. Suresh Premachandran)

உங்களது மாகாண சபை உறுப்பினர்கள் அவருக்கெதிராக நிறைவேற்றிய நம்பிக்கையில்லாத் தீர்மானம்தான் ஜனாதிபதி அவர்களிடம் போயிருக்கின்றது.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**

(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)

(The Hon. A.L.M. Athaullah)

இது மிகவும் பழைய கதை! இப்பொழுது முதலமைச்சர் மற்றும் ஆளுநர் ஆகியோர் மிகவும் நன்றாக இருக்கின்றார்கள்.

**නියෝජ්‍ය සභාපතිතුමා**

(பிரதித் தவிசாளர் அவர்கள்)

(The Deputy Chairman)

கௌரவ சுரேஷ் பிரேமச்சந்திரன்! உங்களுடைய உரையை முடித்துக்கொள்ளுங்கள்!

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

கிழக்கு மாகாணத்தில் இருப்பது உங்களுடைய மாகாண சபை. அதாவது அரசாங்கத்தினுடைய மாகாண சபை. அங்கு முதல்வராக இருப்பவர் மற்றும் எதிர்க் கட்சியில் இருக்கக்கூடிய எல்லோருமே இணைந்துதான்ஆளுநருக்கு எதிரான அந்த நம்பிக்கையில்லாத் தீர்மானத்தை நிறைவேற்றி ஜனாதி பதிக்கும் அதுகுறித்து அறிவித்திருக்கின்றார்கள். அது உங்க ளுக்கும் தெரியும்.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

நன்றி! முடித்துக் கொள்ளுங்கள்.

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

ஒரு நிமிஷம்! நான் முடிக்கின்றேன்.

ஆனால், அதற்கு எந்தவிதமான தீர்வுகளும் எட்டப்பட வில்லை. ஆகவே, அமைச்சர் அவர்களே நான் கூறிய விடயங் களைத் தயவுசெய்து கவனத்தில் எடுத்துச் செயற்படுங்கள்!

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

உங்களுடைய தரப்புக் கொறடா உங்களுக்கு மேலும் ஐந்து நிமிடங்கள் கொடுக்கச் சொல்கின்றார்.

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

நன்றி. ஏனையோர் பேச வேண்டும் என்பதால் நான் என்னுடைய உரையை இப்போது முடித்துக் கொள்கின்றேன்.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

கிழக்கு மாகாணத்திலே ஏற்கனவே ஏதாவது பிரச்சினைகள் இருந்திருந்தால் அப்படி அவர்கள் எழுதியிருக்கலாம்.

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

அமைச்சரவர்களே, உங்களுடைய நேரத்தில் நீங்கள் பதிலளிக்கலாம். இன்று நாட்டில் Executive President பதவியில் இருக்கின்றார். ஆனால், Executive Governor இருக்கின்றாரா என்றுதான் நான் கேட்கின்றேன். Executive Governor இருந்தால் அது வடக்கிலும் கிழக்கிலும் மாத்திரம் தானா, அல்லது ஏனைய மாகாணங்களிலுமா? என்றும் கேட்கின்றேன்.

இலங்கையில் ஜனநாயகம் இருப்பதாக வெளிநாடுகளிலே பகட்டான பிரச்சாரம் செய்யப்படுகின்றது. மேதகு ஜனாதிபதி அவர்கள் பாலித்தீவுக்குச் சென்று அங்கு பேசுகையில், "இலங்கை உலகத்திலேயே பழைமைவாய்ந்த ஜனநாயகத்தைக் கொண்ட நாடு" என்று சொல்லி இருக்கின்றார். ஆனால், யாழ்ப்பாணத்தில் இருக்கின்ற நாங்கள் - கௌரவ அமைச்சர் அவர்களே தயவுசெய்து கேளுங்கள் - அங்கு வாய் திறக்க முடியாதிருக்கின்றது. அதாவது, வடக்கு, கிழக்கில் ஒருவிதமான ஜனநாயகம்! வெளியில் இன்னொரு விதமான ஜனநாயகம்! உண்மையாகவே உங்களுடைய ஜனநாயகம் எனக்குப் புரியவில்லை.

இன்று காலையிலும் நான் இந்தச் சபையிலே ஒரு விடயத்தைக் கூறினேன். அதாவது யாழ்ப்பாணத்தில் we are totally under army occupation. இராணுவ உளவுப் பிரிவினர் helmet அணிந்துகொண்டு யாழ்ப்பாணம் பல்கலைக்கழகத் திற்குள் சென்று அங்கிருக்கின்ற ஒரு notice board ஐ உடைக்கின்ற அளவுக்கு மோசமான சூழ்நிலைதான் இன்னமும் யாழ்ப்பாணத்தில் இருக்கின்றது. நான் இதனைச் சொன்னால் நீங்கள் அப்படி இல்லை என்று கூறுவீர்கள். ஆனால், that is the fact; that is what is happening. இன்று யுத்தம் முடிந்து 30 மாதங்கள் கடந்துவிட்டபோதிலும் தமிழ் மக்கள் முழுமையாக இயல்பு வாழ்க்கைக்குத் திரும்ப முடியவில்லை; அவர்கள் சிறுகச் சிறுகவாயினும் ஒரு சாதாரண வாழ்க்கையை அனுபவிப்பதற்கு அனுமதியுங்கள்; குறைந்த பட்சம் அவர்கள் தங்களது காரியங்களைச் செய்ய அனுமதியுங்கள் என்றுதான் நாங்கள் கோருகின்றோம்.

கௌரவ அமைச்சர் அவர்களே! நீங்கள் வவுனியாவில் இருந்து புறப்பட்டால் யாழ்ப்பாணம் செல்ல முன்னர், யுத்தத்தில் வென்ற இராணுவத்தினருக்கு எத்தனையோ நினைவுச் சின்னங்கள் இருப்பதைக் காணலாம். Gateway to Jaffna, அதாவது Elephant Pass இல் மிகப் பிரமாண்டமான ஓர் இராணுவ நினைவுத்தூபி அமைக்கப்பட்டிருப்பதைக் காணலாம். அவ்வாறே, கிளிநொச்சியிலும் முல்லைத்தீவிலும் அவற்றினைப் பார்க்கலாம். ஆனால், அங்கிருந்த தமிழ் மக்களின் விடுதலைக்காகப் போராடியவர்களின் நினைவுத் தூபிகள் அனைத்தும் தரைமட்டமாக்கப்பட்டிருக்கின்றன. எனது தொகுதியான கோப்பாய்த் தொகுதியில் முன்னர் ஒரு திறந்தவெளிச் சிறைச்சாலை இருந்தது. அந்த சிறைச்சாலைக் கைதிகள் அங்கு விவசாயம் செய்ய அனுமதிக்கப்படுவார்கள். ஒரு காலகட்டத்தில் விடுதலைப் புலிகள் தமது மாவீரர் துயிலும் இல்லமாக அதனைப் பாவித்தார்கள். இன்று அது தரைமட்டமாக்கப்பட்டு அங்கு இராணுவ முகாம் அமைக்கப் பட்டிருக்கின்றது. அது மக்கள் குடியிருக்கின்ற சன நெருக்கடி மிக்க ஓரிடம்! இவ்வாறான ஒரு நிலையில்தான் தமிழ் மக்கள் வைக்கப்பட்டிருக்கின்றார்கள்! இந்த நிலைமையே அங்கு தொடர்ந்துகொண்டிருக்கின்றது. ஆகவேதான் இதில் மாற்றங்கள் வேண்டுமென்று நாங்கள் கேட்கின்றோம். அப்படி மாற்றங்கள் உருவாகாதவரை நீங்கள் எடுக்கின்ற நடவடிக் கைகள் மக்கள் மத்தியில் கோபத்தையும் ஆத்திரத்தையும்தான் ஏற்படுத்தும்.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

உங்களுடைய உரையை முடித்துக்கொள்ளுங்கள்.

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

உண்மையாகவே நீங்கள் நாடகம் நடிப்பதாகவே தமிழ் மக்கள் உங்களைப் பார்ப்பார்களே தவிர, தங்களை அரவணைப்பவர்களென உங்களைப் பார்க்க மாட்டார்கள். ஆகவே, தமிழ் மக்களை நம்பிக்கைகொள்ள வைக்கும் செயற் பாடுகளில் ஈடுபடுவதோடு, அதற்கு முதற்கட்டமாக தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர் அவர்கள் அவரது காலத்திலாவது 1958ஆம் ஆண்டு கொண்டுவரப்பட்ட தமிழ் மொழி அமுலாக்கல் சட்டத்தை வடக்கு, கிழக்கில் சரியான முறையில் நடைமுறைப்படுத்த வேண்டுமெனத் தயவுடன் கேட்கின்றேன். நன்றி.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
கௌரவ சுரேஷ் பிரேமச்சந்திரன் அவர்களே, உங்களுடைய உரையுடன் சம்பந்தப்பட்டதாக ஒரு விடயத்தை நான் கூற விரும்புகின்றேன். வட மாகாண ஆளுநர் மாவட்ட அபிவிருத்திக் குழுவில் இணைத் தலைவராகவும் - Joint Chairman - இருக்கின்றார். மேலும், போட்டிப் பரீட்சையில் தோன்றிய பரீட்சார்த்திகளுக்கு அநீதி ஏற்பட்டால் பாதிக்கப் பட்ட பரீட்சார்த்திகள் அதற்கெதிராக வழக்குத் தாக்கல் செய்யலாம். நன்றி.

[අ. භා. 1.58]

**ගරු රත්නසිරි වික්‍රමනායක මහතා (යහපාලනය හා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்னசிறி விக்கிரமநாயக்க - நல்லாட்சி மற்றும் உட்கட்டமைப்பு அமைச்சர்)
(The Hon. Ratnasiri Wickramanayaka - Minister of Good Governance and Infrastructure)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමාගේ කථාවට මම ඉතාමත්ම වුවමනාවෙන් සවන් දීගෙන හිටියා. එතුමා එක දෙයක් කිව්වා. ඒක තමයි, ඕනෑම රාජ්‍ය සේවකයෙක් ලංකාවේ ඕනෑම තැනක සේවය කිරීමට ලකලෑස්ති වෙන්න ඕනෑය කියන එක. මම ඒ කථාවත් එක්ක එකඟ වන අතර, එයට එක කොන්දේසියක් එක්කාසු කරන්නයි සූදානම් වන්නේ. එවැනි නිලධාරියෙක් කොහේ සේවය කළත් තමා ළඟට එන්නා වූ පුද්ගලයා කථා කරන භාෂාවෙන් ඒ ප්‍රශ්නය නිරාකරණය කර දීමට ඒ නිලධාරියාට ශක්තියක් තිබිය යුතුයි. ඒකයි මම කියන්නේ. ඒ භාෂා දැනුම අත්‍යවශ්‍යයි. ප්‍රදේශයක් ගැන නොවෙයි මා මේ කථා කරන්නේ. තමන් ළඟට එන පුද්ගලයා මොන භාෂාවෙන්ද කථා කරන්නේ, ඒ භාෂාවෙන් ඒ මනුස්සයාගේ ප්‍රශ්නය නිරාකරණය කර දීලා එම පුද්ගලයා සතුටු කිරීමට ඒ පුහුණුව, ඒ දැනීම ඒ නිලධාරියාට ලබා දිය යුතුයි කියන එකයි මගේ විශ්වාසය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විෂයය මමත් කාලයක් කළා. එදා තිබුණු තත්ත්වයයි අද තිබෙන තත්ත්වයයි හුඟක් වෙනස්. එදා රාජ්‍ය සේවකයෝ ලක්ෂ පහක් විතර හිටියේ. ගරු ඇමතිතුමනි, මම දන්නේ නැහැ අද ඉන්න ගණන හරියටම කීයද කියලා. මම විශ්වාස කරනවා සමහර විට ලක්ෂ 12ත් පැනලා ඇති කියලා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ලක්ෂ 13යි.

**ගරු රත්නසිරි වික්‍රමනායක මහතා**
(மாண்புமிகு ரத்னசிறி விக்கிரமநாயக்க)
(The Hon. Ratnasiri Wickramanayaka )
ලක්ෂ 13ක් ඉන්නවා. එම නිසා ප්‍රශ්න හුඟක් උග්‍රයි; බරපතළයි. එදා තිබුණු සමාජය නොවෙයි අද තිබෙන්නේ. ඒ සමාජයේ ඉල්ලීම් නොවෙයි අද තිබෙන්නේ. ඒ අනුව කල්පනා කරලා බැලුවාට පස්සේ, මේ අමාත්‍යාංශය සෑහෙන වැඩ කොටසක් කරලා තිබෙනවා. විශේෂයෙන් උතුරු හා නැඟෙනහිර පළාත්වල සිවිල් පාලනය ඇති කිරීමට මේ අමාත්‍යාංශය සෑහෙන බරක් ඇද්දා. ඒ සම්බන්ධව අපේ ස්තුතිය ඇමතිතුමා ප්‍රමුඛ අමාත්‍යාංශයට පිරිනමන්න ඕනෑ.

තව කාරණයක් මම ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට යොමු කරනවා. රාජ්‍ය සේවකයෝ ලක්ෂ 13ක් විතර වුණාට පස්සේ ප්‍රශ්න වැඩි වන එක ඇත්ත. ප්‍රශ්න වැඩි වුණා කියලා අපට ඒවායින් අයින් වෙන්න බැහැ. ඒවාට විසඳුමක් දෙන්නත් ඕනෑ. අද චෝදනාවක් එනවා රාජ්‍ය සේවය කඩා වැටිලා කියලා. මම රාජ්‍ය ප්‍රතිසංස්කරණය අමාත්‍යාංශය භාරව සිටි කාලයේ ඒ අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමාම තමයි දැන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කරන්නේ.

ඒ කාලයේ අප වෘත්තීය සමිති සාකච්ඡාවක් කැඳවපු වෙලාවක ඒ වෘත්තීය සමිතිවලින් පැහැදිලිව කියැවුණු එක් දෙයක් තමයි, අද රාජ්‍ය සේවයේ කෙනෙක් වැඩ කරන්නේ පැය තුනහමාරක් වැනි සුළු කාලයක්ය කියන එක. ඒකට නොයෙක් නොයෙක් හේතු තිබෙන්න පුළුවන්. ප්‍රවාහන සේවයේ ප්‍රමාදවීම්, පාසල් ප්‍රශ්න වැනි නොයෙක් නොයෙක් හේතු තිබෙන්න පුළුවන්. එහෙම ප්‍රශ්න තියෙද්දී රාජ්‍ය සේවකයෙක් පැය තුනහමාරට වැඩි සේවාවක් ලබා දෙන්නේ නැහැයි කියන පැහැදිලි ප්‍රකාශය ඔවුන් කළා. කොයි ආකාරයෙන්ද මේ මට්ටම නඟා ගන්න පුළුවන් කියලා අපි කල්පනා කරලා බැලුවොත් මම විශ්වාස කරනවා රාජ්‍ය සේවකයාගේ ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයි කියලා. ඔවුන් සිතන ආකාරය සම්බන්ධව වෙනසක් ඇති විය යුතුයි. ඉල්ලීම් විතරක් නොවෙයි වගකීම් ගැනත් ඔවුන්ට අවබෝධයක් ඇති කර දිය යුතුයි. ඒ සඳහා පුහුණුවක් දිය යුතුයි. ඒ පුහුණුව එක අවුරුද්දකට සීමා කළ යුතු නැහැ; අවුරුද්දකට සැරයකට සීමා කළ යුතු නැහැ. එය නිරන්තර පුහුණුවක් විය යුතුයි. ඒකයි මම කල්පනා කරන්නේ. ඒකට දැනට පහසුකම් නැහැ.

ලංකාවේ ඉන්න හැම නිලධාරියාම ස්ලීඩා ආයතනයට ගෙන්වන්න එපා. දිස්ත්‍රික් මට්ටමින් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන ඇති කළ යුතුයි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමට යන්න පුළුවන් නම් තවත් හොඳයි. එතකොට ඒ ප්‍රදේශයේ ඉන්න සෑම රාජ්‍ය නිලධාරියාම නිරන්තර පුහුණුවකට ලක් කළ හැකියි. මොකද, සමාජය වෙනස් වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ වෙනස් වන සමාජයත් එක්ක ප්‍රශ්නත් වෙනස් වෙනවා. ඒ ප්‍රශ්නවලට තිබෙන විසඳුම් ද වෙනස් වෙනවා. එම නිසා නිරන්තර පුහුණුවක් දීම කාලෝචිතයි. මම දන්නවා දැනට තිබෙන තත්ත්වයන් යටතේ අමාත්‍යාංශයට එක පාරටම මේක කරන්න බැරි වේවි කියා. නමුත් සමහර විට විදේශ ආධාර ලබා ගෙන ඒ සම්බන්ධ වැඩ පිළිවෙළකට ක්‍රමානුකූලව විධිමත්ව යෑමට පුළුවන් වේවි කියලායි මා කල්පනා කරන්නේ. මා ඒ කෙරෙහි ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරවනවා.

ගරු ඇමතිතුමනි, COPE වාර්තාවෙනුත් එළිදරව් වුණා ලේකම්වරුන්ගේ රාජකාරි හරියට ඉටු වෙලා නැහැ කියලා. අමාත්‍යාංශයක ප්‍රධාන ගණන් තැබීමේ නිලධාරියා වන්නේ ලේකම්වරයායි. ඇමතිවරයා ප්‍රතිපත්ති විතරයි තීන්දු කරන්නේ. අමාත්‍යාංශය දුවවන්නේ ලේකම්වරයායි. සල්ලි වියදම් කිරීම් සම්බන්ධව ගණකාධිකාරිවරයා වශයෙන් වැඩ කරන්නේ ලේකම්වරයායි. එම නිසා එවැනි තනතුරක් දරන පුද්ගලයකුගේ තත්ත්වය හොඳ නැහැ කියනවා නම්, ඒ රාජකාරි හරියට ඉටු කරලා නැහැ කියනවා නම් ඒක බරපතළ ප්‍රශ්නයක්. ඒකත් රාජ්‍ය සේවය කඩා වැටීමට හේතු වනවාට කිසිම අනුමානයක් නැහැ. එම නිසා මේ COPE වාර්තාව සම්බන්ධයෙනුත් නිශ්ශබ්ද නොවී ඉදිරියේදී පියවර ගන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලනවා ගරු ඇමතිතුමනි. මා ඉස්සර වෙලා කියපු ආකාරයට, පුහුණුවීම් නිරන්තරව කරනවා නම් මේ ප්‍රශ්න, ගැටලු ඇති වන්නේ නැහැ. නමුත් පුහුණුවීම් නිරන්තරව කරන්නට දැනට ශක්තියක් නැහැ. දැනට ශක්තියක් නැති බව මම පිළිගන්නවා. නමුත් අපි ඒ රාමුව හදා ගන්නට ඕනෑ. මේක අවශ්‍යතාවක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොන රජයක් තිබුණත් ඒ රජයේ ප්‍රතිපත්ති ගමට ගෙන යන්නේ රාජ්‍ය සේවකයායි. ග්‍රාම නිලධාරි මහත්මයා රජය වෙනුවෙන් ගමේ සෑම දෙයකටම පාහේ සම්බන්ධ පුද්ගලයායි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දන්නවා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ග්‍රාම නිලධාරි කොට්ඨාස අලුතින් කැඩීමේ වැඩ පිළිවෙළක යෙදිලා ඉන්නා බව. ගෙවල් 500කට එක ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් වශයෙනුයි ඒ අය හදන්න බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැබැයි භූගෝලීය වශයෙනුත් අප මේ ප්‍රශ්නය ගැන බැලිය යුතුයි. ගම්බද අර ගෙන බැලුවොත් ගෙවල් 500ක් කියන්නේ සෑහෙන ප්‍රදේශයක්. කොළඹ වාගේ, නගරවල වාගේ යාබදව ගෙවල් නැහැ. ගෙවල් 500 කියන ඉලක්කය ඒ විධියටම තියා ගත්තොත් නම් අපි අමාරුවේ වැටෙනවා. සමහර තැන්වල භූගෝලීය පිහිටීම අනුව ගෙවල් 500ට වඩා අඩු කරන්න වේවි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එම නිසා ප්‍රායෝගිකව, ජනතාවට සේවයක් වන ආකාරයට එම කටයුත්ත සිදු කිරීම කෙරෙහි මා ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරවන්න සූදානම්. ගණනක් මිම්මක් හිතේ තියා ගත්තාට කමක් නැහැ. නමුත් පහසු වන ආකාරයට ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ග්‍රාම නිලධාරි මහත්වරුන්ටත් නිරන්තර පුහුණුවක් දෙන්න ඕනෑ කියා මම කියනවා. ඒ අය රජයේ සේවකයෝ. ඒ අය තමයි ගම් මට්ටමින් රජය නියෝජනය කරන්නේ. ගම නැඟුම වෙන්න පුළුවන්, නොයෙක් සංවර්ධන ක්‍රියා දාම වෙන්න පුළුවන්, ඒ සෑම එකකම පුරුක ග්‍රාම නිලධාරියායි. එම නිසා නිතරම ඔහු දැනුවත් කරන්න ඕනෑ. පළල් වශයෙන් ගත්තොත් රාජ්‍ය සේවය වැටීමකට ලක් වෙලා කියන චෝදනාවෙන් එය නිදහස් කර ගන්නට ඕනෑ. ඒක ගොඩ ගන්න නම් ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් ඇතිව අවබෝධයක් ලබා දීමට කටයුතු කරන්න ඕනෑ. ඒක අත්‍යවශ්‍යයි. රාජ්‍ය සේවාව කඩා වැටුණොත් බරපතළ ප්‍රශ්න ගණනාවකට අපට මුහුණ දෙන්න සිදු වෙනවා. පරිපාලන යන්ත්‍රණය කඩා වැටෙනවා කියන්නේ භයානක දෙයක්. අපි ඒ තත්ත්වයෙන් රාජ්‍ය සේවය බේරා ගන්නට ඕනෑ. මෙන්න මේ අදහස් ටිකයි මා තමුන්නාන්සේ ඉදිරියේ තබන්නේ ගරු ඇමතිතුමනි. මේ අදහස් අනුව ඉදිරියේදී රාජ්‍ය පරිපාලන සේවය හෙවත් රාජ්‍ය සේවය හොඳ අතට හරවා ගන්නට අපට පුළුවන් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ස්තුතියි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

The next speaker is the Hon. Joseph Michael Perera. Order, please! The Hon. R. Yogarajan will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

[අ. භා. 2.06]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වැදගත් අමාත්‍යාංශ දෙකක්, පුළුල් වැඩසටහනක් අපි සාකච්ඡා කරන වෙලාවේ රාජ්‍ය පරිපාලනය පිළිබඳවත්, පළාත් සභා වැඩ පිළිවෙළ පිළිබඳවත් කථා කරන්නට මා අදහස් කළා.

පළමුවන්ම රාජ්‍ය පරිපාලනය ගනිමු. අපේ ඉතාම හොඳ ඇමතිවරයෙක් එය භාරව ඉන්නවා. එතුමා ඇමතිකම් කීපයක් කරලා තිබෙනවා. එතුමාට හොඳ අවබෝධයක් තිබෙනවා. ඒ වාගේම ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමා - අපේ හිටපු අගමැතිතුමා- මේ අමාත්‍යාංශය භාරව සිටියා. එතුමාගේ කාලයේදීත් ඉතාම හොඳ වැඩ කොටසක් කෙරුණා. අද අපේ මතයත්, රටේ මතයත් තමුන්නාන්සේලාගේ බොහෝ මන්ත්‍රීවරුන්ගේ මතයත් වන්නේ මේ රාජ්‍ය පරිපාලනය කඩා වැටිලා ඇති බවයි. කිව්වාට තරහා වෙන්න එපා. මම ඒකට කාරණාත් කියන්නම්.

ගරු රත්නසිරි වික්‍රමනායක ඇමතිතුමන් -අපේ ජ්‍යෙෂ්ඨ ඇමතිතුමන්- ග්‍රාම නිලධාරින් පිළිබඳව ප්‍රකාශයක් කළා. මම මේවා ලියා ගෙන තිබුණා, කථා කරන්න. අද ඔබතුමා කියන තත්ත්වයෙන් නොවෙයි, ග්‍රාම නිලධාරින් ගමේ ඉන්නේ. ඒ අයට වැඩක් නැහැ. ඒ රාජකාරි කඩලා කඩලා බෙදලා දීලා. එතුමන්ලාට ඡන්ද ලැයිස්තු පිළිබඳ වැඩ පිළිවෙළක් තිබෙනවා. අපිත් එය දන්නවා. ඊට එහා වැඩ පිළිවෙළක් නැහැ. රජය බලාපොරොත්තු වන සංවර්ධන ක්‍රියාදාමයේ වැඩක් කරන්න නම් මේ රාජ්‍ය පරිපාලනය තුළ අතිවිශාල වෙනසක් ඇති වෙන්නට ඕනෑ. ඒ වෙනස ඇති වන්නේ ග්‍රාම නිලධාරි මට්ටමෙන් ජනගහනය, පවුල් ගණන, ප්‍රදේශය අපි සැලකිල්ලට අරගෙන සංවර්ධන ඒකකයක් පිහිටෙව්වොත් විතරයි.

දැනට මේ ඒකකයේ වැඩ කරන ගම් මට්ටමේ රාජ්‍ය නිලධාරින් කී දෙනෙක් සිටිනවාද? ග්‍රාම නිලධාරි මහත්මයා ඉන්නවා; සමෘද්ධි නිලධාරි මහත්මයා ඉන්නවා; පවුල් සෞඛ්‍ය සේවිකාව ඉන්නවා; ධීවර පරීක්ෂකතුමා ඉන්නවා. ඒ වාගේම කෘෂිකර්ම අංශයෙන් ඉන්නවා. මේ විධියට අපි බලපුවාම එක ගමක වැඩ කරන්න විවිධ කාර්යන් සඳහා රාජ්‍ය නිලධාරින් කී දෙනෙක් සිටිනවාද? ඒ වාගේම රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් මා අහන්න කැමැතියි, ප්‍රාදේශීය ලේකම් මට්ටමට ගියාම ප්‍රාදේශීය ලේකම්තුමා යටතේ විවිධ අමාත්‍යාංශවලින්, දෙපාර්තමේන්තුවලින් සම්බන්ධ කරලා තිබෙන නිලධාරිනුත් ඇතුළුව නිලධාරින් කොච්චර සිටිනවාද කියලා. ඒක මේ පොත්වල කොහේවත් සටහන් වෙලා නැහැ. ඒක තමයි රාජ්‍ය පරිපාලනයේත්, බිම් මට්ටමේ සහ ඊළඟ තිබෙන මට්ටමේ අති විශාල ව්‍යුහය. මේ ව්‍යුහයන් දෙකම කඩා ගෙන වැටිලා. රාජකාරිවල බෙදීම ඉතාම සංකීර්ණ වැඩක්. ඒ සංකීර්ණ ක්‍රමය තුළ එතුමන්ලාට කරන්න තිබෙන වැඩ කොටස ගැන මා කිව්වොත්, සමහර නිලධාරින්ට කරන්න වැඩ කොටසක් නැහැ.

ගරු ඇමතිතුමා කිව්වා, කළමනාකරණ සේවය ගැන; අලුතෙන් පත් කරපු අය ගැන. ඒ අයට තවම හරි පුහුණුවක් ලැබිලා නැහැ. ඒ අයට කරන්න වැඩක් නැහැ. එහෙම නැත්නම් වැඩක් පටන් ගත්තාම එතැන් සිට දිගටම මේ සංවර්ධන ක්‍රියාදාමයට ඒගොල්ලන්ට සම්බන්ධ වන්නට බැහැ. මා උදාහරණයක් කියන්නම්. මා කිහිප වතාවක්ම මේ ගැන කියා තිබෙනවා. අපේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගේ කැබිනට් මණ්ඩලය සමඟ අපි සාකච්ඡා කරපු Select Committee එකේදීත් මා මේ ගැන කිව්වා. විද්‍යා මධ්‍යස්ථානවල ඉන්නේ හොඳ පළපුරුදු උපාධිධාරියෙක්. එයා විවිධ අංශවලින් පුහුණු වීම් කරනවා. ඒ පුහුණුවීම් කරලා ඊට පසුව පුහුණු වුණු එක්කෙනාට මේ සංවර්ධනයට හවුල් වෙන්න මාර්ගය හදන්න විධිමත් සැලැස්මක් නැහැ. ඒක එකක්. මේක මමත් දැකලා තිබෙන දෙයක්. මොකද, මේ අයත් එක්ක මා හුඟාක් සම්බන්ධ වන නිසා. ඒ හැම අංශයෙන්ම එහෙමයි. අද අපි වියදම් අතින් කල්පනා කරලා බැලුවොත් එක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක විවිධ අංශවල රාජ්‍ය සේවකයින් කොච්චර සිටිනවාද? ඇස්තමේන්තු අරගෙන කරන මේ ගණන් හිලවුවලට වඩා රාජ්‍ය පරිපාලනය, මහ ජන සම්බන්ධතා පිළිබඳවයි මට ලොකු වැටහීමක් තිබෙන්නේ. සෞඛ්‍ය අංශයෙන් බැලුවොත්, අධ්‍යාපන අංශයෙන් බැලුවොත්,

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

ධීවර අංශයෙන් බැලුවොත්, කෘෂිකර්ම අංශයෙන් බැලුවොත්, ආරක්ෂක අංශයෙන් බැලුවොත් නිලධාරින් කොච්චර සිටිනවාද? සේවාවන් සඳහා අති විශාල ප්‍රමාණයක් සිටිනවා. නමුත් තවම බෙංගු මදුරුවෝ ඉන්නවා. එන්න එන්නම වැඩි වනවා. ඕක අඩු කර ගන්න බැහැ. විශාල නිලධාරින් පිරිසක් සිටිනවා. අධ්‍යාපනය පැත්තෙන් බැලුවොත් ඒ එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක - එක ආසනයක- අති විශාල ප්‍රමාණයක් ගුරුවරුන් සිටිනවා. ඒ වාගේම ඒ ගුරුවරුන්ව පාලනය කරන, ඊට එහායින් සුදුසුකම් නැති අයත් ඉන්නවා. ගුරුවරුන් තරම්වත් සුදුසුකම් නැහැ. එහෙම අයත් සිටිනවා. අවසාන ප්‍රතිඵලය මොකක්ද? විශ්වවිද්‍යාලයට යන කිහිප දෙනායි, සාමාන්‍ය පෙළ සමත් කිහිප දෙනායි සිටින්නේ. එතැනින් එහාට ඉන්නේ අනෙක් පැත්තට යන අය. මොකක්ද වෙන්නේ? මම ඇමතිතුමාට දොස් කියනවා නොවෙයි. රාජ්‍ය පරිපාලන ව්‍යුහය ගැනයි මම මේ කථා කරන්නේ. ඒක තමුන්නාන්සේට අයිති ලොකු භාරදූර වැඩ කටයුත්තක්. එතැනින් එහාට වැඩ පිළිවෙළක් ඇත්තේ නැහැ.

අද සමෘද්ධිය ගැන කථා කරනකොට කියන්නට ඕනෑ, මේ සමෘද්ධිය සම්බන්ධ ආකල්පය මේ රටට ඉදිරිපත් කළේ රණසිංහ ප්‍රේමදාස මැතිතුමා බව. එතුමා කිව්වා, ඉතා ලස්සන කතන්දරයක්. "නැහැයි, බැහැයි කියන එක හුරු ජනතාවක් නොවෙයි මේ රටේ ඉන්නේ. කම්මැළි ජනතාවක් නොවෙයි මේ රටේ ඉන්නේ. හොඳ බුද්ධියක් තිබෙන, දෑත ශක්තිමත් ජනතාවක්. මේ අය කන්න විතරක් නොවෙයි ඉල්ලන්නේ. ඒ අයගේ බුද්ධියෙන්, ඒ වාගේම දෑතින් මේ රටට යම් කිසි සේවයක් කරන්නයි ඉල්ලන්නේ." කියලා එතුමා කිව්වා.

ඒ අනුව තමයි සමෘද්ධිය පටන් ගත්තේ. ඒක මුදල් දෙන වැඩ පිළිවෙළක් විතරක් නොවෙයි. සමහර අය මේ වැඩ පිළිවෙළ පරිවර්තනය කර ගත්තා මුදල් දෙන වැඩ පිළිවෙළක් බවට. ඒක වැරැදියි. මේ පිරිස මේ රටේ සංවර්ධනයට දායක කර ගන්නේ කොහොමද කියලා කල්පනා කරලා තමයි එතුමා අර වචන ටික කිව්වේ.

අපි දිස්ත්‍රික්කයක් හැටියට ගත්තොත් එක දිස්ත්‍රික්කයක නිවාස අධිකාරියේ නිලධාරින් කොච්චර ඉන්නවාද? ගරු ඇමතිතුමනි, නිවාස අධිකාරියේ නිලධාරින් කොච්චර පිරිසක් ඉන්නවාද? ඒ කටයුත්තට සම්බන්ධ වන නිලධාරින් කොච්චර ඉන්නවාද? හැදෙන ගෙවල් ප්‍රමාණය කොච්චරද? යම් වැඩ පිළිවෙළකට අනුව තමයි රාජ්‍ය පරිපාලනය හැටියට අපේ වැඩ පිළිවෙළ සකස් විය යුත්තේ. මේ සම්බන්ධයෙන් එක වරදක් තිබෙනවා.

දැන් ඔබතුමා කිව්වා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ඇති e -government කියන එක ගැන. මා ඒ ගැන කල්පනා කරන්නේ එහෙම නොවෙයි. උප්පැන්න සහතිකයක්, මරණ සහතිකයක් ගන්න විතරක් නොවෙයි, මේ රාජ්‍ය නිලධාරින්ගේ කාර්ය භාරය, වෙන් වන මුදල් ප්‍රමාණය, අප බලාපොරොත්තු වන ඉලක්ක යන මේ සියල්ල ගැනම සැලසුම් හදලා ඕනෑ කෙනෙකුට බලන්න පුළුවන් තත්ත්වයට අපේ මේ අලුත් තාක්ෂණ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ඕනෑ. එහෙම කරන්න පුළුවන්. ඒ වැඩ පිළිවෙළ පටන් ගන්න තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්. නමුත් අපට කොහොමවත් පෙනෙන්නේ නැහැ, මේ වැඩ පිළිවෙළ ජනතාවට හුරුයි කියලා.

ජනාධිපතිතුමා කථා කළා, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව; ගමේ සම්බන්ධතාව පිළිබඳව. නමුත් අපට එහෙම සම්බන්ධතාවක් පෙනෙන්නේ නැහැ. මා ඔබතුමාට එක උදාහරණයක් කියන්නම්. මේ පාර්ලිමේන්තුවේ මා ප්‍රශ්නයක් ඇහුවා,"ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දහතුනක් තිබෙනවා. මේ කොට්ඨාස දහතුනේ ඉන්න සමෘද්ධි ආධාර ලබන අය කවුද, සමෘද්ධි ආධාරය ලැබිලා පසුව කපා හැරපු අය කවුද, මට පෞද්ගලිකව ඒ අයගේ නම් දෙන්න"කියලා. මේ තොරතුරු ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කොම්පියුටරයේ තිබෙන්නට ඕනෑ දෙයක්. ඒවා රහස් නොවෙයි. එතැන වැඩ කරන්න නිලධාරින් ඉන්නවා. ඒ අය ඒ තොරතුරු දන්නවා. ඊට පිටස්තරව සිටින ග්‍රාම නිලධාරි මහත්වරුන් ඒ තොරතුරු දන්නවා. මොන දෝෂයක් නිසා හෝ වේවා, ඒ තොරතුරු කොම්පියුටර් එකෙන් අරගෙන මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න තමුන්නාන්සේලාට බැරි වුණා. එහෙනම් ඒ මුදල් ගලා ගෙන එන වැඩ පිළිවෙළ බලන්න ක්‍රමයක්, මේ මුදල් ගියේ සුදුස්සන්ටද, නුසුදුස්සන්ටද, නිලධාරින් අතටද කියලා බලන්න පුළුවන් පරිපාලන ව්‍යුහයක් එතැන නැහැ.

හිටපු ගරු ඇමතිතුමාගේ කථාව සම්බන්ධයෙනුත් මා පිළිතුරක් දෙන්න ඕනෑ. අද පරිපාලන සේවයේ ප්‍රාදේශීය ලේකම්වරු ඉන්නවා. ඊට ඉහළින් අමාත්‍යාංශ ලේකම්වරු ඉන්නවා. ඒ වාගේම විවිධ සංස්ථාවල ඉහළ තනතුරු දරන නිලධාරින් ඉන්නවා. මේ ලේකම්වරුන්ගේ දැනීම පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. ඒ අය රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන නිලධාරින් තමයි. නමුත් ඒ අයට ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නට පුළුවන් ඉඩක්, දේශපාලන නිදහසක් තිබෙනවාද? අද ඒක නැහැ. මේක අද විතරක් නොවෙයි, බොහොම හුඟක් කල් ඉඳලා පැවැතෙන දෙයක්. නමුත් එක්තරා කාලයක සිටියා, රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ආදායම් එකතු කිරීම, වියදම් කිරීම ආදී මේ සියලු දෙයක්ම ගම් මට්ටමෙන් පරිපාලනය කරන්නට පුළුවන් නිලධාරියෙක්. අපි ඉස්සර එතුමාට කිව්වේ, RDO -Rural Development Officer- කියලායි. ඊට පසුව මේ නම වෙනස් කර ගත්තා. ඊළඟට එතුමාට AGA කියලා කිව්වා. ඊට පස්සේ කිව්වා, දිස්ත්‍රික් ලේකම්ගේ දෙවැනියා ප්‍රාදේශීය ලේකම් කියලා. ඒ අය ඉතාම හොඳ නිලධාරින් කොටසක්; බොහොම අවංකව වැඩ කරපු නිලධාරින් කොටසක්. මේ නිලධාරින්ට වැඩ කරන්න තිබෙන වෙලාවට වඩා, රැස්වීම්වලට යන්න තිබෙන වෙලාව වැඩියි; පිළිගැනීම්වලට යන්න තිබෙන වෙලාව වැඩියි; මුල් ගල් තියන්න යන්න තිබෙන වෙලාව වැඩියි. මේක තමයි අද මේ රටේ පරිපාලනයේ තිබෙන කඩා වැටීම. ගම් මට්ටමෙන් ග්‍රාම නිලධාරි මහත්මයාගේ ඉඳලා ගත්තොත්, ඒ අයට ආත්ම ශක්තියක්, අභිමානයක් ඇතිව වැඩ කරන්න පුළුවන් ආකාරයෙන් එතුමන්ලාට අපි සලකා තිබෙනවාද?

මම දන්නා හැටියට ශ්‍රේණිගත කිරීමේදී ලිපිකරුවන්ගෙනුත් පහළ තත්ත්වයට ග්‍රාම නිලධාරින් වැටිලා තිබුණා. යම් විෂමතාවක් ඇති වෙලා ඒ විධියට පහළට වැටිලා තිබුණා. ඉතින් කොහොමද එතුමා නායකයකු විධියට වැඩ කරන්නේ? එහෙම වැඩ කරන්න බැහැ. මම මේ කිව්වේ ග්‍රාම නිලධාරින් ගැන විතරයි. ඒ නිසා මේ නිලධාරින්ට දිය යුතු සහන අපි ඉතාම අගය කොට සලකනවා. එය රාජ්‍ය පරිපාලනයට අයිති වැඩ කොටසක්.

අනෙක් එක COPE වාර්තාවේත්, අපේ Select Committeeයේ,-[බාධා කිරීමක්] ඔබතුමා පසුව උත්තර දෙන්න. මගේ වෙලාව ගත වෙනවා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ග්‍රාම නිලධාරින්ගේ අභිමානය රැකෙන විධියට අපි පියවර කීපයක්ම මෑතකදී ගත්තා. ඒ අයගේ දීමනා වැඩි කළා; වගකීම් වැඩි කළා. ඒ වාගේම ඒ අය කටයුතු කළ යුතු ආකාරය ගැන දැනුවත් කළා. ඒ අය එදාට වඩා අභිමානවත් පිරිසක් බවට පත් කළා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු ඇමතිතුමා, ඒ කරපු වැඩ කොටස ඔබතුමා අපට ලිඛිතව දෙනවා නම් අපි පිළිගන්නම්. නැත්නම් කොහොමද පිළිගන්නේ?

ඒ අභිමානය වැඩි කිරීමට ගත්ත පියවර ලිඛිතව දෙන්න. [බාධා කිරීමක්] ගත්ත පියවර තිබෙනවා නේ. ඇමතිතුමා, අපිට මෙහෙම නිකම් කථා කරන්න පුළුවන්. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කොහොමද දන්නේ මේ අභිමානය කොහොමද දුන්නේ කියලා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඒක ග්‍රාම නිලධාරින් දන්නවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපට ග්‍රාම නිලධාරින්ගෙන් අහන්න යන්න බැහැ. අපි අහන්නේ පාර්ලිමේන්තුවෙන්. තමුන්නාන්සේ ග්‍රාම නිලධාරින්ගෙන් අහලා මේ පාර්ලිමේන්තුවට කියන්න. පාර්ලිමේන්තුව හැටියට අපි අහන්නේ, "කොහොමද, ඒක සිද්ධ වෙලා තිබෙන්නේ?" කියලායි. මම දන්නා තොරතුරු කියන්නේ නැහැ ඒ අයට ප්‍රශ්නයක් වෙයි කියලා. මම කියන්නම්. අභිමානය තිබෙන්නේ මෙන්න මෙහෙමයි. ග්‍රාම නිලධාරිවරයාගේ කාර්යාලයට කවුරු හෝ ආවාම වාඩි වෙන්න පුටු තිබුණේ නැහැ! මම කියන්නේ නැහැ මේ කොහේද කියලා, ඒ නිලධාරින්ට හොඳ නැති නිසා. ඒ අයට විමධ්‍යගත මුදලින් පුටු ලබා දුන්නේ මමයි. මෙන්න ඒ අයගේ අභිමානය තිබෙන හැටි! ග්‍රාම නිලධාරි කාර්යාලයට කෙනකු ආවාම ඉඳ ගන්න දෙන්න පුටුවක් නැහැ! ඒකද අභිමානය? තමුන්නාන්සේ අභිමානය ගැන කියපු නිසායි මම ඒක කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය පරිපාලන විෂයය කියන්නේ විශාල පරාසයක් තිබෙන එකක්. මම ළඟදී පාසල් කීපයකට ගියා. ඒ පාසල්වලින් මගෙන් ඉස්සෙල්ලාම ඉල්ලුවේ මොනවාද? ගුරු පුටු. ගුරුවරුන්ට ඉඳ ගන්න පුටු නැහැ. ඉතින් කොහොමද ඒ අයට අභිමානයක් තිබෙන්නේ? ගුරුවරයාට ඉඳ ගන්න පුටුවක් නැති වුණාම ඒ ගුරුවරයාට අභිමානයක් තිබෙනවාද? ඒ ගුරුවරයාට අභිමානයක් තිබෙනවාද? ඒ ගුරුවරයාට අභිමානයක් නැහැ. ලිඛිතවත් මා ළඟ ඒ විස්තර තිබෙනවා. මම මේ කියන්නේ රාජ්‍ය පරිපාලනය ගැන. [බාධා කිරීමක්] මම කියන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය ගැන නොවෙයි, රාජ්‍ය පරිපාලනය ගැන. රාජ්‍ය පරිපාලනය කියන්නේ, - තමුන්නාන්සේ වාගේ නිකම් කොන් වෙච්ච වෙනම අමාත්‍යාංශයක් නොවෙයි- මුළු රටේම රාජ්‍ය පරිපාලනය. ඒ රාජ්‍ය පරිපාලනයේ යෙදිලා ඉන්න නිලධාරින්ට තිබෙන ප්‍රශ්න පිළිබඳව, ඔවුන්ගෙන් ලැබෙන ප්‍රතිඵල පිළිබඳව, ඒ ප්‍රතිඵල වැඩි කර ගන්න අපි යොදා ගන්න උපක්‍රම පිළිබඳව අපි සොයා බලන්න ඕනෑ. ඒක තමයි රාජ්‍ය පරිපාලනය කියන්නේ. එක එක තැන්වලින් කෑලි කෑලි අර ගෙන අපි කථා කරනවා නොවෙයි මේ. එහෙම අඩු පාඩු කියන්න මම ලෑස්ති නැහැ. මම මේ බොහොම පැහැදිලිව කියන්නේ රාජ්‍ය පරිපාලනය පිළිබඳව. මේ වෙන් වෙන මුදල් කොහොමද වියදම් වන්නේ? මම ඒ ගැනයි කියන්නේ.

සමහර ආයතනවල ගිණුම් පරීක්ෂා කරන නිලධාරින් ඉන්නවා. සමහර තැන්වල නැහැ. සමහර ආයතනවල විස්තර අපට හම්බ වුණා. එකක් තමයි National Water Supply and Drainage Board එක. ඒ වාර්තාවේ තිබෙනවා, ඒ අයට ගිණුම් නිලධාරින්ගේ විශාල හිඟයක් තිබෙනවා කියලා. සමහර අමාත්‍යාංශ තිබෙනවා, ඒවායේ ගණන් හිලව් බලන්න, වියදම් වන මුදල් හරිද කියලා බලන්න වැඩ පිළිවෙළක් නැහැ. අද ගිණුම් නිලධාරින් හුඟක් හිඟයි. මම ඒකයි කියන්නේ. මම එක තැනක අඩුවක් කියලා එතැනින් නතර වෙන්නේ නැහැ. මේ වෙන් කරන මුදල් ඒ අවශ්‍ය තැනට, ඒ අවශ්‍ය ප්‍රදේශයට, ඒ අවශ්‍ය පුද්ගලයාට ගෙන යන්නේ කොහොමද කියන වැඩ පිළිවෙළ තමයි මම මේ කිව්වේ. ඒක විවිධ අමාත්‍යාංශ හරහා, විවිධ දෙපාර්තමේන්තු හරහා සිදු විය යුතුයි.

මේ වැඩ පිළිවෙළේදී ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා තමයි ප්‍රධාන ගිණුම් නිලධාරියා. ප්‍රධාන විගණන නිලධාරියා ලෙස ඉන්නේ එයා. එයා තමයි ගිණුම් කටයුතුවලට වග කියන්න ඕනෑ. එහෙම වග කියන්න තරම් හැකියාවක් ඔහුට නැත්තේ ඇයි? එහෙම වන්නේ අවශ්‍ය නිලධාරින් පිරිස ඒ නිලධාරියාට නැති නිසායි. මේක තමයි අපට හම්බ වුණ වාර්තාවේ තිබෙන ඉතාම වැදගත් කොටස. එහෙම නම් ඒ නිලධාරියා තනියෙන් වැඩ කරන කෙනෙක්.ඔහුට මුදල් පිළිබඳව, ඒ ගණන් හිලව් පිළිබඳව තිබෙන වගකීම් ඉෂ්ට කරන්නට ඕනෑ කරන අනෙකුත් නිලධාරින් එතැනට දීලා නැහැ. එම නිසා ලේකම් මහත්වරුන්ට විතරක් දොස් කියා එතැනින් අපට ඉවත් වන්නට බැහැ. රාජ්‍ය පරිපාලන ව්‍යුහයේ වැඩ කොටස ගැන අප දැන් පල්ලෙහා සිට කථා කළා. ඉහළ ඉඳලා කථා කළොත් ප්‍රධාන වශයෙන්ම අපට කියන්නට තිබෙන්නේ මේ නිලධාරින්ගේ තිබෙන ප්‍රශ්න පිළිබඳවයි.

අපේ ග්‍රාම නිලධාරි මහත්වරුන්ට මම විශේෂ ස්තුතියක් කරනවා. මොන ප්‍රශ්න තිබුණත් දේශපාලන භේදයෙන් තොරව ඔවුන් ඉතාමත් හොඳ වැඩ කොටසක් කර තිබෙනවා. එසේම ඉතාම හොඳ වැඩ කොටසක් කරනවා. මට ලැබිච්ච සන්දේශයක් තිබෙනවා. මේක කෙටි වෙලාවක් තුළදී කියවන්නට මම උත්සාහ කරනවා. අපට කරුණු කිහිපයක් ගැන කියන්නට තිබෙනවා. නමුත් වෙලාව හුඟක් ගත වී තිබෙනවා.

මන්ත්‍රීවරුන්ගේ නිලධාරින් ඉන්නවා. ඒ අය තාවකාලිකව වැඩ කරන අය; අවුරුදු පහක් වැඩ කළ අය නැත්නම් අවුරුදු 10ක් වැඩ කළ අය. ඒ නිලධාරින්ගේ ඉල්ලීමක් තිබෙනවා; ඒ ලිපිකරුවන්ගේ, ඩ්‍රයිවර්ලාගේ ඉල්ලීමක් තිබෙනවා. ඒ තමයි ඔවුන් වැඩ කරන කාලය තුළ අග්‍රහාර රක්ෂණ වැඩ පිළිවෙළට සම්බන්ධ වන්නට අවස්ථාවක් ලබා දෙන්නටය කියන එක. ගරු ඇමතිතුමා, මේ පාර්ලිමේන්තුවේ අප ළඟ -මේ 225 දෙනා ළඟ- වැඩ කරන නිලධාරින් ඉන්නවා. අමාත්‍යාංශවල වැඩ කරන නිලධාරින් ඉන්නවා. මේ අයට පෙන්ෂන් එකත් නැහැ; EPF එකත් නැහැ; EPF එකට යන්නත් බැහැ. ඒ අය ඉල්ලීමක් කරනවා, අග්‍රහාර රක්ෂණ වැඩ පිළිවෙළට සම්බන්ධ වෙන්න. ඒ යන මුදල ඒ ගොල්ලෝ දෙන්නට කැමැතියි. අග්‍රහාර රක්ෂණ වැඩ පිළිවෙළ සඳහා දැනට රජයේ සේවකයෙකුගෙන් රුපියල් 75ක් පඩියෙන් කපනවා. ඒ වාගේ ක්‍රමයක් තුළ ඒ නිලධාරින්ටත් මේ සම්බන්ධතාව ඇති කරන්නටය කියා ඉල්ලා සිටිනවා. මේ වෙච්ච වරදක්. මම දන්නේ නැහැ, අනෙක් මන්ත්‍රීවරු මේකට කොච්චර දුරට එකඟ වේවිද කියා.

දැන් අපට රක්ෂණයක් දෙනවා. ලක්ෂ 2යි ඔක්කොටම. මේ අයත් අග්‍රහාර රක්ෂණ ක්‍රමයට මුදලක් දීලා සම්බන්ධ කර ගන්න. එතකොට මේ වරප්‍රසාදය ඒගොල්ලන්ටත් ලැබෙනවා. [බාධා කිරීමක්] ඔවුනුත් අග්‍රහාර රක්ෂණ ක්‍රමයට සම්බන්ධ කර ගන්න. එතකොට අපට මේ රාජ්‍ය ව්‍යුහය තුළ ඉතා හොඳ වැඩ කොටසකට යන්නට පුළුවන්. මෙය වැය ශීර්ෂ පිළිබඳ කොමිටියේදී කථා වුණා. රාජ්‍ය පරිපාලනයට හසුරුවන්නට පුළුවන්, මේ අග්‍රහාර රක්ෂණ වැඩ පිළිවෙළ පිළිබඳව ඔබතුමාගේ අවධානයත් තිබෙන නිසා. මේකට මේ අයත් සම්බන්ධ කර ගන්නට පුළුවන්. ඒ අය ගෙවීමක් කරන්නට ලෑහැස්තියි. එවැනි පිරිසක් ඉන්නවා. ඒ අය තමයි අප හැම දාම කෑ ගහලා, කෑ ගහලා මේ අග්‍රහාර රක්ෂණ වැඩ පිළිවෙළට ඇතුළත් කර ගත්තේ. ඒ අයට මේ අග්‍රහාර රක්ෂණ වැඩ පිළිවෙළින් යම් සහනයක් ලැබෙනවා. අග්‍රහාර රක්ෂණ වැඩ පිළිවෙළේම එය සඳහන් වෙනවා. කෙනෙක් හදිසි අනතුරකින් මිය ගියොත් ලක්ෂ 6ක් ගෙවනවා. සේවයේ සිටියදී ස්වාභාවික ලෙස මැරුණොත් රුපියල් 50,000ක් ගෙවනවා. මේ එකම පුද්ගලයා සම්බන්ධයෙන්. මේ එකම පුද්ගලයා. ඔහු සේවයේ සිටියදී මිය ගියොත් -හොඳ ශරීර සෞඛ්‍යයක් ඇති කෙනෙකු හැටියට නේ සේවයට යන්නේ. ඒ වාගේ වෙලාවකදී ඔහු මිය ගියොත්- "ස්වාභාවික මරණයක්" කියා -අප දන්නේ නැහැ, ස්වාභාවික මරණය මොකක් ද කියා-

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

ඔහුට රුපියල් 50,000ක් ගෙවනවා. ඔහුගේ පවුලට එච්චරයි හම්බු වෙන්නේ. "ඇක්සිඩන්ට්" එකක් වුණොත් ලක්ෂ 6ක් ගෙවනවා. මේකේ ලොකු විෂමතාවක් තිබෙනවා. ඒක ඔබතුමාගේ අවධානයට මම යොමු කරනවා. කොහොම වුණත් අග්‍රහාර රක්ෂණ වැඩ පිළිවෙළ තව ශක්තිමත් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක්; රාජ්‍ය සේවකයා නිදහස් වන වැඩ පිළිවෙළක්. මේක ඉතා වැදගත්. රාජ්‍ය සේවකයා දිරිමත් කරනවාය කියන්නේ මේවා උඩයි.

රාජ්‍ය සේවකයා, පුද්ගලික අංශයේ සේවකයා අද හුඟක් රස්තියාදු වෙන්නේ එක්කෝ සෞඛ්‍යයට. මේක තමයි ලෙකුම ප්‍රශ්නය. එහෙම නැත්නම් දරුවන්ගේ අධ්‍යාපනයට. එහෙමත් නැත්නම් නිවාස ප්‍රශ්නයකට. අපට අවශ්‍යතාවක් තිබෙනවා, මේ සෑම රජයේ සේවකයකුටම ගෙයක් ලබා දීමේ වැඩ පිළිවෙළක් හදන්න. ලෝකයේ නොයෙක් රටවල මේවා තිබෙනවා. මේවා අලුත් දේවල් නොවෙයි. අපට අලුතෙන් හිතන්න වන්නේ ඒකයි. සුදුසු ගෙයක් හදලා -ණයක් දෙන්න නොවෙයි- දෙන්න. ඔහුට ගෙවන්නට පුළුවන් ක්‍රමයකට ඔහුගේ මුළු කාල පරිච්ඡේදය තුළම ගෙවන්න කියන්න. කොච්චර ගෙවල් හැදෙයිද? අද රාජ්‍ය සේවකයාට ගෙයක් හදා ගන්ට බැරි ඒ දරුවන්ට ගෙයක් හදා දෙන්නට බැරි ප්‍රධාන හේතුව මොකක්ද? ඒ ණය මුදලයි, පොලියයි නිසා. ඒක දරන්න බැහැ. ඒක නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, වහාම ක්‍රියාත්මක වන පරිදි සෑම රාජ්‍ය සේවකයකුටම නිවාසයක් ලබා දීමේ වැඩ පිළිවෙළක් හදන්නය කියා. දැනට ගෙවන්නට පුළුවන් ප්‍රමාණයට දෙන්න. මෙච්චර ප්‍රමාණයක් ගෙවන්න, පොලිය මෙච්චරයි කියලා අපි නිශ්චිත ගණනක් දැම්මොත්, ඒක ඔහුට ගෙවා ගන්න බැරි වෙනවා. මොකද, අද තිබෙන්නේ එක ජීවන තත්ත්වයක්, හෙට තිබෙන්නේ වෙනත් එකක්. ඒ නිසා ඔහු ණය ගන්නේ නැහැ. පුළුවන් විධියට ගෙවන්නය කියලා දෙන්නට තීරණය කළොත්, ඒ රාජ්‍ය සේවකයා රාජ්‍ය සේවයෙන් අයින් වෙලා වෙන කොහේ හරි රස්සාවකට යනවා නම්, ඔහු යන්නේ ගෙයක අයිතිකාරයෙක් හැටියටයි. ඔහුට ඕනෑ නම්, රජයේ මුදල ගෙවලා ඒ ගෙය විකුණන්න පුළුවන්. මේ අලුත් වැඩ පිළිවෙළට ඇතුළු වුණොත් අපට පුළුවන් ඒ ගැන හිතන්න. ඒ සඳහා අපට මුදල් තිබෙනවාද? ඔව්, මේ රටේ වැඩ කරන ජනතාවගේ මුදල් තිබෙනවා. මම මේ රාජ්‍ය සේවයත් එක්කම සම්බන්ධ කරන්නේ මොකද? මම රාජ්‍ය සේවකයා කියලා කියන්නේ මේ රටේ වැඩ කරන ජනතාවටයි. ඒක තමයි මගේ ඔළුවේ තිබෙන්නේ. තමුන්නාන්සේලාත් රජයේ වැඩ පිළිවෙළට පොඩ්ඩක් සම්බන්ධ වෙන්න. පෞද්ගලික අංශයේ සහ සංස්ථා අංශයේ වැඩ කරන සේවකයන් ගැන අනෙක් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කරන කොට මම කියනවා.

EPF එකේ රුපියල් ට්‍රිලියනයක් මුදල් තිබෙනවා. ඒ කියන්නේ රුපියල් බිලියන 1,000ක්. Employees' Trust Fund එකේ රුපියල් බිලියන 1,200ක් විතර තිබෙනවා. මම හිතන හැටියට ඒ ගණන හරි. ඒ මුදල් කම්කරු ජනතාව වෙනුවෙන් ආයෝජනය කරන්න ඉඩක් සලසා දෙන්න. ඉඩක් දෙනවා කියන්නේ කොටස් වෙළෙඳ පොළේ නොවෙයි, තමන්ගේ ගෙදරට, තමන්ගේ දරුවන්ගේ අධ්‍යාපනයට ඒවා යොදන්න ඉඩක් දෙන්න. මේක තමයි රාජ්‍ය සේවයේත්, පෞද්ගලික සේවයේත් අද තිබෙන කැපී පෙනෙන තත්ත්වය. අද රාජ්‍ය සේවයට ඇදිලා එන්නේ pension එක නිසායි. ඒක අපි පිළිගන්නවා. නමුත් ඊට එහායින් යන ජීවන සැලැස්මකට ඒ දෙගොල්ලෝම කොටු වෙලා, හිර වෙලා ඉන්නවා.

අද විවාදයේදී ඉස්පිරිතාල ගැනත් කථා කළා. ගණන් හිලව් ගැන කථා කළා. මම දන්නේ එක දෙයයි. රාගම ඉස්පිරිතාලේ බලන්න. ඒත් රාජ්‍ය සේවයේ කැල්ලක් නේ. රාගම ඉස්පිරිතාලේ වැඩි හරියක් ලෙඩ්ඩු ඉන්නේ කොහේද? ඇඳන් යට. ඉන්න ඉඩ නැහැ. එතකොට එක පැත්තකින් පෞද්ගලික ආරෝග්‍ය ශාලා බිහි වෙනවා. පෞද්ගලික ආරෝග්‍ය ශාලාවට යන්න පුළුවන් ඉඩ ප්‍රමාණයක් හදන්න ඕනෑ. රුපියල් බිලියන ගණනක් සල්ලි තිබෙන කම්කරුවාට එතැනට යා ගන්න බැහැ. මේක තමයි ඇත්ත තත්ත්වය. මේ වෙනස්කම් අපි කළ යුතුයි. ආණ්ඩුව කොයි එක වුණත් අපට ඒ ගැන හිතන්න වෙනවා.

විශේෂයෙන්ම අනිත් කාරණයට මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. e-Government කියන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පටන් අරන් හුඟක් කල් වෙනවා. එය අලුත් තාක්ෂණය අනුව ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළක්. නමුත් මේ රටේ කෙනෙකුට ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක, තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළක් -programme එකක්- ගැන අද අපි කථා කරන අය වැය කාරක සභා අවස්ථාවේ, මේ කාර්තුවේ කෙරෙන්න ඕනෑ වැඩ පිළිවෙළක ප්‍රගතිය බලන්න පුළුවන් ක්‍රමයක් මේ රටේ මහ ජනතාවට නැහැ. ප්‍රජාතන්ත්‍රවාදී රජයක් ඉදිරියට ගෙන යන්න ශක්තියක් තිබෙන ක්‍රමයක් සහිත වැඩ පිළිවෙළකට අපට යන්න බැරිද කියලා සොයා බලන්න ඕනෑ. ඒක හුඟක් වැදගත් වෙනවා. ඒ නිසා e-Government කියන වැඩ පිළිවෙළ මඟින් මේ පාර්ලිමේන්තුවේ ඉඳලා රජය හරහා, අමාත්‍යාංශ හරහා, දිස්ත්‍රික් කාර්යාල හරහා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හරහා මේ රටේ ජනතාවට ඇතුළු වෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කරන්න කටයුතු කරන්න. එතකොට ඇමතිවරුන්ට පුළුවන් බලන්න. ඔබතුමා කිව්වා වාගේ ලේකම්තුමාට වුණත් office එකේ ඉඳ ගෙන බලන්න පුළුවන්, කොතැනද අඩුව තිබෙන්නේ කියලා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඔය කියන එක ගැන සැලැස්මක් තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
සැලැස්ම තිබෙනවා. මම දන්නවා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
අපි ඒක තවම ක්‍රියාත්මක කරලා නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒකයි තිබෙන ලෙඩේ. මේ සැලැස්ම තිබෙනවා, පොත තිබෙනවා. මම පොඩි උදාහරණයක් කියන්නම්. මීගමුව මැතිවරණ කොට්ඨාසයේ ඉන්න සමෘද්ධිලාභීන්ගේ නම් ටික මට දෙන්න හෙට.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
e-Government කියන වැඩසටහන අපි ඉදිරියේදී ක්‍රියාත්මක කරනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අන්න එහෙම පිළිගන්නවා නම් හරි. ක්‍රියාත්මක වෙලා නැහැ. උදාහරණයක් ලෙස,- [බාධා කිරීමක්] ඒ කියන්නේ මෙච්චර කල් තිබුණේ නැහැ නේ. දැන් නේ සැලැස්ම හදන්නේ. මෙච්චර කල් තිබුණේ නැහැ කියලා ඔබතුමා පිළිගන්නවා. මම කියන්නෙත් ඒකයි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඒක අපි කරලා තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කෙරුවයි කියලා කියන්නේ, තවම පටන් ගත්තේවත් නැහැ නේ. තවම Budget එක ගැන නේ කථා කරන්නේ. තමුන්නාන්සේගේ සැලැස්ම තමුන්නාන්සේ ළඟ. මගේ ළඟ නොවෙයි නේ.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
යන්නේ කොහේද? මල්ලේ පොල්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඇයි තමුන්නාන්සේ පිළිගන්නේ නැද්ද, මේ e-Government කියන එක? තමුන්නාන්සේගේ සැලැස්ම අපට දීලා තිබෙනවාද? [බාධා කිරීමක්] තමුන්නාන්සේලා ක්‍රම දෙකකට දීලා තිබෙනවා. [බාධා කිරීමක්] මේ අමාත්‍යාංශයේ ප්‍රගතිය සම්බන්ධව එක පොතක් තිබෙනවා, පුස්තකාලයේ. මන්ත්‍රීවරුන්ගේ මේසය උඩ තිබෙනවා, CD එකක්. මේ CD එක මොකක දාලද බලන්නේ? අද මොකක දාලද මේ CD එක බලන්නේ? කරුණාකරලා කියන්න. මෙන්න රාජ්‍ය පරිපාලනයේ තත්ත්වය. [බාධා කිරීමක්] වෙලාසනින් දුන්නා නම් බලන්න තිබුණා. ගරු ඇමතිතුමා වෙලාසනින් දුන්නා නම් මේක බලන්න තිබුණා. තමුන්නාන්සේලා හොරට, පුස්තකාලයේ පොත තියලා අපට දෙනවා, CD එකක්. ගරු අගමැතිතුමනි, මේ CD එක කොතැනට දාලාද බලන්නේ? මේ CD එක මොකකට දාලාද බලන්නේ? මා ගාව CD ගොඩාක් තිබෙනවා. මම සෑහෙන ප්‍රමාණයක් ගෙදර ගෙනිච්චා, තමුන්නාන්සේලා ඕක කියයි කියලා. මෙන්න CD තොගය. මේ එක කොටසක්. මේවා කවදාද දෙන්නේ? අමාත්‍යාංශය පිළිබඳව කථා කරන දවසේ මට පුළුවන්ද, මේ CD එක මේ මේසය අස්සට දාලා බලන්න. බැහැ නේ. එහෙම නම් අර පොත ගෙන්වා ගන්න ඕනෑ, පුස්තකාලයට ගිහිල්ලා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
කොහේද යන්නේ මල්ලේ පොල්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මේකත් මල්ලේ පොල් තමයි. තමුන්නාන්සේ කියනවා. නමුත් ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. තමුන්නාන්සේ අපට පොතක් පෙන්වනවා. කොහේද පොත? මෙතැන තිබෙන්නේ CD එකක් නේ. අපට බලන්න තිබුණා, බලන්න අවශ්‍ය කරන දේවල් තිබුණා නම්. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ කියන වැඩ පිළිවෙළ හදන්න වෙන්නේ මෙන්න මෙහෙමයි. මීගමුවේ කෙනෙකුට මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ website එකට ඇතුළු වෙලා අදාළ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කවුද සමෘද්ධිය ගන්නේ කියලා බොත්තමක් ඔබලා බලා ගන්න පුළුවන් නම්, අන්න ඒ වැඩ පිළිවෙළ හරි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඒ වැඩේ කරන්න අවුරුද්දක් විතර යනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අවුරුද්දක් යනවා. තමුන්නාන්සේලා ඉන්නවා නේ, 1994 ඉඳලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, your time is over. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වෙලාව අවසන්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම මෙතැනින් එහාට කථා කරන්න යන්නේ නැහැ. මොකද, එතුමා අපහසුතාවට පත් කරන්නේ නැහැ. ඔබතුමන්ලා 1994 ඉඳලා ඉන්නවා. දැන් 2012 වර්ෂයේදීවත් මේ කටයුත්ත කරන්න පුළුවන් නම් අපි සුබ ප්‍රාර්ථනා කරනවා, එතැනට යන්න කියලා. ඒ වාගේම කියනවා, බැරි නම් ගෙදර යන්න කියලා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. ගරු ඉන්දික බණ්ඩාරනායක නියෝජ්‍ය ඇමතිතුමා.

[අ. භා. 2.36]

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයට ලක්වන මේ මොහොතේ එහි නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් වචන කිහිපයක් කථා කරන්නට ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා. මධ්‍යම රජය හා පළාත් සභා අතර සම්බන්ධීකරණය හා පළාත් සභා සඳහා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම අපේ අමාත්‍යාංශයේ කාර්ය භාරයක්. ඒ වාගේම පළාත් සභා හා පළාත් පාලන ආයතන අතර යහපාලනය ප්‍රවර්ධනය හා සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම හා අධීක්ෂණය කිරීමත් අපේ අමාත්‍යාංශයේ කාර්ය භාරයක්. පසු ගිය වසර ගැන කථා කරන කොට ඒ අනුව යමින් අපි 2011වසරේ ජයග්‍රහණ රාශියක් අත් පත් කර ගත්තු වසරක් බව සඳහන් කරන්නේ ඉතාමත් සතුටිනුයි. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා දශක ගණනාවක් තිස්සේ තිබුණු ඒ කුරිරු යුද්ධයෙන් අපේ රට බේරා ගත්තාට පස්සේ විශේෂයෙන්ම අපට අවශ්‍යතාව තිබුණා, උතුරු, නැඟෙනහිර ප්‍රදේශවල ඡන්දය පවත්වන්න. ඒ අනුව වසර ගණනාවකට පස්සේ අපට හැකියාව, ශක්තිය ලැබුණා, ඒ ප්‍රදේශවල සිවිල් පරිපාලනය ස්ථාපිත කළායින් පස්සේ ඒ ප්‍රදේශවල ඉතාමත් සාධාරණ ඡන්දයක් පවත්වලා පළාත් පාලන ආයතනවල නියෝජිතයන් පත් කර ගන්න. යුද්ධයෙන් විනාශ වූ ප්‍රදේශවලට පළාත් පාලන නියෝජිතයන් පත් කර ගත්තාට පස්සේ ඒ නියෝජිතයන් හරහා ඒ ප්‍රදේශ සංවර්ධනය කර ගැනීමේ අවස්ථාවක් අද අපට උදාවෙලා තිබෙනවා. ඒ අනුව අපේ රටේ පසු ගිය වසර පුරාම මැතිවරණ පැවැත්වූවා. මේ වන කොට පළාත් පාලන ආයතන 335න්, 333කම ඡන්දය පවත්වලා අවසානයි. මුලතිව් දිස්ත්‍රික්කයේ තවත් පළාත් පාලන ආයතන දෙකක ඡන්දය පවත්වන්න තිබෙනවා. ඒ අනුව ලබන වසර තුළදී ඒ පළාත් පාලන ආයතනවලත් ඡන්දය පවත්වලා අවසන් කරන්න අපි කටයුතු කරනවා.

[ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණයෙන් පස්සේ අපි විශේෂයෙන් අවධානය යොමු කළ කාරණයක් තිබෙනවා. මේ පළාත් පාලන ආයතනවලට 4,488ක විතර පළාත් පාලන නියෝජිතයන් පත් වෙලා ඉන්නවා. අපි දැක්කා, මේ පත් වෙලා ඉන්න පළාත් පාලන නියෝජිතයන්ට තමන්ගේ ප්‍රදේශවලට සේවය කිරීමේදී ඒ අවශ්‍ය කරන දැනුම හා පළපුරුද්ද මදකම ඒ ප්‍රදේශවල සංවර්ධනය අඩාළ කරන්න හේතු වෙලා තිබෙන බව. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත අපේ අමාත්‍ය ගරු ඒ.එම්.එල්. අතාවුල්ලා මැතිතුමා අපට නායකත්වය ලබා දීලා දිස්ත්‍රික්ක මට්ටමෙන් පළාත් පාලන ආයතනවල නියෝජිතයන් පුහුණු කිරීමේ වැඩසටහන් අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ අනුව අපි ගම්පහ දිස්ත්‍රික්කයෙන් ඒ වැඩසටහන ආරම්භ කළා. ඒ හරහා පළාත් පාලන ආයතනවල නියෝජිතයන්ට ඒ දැනුම සහ අවබෝධය ලබා දීම තුළින් ඒ පළාත් පාලන ආයතනවල යහ පාලනය ඇති කරන්නත්, ඒවායේ ආදායම් ප්‍රවර්ධනය කිරීම සහ ඒවා ශක්තිමත් කරලා ඒ හරහා ඒ ඒ පළාත් පාලන ආයතනවල විධිමත් සංවර්ධනයක් ඇති කරන්නත් තමයි අපේ අමාත්‍යාංශය කටයුතු කරගෙන යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ විශේෂ කාර්ය භාරයක් තමයි සංවර්ධනය කිරීම, අධීක්ෂණය සහ මෙහෙයවීම. ඒ අනුව පළාත් සභා විෂයයන් කෙරෙහි අපේ අවධානය යොමු කරලා පසු ගිය වසර පුරාම ඒ ආයතනය ශක්තිමත් කරන්න විශේෂ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ යටතේ මාර්ග කිලෝ මීටර් 1,115ක් කාපට් කරන්න අවශ්‍ය කරන ප්‍රතිපාදන මුදා හැර තිබෙනවා. ආපදා කළමනාකරණ ජාලය වැඩිදියුණු කරන්නට මේ වනකොට නෙදර්ලන්ත ආධාර යටතේ කටයුතු කර ගෙන යනවා. නගර සංවර්ධන වැඩසටහන් ආරම්භ කර තිබෙනවා. ඝන අප ද්‍රව්‍ය කළමනාකරණය, උතුරු නැගෙනහිර විනාශ වුණු ප්‍රදේශ සංවර්ධනය වැනි කටයුතු මිලියන 7000ක -කෝටි 700ක- පමණ වියදමින් කර ගෙන යනවා. අතිගරු ජනාධිපතිතුමා ගෙන යන සංවර්ධන වැඩ පිළිවෙළ ශක්තිමත් කරන්න අපේ අමාත්‍යාංශය හරහා අපි ඒ අන්දමින් කටයුතු කර ගෙන යනවා.

අපි අවධානය යොමු කර තිබෙනවා,මැතිවරණ ක්‍රමය සංශෝධනය පිළිබඳව. පළාත් පාලන මැතිවරණ ක්‍රමය සංශෝධනය කළ යුතුයි කියන කාරණය පිළිබඳව කාලයක් තිස්සේ මේ රටේ ජනතාවගේ අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී මනාප ක්‍රමය ඉවත් කරලා කොට්ඨාස ක්‍රමය සඳහා අවශ්‍ය කරන කටයුතු කර ගෙන යනවා. ඒ අනුව ඉතාමත් ශක්තිමත් මැතිවරණ ක්‍රමයක් තුළින් පළාත් පාලන මැතිවරණ ක්‍රමය රටට ඵලදායී ආකාරයට නිර්මාණය කරන්න හැකි වේවිය කියා අපි විශ්වාස කරනවා. අද මේ පළාත් පාලන ආයතනවල තිබෙන මැතිවරණ ක්‍රමය තුළ විශාල මුදල් ප්‍රමාණයක් වියදම් වෙනවා; ගැටුම් ඇති වෙනවා. ඒ වාගේම තමන්ගේ බල ප්‍රදේශවලට සුදුසු නියෝජිතයන් පත් වෙන්නේ නැහැ. ඒ නිසා අපි ඒ පිළිබඳව අවධානය යොමු කරලා ඉදිරි වසර තුළදී ඒ මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන්නට අවශ්‍ය සියලුම වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. ලබන වසරේදී ඒ සියලු කටයුතු අවසන් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතනවල නියෝජිතයන් පිළිබඳව මීට වඩා අවධානයක් යොමු කළ යුතු කාලය ඇවිල්ලා තිබෙනවා. පළාත් පාලන ආයතන හරහා මේ රටේ සංවර්ධනය වෙනුවෙන් සුවිශේෂී කාර්ය භාරයක් ඉටු වෙනවා. ඒ සඳහා පළාත් පාලන ආයතනවලට තිබෙන සම්පත් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ නිසා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය යාන වාහන ඇතුළු පහසුකම් ලබා දෙන්න, කාර්යාල සංකීර්ණ ඇති කරන්න මේ වනකොට වැඩසටහන් ගණනාවක් ආරම්භ කර තිබෙනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, නොයෙකුත් අඩු පාඩුකම් දුෂ්කරතා මැද්දේ පළාත් පාලන ආයතනවල සහ පළාත් සභා ආයතනවල නියෝජිතයන් සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරන එක ගැන. අද වනකොට ඒ කාර්ය මණ්ඩලවල යම් යම් ප්‍රශ්න ගැටලු ගණනාවක් පැන නැඟී තිබෙනවා. ඒවායේ තිබෙන යන්ත්‍ර සූත්‍රවල අඩු පාඩුකම් තිබෙනවා. අපි දන්නවා, ඒ පළාත් පාලන ආයතනවල නියෝජිතයන් ඉතාමත් සුළු දීමනාවක් ලබා ගනිමින් සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරන බව. ඒ කරුණත් අපි අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කර තිබෙනවා. ඒ අනුව ඉදිරි කාලයේදී ඒ අයට මීට වඩා වැඩි පහසුකම් ප්‍රමාණයක් සලසන්න අපේ අමාත්‍යාංශය කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා පළාත් පාලන ආයතනවල නියෝජිතයන් නොසලකා හැරපු කාලයක් තිබුණා. පළාත් පාලන ආයතනවලට නියෝජිතයන් පත් කර ගන්නේ තමන්ගේ ප්‍රදේශවලට සහ ඒ ප්‍රදේශවල ජනතාවට සේවය සලසා ගන්නයි. නමුත් පසු ගිය ආණ්ඩුවලින් ඒ සේවය සලසන්න අවශ්‍ය ප්‍රතිපාදන සහ ශක්තිය ඒ නියෝජිතයන්ට ලැබුණේ නැහැ. තමන්ගේ ප්‍රදේශවල සංවර්ධනය සඳහා ඒ පළාත් පාලන ආයතනවල නියෝජිතයන්ට එක සතයක්වත් ලබා ගන්න හැකියාවක් ලැබුණේ නැහැ. නමුත් අතිගරු ජනාධිපතිතුමාගේ වැඩසටහන් හරහා, ඒ වාගේම ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ "ජාතික සවිය" "ගම නැගුම" වැඩසටහන් හරහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දෙන ප්‍රතිපාදනවලට වැඩි ප්‍රමාණයක් ප්‍රාදේශීය මන්ත්‍රීවරුන්ට ලබා දීලා ඒ ප්‍රදේශවල සංවර්ධන කටයුතු කරන්න අතිගරු ජනාධිපතිතුමා කටයුතු කර තිබෙනවා. ඒ අනුව ඉදිරි වසර තුළදී "ජාතික සවිය" "ගම නැගුම" වැඩසටහන් හරහාත්, "පුර නැගුම" වැනි පසුගාමී පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන් හරහාත්, "ජන දිරිය" වැනි වැඩසටහන් හරහාත් ඉදිරි කාලය තුළදී ප්‍රාදේශීය සභා ශක්තිමත් කරන්න කටයුතු කරනවා.

විශේෂයෙන්ම මීට පෙර කථා කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, අපේ රජය පළාත් සභා අමතක කරලා කටයුතු කරනවාය කියලා. ඇත්ත වශයෙන්ම එදා එක්සත් ජාතික පක්ෂය සාම ගිවිසුම ඇති කළාට පස්සේ මේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කළා. පළාත් සභාවල බලතල කප්පාදු කරන්න, බලතල අඩු කරන්න අපේ රජය කටයුතු කරලා නැහැ. ඒ උදව්වයට දෙන්න ඕනෑ බලතල අපි යම් ප්‍රමාණයකට ලබා දීලා තිබෙනවා.

පළාත් සභාවලට අවශ්‍ය කරන ප්‍රතිපාදන අපි වෙන් කරලා තිබෙනවා. පළාත් සභාවල සංවර්ධන වැඩ කටයුතු සඳහා අතිගරු ජනාධිපතිතුමා මේ වසරේ අය වැයෙන් අපට රුපියල් බිලියන 160ක මුදලක් වෙන් කර දී තිබෙනවා. ඒ මන්ත්‍රීතුමාගේ කථාවෙන් පැහැදිලි වුණා, පළාත් සභාවලට විදුලිය වෙනුවෙන් ලබා දෙන මුදල් කප්පාදු කරලා තිබෙනවා කියලා. නමුත් අපි ඉතාමත්ම වගකීමෙන් කියනවා 2004 දී මේ රටේ ජනගහනයෙන් සියයට 70කට තිබුණු විදුලි බලය අද සියයට 90ක් දක්වා වැඩි කර තිබෙන බව. අතිගරු ජනාධිපතිතුමාගේ බලාපොරොත්තුව වෙලා තිබෙනවා 2012 වසර අවසාන වන විට මේ රටේ සමස්ත ජනතාවටම විදුලි බලය ලබා දෙන්න. ඒ නිසා විදුලියට කියලා පළාත් සභාවලට අමතර මුදලක් වෙන් කිරීමේ අවශ්‍යතාවක් නැහැ. අපි වසරින් වසර පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට වෙන් කරන මුදල් ප්‍රමාණය වැඩි කර තිබෙනවා. ඒ වාගේම අපේ රටේ අය වැයෙන් මුදල් වෙන් කරන කොට තෙවනුවට මුදල් වෙන් කරන අමාත්‍යාංශය හැටියට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය හඳුන්වන්නට පුළුවන්.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා අමාත්‍යතුමා අපේ අමාත්‍යාංශයට ඉතාමත්ම ශක්තිමත්, නිවැරදි නායකත්වයක් ලබා දෙමින් අපට උපදෙස් ලබා දෙනවා. ඒ පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, ව්‍යාපෘති

අධ්‍යක්ෂතුමන්ලා, අතිරේක ලේකම්තුමන්ලා සහ උපදේශකතුමන්ලා ඇතුළු සියලුම නිලධාරින් කණ්ඩායමක් හැටියට වැඩ කටයුතු කිරීම තුළ මේ වසරේ ජයග්‍රහණ රාශියක් අත් පත් කර ගත් බව ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.46]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නියෝජිත දේශපාලන ක්ෂේත්‍රය තුළ පළාත් පාලන ආයතන හරහා රට තුළ පරිපාලනය, සංවර්ධනය ශක්තිමත් කරන්නට ඉතාමත්ම වැදගත් කාර්ය භාරයක් ඉෂ්ට කරන ආයතන ක්ෂේත්‍රයක් පිළිබඳව මගෙත් අදහස්, උදහස් කිහිපයක් එකතු කරන්නට අවස්ථාවක් ලැබීම ගැන මේ මොහොතේ මම සතුටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම පළාත් පාලන ආයතන තුළ වැදගත් කාර්ය භාරයක් ඉෂ්ට කරන පළාත් පාලන ආයතන නියෝජනය කරන මහ ජන මන්ත්‍රීතුමන්ලා පිළිබඳව මම අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වනවා. නියෝජිත දේශපාලනය ගත් කල අපි පිළිගන්නට ඕනෑ ජනතාවට සමීපතම මහ ජන නියෝජිතයින් හැටියට කටයුතු කරන්නේ පළාත් පාලන ආයතන නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා බව. එතුමන්ලා තමයි පොදු ජනතාවගේ හද ගැස්ම වඩාත්ම සමීපව, වඩාත්ම කාර්යශූරව, ක්‍රමවත්ව හඳුනා ගත් නියෝජිතයින් කොට්ඨාසය. විශේෂයෙන්ම ගමේ, නගරයේ ඕනෑ එපාකම් පිළිබඳව මනා දැනුමක් අවබෝධයක් ලබා ගෙන ගමට අවශ්‍ය කුමක්ද, නගරයට ඉෂ්ට සිද්ධ විය යුතු ජනතා සේවාව, සංවර්ධනමය ක්‍රියාදාමය කුමක්ද, රටට අවශ්‍ය කුමක්ද කියන එක ගැන හොඳ අවබෝධයක් තිබෙන කොට්ඨාසයක් තමයි අපේ පළාත් පාලන මන්ත්‍රීතුමන්ලා. ජනතාවට සමීපතම දේශපාලනඥයින් කොට්ඨාසයට කොයි ආකාරයේ සැලකිල්ලක් වර්තමාන ආණ්ඩුවෙන් ලැබෙනවාද කියන එක ගැන අපි පොඩ්ඩක් විමසලා බලන්නට ඕනෑ.

දැන් ගරු නියෝජ්‍ය ඇමතිතුමා බොහොම ලස්සන කථාවක් කළා. පළාත් පාලන ක්ෂේත්‍රයේ ස්වර්ණමය යුගය අද උදා වෙලා තිබෙනවාය කියන එක එතුමාගේ අදහස්වල ගැබ් වෙලා තිබුණා. අපි බලමු, මේ පළාත් පාලන ක්ෂේත්‍රය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාට ලැබෙන වේතනය -ඒ අයට ලබා දෙන වැටුප-කීයද කියලා. මම හිතන විධියට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකුට රුපියල් 5,000ක වැටුපක් ලැබෙනවා. නගර සභා මන්ත්‍රීවරයකුට රුපියල් 7,500ක වැටුපක් ලැබෙනවා. මොහොතකට හිතලා බලන්න, මහ ජන ඡන්දයෙන්, කතිරයෙන්, ආශිර්වාදයෙන් පත් වුණු ඒ නියෝජිතයින්ට මේ වාගේ වේතනයකින් ගමේ, නගරයේ, රටේ තොටේ කාර්ය භාරය ඉෂ්ට කරන්නට පුළුවන්ද කියලා. ඒ සඳහා මේ වැටුප ප්‍රමාණවත්ද කියලා මා අහන්න කැමැතියි. රුපියල් 5,000ක් 7,500ක් වැනි සොච්චම් මුදලකින් මේ කාර්ය භාරය විධිමත්ව ක්‍රියාත්මක කරන්නට හැකියාවක් ලැබෙන්නේ නැහැ. හැබැයි ඒක කියන අතරතුර මම ස්තුතිවන්ත වනවා, එක් කාරණයක් පිළිබඳව. එනම්, මගේ මතකයේ හැටියට ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලාගේ වේතනයේ යම් කිසි වැඩි වීමක් සිදු වුණා නම් එය සිදු වුණේත් පොදුජන එක්සත් පෙරමුණු කාල වකවානුවේදී ඔබතුමන්ලාගේ අනුග්‍රහය මතයි. නමුත් ඒක ප්‍රමාණවත් නැහැ. මා යෝජනා කරනවා අඩුම තරමින් මේ අයට රුපියල් 15,000කවත් වැටුපක් ලබා දිය යුතුයි කියන එක.

මම තවත් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වනවා. මම ප්‍රාර්ථනා කරනවා, අපේ ගරු උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා උසස් ලෙස මගේ කථාවට සවන් දෙයි කියලා. විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුරකථන දීමනාවක් අපේ පළාත් පාලන මන්ත්‍රීතුමන්ලාට ලැබෙන්නේ නැහැ. ප්‍රවාහන පහසුකමක් ලැබෙන්නේ නැහැ. ඒ වාගේම කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා කිසිම අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා වන අපට මේ සියල්ලක්ම ලැබෙනවා. නමුත් ජනතාවට සමීපතම මහ ජන නියෝජිතයින් කොට්ඨාසයට මේ එකම පහසුකමක්වත් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මා යෝජනා කරන්න කැමැතියි, ආණ්ඩුවේ තිබෙන මූල්‍යමය ශක්තිය සහ ප්‍රතිපාදන රාමුව තුළ කළ හැකි දේ තමුන්නාන්සේලා ඉෂ්ට කරන්නය කියලා. අපි කොච්චර කථා කළත් ඉල්ලන හැම දේම දෙන්නට බැරි වෙනවා. නමුත් යම් කිසි දුරකථන දීමනාවක්, ප්‍රවාහන පහසුකමක්, අඩුම තරමින් තීරු බදු රහිතව ත්‍රිරෝද රථයක් හෝ මෝටර් සයිකලයක් ලබා ගැනීමේ අවස්ථාවක් උදා කර දෙන්නය කියලා මා මේ අවස්ථාවේදී යෝජනා කරනවා. ඒ වාගේම කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් සහ හැම පළාත් පාලන මන්ත්‍රීවරයකුටම රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නය කියන එකත් මා මේ අවස්ථාවේ යෝජනා කරනවා. ඒක අමාරු කාර්යයක් නොවෙයි. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමන්ලා 225 දෙනා වෙනුවෙන් මේක ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් රටේම සිටින පළාත් පාලන මන්ත්‍රීතුමන්ලා 4,420 වෙනුවෙන් මේක කරන එක මහ ලොකු දෙයක් නොවෙයි කියන එක මා ප්‍රකාශ කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්නට බලාපොරොත්තු වනවා,මේ පළාත් පාලන ක්ෂේත්‍රය තුළ තිබෙන කාන්තා නියෝජනත්වය ගැන. අපේ රටේ පළාත් පාලන මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා 4,420ක් ඉන්නවා. විශේෂයෙන්ම 2006 වර්ෂයේ අපි කාන්තා නියෝජනත්වය ගනිමු. අංග සම්පූර්ණ සංඛ්‍යා ලේඛන ගන්නට පුළුවන්කම ලැබුණේ 2006 වර්ෂයේයි. 2006 වර්ෂයේ අපි කාන්තා නියෝජනත්වය ගත්තොත් කාන්තාවන්ට මහ නගර සභා නියෝජනත්වය සියයට 3ක් තිබුණා; නගර සභා නියෝජනත්වය සියයට 3.4ක් තිබුණා. ප්‍රාදේශීය සභා නියෝජනත්වය තිබුණේ සියයට 1.6යි.

මෑතකදී පැවැත්වුණු පළාත් පාලන මැතිවරණය හරහා එකතු කර ගත්ත දත්තයන් අනුව අපි වයඹ පළාත උදාහරණයකට ගනිමු. පුත්තලම් දිස්ත්‍රික්කයත්, කුරුණෑගල දිස්ත්‍රික්කයත් වයඹ පළාතට අයිතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම පළාතේ පළාත් පාලන මහ ජන නියෝජිතයින් 501න් කාන්තාවන් 04 දෙනායි ඉන්නේ. ප්‍රතිශතයක් හැටියට දශම 79යි. අපි බස්නාහිර පළාත ගනිමු. පළාත් පාලන නියෝජිතවරුන් 872න් කාන්තාවන් 26යි. ප්‍රතිශතය 2.98යි. [බාධා කිරීමක්] මම පිළිගන්නවා තමුන්නාන්සේලා කියන කථාව. ජනතාව තමයි මේ තීන්දු තීරණ ගන්නේ. නමුත් හොඳට මතක තියා ගන්න, ජී.එල්. පීරිස් මැතිතුමා සභාපතිත්වය දරපු තරුණයක් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ තීරණයට අනුව තරුණයින්ට ලබා දුන්නු සියයට 40ක වෙන් කිරීම නිසා අද පළාත් පාලන ආයතනයේ සිට මේ ගෞරවණීය මැති සබයට ආපු කී දෙනෙක් සිටිනවාද කියන එක ගැන. ඒ ගැන තමුන්නාන්සේලාටම නිගමනයකට එන්න පුළුවන්. ඒ නිසා විශේෂයෙන්ම මා ඔබතුමාට ප්‍රකාශ කර සිටිනවා කාන්තා සහ තරුණ නියෝජනත්වය වෙනුවෙන් අලුත් පනත යටතේ සියයට 25ක් වෙන් කරන්නට කටයුතු කරන්නය කියලා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී ඒ පිළිබඳව පිළිතුරු ලබා දෙන්න. මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ තරුණ ප්‍රතිශතය එලෙසම තබන්න, ඒක වෙනස් කරන්නට එපාය කියලා. අපේ රටේ මුළු ජනගහනය ගත් කල සියයට 52ක් කාන්තාවන්. අන්න එම නිසා එයට සරිලන සාධාරණ වෙන් කිරීමක් වෙනමම කාන්තාවන්ටත් කරන්න කියලා මා මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

විශේෂයෙන්ම මා මතක් කරන්න කැමැතියි, ගරු ජනාධිපතිතුමා මුළු රටටම ඉදිරිපත් කර තිබෙන මහින්ද චින්තන ඉදිරි දැක්ම මහා යෝජනාවලියේත් එය සඳහන් වෙලා තිබෙන බව. "මහින්ද චින්තන ඉදිරි දැක්මේ" එතුමා මෙහෙම කියනවා. එය "මහින්ද චින්තන ඉදිරි දැක්මේ" 21වන පිටුවේ සඳහන් වන්නේ මෙසේයි:

> "දේශපාලන සහ පරිපාලන ව්‍යුහයන් තුළ කාන්තා නියෝජනය වැඩි කිරීමට පියවර ගන්නෙමි. එමඟින් අපේ දැන උගත් කාන්තාවන්ට නිසි සාධාරණය ඉටු කරමි.
>
> ගමේ තීන්දු තීරණ ගන්නා ජන සභාවේ කාන්තා නියෝජනය අනිවාර්ය කිරීම මඟින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම්වලදී කාන්තා දායකත්වය ඉහළ නංවමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගමේ තීන්දු තීරණ ගන්නා ජන සභාවේ කාන්තා නියෝජනත්වය වැඩි කරන්නට පෙර මා මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා, විශේෂයෙන්ම පළාත් පාලන ආයතන නියෝජනය කිරීම සඳහා කාන්තාවන් වෙනුවෙන් වෙන් කරන ප්‍රතිශතය ඉහළ මට්ටමට ගෙන එන්නට ඔබතුමන්ලා සතුව තිබෙන රාජ්‍ය බලය මත නීතිමය ප්‍රතිපාදන ඉක්මනින්ම ගෙනෙන්නටය කියලා. [බාධා කිරීමක්]

ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා හරහා මා මේ සභාවට විශේෂයෙන්ම මේ කාරණයත් ඉදිරිපත් කරන්න කැමැතියි. අද රටේ තිබෙන සමහර සභා බොහොම අමාරුවෙන් තමයි ක්‍රියාත්මක වන්නේ. සමහර සභාවල වැටුප් ටික ගෙවා ගන්නටත් බැහැ. අපේ ඉන්දික බණ්ඩාරනායක මැතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා නම් එතුමා දන්නවා ඇති, එතුමාගේ දිස්ත්‍රික්කයේ කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව ප්‍රශ්න රැසක් මැදයි කටයුතු කර ගෙන යන්නේ කියලා. පුත්තලම දිස්ත්‍රික්කය ගත්තොත් කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව, අනුරාධපුරය දිස්ත්‍රික්කය ගත්තොත් පලාගල ප්‍රාදේශීය සභාව ඉතාමත්ම අමාරු තත්ත්වයකින් තමයි මේ කටයුතු කර ගෙන යන්නේ. එම නිසා මධ්‍යම ආණ්ඩුවේ මැදිහත් වීම තුළින් මීට වඩා සම්පත් ප්‍රමාණයක් ප්‍රාදේශීය සභාවල නඩත්තුව උදෙසා වෙන් කරන්නය කියලා මා යෝජනා කරනවා. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උත්තරීතර සභාවට මා මතක් කරන්න කැමැතියි, දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ සමයේදී පමණයි අංග සම්පූර්ණව වැටුප් ප්‍රතිපූරණය කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණේ කියලා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ සමයේ පටන් අද දක්වා ප්‍රාදේශීය සභාවල වැටුප් ප්‍රතිපූරණය කිරීමේ ප්‍රතිශතය සියයට 100 සිට සියයට 65ක්, 75ක් දක්වා අඩු වෙලා තිබෙනවා. මේ නිසාම මහා මූල්‍ය අර්බුදයකට අපේ ප්‍රාදේශීය සභා ක්ෂේත්‍රය, පළාත් පාලන ක්ෂේත්‍රය ලක් වෙලා තිබෙනවා. එම නිසා මා යෝජනා කරනවා, නැවතත් වරක් වැටුප් ප්‍රතිපූරණය කිරීමේදී සියයට 100ක වගකීම මධ්‍යම ආණ්ඩුව සතුව තබා ගැනීමට කටයුතු කරන්නය කියලා.

ගරු ඇමතිතුමනි, උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු පළාත් පාලන ආයතනවලට තිබෙන ප්‍රධානතම ආදායම් මාර්ග හැටියට හඳුන්වන්නට පුළුවන්. හැබැයි මේ දෙකොට්ඨාසයේම මුදල් සෘජුව යන්නේ පළාත් සභාවටයි. ඉන් පසුව තමයි පළාත් පාලන ආයතන වෙත මේ මුදල් ටික යොමු වන්නේ. වෙන දාට මේ කටයුත්ත -මේ මුදල් පළාත් පාලන ආයතනවලට ලබා දීම- සිදු වුණේ ප්‍රධාන ලේකම්වරයා හරහායි. අද සිදු වන්නේ පළාතේ මහ ඇමතිවරයාගේ ඕනෑ එපාකම් මතයි. මහ ඇමතිවරයා යම් කිසි පළාත් පාලන ආයතනයක ප්‍රධානියකුට සමීප නම්, ඒ පුද්ගලයාට නිසි මුදල් ටික ලැබෙනවා. සමහර අවස්ථාවලදී මහ ඇමතිවරයාගේ අභිමතය පරිදි ඒ මුදල් ටික වියදම් කරනවා, තම තමන්ගේ සංවර්ධනමය ඕනෑ එපාකම්වලට. මේක ඉතාමත් බරපතළ තත්ත්වයක් හැටියට මා දකිනවා.

කරුණාකරලා මේ දඩ මුදල්, ඒ වාගේම මුද්දර ගාස්තු පළාත් පාලන ආයතනවලට ලබා දීමේ ක්‍රියාවලිය ක්‍රමවත් කරන්න, කාර්යක්ෂම කරවන්න, විනිවිදභාවයෙන් යුක්තව ඒක ක්‍රියාත්මක කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරියට විනාඩියෙන් නතර කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් යෝජනා කිහිපයක් කරනවා. මම මුලදී ප්‍රකාශ කළා මේ පළාත් පාලන ක්ෂේත්‍රය තුළ සම්පත් හිඟයක් පවතිනවා කියලා. මීට වැඩිය මධ්‍යම ආණ්ඩුවේ සෘජු දායකත්වයක් පළාත් පාලන ක්ෂේත්‍රයට යොමු කරන්නට ඕනෑ. ඉන්දික බණ්ඩාරනායක මැතිතුමා නිර්මාණය කරපු ඒ සුරංගනා ලෝකය අද පළාත් පාලන ආයතනවලට ලැබිලා නැහැ. ඒකයි සත්‍ය කථාව. පළාත් පාලන නියෝජිතවරුන්ට, මන්ත්‍රීවරුන්ට තමන්ගේ සේවාව කරන්න විමධ්‍යගත මුදලක් ලැබෙන්නේ නැහැ. [බාධා කිරීමක්]

විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ශත පහක් දෙන්නේ නැහැ. මම වග කීමෙන් ප්‍රකාශ කරන්නේ. අන්න ඒ නිසා මම යෝජනා කරනවා ඒ සුරංගනා ලෝකයේ තමුන්නාන්සේලා තනි වෙන්නේ නැතුව කරුණාකරලා පළාත් පාලන ආයතනවලට ප්‍රමාණවත් මුදලක් ලබා දීලා, හැම මන්ත්‍රීවරයකුටම විමධ්‍යගත අරමුදලක් ලබා දෙන්නට කටයුතු කරන්න කියලා. ඒ වාගේම හැම පළාත් පාලන ආයතනයකටම යන්ත්‍රෝපකරණ ඒකකයක්, විශේෂයෙන්ම මේ ආණ්ඩුවේ ජාත්‍යන්තර සම්බන්ධතා ජාලය තුළ හැම පළාත් පාලන ආයතනයකටම යන්ත්‍රෝපකරණ ඒකකයක් සකස් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම ගරු ඇමතිතුමාට කියන්න කැමැතියි, අපේ රටේ උපදිසාපති කොට්ඨාස 332ක් තිබෙනවාය කියලා. හැම උපදිසාපති කොට්ඨාසයකටම පළාත් පාලන ආයතනයක් පිහිටුවන්න කටයුතු කරන්න. විශේෂයෙන්ම මම යෝජනා කරන්න කැමැතියි ඒ ගමන හම්බන්තොටින් පටන් ගන්න කියා. දැන් වීරකැටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 3ක් තිබෙනවා. එනම් ඕකේවෙල කොට්ඨාසය, වලස්මුල්ල කොට්ඨාසය, වීරකැටිය කොට්ඨාසය. එක සභාවයි තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය කේන්ද්‍ර කර ගෙන අද ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාසයක් තිබෙනවා, ඒ වාගේම අධ්‍යාපන කොට්ඨාසයක් තිබෙනවා. එසේ නම් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක් හැටියට මේ උපදිසාපති කොට්ඨාස තුන්සිය තිස්දෙකේම මේ පළාත් පාලන ආයතන ස්ථාපනය කරලා විධිමත් ශක්තිමත් ජනතා සේවාවක් ඉෂ්ට කරන්නට අවශ්‍ය ඒ යාන්ත්‍රණය, ඒ ව්‍යුහය නිර්මාණශීලීව සකස් කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. මගේ අදහස් උදහස්වලට පටහැනිව ඉදිරිපත් කරපු ඔබතුමන්ලාගේ අදහස්වලටත් මම සවන් දුන්නා.

නැවත වරක් මම කියන්නට ඕනෑ ප්‍රාදේශීය සභා, නගර සභා මන්ත්‍රීතුමන්ලාට විමධ්‍යගත අරමුදලක් අද ලැබෙන්නේ නැති බව. හැබැයි "ගම නැඟුම", "මඟ නැඟුම" යනාදී වැඩසටහන්වලින්

පළාත් පාලන ආයතනවල එක කොට්ඨාසයකට පමණක් ගසා කන්නට මුදල් වෙන් වෙනවාය කියන එක මම පිළිගන්නා බව ප්‍රකාශ කරමින්, මට සවන් දුන් ඔබ සියලු දෙනාටම තුති පුදමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[பி. ப. 3.02]

**ගරු ප්‍රභා ගනේසන් මහතා**
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Praba Ganesan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! தேசிய மொழிகள் ஒருமைப்பாட்டின் அவசியத்தை வலியுறுத்திப் பேசுவதற்குக் வாய்ப்புக் கிடைத்ததையிட்டு நான் மனமகிழ்ச்சியடைகின்றேன். ஏனெனில் இன்று எமது நாட்டிலே கொழுந்துவிட்டு எரிந்துகொண்டிருக்கின்ற தேசிய இனப்பிரச்சனைக்கு நேர்மையான முறையில் முழுமையான தீர்வை இந்த அமைச்சின் மூலமாகத்தான் ஏற்படுத்தக் கூடியதாக இருக்குமென நான் நினைக்கிறேன். அதனால் தானோ, என்னவோ எமது மேதகு ஜனாதிபதி அவர்கள், தமிழ் மக்களுக்கு மிக நெருக்கமானவரும், கம்யூனிச சிந்தனைப் போக்குடையவருமான மாண்புமிகு அமைச்சர் வாசுதேவ நாணாயக்கார அவர்களிடம் இந்தப் பொறுப்பை ஒப்படைத் திருக்கிறார் என நினைக்கிறேன். எமது நாட்டில் பல்லாண்டு காலமாக, தமிழ் பேசும் மக்கள் ஓரங்கட்டப்பட்டுவிட்டார்களா என்ற சந்தேகம் ஏற்படுவதற்கான காரணிகளில் ஒன்றுதான் தமிழ் மொழி அமுலாக்கம் என்பது முறையாக நடைமுறைப் படுத்தப்படாமையாகும். ஒரு மாவட்டத்திலே 12.5 சதவீதம் தமிழ் பேசும் மக்கள் இருந்தால், அம்மாவட்டத்தில் அரச கருமங்கள் யாவும் தமிழ்மொழியிலும் நடைமுறைப்படுத்தப்பட வேண்டும் என்று சட்டம் இருக்கின்றபொழுதிலும் அது அவ்வாறு முழுமையாக நடைமுறைப்படுத்தப்படாமல் இருப்பது மிகுந்த வேதனையளிக்கின்ற விடயமாகும். என்னைப்பொறுத்தவரையில், இச்சிறிய நாட்டிலே இப்படி யான ஒரு சட்டம்கூட எமக்குத் தேவையில்லை. மாறாக, இந்த நாட்டிலுள்ள அனைத்து இடங்களிலும் நாம் முழுமையாக தமிழ் மொழியிலும் எமது கருமங்களைச் செய்யக்கூடிய சூழ்நிலை ஏற்படுத்தப்படுமாகவிருந்தால் அது வரவேற்கத்தக்க, சரியான விடயம் என நான் கருதுகின்றேன்.

வடக்கு, கிழக்கு மாகாணங்களிலே தனித் தமிழ் மொழியிலே கருமங்களை ஆற்றக்கூடிய சூழ்நிலை இருந்தாலுங்கூட, தலை நகரத்திலுள்ள மத்திய அரச அலுவலகங்கள், மாகாண சபை அலுவலகங்கள், மாநகர சபை அலுவலகங்கள் எதிலுமே தமிழ் மக்கள் தமிழ் மொழியிலே தமது கருமங்களை ஆற்றக்கூடிய வழிவகைகள் இல்லாமல் இருப்பதனை ஒரு பாரிய குறைபாடாகவே நாம் பார்க்கிறோம். பல மொழிகள் புழக்கத்தில் உள்ள நாடுகளிலே அங்குள்ள மொழிகள் அனைத்தையும் நடைமுறைப்படுத்துவதில் இத்தகைய குறைபாடுகள் இருப்பின் அதனை ஏற்றுக்கொள்ள முடியும். ஆனால், இரண்டு மொழிகளை மட்டும் கொண்டுள்ள எமது இச்சிறிய நாட்டிலே இவ்விரண்டு மொழிகளையும் நடைமுறையில் அமுல்படுத்துவது மிகவும் இலகுவாக இருந்தபொழுதிலும் அவ்வாறு அதனைச் செய்யாமலிருப்பது மிகுந்த வேதனையளிக்கும் விடயமாக இருக்கிறது. எமது நாட்டின் தென்பகுதியிலுள்ள காலி, மாத்தறை, அம்பாந் தோட்டை ஆகிய பிரதேசங்களுக்குச் செல்லும் தமிழ் பேசுபவர் ஒருவர் அங்கு தனது கருமத்தைத் தமிழ் மொழியிலும், வட பகுதியிலுள்ள கிளிநொச்சி, யாழ்ப்பாணம் போன்ற இடங்களுக்குச் செல்லும் சிங்கள மொழி பேசுபவர் ஒருவர் தனது கருமங்களை அங்கு சிங்கள மொழியிலும் ஆற்றக்கூடிய சூழ்நிலை இந்த நாட்டில் என்று உருவாகிறதோ, அன்றுதான் அனைவரும் "நாம் இலங்கையர்" என்ற எண்ணத்தை ஏற்படுத்திக்கொள்ளக்கூடியதாக இருக்கும் என நினைக்கிறேன். இப்படியான நிலைமையை நாம் நமது நாட்டில் ஏற்படுத்துவதன்மூலம்தான் மேதகு ஜனாதிபதி அவர்களின் கனவை நனவாக்க முடியும். ஆகவே, மொழி அமுலாக்கலை நாடு முழுவதும் நடைமுறைப்படுத்த வேண்டி யது பாராளுமன்ற, மாகாண சபை உறுப்பினர்களினதும் மாநகர சபை, நகர சபை, பிரதேச சபை உறுப்பினர்களினதும் கடமையாகும் என நான் நினைக்கிறேன்.

இந்த நாட்டின் யுத்தம் முடிவுக்குக் கொண்டுவரப் பட்டவுடன் எமது மேதகு ஜனாதிபதி அவர்கள் எமது நாட்டில் பல இனங்கள் இல்லை எனவும் 'இலங்கையர்' என்ற ஓர் இனம் மட்டுமே உள்ளதெனவும் தனது எதிர்கால சிந்தனையைத் தெளிவான முறையில் வெளிப்படுத்தியிருந்தார். ஆனாலும், தமிழ்மொழி அமுலாக்கத்தைச் சரியாகச் செய்வதில்தான் இச்சிந்தனையின் வெற்றி அமைந்துள்ளது என்பதை அரசாங்கம் தெளிவாகப் புரிந்துகொள்ள வேண்டும். மத்திய மாகாணத்தில் சேவையில் ஈடுபடுத்தப்பட்டுள்ள அரச, மற்றும் தனியார் பேருந்துகளின் பெயர்ப் பலகைகளில் தமிழ் மொழி புறக்கணிக்கப்படுகிறது. சில தனியார் பேருந்துகளின் பெயர்ப்பலகைகளில் தமிழ்மொழி உபயோகிக்கப் பட்டிருந்தாலும், அதனைக் கொலைசெய்யும் விதத்தில் அது பிழையாக எழுதப்பட்டிருக்கும். அதுமட்டுமல்ல, தென்னிலங் கையிலே பல இடங்களிலும் பாதையின் பெயர்ப் பலகைகள் தனிச் சிங்கள மொழியிலேயே எழுதப்பட்டிருக்கின்றன. அரச கூட்டுத்தாபனங்களின் விண்ணப்பப்படிவங்கள், சுற்றறிக் கைகள் போன்றவை தனிச் சிங்கள மொழியிலே காணப் படுகின்றன. மத்திய மாகாண அமைச்சினால் ஆசிரியர்களுக்கு அனுப்பப்படும் சுற்று நிருபங்கள்கூட தனிச் சிங்கள மொழியி லேயே காணப்படுகின்றன. இவ்வாறாக நாங்கள் எமது நாட்டிலே நடைமுறையில் காணப்படும் குறைபாடுகள் பலவற்றைச் சொல்லிக்கொண்டே போகலாம். இவை அனைத் தும் அடையாளங் காணப்பட்டு, அக்குறைபாட்டைப் போக்க ஆவன செய்யப்பட வேண்டும். "இந்த நாட்டில் தமிழர்கள் பாதுகாப்பாக வாழலாம்; இனவாதத்துக்கு இடமில்லை" என்று வெறுமனே சொல்லிக்கொண்டிருப்பதில் மட்டும் எவ்வித பலனும் இல்லை. மாறாக, இந்த மொழி அமுலாக்கத்தை நாடு முழுவதும் பரவலாக்க அனைவரும் ஒன்றுபட வேண்டும்.

கடந்த ஒரு வருட காலமாகத்தான் இந்த தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சு இந்த அமைச்சரின்கீழ் இருந்து வருகிறது. எனவே, மாண்புமிகு அமைச்சர் அவர்கள் தனது கடமையைப் பூரணமாகச் செய்வதற்குக் கால அவகாசம் தேவை என்பதை எங்களால் புரிந்துகொள்ள முடிகிறது. தற்பொழுது, கொழும்பு மாநகரில் வீதி அபிவிருத்தி அதிகார சபையினால் புனரமைப்புச் செய்யப்பட்ட பல வீதிகளின் பெயர்ப் பலகைகளில் தமிழ்மொழி மிகவும் அழகான முறையில் எழுதப்பட்டிருக்கின்றது. இதனைப் பார்க்கும்பொழுது எங்க ளுக்கு மனநிறைவு ஏற்படுகின்றது. இவ்வாறான நிலை நாட்டினுடைய ஏனைய பகுதிகளிலும் ஏற்படுத்தப்படல் வேண்டும். இலங்கையினுடைய தேசிய கீதத்தை எந்த மொழியில் இசைப்பது என்பது தொடர்பில் அண்மையில் பெரும் சர்ச்சை கிளம்பியபொழுது, மாண்புமிகு அமைச்சர் வாசுதேவ நாணாயக்கார அவர்கள் தெளிவானதொரு கருத்தை முன்வைத்து, அதற்கு முற்றுப்புள்ளி வைத்தார். அரசாங்கத்தில் இருக்கும் சில இனவாத பங்காளிக் கட்சிகளின் கோஷங் களுக்கு அவர் இடம்கொடுக்காது, அவரது பக்கச்சார் பற்ற தன்மையை மிகத் தெளிவான முறையிலே எடுத்துக் காட்டினார். என்னைப்பொறுத்தமட்டில், இன விகிதா சாரத்தின் அடிப்படையில் தேசிய கீதத்தில் 25 சதவீதம் தமிழ் மொழியிலான வரிகளையும் 75 சதவீதம் சிங்கள

[ගරු ප්‍රභා ගනේසන් මහතා]

மொழியிலான வரிகளையும் உள்ளடக்கி, அதன்மூலம் இரு சாராரும் இரண்டு மொழிகளையும் சேர்ந்த வரிகளையும் இசைக்கக்கூடிய ஒரு நிலையை ஏற்படுத்துவதுதான் சரியான ஒரு முறையாக இருக்குமென நான் நினைக்கின்றேன். இவ்வாறு சிறு சிறு பிரச்சனைகளை நாங்கள் தூக்கிப்பிடிக்கும் போது, எமது நாட்டை அபிவிருத்தி செய்வதற்கான சூழலை எம்மால் ஏற்படுத்திக் கொடுக்கமுடியாது. அதேநேரம் சிறுபான்மையின மக்களின் மனங்களைக் காயப்படுத்திக் கொண்டு இந்த நாட்டை ஒருபோதும் அபிவிருத்திப் பாதையில் இட்டுச்செல்ல முடியாது என்பதையும் நாங்கள் விளங்கிக் கொள்ளவேண்டும்.

சிங்கள அண்ணன்மார் தமிழ்த் தம்பிமாரை அரவணைத்துச் செல்லவேண்டிய ஒரு கட்டாய சூழலில் இந்த நாடு இருக்கின்றது. நாங்கள் தமிழ் மக்களுடைய உரிமைகளுக்காகக் குரல் கொடுக்கும் அதேநேரத்தில், தமிழ் இனவாதத்தைப் பேச முற்படுவது எமது உரிமைகளைப் பெற்றுக்கொள்ளவதற்கான சரியான வழியாக அமையாது. சிங்கள இனவாதத்தை எதிர்க்கும் நாம், தமிழ் இனவாதத்தை எம்மத்தியில் பேசி அரசியல் இலாபம் தேட முற்படுவது, எங்களுடைய சமூகத்துக்கு இழைக்கும் பாரியதொரு துரோகம் என்பதை உணர வேண்டும். அவ்வாறில்லாமல், எமது உரிமைகளைப் பெறுவதற்கு யதார்த்த ரீதியாகப் பயணித்தால், எமது மக்கள் ஒருபோதும் யாரிடமும் மண்டியிடத் தேவையில்லை. எமது மக்களிடையே காணப்படும் மொழியமுலாக்கல் பிரச்சினையைத் தீர்ப்பதற்காகத்தான் இவ்வமைச்சானது மேதகு ஜனாதிபதி அவர்களால் விசேடமாக உருவாக்கப்பட்டிருக்கின்றது என்பதை நாங்கள் கருத்திற்கொள்ள வேண்டும். இப்பிரச்சனைகளையெல்லாம் ஒரே இரவில் தீர்க்க முடியாது. ஆனால், தமிழ் மொழி அமுலாக்கம் தொடர்பிலான குறைபாடுகளை நான் அமைச்சர் அவர்களின் கவனத்துக்குக் கொண்டுவருவதற்கான முயற்சிகளை முன்னெடுத்து வருகின்றேன். அதன்படி மிகவிரைவில் எமது நாட்டில் இரண்டு மொழிகளிலும் கருமமாற்றக்கூடிய நிலைமை ஏற்படும் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

கடந்த சில வாரங்களுக்கு முன்பு மன்னார் மாவட்டத்துக்கு சிங்கள மொழி பேசும் ஒருவரை அரச அதிபராக நியமித்தது தொடர்பில், எதிர்க்கட்சியினர் ஊடகங்களில் பாரிய எதிர்ப்புக்களைத் தெரிவித்து வந்தனர். இவர்கள் தங்களுடைய பெயர் ஊடகங்களின்மூலம் வெளிவரவேண்டும் என்ற ஆசையில்தான் இவ்வாறு செய்கின்றார்கள் என்று நான் நினைக்கின்றேன். இது சம்பந்தமான ஆட்சேபனையை எந்தவொரு எதிர்க்கட்சி உறுப்பினரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர் மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன அவர்களுக்கே தெரிவிக்கவில்லை.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
அது உண்மையல்ல!

**ගරු ප්‍රභා ගනේසන් මහතා**
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Praba Ganesan)
நான் இது சம்பந்தமாக - [இடையீடு] நீங்கள் தெரிவித்திருந்தால் பரவாயில்லை. நீங்கள் அதனைப் பிறகு சொல்லுங்கள்! [இடையீடு] நீங்கள் அமைச்சர் அவர்களைக் கேளுங்கள்!

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
What is your point of Order?

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
நான் இது தொடர்பாக எழுத்துமூலமாகவும் தொலைபேசி மூலமாகவும் மாண்புமிகு அமைச்சர் ஜோன் செனெவிரத்ன அவர்களுடைய கவனத்துக்குக் கொண்டுவந்தேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order.

**ගරු ප්‍රභා ගනේසන් මහතා**
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Praba Ganesan)
நீங்கள் அதனைப் பாராளுமன்றத்தில் சமர்ப்பியுங்கள்!

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Hon. Member, you have to conclude your speech now. Your time is over.

**ගරු ප්‍රභා ගනේසන් මහතා**
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Praba Ganesan)
நான் இது சம்பந்தமாக உடனடியாக அமைச்சர் அவர்களோடு தொடர்புகொண்டு எனது ஆட்சேபனையைத் தெரிவித்தபொழுது, அவர் அதற்கு "முல்லைத்தீவு மாவட்டத்தில் கடமையாற்றிய தமிழ் அரசாங்க அதிபரை மொனராகலை மாவட்டத்துக்கு இடமாற்றம் செய்திருக்கின்ற பொழுது, ஏன் மன்னார் மாவட்டத்துக்கு சிங்கள மொழி பேசுகின்ற ஓர் அரச அதிபரை நியமிக்கக்கூடாது?" என தெளிவாகச் சுட்டிக்காட்டினார். இருப்பினும், யுத்தம் முடிவடைந்து சில வருடங்களுக்குள் இவ்வாறான நிகழ்வுகளை மேற்கொள்வது தமிழ் மக்கள் மத்தியில் பாரிய சந்தேகங்களை ஏற்படுத்தும் என்பதை நான் அமைச்சர் அவர்களுக்குத் தெளிவாகச் சொல்லியிருக்கிறேன். இந்த நாட்டில் தமிழ் மக்கள் வாழ்வதற்கான பாதுகாப்பு உத்தரவாதத்தை நாங்கள் மண்டியிட்டுப் பெறவேண்டிய அவசியமில்லை.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have to conclude now. Your time is over.

**ගරු ප්‍රභා ගනේසන් මහතා**
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Praba Ganesan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் எனது உரையை ஒரு நிமிடத்துக்குள் முடித்துக் கொள்கின்றேன்.

எங்களுக்கு பாதுகாப்பு மட்டும் போதாது. மாறாக, எங்களுடைய முழு உரிமைகளும் உரியமுறையில் வழங்கப்பட வேண்டும் என்பதில் நாங்கள் மிகவும் கவனமாக இருக் கின்றோம். தற்பொழுது, எமது அரசாங்கம் சரியான பாதையில் செயற்பட்டுக்கொண்டு வருகின்றது. மேதகு ஜனாதிபதி அவர்களின் "ஒரே இலங்கையர்" என்ற கனவை நனவாக்கு வதற்குச் சம்பந்தப்பட்ட அமைச்சர்கள் பூரண ஒத்துழைப்பினை வழங்கினால், தமிழ் மொழி அமுலாக்கத்தை நாடு முழுவதும் சரியான முறையில் நடைமுறைப்படுத்த முடியும் எனக்கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. E. Saravanapavan. Order, please! The Hon. Alhaj A.H.M. Azwer will now take the Chair.

***අනතුරුව ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. R. YOGARAJAN *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[3.13 p.m.]

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

Mr. Presiding Member, I have to congratulate the Ministry of Local Government and Provincial Councils for its endeavours to defeat its own objectives, than any other Ministry. After the end of the war, in order to hoodwink the people and the international community, in the month of December, 2009, the Consultative Committee on Local Government and Provincial Councils approved a national policy on local government and promulgated same by Extraordinary Gazette No. 1632/26 of 18th December, 2009. This was ratified by Parliament in the month of February, 2010. In this policy, the Government declared several noble objectives and commitments towards regional and local governance. What is happening to these policy objectives? What is happening to the much- advertised local government reforms? Whenever a crisis occurs, the Government makes announcements about devolution, local governance, regional governance, autonomous local governments and all such pompous statements. What is actually happening now?

After 1987, so much of noise was made in this country about devolution, empowerment and strengthening of second and third tiers of governance structures. What does the Budget provide towards these objectives in its Proposals? Ever since the Provincial Councils Act and the Pradeshiya Sabha Act were introduced in Parliament, the Finance Commission has not been able to properly assess the financial needs of the second and third tiers of governance structures and provide adequate funds for their function and service delivery. Continuously, the Government Budgets ensured that the second and third tiers of governance structures get only around or less than 1 per cent of the total Government expenditure. In the Budget for 2012, the Government has allocated only 0.09 per cent of the total recurrent provision and 0.06 per cent of the capital allocation to the other two governance structures, namely, the entire provincial councils and local governments. What a ridiculous scenario? Does the Government have a real commitment, an intention and capacity to solve the ethnic problem if this is the treatment and respect it gives to the devolution process and local governance?

The Finance Commission is constituted according to the constitutional provisions. It has to perform its constitutional obligations. If it does not perform its constitutional obligations, we do not need to have a Finance Commission. If the Finance Commission is not able to discharge its constitutional responsibilities, who is undermining its functions? I am sure the Finance Commission is fully aware of the governance structures of this country and the governance responsibilities shared among the three tiers of governance structures, namely, central government, provincial councils and local government. It cannot function to defeat the objectives of the Government and the Constitution towards devolution and local governance. I am sure the Finance Commission does not constitute of a bunch of ignorant people. It would have given its recommendation at least to a reasonable extent. If so, does the Treasury have administrative authority to overrule the recommendation given by the constitutional authority? Can the Treasury cut down the recommendations made by the Finance Commission? If we have a constitutional provision, we have to honour it. The question is, how can you insulate the Finance Commission from the unconstitutional interferences made by the Treasury if it does exist? Or, we have to educate the different apparatus of the Government to work towards the same constitutional objectives.

The rulers of this country have trained the entire arms and institutions of the Government machinery to become devolution hostile. There is no regard to the rights of people to good local governance in this country. The Ministry of Local Government and Provincial Councils which is supposed to take the mantle to fulfil the noble objective of local governance and regional governance is totally insensitive and lethargic in this connection or they do not have the diagnostic ability to identify the disease that has plagued the governance structures in this country.

We may have to appoint another MBBS doctor as the Secretary to the Ministry of Local Government and Provincial Councils. We do not see any tangible improvement in the capacities of the second and third tiers of governance structures over the past several years.

[ගරු ඊ. සරවනපවන් මහතා]

His Excellency the President in his Budget Proposals pronounced that he will continue with the strategies that will undercut the authorities of the provincial councils. The Government is not prepared to allow the provincial councils to take over their roles and responsibilities. Consistently, this year too the Budget has provided broader access to the national ministries to function in the sectors of agriculture, livestock, fisheries and sports. This is in addition to the financial provision made to the central ministries for subjects such as education, health, elders' welfare, provincial roads, water supply, irrigation et cetera devolved to the provincial councils. This is how the national Budget is used as an effective instrument to undermine the devolution process and destabilize the country.

I submit to this august Assembly that in order to give a chance to the provisions of the Constitution to become operational in practical terms, the Government, instead of giving with one hand and taking it away with the other, should develop the capacities of the provincial councils to take over the development responsibilities without weakening them. We are yet to see credible signals and real commitment of the Government towards devolution. The Ministry of Local Government and Provincial Councils only aids and abets the other institutions in eroding the legitimate powers of provincial councils and local governments. We have never heard from the Minister any advocacies to protect the rights of the provincial councils and local governments. After providing less than 1 per cent of the total budget, how can one claim that provincial councils are white elephants? If you go through the Budgetary provisions for this year, you can identify a number of other white elephants in the Government.

Of course, whatever money the provincial councils get, however meagre they are, when compared to the total expenditure of the Government, it is also public money. It should be used in a purposeful way. I do not know whether the funds given to the Northern Provincial Council are properly utilized. According to statistics, the Northern Provincial Council is the least-fund utilized Provincial Council in the country as of July, 2011.

Sir, in our country, rumours are often founded on some facts. I wish to mention some of the stories that go around in Jaffna. The reason for the underutilization of funds is said to be the total interference by the Governor in the financial procedure. He has downgraded himself to the level of an imprest accountant and a certifying officer. I heard that departmental heads and the ministries have to get permission from the Governor for release of imprest on account of any work done according to an approved plan. He has to give the okay to make payments to the contractors. He often calls for meetings with contractors.

We have heard folk stories of a chieftain called "*Mahadena Muththa*". He is notorious for his mockeries. We have heard that he cut down trees, demolished structures in his way and et cetera. In today's context, this type of activities will be considered an encroachment into the affairs of others. The Governor of the North has constructed a luxury bungalow at a cost around Rs. 100 million for his use in a public trust property. He has also demolished a part of the parapet wall around this property and so on. This Army Major-General who used to demolish the properties of others and occupy them without anybody's permission earlier, continues his practice even now without considering any civil desires.

I would urge the Minister of Public Administration and Home Affairs to stop this type of mockery done by using public funds and common properties without the consent of the people. I understand that the management of the property that I am referring to, namely, the Jaffna Old Park, has to be streamlined according to the Trust Ordinance in order to stop the misuses in future. The Governor also runs his bungalows in Kilinochchi, Vavuniya and Colombo, all out of public funds. He has engaged seven vehicles, including luxury ones, for his official purpose. Against technical advice, he ordered 16 heavy-duty air conditioners for Jaffna Weerasingam Hall and those were just fitted and kept for months and later removed and handed over to the Jaffna Hospital. Can the Governor appropriate some of the money voted by Parliament for provincial capital works, divert it to the capital work of a line ministry without the approval of the Parliament?

There is some procurement muddle, I hear. There are also rumours that the Governor of the Northern Province procured thousands of bicycles and sarees for give-away at exorbitant prices, more than the market rates, during the last Local Government Elections. The latest complaint is that the Governor directly interferes with the Secretaries of the Pradeshiya Sabhas. His Coordinating Secretary, a Major, who takes virtually all important administrative decisions in the Provincial Council, has placed orders for library books to the tune of about Rs. 30 million without properly following procedures in the selection of books, selection of suppliers et cetera. The personal staff of the Governor has put up a three-floor mansion and ordered for a luxury vehicle out of his personal income. No staff officer is close to the Governor due to his uncivil bullying approach. They are treated as sentry point soldiers, issued with sudden transfer orders, frequent admonitions and castigations. In fact, most of them will leave if they get a chance. This is the state of affairs in the Northern Provincial Council.

Sir, you are aware that after a very long period of time there were Local Government Elections in the North. There is a new generation of local level leaders, who need to be educated on local governance. The elected members need to be trained. The Provincial Department of the Local Government has been instructed not to train any Local Authority member.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, there is only one more minute left for you.

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

Sir, please give me another minute.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Yes, I will give you a minute.

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

Thank you. These Local Authority members are the people's representatives who have the legitimacy to run the Council's affairs. Most of them are TNA Members and therefore they should not be deprived of taking part in the process of local governance. They are not invited for any official functions. They are not supposed to be consulted in any matters that affect the people. This is the level of respect and recognition the elected representatives command in the Northern Province. This is how the people are set against the Government. How could there be reconciliation if these types of conditions prevail? This is the state of affairs of local governance and provincial governance in the Northern Province.

Sir, the Government's objectives for regional imbalance could be achieved only if the resources and authorities are granted to the next tiers of governance structures. The financial proposals and policies pronounced in this Budget are not going to take us anywhere in the direction of good governance, peace and prosperity in the country as declared by His Excellency the President.

Thank you.

[අ.භා. 3.28]

**ගරු ජගත් බාලසූරිය මහතා (ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜகத் பாலசூரிய - தேசிய மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. Jagath Balasuriya - Minister of National Heritage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී විශේෂයෙන්ම එම අමාත්‍යාංශයේ පළාත් පාලන අංශය කෙරෙහි අවධානය යොමු කිරීමට මා කැමැතියි. අප දන්නවා, මේ පළාත් පාලන ක්‍රමය අප උරුම කර ගත්තේ බ්‍රිතාන්‍යයේ යටත් විජිත රටක් හැටියට අප සිටිය කාලයේ බව. අප නිදහස ලබා ගෙන වර්ෂ 60ක් පමණ ගත වුණත්, මේ පළාත් පාලන ක්ෂේත්‍රයේ විශාල වෙනස්වීමක්, විපර්යාසයක් ඇති වෙලා නැහැ. පළාත් පාලන ක්‍රමය අප ලබා ගත්ත එංගලන්තය පවා 1997 දී එරට පළාත් පාලන ක්‍රමයේ පුළුල් වෙනස්වීමකට පදනමක් දැම්මා. පළාත් පාලනය පිළිබඳ ධවල පත්‍රිකාවේ "Modern Local Government in Touch with the People" කියන ප්‍රකාශය සමඟම 1998 දී පළාත් පාලනය පිළිබඳ පනතක් සකස් කළා. මම මෙයින් උත්සාහ කරන්නේ පළාත් පාලන ක්‍රමය අප උරුම කර ගත් රටේ පවා වෙනස් වීම් ඇතිවන අවස්ථාවක අපේ රටේත් අද වෙනකම් විශාල වෙනසක් ඇති නොවීම ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවීමටයි.

අප දන්නවා මීට වර්ෂ 12කට ප්‍රථම -1999 දී ආචාර්ය එච්.පී. අබේවර්ධනගේ ප්‍රධානත්වයෙන් කොමිසමක් පත් කළ බව. ඒ කොමිසම විසින් ඉදිරිපත් කරපු සමහර යෝජනා - Report of the Commission of Inquiry on Local Government Reforms - අදට නොගැළපීමක් නොතිබුණත්, සමස්තයක් වශයෙන් ගත්තාම එහි ඉතාම වැදගත් යෝජනා සමූහයක් අපට දකින්න පුළුවන්. ඒ යෝජනා අතර තිබෙන වඩාත් පුළුල් ප්‍රාදේශීය ස්වයං පාලනයක් කියන කාරණය අද අනිවාර්යයෙන්ම අවශ්‍ය වන දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඔවුන් සඳහන් කරන තවත් කාරණයක් තමයි පළාත් පාලන කටයුතු සඳහා ජනතා සහභාගිත්වය පුළුල් කිරීම. ඊළඟට, ස්වයං විශ්වාසය ඇති කිරීම, ප්‍රාදේශීය ඡන්ද දායකයන්ගේ අවශ්‍යතාවලට දැඩි ලෙස ප්‍රතික්‍රියා දැක්වීම, රටෙහි සංවර්ධනයෙහිලා පළාත් පාලනයට විශේෂ කාර්ය භාරයක් ඇති කිරීම, පළාත් පාලන ආයතනවල කාර්යක්ෂමතාව, ඵලදායිතාව හා නිෂ්පාදනය වැඩි කිරීමට ක්‍රියාදාමයන් ගැනීම, එසේම නව පළාත් පාලන සංස්කෘතියක් හා බදු ගෙවන්නන්ගේ ප්‍රඥප්තියක් ඇති කිරීම වැනි කරුණු මේ කොමිෂන් සභාවෙන් ඉදිරිපත් කළා. නමුත් අභාග්‍යයකට ඒ පිළිබඳ තවම අවධානයක් යොමු වී නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප විශේෂයෙන්ම කල්පනා කළ යුතු දෙයක් තමයි, බලය බෙදීම හා බලය විමධ්‍යගත කිරීම - Devolution and Decentralization - කියන සංකල්ප දෙක එකිනෙකට සම්බන්ධ වුණත් ඒ වචන දෙකට වෙනම අනන්‍යතාවක් තිබෙන බව. බලය බෙදීම කියන්නේ වාර්ගික හෝ ආගමික ප්‍රශ්නයක් මත ලෝකයේ බොහෝ රටවල එක්තරා විධියක බලය බෙදා හැරීමක් කරන ක්‍රියාදාමයක්. නමුත් විමධ්‍යගත වීම කියන්නේ රටක මධ්‍යම පාලනය හැකිතාක් දුරට ගම් මට්ටමට ගෙන යැමයි; නොඑසේ නම් ප්‍රජාතන්ත්‍රවාදය ගමට ගෙන යැමයි. ඒ කාලයේ අයිවෝ ජෙනින්ස් වැනි පුද්ගලයන්ගේ මූලික තර්කය අනුව බලය විමධ්‍යගත කරනවා කියන්නේ ගමට ප්‍රජාතන්ත්‍රවාදය ගෙන යැමයි. අද වෙලා තිබෙන්නේ මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලය බෙදීම පළාත් සභාවේ සංකේන්ද්‍රගත වෙලා තිබෙනවා. පළාත් සභාවෙන් පහළට බලය බෙදීමක්, බලය විමධ්‍යගත වීමක් දකින්න නැහැ.

ඉතාම සරල උදාහරණයක් ගනිමු. අද සමහර පළාත් පාලන ආයතනයකට සේවකයෙක් පත් කර ගැනීමේදී ආයතනය සතුව මුදල් තිබුණත් පළාත් සභාවෙන් අවසරයක් නැත්නම් එවැනි ක්‍රියා මාර්ගයක් ගැනීමට අවකාශයක් නැහැ. අද මේ රටේ නගරාධිපතිවරුන්ගේ සම්මේලනයත්, ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ගේ සම්මේලනයත් පුන පුනා ඉල්ලා සිටින්නේ පළාත් සභාව සතුව තිබෙන ඒ බලය ප්‍රාදේශීය මට්ටමට පුළුල් කරන්නය කියන එකයි. මේ පිළිබඳව ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කළ යුතුයි.

දෙවන කාරණය මෙකයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද ප්‍රාදේශීය සභාවල ඡන්දදායකයන් ඒ වාගේම නගර සභාවල ඡන්දදායකයන් සංඛ්‍යාව ගත්තොත් අතිවිශාල පරතරයක් තිබෙනවා. හෝමාගම ප්‍රාදේශීය සභාව ගත්තොත් ඡන්දදායකයන්

[ගරු ජගත් බාලසූරිය මහතා]

1,50,000කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. තලවකැලේ නගර සභාව ගත්තොත් ඡන්ද දායකයන් 4,500ක් පමණ ප්‍රමාණයක් තමයි ඉන්නේ. හෝමාගම, කටාන, මීරිගම වැනි ප්‍රාදේශීය සභාවල ඡන්ද 1,00,000කට වැඩිය තිබෙනවා. වත්තේගම, කඩුගන්නාව, හැටන් දික්ඔය, තලවකැලේ, නාවලපිටිය, වැල්වැටිතුරෙයි නගර සභාවල ඡන්ද 10,000කට අඩු ප්‍රමාණයක් තිබෙන්නේ. මේක එක්තරා ක්‍රමවේදයක් තුළින් අනිවාර්යයෙන්ම වෙනසක් කළ යුතුයි.

අපේ ඉන්දික බණ්ඩාරනායක නියෝජ්‍ය ඇමතිතුමා වැදගත් අදහසක් ඉදිරිපත් කළා. මොකක්ද ඒ අදහස? අනාගතයේදී පැරණි ආසන ක්‍රමයට පළාත් පාලන ඡන්දය පැවැත්වීමට ක්‍රියා මාර්ගයක් ගන්නවා කියන එකයි. ඒක ඉතාම වැදගත් අදහසක් වන්නේ මෙන්න මේ හේතුව මතයි. හෝමාගම වාගේ ප්‍රාදේශීය සභාවකට දුප්පත් පුද්ගලයෙක් අපේක්ෂකයෙකු හැටියට ඉදිරිපත් වුණොත් ඡන්ද දායකයන් 1,50,000කට ආයාචනය කරන්නට, ඡන්ද ව්‍යාපාරය ගෙන යන්නට ඒ පුද්ගලයාට ආර්ථික ශක්තියක් නැහැ. නමුත් පැරණි ක්‍රමයට අනුව පොඩි කලාපයක් තිබෙනවා නම්, සුළු කලාපයක් තිබෙනවා නම් තමන්ගේ ඡන්ද ව්‍යාපාරය ගෙන යෑමට හැකියාවක් තිබෙනවා. මේ ක්‍රමයේ වෙනසක් නොකළොත් ඇති වන ප්‍රතිවිපාකය වන්නේ මොකක්ද? තමන්ගේ පන්තියේ පුද්ගලයෙක් ප්‍රාදේශීය සභාවකටවත් පත් කර ගැනීමට ආර්ථික පදනමක් නැහැ කියා මේ රටේ වැඩ කරන පන්තියට හෝ නිර්ධන පන්තියට වැටහුණොත් ඔවුන් තුළ මේ ක්‍රමය කෙරෙහි තිබෙන විශ්වාසය, භක්තිය අඩු වෙලා යැමයි. ඒ නිසා මේ ඡන්ද ක්‍රමයේත් වෙනසක් ඇති කිරීම ඉතාමත්ම වැදගත් වනවා.

සජිත් ප්‍රේමදාස මහත්මයා යෝජනාවක් කළා, අපි අපේක්ෂා කරන පරිදි අද මේ රටේ කාන්තාවන්ට නියෝජනයක් නැහැ කියා. ඇත්ත වශයෙන්ම දකුණු ආසියාවේ පාර්ලිමේන්තුවල සිටින කාන්තාවන් ප්‍රමාණය බැලුවාම අපි ඉන්නේ පාකිස්තානයට සහ බංග්ලාදේශයට වඩා පහළින්. මෙතැනදී ගත යුතු ක්‍රියා මාර්ගය මොකක්ද? Quota ක්‍රමයක් නැත්නම් reserve system එකක් ඇති නොකර කාන්තාවන්ට සියයට ගණනක අනුපාතයක් දුන්නත් ඔවුන්ට ප්‍රාදේශීය සභාවට ඇතුළු වන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. උදාහරණයක් හැටියට ගත්තොත් ඉන්දියාවේ තිබෙන පහත්ම මට්ටමේ, ප්‍රාදේශීය මට්ටමේ පළාත් පාලන ආයතනවල සියයට 40කට වඩා ඉන්නේ කාන්තාවෝ. ඉන්දියාව විසින් ඒකට ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා. මොකක්ද ක්‍රමවේදය? Reserve system එකක්, quota ක්‍රමයක් ඔවුන් හඳුන්වා දී තිබෙනවා. ඒ ක්‍රමය තුළ පංචායට් වැනි පහළ මට්ටමේ ප්‍රාදේශීය පාලනයට ඇතුළු වීමට කාන්තාවන්ට හැකියාවක්, ශක්තියක් ඇති වෙලා තිබෙනවා. රටේ ජනගහනයෙන් සියයට 52ක් පමණ සිටින කාන්තාවන්ට ඒ අවස්ථාව ලබා දුන්නොත් එයින් එක්තරා යහපතක් ඇති වනවාය කියා අපට කියන්න පුළුවන්.

ඊට අමතරව, බොහෝ විට බලය විමධ්‍යගත කිරීමේ ක්‍රියාදාමය මත ප්‍රාදේශීය සභාවලට පුළුල් බලතල දුන්නොත් මා කලින් කී පරිදි ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රාදේශීය සභා සඳහා නියත වශයෙන්ම අන්තර්ගත වනවා. විශේෂයෙන්ම පළාත් පාලන ක්‍රමයේ සම්පූර්ණ වෙනසක් ඇති කිරීමට අවධානය යොමු කරන්නය කියා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මා නවතිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
ස්තුතියි. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. තමුන්නාන්සේට විනාඩි පහක්ම තිබෙනවා.

[අ. භා. 3.39]

**ගරු සුජීව සේනසිංහ මහතා**
**(மாண்புமிகு சுஜீவ சேனசிங்க)**
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමාට විනාඩි 10ක් වෙන් කළ නිසා මට විනාඩි පහයි හම්බ වෙන්නේ. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, පළාත් පාලන හා පළාත් සභා, ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා විෂය පුළුල් විෂයයක්. අපේ ආචාර්ය ජගත් බාලසූරිය ඇමතිතුමා වාගේම මමත් පළාත් පාලන හා පළාත් සභා සම්බන්ධයෙන් පමණක් වචන කීපයක් මේ අවස්ථාවේදී කථා කරන්න බලාපොරොත්තු වනවා. එතුමා හොඳ අදහස් කීපයක් ඉදිරිපත් කළා. මට මතකයි, මේ ආණ්ඩුව ලහි ලහියේ ඒ පළාත් පාලන ඡන්ද ක්‍රමය වෙනස් කරන්න හැදූ අන්දම. 1,50,000කට වැඩිය ජනතාවක් ඉන්න හෝමාගම, කඩුවෙල වාගේ ආසනවල විශේෂයෙන්ම පළාත් පාලන මැතිවරණවලට ඉදිරිපත් වන අපේක්ෂකයන්ට පොඩි මුදලක් වියදම් කරලා දිනන්නට තිබෙන හැකියාව ඉතා අඩුයි. අප විමතියට පත් වන කාරණය තමයි මේ ආණ්ඩුව කෝටි ගණනක් වියදම් කරලා ලහි ලහියේ ඒ පළාත් පාලන ඡන්දය ක්‍රමය වෙනස් කරන්න යෝජනා ඉදිරිපත් කළත් අන්තිමට ඒ සංශෝධන ඒ ආකාරයෙන් ඉදිරිපත් නොකිරීම. මේ අවස්ථාවේදී එය අප සියලු දෙනාගේම කනගාටුවට භාජනය වනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
**(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)**
(The Hon. W.D.J. Senewiratne)
ඉදිරිපත් කරනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
**(மாண்புமிகு சுஜீவ சேனசிங்க)**
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තුතියි, ඇමතිතුමනි. පැවැති පළාත් පාලන මැතිවරණයට කලින් එය ඉදිරිපත් කළා නම් එක්සත් ජාතික පක්ෂයට ඒ ක්‍රමය වාසි සහගත වෙන්න තිබුණා. ඒ අවස්ථාවේදී ඔබතුමන්ලා ගොඩාක් වෙහෙස ගත්තා, මෙය ලහි ලහියේ ඉදිරිපත් කරන්න. කමක් නැහැ, පරක්කු වෙලා හරි මේ ක්‍රමය ඉදිරිපත් වුණොත් හොඳ දෙයක්.

විශේෂයෙන්ම මේ පළාත් පාලන ආයතනවලට තවත් ක්‍රමවේදයක් හඳුන්වා දෙන්න පුළුවන් නම් හොඳයි. ඒ තමයි වග කියන්න පුළුවන්, අධ්‍යාපනයක් තිබෙන සභිකයෝ මේ පළාත් පාලන ආයතනවලට පත් කර ගන්න මොනවා හෝ ක්‍රමයක් සකස් කිරීම. එහෙම ක්‍රමයක් තිබෙනවා නම් මම හිතන හැටියට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක රටේ ඉදිරි අනාගතයට හොඳ ලක්ෂණයක් බවට පත් වනවා.

පළාත් සභාව ගැන කථා කරන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුවට ගොඩාක් විවේචන තිබෙනවා. පළාත් සභාව එක්සත් ජාතික පක්ෂය හඳුන්වා දෙන කොට බොහෝ දේවල් කියමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විරුද්ධ වුණා. පසුව අද වන කොට එක්සත් ජාතික පක්ෂයේ සියලු ප්‍රතිපත්ති අමාරුවෙන් හරි අනුගමනය කරන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන ඉදිරි ගමන නැඹුරු වෙලා තිබෙනවා. එතුමන්ලාට අම්හිරි වුණත් එක්සත් ජාතික පක්ෂයේ අපි රටේ අනාගතය වෙනුවෙන් නොයෙකුත් අවස්ථාවල ක්‍රියා කර තිබෙනවා. රටේ තිබෙන ස්වභාවය සහ රටේ තිබෙන භූමිය ගත්තාම ඔබතුමන්ලාට වාගේම මටත් දැනෙන්න පුළුවන්, මේ රට පොඩි රටක්, පළාත් සභා ක්‍රමයක් අවශ්‍ය නැහැයි කියලා. හැබැයි ඇමතිතුමනි, පළාත් සභා ක්‍රමය මේ රටේ ජනවාර්ගික ප්‍රශ්නය විසඳීමට, ඒ වාගේම ජාති

ආගම් වශයෙන් වෙන්න පුළුවන්, නැත්නම් සංස්කෘතික වශයෙන් වෙන්න පුළුවන්, ඒ වාගේම වෙනත් හේතු මත වෙන්න පුළුවන්, එක එක ප්‍රදේශවල ඉන්න ජන කොට්ඨාසවලට තමන්ට අදාළ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි පහ අවසන්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
විනාඩියක්වත් ගියේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි පහ හරියටම හරි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එතකොට විනාඩි 06ක් වනවා. අවසන් කරන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මට විනාඩි 05යි හම්බ වුණේ. කමක් නැහැ,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා පරිත්‍යාග කරන්න නරකයි, time එක වුණත්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
පරිත්‍යාගශීලී වන්න නරකයි. මම පිළිගන්නවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තව එක් අදහසක් පමණක් ඉදිරිපත් කරන්නම්, අපේ ගරු ඇමතිතුමන්ලාට. අපේ පාර්ලිමේන්තුවේ COPE කමිටුවක් තිබෙනවා, විගණනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන. හැබැයි පළාත් සභාවලටත්, ප්‍රාදේශීය සභාවලටත් ඇමතිතුමනි, මේ වාගේ විගණනය සම්බන්ධයෙන් පරීක්ෂා කරන්න කිසිම කමිටුවක් නැහැ.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
විමර්ශනය කරනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
විමර්ශනය කළාට ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් නීතිමය වශයෙන් ක්‍රියාත්මක වන්න හැකියාවක් නැහැ. බොහෝ වෙලාවට මහ නැඟුම, ගම නැඟුම - [බාධා කිරීමක්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Public Accounts Committee එක තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නියෝජ්‍ය ඇමතිතුමනි, විමර්ශනය කළාට ඒ සම්බන්ධයෙන් නීතිමය වශයෙන් ක්‍රියාත්මක වෙන්න හැකියාවක් නැහැ. බොහෝ වෙලාවට දූෂණය මග නැඟුම, ගම නැඟුම, -[බාධා කිරීමක්] අහ ගෙන ඉන්න කෝ ඇමතිතුමා. මග නැඟුම, ගම නැඟුම වාගේ ක්‍රම තුළින් මේ දූෂණය-[බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එතුමාට වෙලාවක් නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
දැන් වාසුදේව නානායක්කාර ඇමතිතුමා දූෂණයට හරි කැමැතියි නේ. සමාජවාදය ගැන කථා කළ මෙතුමන්ලා ඇමති පට්ටමක් හම්බ වුණාම දූෂණ ඔක්කොම අමතක කරනවා. මේ ආණ්ඩුවේ තිබෙන සියලුම වැරදිවලට කඩිනවා. අපට ලජ්ජයි. මේ වාගේ සමාජවාදය ගැන විශාල පුරාජේරු නගපු ඇමතිවරු-[බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, අපි අවසන් කරමු. අලුත් මාතෘකාවක් එපා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අද පළාත් සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ දූෂණය වළක්වන ආකාරය ගැන මන්ත්‍රීවරයෙක් කථා කළොත් ඒකටත් කඩිනවා. [බාධා කිරීමක්] මම බලාපොරොත්තු වෙනවා, ඔබතුමා සමාජවාදයේ මිනී පෙට්ටියට අන්තිම ඇණය ගැහුවා වාගේ මේ රටේ අනාගතයටත් ඔබතුමාගේ හැකියාව අනුව කවදා හරි ඇණය ගහයි කියලා. බොහොම ස්තුතියි. [බාධා කිරීමක්]

[අ. භා. 3.44]

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා (උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க - உயர் கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Nandimithra Ekanayake - Deputy Minister of Higher Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ විවාදයට ගැනෙන්නේ ඉතාමත් වැදගත් අමාත්‍යාංශ තුනක වැය ශීර්ෂ. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගේ රාජකාරි ජීවිතයේ අමාත්‍යාංශය. ඒ වාගේම පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මම වරක් කැබිනට් ඇමතිවරයා වශයෙන් සිටි අමාත්‍යාංශය. ඒ නිසා ඒ අමාත්‍යාංශ දෙක මට ඉතාමත් වැදගත්. ඒ වාගේම අලුතෙන් නිර්මාණය වුණ අපේ ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමාගේ අමාත්‍යාංශය මේ රටේ සමාජ ඒකාබද්ධතාව ඇති කරන්න, ඒ වාගේම ජාතීන් අතර ඒකාබද්ධතාව ඇති කරන්න ඇති කළ වැදගත් අමාත්‍යාංශයක්.

[ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව පටන් ගැනීමේදී මම ඉස්සෙල්ලාම අපේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා කළ චෝදනාවක් ගැන කියන්නට කැමැතියි. එතුමා කිව්වා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට පළාත් සභාවල මන්ත්‍රීවරුන්ට පිළිගැනීමක් ඇති වෙන විධියට මේ ආණ්ඩුව කටයුතු කරන්නේ නැහැයි කියන එක. මම හිතන්නේ එතුමා ඒකෙන් අදහස් කළේ, පාර්ලිමේන්තුව තුළදී එවැනි කථාවක් කරලා, ග්‍රාමීය මට්ටමේ, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගෙන් ලකුණු දමා ගන්න කියලායි.

අපි එතුමාට පැහැදිලි කරලා දෙන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. අපේ රජයේ ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ දිවි නැඟුම වැඩසටහන යටතේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු තුළින් කරන සියලු සංවර්ධන කටයුතු, මග නැඟුම යටතේ කෙරෙන සංවර්ධන කටයුතු වාගේ සියලු දේවලට යෝජනා සියල්ල අපට ලබා දෙන්නේ අපේ මන්ත්‍රීවරුයි. හැම ප්‍රාදේශීය සභාවකම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පිහිටුවා තිබෙනවා. එක මන්ත්‍රීවරයෙකුගේ යෝජනාවකට සමහර වෙලාවට රුපියල් ලක්ෂ 150, 200 වැය වෙන අවස්ථා තිබෙනවා. ඒ විධියට ඒ පිළිගැනීම ඇති වෙලා තිබෙනවා. අපි ගමට වැඩ කරන විට ගමේ මන්ත්‍රීවරයාට ජනතාවගේ ප්‍රසාදය හිමි වෙනවා. අපේ මන්ත්‍රීවරු සල්ලි ඉල්ලලා කෑදරකමේ කෑ ගහන අය නම් නොවෙයි. ඒක පැහැදිලිව මතක් කරලා දෙන්න ඕනෑ. ඊට අමතරව "පුර නැඟුම" වැඩසටහන යටතේ රුපියල් මිලියන 7000ක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ සියල්ල තුළින් ප්‍රතිලාභ ලබන්නේ ගමේ ජනතාව සහ ගමේ නායකත්වය දරන පළාත් පාලන ආයතනයි කියන එක ප්‍රකාශ කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟට අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙකුම රජයේ සේවකයින්ගේ ප්‍රශ්න ගැන කථා කළා. විශේෂයෙන් දෙමළ ජනතාව බහුතරයක් ඉන්න ප්‍රදේශවලට සිංහල පමණක් දන්න නිලධාරින් යනවා; ඒ නිසා ඒ ජනතාවට අපහසුතාවක් ඇති වෙනවා කියලා කිව්වා. ඒක අපි තේරුම් අරගෙන තිබෙනවා; පිළිඅරගෙන තිබෙනවා. ඒ නිසා අපේ ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා යටතේ තිබෙන රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මේ කටයුත්ත කරනවා. මේ රටේ රාජ්‍ය සේවකයින්ට විශාල වියදමක් දරලා, විශාල මුදලක් දරලා, අවශ්‍ය රාජකාරි නිවාඩු ලබා දීලා -පැය ගණන්- සිංහල නිලධාරින්ට දෙමළ භාෂාව ඉගෙන ගන්න බල කරලා තිබෙනවා. එහෙම නැති වුණොත්, ඒ විභාගවලින් සමත් නොවුණොත් ඒ අයගේ කාර්යක්ෂමතා කඩ ඉම් ලබා ගන්න බැරිව යනවා. ඒ වාගේම දෙමළ අයට සිංහල ඉගෙන ගන්නත් ඒ තත්ත්වය ඇති කරලා තිබෙනවා. ඒ තුළින් බලාපොරොත්තු වන්නේ මේ ශ්‍රී ලංකාද්වීපයේ සෑම ජන කොට්ඨාසයකටම පහසු වන ආකාරයට රජයේ නිලධාරින්ට මේ භාෂාවන් දෙකම හොඳාකාරව දැන ගැනීමට කටයුතු සැලැස්වීමයි. මම ඊට වඩා ඒ ගැන කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

අපි 6/2006 චක්‍රලේඛනය සංශෝධනය කිරීමට දැනටමත් කටයුතු කර තිබෙනවා. ඒ වැඩ කොටස තව මාස දෙක තුනක් තුළ අපට හරියට කරන්න පුළුවන් නම් ඉතා විශාල ජයග්‍රහණයක් ලබා ගන්න පුළුවන්. මේ 6/2006 චක්‍රලේඛනයේ අංග දෙකක් තිබෙනවා. එකක්, වැටුප් විෂමතා ඉවත් කිරීම. අනෙක, උසස්වීම් ලබා දීම. දැනට වැටුප් විෂමතා ඉවත් කරලා තිබෙනවා. දැන් අපි උසස්වීම් පිළිබඳව සාකච්ඡා කරගෙන යනවා. මම කියන්න සතුටුයි ඒ කටයුතුවලදී සියලුම අමාත්‍යාංශ මාගේ අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වෙලා ඉතාම සහයෝගයෙන් කටයුතු කරන බව.

මීට මාස දෙකකට පෙර මෙම අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වශයෙන් මා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා අමාත්‍යාංශ 21ක කාර්ය සාධක ඇගැයීමක් කරන්නට කටයුතු කළා. විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ විශ්වාසයක් තිබෙනවා යම් කිසි වෙනසක් ඇති කරනවා නම් ද්විත්ව වෙනසක් ඇති විය යුතුයි කියලා. A subjective and objective assessment has to be made on each institution that we are going to change. අපි ඉස්සෙල්ලා ආයතන පිළිබඳව හොඳ විග්‍රහයක් කරලා, MRC එකක් - Ministerial Review Committee එකක් - හරහා අදහස් ලබා ගෙන, වෙනම විශේෂඥයන් පත් කරලා එම ආයතනයේ ව්‍යුහමය වෙනස්කම් කළ යුතුයි.

[ගරු නවින් දිසානායක මහතා]

ඊළඟ කරුණ තමයි ආයතනවල තිබෙන කාර්ය සාධන වැඩසටහන් විධිමත් කිරීමට අපි අදහස් ඉදිරිපත් කරනවා කියන එක. ඒ සඳහා අදහස් ඉදිරිපත් කළාට පසුව ඒ අමාත්‍යවරයා, ලේකම්වරයාත් සමඟ සාකච්ඡා කරලා, කැබිනට් මණ්ඩලය හරහා ඒ අමාත්‍යාංශයේ තිබෙන අඩු පාඩුකම් සම්පූර්ණ කිරීම තුළ, ඒ අමාත්‍යාංශයේ කටයුතු මීට වඩා කාර්යක්ෂම කරන්න අපි උත්සාහ කරනවා. ඉතින් මේක අවංක උත්සාහයක්. අපට කරන්න පුළුවන් වැඩ කොටස අපි අනෙක් අමාත්‍යවරුන් සමඟ සාකච්ඡා කරලා කරන්න බලාපොරොත්තු වනවා.

ගරු ජනාධිපතිතුමාගේ අදහසක් අනුව අපි බලාපොරොත්තු වනවා, 2012 වර්ෂයට රාජ්‍ය සේවයට බැඳෙන සියලුම දෙනාට පත්වීමේ ලිපිය ලබා දෙන්න ඉස්සර පුහුණුවක් - pre-training- ලබා දෙන්න. ඒකට මිලියන 40ක මුදලක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඉතින් අපි බලාපොරොත්තු වනවා, මේ දෙසැම්බර් මාසයේ සිටම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් බඳවා ගන්නා රාජ්‍ය සේවකයන්ට pre-training එකක් ලබා දීමට. ඇත්ත වශයෙන්ම අපගේ රාජ්‍ය සේවය ක්‍රමවත් කරන්න, විධිමත් කරන්න අපට විශාල ඉලක්කයක් තිබෙනවා. ඒ ඉලක්කයට යන්න අපට රාජ්‍ය සේවකයන්ගේ උදව් උපකාර අවශ්‍ය වෙනවා. අපට මේ කටයුත්ත බලහත්කාරයෙන් කරන්න බැහැ. නමුත් සාකච්ඡා මාර්ගයෙන්, හොඳ පුහුණුවීම් ලබා දීම මාර්ගයේ රාජ්‍ය සේවකයන් තුළ, විශේෂයෙන්ම රාජ්‍ය සේවයට අලුතින් බැඳෙන ඒ තරුණ පිරිස් තුළ හොඳ ආකල්පමය වෙනසක් ඇති කිරීමට අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අමාත්‍යාංශය ඇතුළුව මේ අමාත්‍යාංශ තුනේම දක්ෂ ලේකම්වරුන් ඉන්නවා. මේ ලේකම්වරු නිරන්තරයෙන්ම රාජ්‍ය සේවකයන් සමඟ ගැටිලා, රාජ්‍ය සේවකයන්ගේ ප්‍රශ්නවලට මුහුණ දීලා, ඒ පීඩනවලට මුහුණ දීලා හොඳ අත් දැකීම් ලබා ගත්ත අය. ඉතින් අපි ඒ තිබෙන අඩු පාඩුකම් හොයා ගෙන, නිරන්තර සම්බන්ධයක් ඇති කර ගෙන මේ අමාත්‍යාංශය හරහා මේ රටේ යම් කිසි වෙනසක් ඇති කරන්නයි උත්සාහ කරන්නේ.

මාගේ දැඩි විශ්වාසයක් තිබෙනවා, අපි හොඳට වැඩ කරන රාජ්‍ය සේවකයන්ට යම් කිසි ප්‍රතිලාභයක් දෙන්න අවශ්‍යයි කියලා. ඒ අය වෙනුවෙන් reward system එකක් ගෙනෙන්න ඕනෑ. මේ රටේ කවදාවත් penalty system එකක් ගෙනෙන්න බැහැ. නමුත් අඩු ගණනේ ඉලක්ක සපුරන, රාජ්‍ය පරිපාලන සේවය හරහා ජයග්‍රහණ ලබා ගන්න කැපවීමෙන් කටයුතු කරන රාජ්‍ය සේවකයන් අගය කරන්න අවශ්‍යයි.

මේ මහඟු අදහස් අපගේ අමාත්‍යාංශය හරහා ඉෂ්ට කරන්න පුළුවන් බවට මා තුළ දැඩි විශ්වාසයක් තිබෙනවා. මහින්ද චින්තනයේ තිබෙන ඒ ආර්ථික ඉලක්කවලට යෑමට විශාල සහයෝගයක් රාජ්‍ය සේවයෙන්, රාජ්‍ය සේවකයන්ගෙන් අපි බලාපොරොත්තු වෙනවා. අපි රාජ්‍ය සේවකයන්ට විශේෂයෙන්ම කාරණයක් මතක් කර දෙනවා. ඔබතුමන්ලාට වේතන ලැබෙන්නේ මේ රටේ ජනතාවගේ මුදල්වලින්. අපගේ මාතෘ භූමිය දකුණු ආසියාවේ ඉතාම ප්‍රබල තැනකට ගෙන එන්න රාජ්‍ය සේවකයන්ට-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, දැනට ලංකාවේ රාජ්‍ය සේවකයන් කොපමණ ප්‍රමාණයක් ඉන්නවාද?

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ලක්ෂ 13ක් ඉන්නවා, හමුදාවේ අයත් එක්ක.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමාට තව වැඩි වෙලාවක් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත් ප්‍රශ්නයක් අහන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ඔය ප්‍රශ්නයට පිළිතුර දීලා කථාව අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, ලබන වසරේ පුහුණුව සඳහා රුපියල් මිලියන 40ක් වෙන් කළා කියලා ඔබතුමා කිව්වා. එහෙම නේද?

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
නැහැ, නැහැ. දැනට ඉන්න ලක්ෂ 13ට නොවෙයි. අලුතින් බැඳෙන රාජ්‍ය සේවකයන්ට අපි "ප්‍රී ට්‍රේනිං" එකක් ලබා දෙනවා ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමා වෙත තබා ඇති විශ්වාසය තහවුරු කරලා ජනතාවට අවශ්‍ය සේවය නොපිරිහෙළා ඉෂ්ට කරන්න කියා මා රාජ්‍ය සේවකයන්ගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මිනිත්තු හයක් තිබෙනවා.

[අ. භා. 4.48]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ස්තුතිවන්ත වෙනවා මට මේ වෙලාව ලබා දීම ගැන. පළමුවෙන්ම මා අපේ ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමා සිහිපත් කරන්න කැමැතියි. රාජ්‍ය සේවයේ ඉතාම දුෂ්කර කාල පරිච්ඡේදය වූ තිස් අවුරුදු ත්‍රස්තවාදී උවදුර තිබුණු කාල පරිච්ඡේදය තුළ විශාල සේවාවක් ඉටු කළ හැම

තරාතිරමකම රාජ්‍ය සේවකයන් සියලු දෙනාට අපේ ස්තුතිය පුද කර සිටිනවා. මේ රටේ රාජ්‍ය සේවාව එසේ ආරක්ෂා කර ගනිමින් ඉටු කළා වූ සේවය, අපේ රටේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමය තවත් ශක්තිමත් කරන්න අතිගරු ජනාධිපතිතුමාට අද විශාල ශක්තියක් වී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාව නියෝජනය කරන පළාත් පාලන ආයතන මේ රටේ ජනතාවට කිට්ටුම, වැදගත්ම ආයතනයයි. ජනතාවගේ එදිනෙදා සංවර්ධනයේ විශාල වැඩ කොටසක් ඉටු කළ හැකි වාගේම, ඉටු කළ යුතු ඉලක්ක සපුරා ලන්නට පළාත් පාලන ආයතනවලට හැකියාව තිබෙනවා. විශාල වැඩ කොටසක් එම ආයතන මඟින් ඉටු කරන්න පුළුවන්කම තිබෙනවා. එම ආයතනවලට අවශ්‍ය නිර්මාණශීලී අදහස් මාලාව ලබා ගැනීමට සහ ඒ වෙනුවෙන් සුදුසු ජනතා නියෝජිතයන් පත් කර ගැනීමට නම්, දූෂිත, පිළිකාවක් බවට පත් වූ මේ ඡන්ද ක්‍රමය වෙනස් විය යුතුමයි.

අපි ඉතා පැහැදිලිව කියනවා, මේ රටේ දූෂිත හා පිළිකාවක් බවට පත් වුණු, ඒ නිසාම නාස්තිකාර දෙයක් බවට පත් වී තිබෙන මේ ඡන්ද ක්‍රමය -මනාප ක්‍රමය හා අනුපාත ක්‍රමය- වෙනසකට භාජන කිරීමේ කාර්යයට අපි කැප වී සිටින බව. එය ඉෂ්ට කරන්න මුළු පාර්ලිමේන්තුවේම සහයෝගය ලබා දිය යුතු අවස්ථාවක් තමයි මේ. තනතුරක් ලැබුණාය කියලා, ඒ තනතුරේ කාලය ඉවර වන තෙක් මැතිවරණ පවත්වන්නේ නැතුව ඉන්න ඕනෑ කියන නියෝජිතයන් ඉන්න පුළුවන්. නමුත් ඊට වඩා අද සමස්ත ජනතාවගේම ඉල්ලීමක් තිබෙනවා මේ ඡන්ද ක්‍රමය වෙනස් කළ යුතු බවට. ඒ ගැන එකඟතාවක් තිබෙනවා; පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙනවා. එම පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාව පමණයි සම්මත කරන්න තිබෙන්නේ. එය සම්මත කර ගැනීම ගරු අමාත්‍යතුමාගේ අභිලාෂයයි.

මේ අවස්ථාවේදී මා විශ්වාස කරනවා, අතිගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කර තිබෙන පරිදි, 2012 ජනවාරි මාසයේ මේ පාර්ලිමේන්තුව රැස් වුණාම, එම වර්ෂයේ ගෙනෙන පළමුවැනි පනත් කෙටුම්පත හැටියට මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කරලා ලංකාවේ ඡන්ද ක්‍රමයේ වෙනසක් ඇති කරන්න හැකියාව ලැබෙයි කියලා. කේවල ඡන්ද ක්‍රමයෙන් පත්වන නියෝජිතයන්ගෙන් සහ අනුපාත ඡන්ද ක්‍රමයෙන් පත්වන නියෝජිතයන්ගෙන් සුළු පිරිසකගෙන් සමන්විත පළාත් පාලන ආයතන ඒ යටතේ බිහි වෙනවා. මේ සැකසුණු නීති මාලාව මඟින් මේ මැතිවරණ ක්‍රමය ක්‍රියාත්මක කොට, රට මහා වෙනසකට භාජන කරන්නට සහ ජනතා නියෝජිතයන් මීට වඩා ජනතාව සමඟ කිට්ටුවෙන් තබන්න පුළුවන්. ඒ වාගේම තමන්ට පුළුවන් ප්‍රදේශයක සංවර්ධන කටයුතු කිරීම හා ජනතා සේවය ලබා දෙන, ජනතා බලාපොරොත්තු ඉෂ්ට කරන නියෝජිතයන් පත් කරන ක්‍රමයක් ඇති කරන්නට අපේ සහයෝගය ලබා දෙමු.

පළාත් පාලන කටයුතු සඳහා සුවිශේෂ මුදල් සම්භාරයක් ජාතික අය වැය ලේඛනයෙන් ලැබෙන කාල පරිච්ඡේදයක්ද අපි ඇති කළ යුතුයි. පළාත් සභාවේ තබා ගෙන ඇති සල්ලිවලින් කොටසක් අනිවාර්යයෙන් පළාත් පාලන ආයතනවලට යන විධියට අපේ රටේ පළාත් සභාවලට මුදල් වෙන් කිරීමට පුළුවන් ක්‍රමවේදයක් සකසා දිය යුතුයි. එය තමයි මේ රටේ ජනතා සහභාගිත්වයට, -ප්‍රජා සහභාගිත්වයට- ප්‍රජාතන්ත්‍රවාදයට දෙන ලොකුම ශක්තිය. යහ පාලනයට දෙන ලොකුම ශක්තිය, ජනතාව සහභාගි කර ගත් පාලනයක් ඇති සංවර්ධන ක්‍රියාදාමයට අනාගතය ගමන් කරවීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා සර්ව පාක්ෂික එකඟතාවෙන් සකස් කරලා තිබෙන මැතිවරණ පනත් කෙටුම්පතට අනුව මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරලා, ඒ තුළින් පළමු වරට පළාත් පාලන මැතිවරණ පවත්වලා, ඉන් අනතුරුව අනෙකුත් මැතිවරණ සඳහාද ඒ ක්‍රමය අනුගමනය කරන ක්‍රියාදාමය වෙත අපි ගමන් කරමු කියන කාරණය සඳහන් කරමින්, ගරු ඇමතිතුමන්ලාට ඒ සඳහා කටයුතු කරන්න ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනය කරමින් මා නවතිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[අ. භා. 4.53]

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ යෝජනාවට අපේ කැමැත්ත අපි මීට කලිනුත් දීලා තිබෙනවා. ඒ වාගේම ඔබතුමන්ලා ඊ ළඟ ජනවාරියේ ඒ පනත් කෙටුම්පත ගේනවා නම් ඒකට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා කියන එකත් මේ අවස්ථාවේ සඳහන් කරනවා. මොකද, ඒක පක්ෂ භේදයකින් තොරව සිදු වෙන්න ඕනෑ කාරණයක්. අපි කාලයක් තිස්සේ මේ සම්බන්ධයෙන් දිගින් දිගටම කථා කරලා තිබෙනවා; අදහස් අරගෙන තිබෙනවා; යෝජනා අරගෙන තිබෙනවා. අපි එතැනින් පටන් ගත්තොත් මනාපයට මරා ගන්න එක ඉදිරියේදී අඩු කර ගන්න අපට පුළුවන් වෙයි. විශේෂයෙන්ම මම ඒ ගැන මුලින්ම සඳහන් කරන්න ඕනෑ.

ඊත් එක්කම අත් දැකීම් බහුල ඇමතිවරයකු හැටියට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා රාජ්‍ය පරිපාලනයේ නව වෙනසක් ඇති කරන්න යම් උත්සාහයක් ගන්නවා නම් ඒකට තිබෙන බාධා වෙනස් කරන්න සමහර අයගේ කැපවීම් අවශ්‍ය වෙනවා.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මේ රටට විශාල වැඩ කොටසක් කරපු අය තමයි රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයෝ. රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයෝ විශාල පිරිසක් මේ රට වෙනුවෙන් අවුරුදු 25ක්, 30ක් කැප වෙලා සේවය කරලා තම සේවය අවසන් කරලා ඉන්න අවස්ථාවේ ඒ අයටත් දැවෙන ප්‍රශ්නයක් තිබෙන බව මම තමුන්නාන්සේට කියන්න කැමැතියි. ඒ තමයි විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතාව. ඒ විෂමතාව ඉවත් කරන්න හැම ආණ්ඩුවකින්ම උත්සාහ කළා. අද මේ පාර්ලිමේන්තුවේ නොහිටියත්, එක්සත් ජාතික පක්ෂයේ හිටපු අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමාව මම මතක් කරන්න ඕනෑ.

විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතාව ඉවත් කරන්න තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ දැන් ඉන්න නිලධාරීන් කිහිප දෙනෙකුගෙන්ම සමන්විත කමිටු පිහිටෙව්වා. මට මතකයි, චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනිය ඉන්න කාලයේ බී.සී. පෙරේරා වැටුප් කොමිසම ගෙනාවා; තිස්ස දේවේන්ද්‍ර වැටුප් කොමිසම ගෙනාවා. ඊට පස්සේ වජිර අබේවර්ධන මැතිතුමාගේ කාලයේ ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඉන්න අතිරේක ලේකම් ඒකනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් වෙනම කොමිටියක් ගෙනාවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ ඒ කොමිටියට වැටුප් විෂමතාව ඉවත් කරන්න බිලියන දෙකක මුදල් ප්‍රමාණයක් වෙන් කෙරුවා. මම හිතනවා, ඒකෙනුත් තවම ඒ ප්‍රශ්නය විසඳිලා නැහැයි කියලා. තිලකරත්න මැතිතුමා චක්‍රලේඛයක් යවලා තිබෙනවා, 2004.01.01දී ගත්තු තීන්දුව අනුව කටයුතු කරන්නය කියලා. ඒත් ගරු ඇමතිතුමනි, ඒ අයගෙන් 2006ට කලින් විශ්‍රාම ගිය අයගේ වැටුප් විෂමතාව තවමත් ඉවත් වෙලා නැහැ. ඒක ලොකු ප්‍රශ්නයක්. මේ අය නිකම් පින් පඩියක් ඉල්ලනවා

[ගරු පී. හැරිසන් මහතා]

නොවෙයි. මා ඔබතුමාට මතක් කරන්න කැමැතියි, විශේෂයෙන්ම මේ වැටුප් විෂමතාව නිසා 2005, 2006 අතර කාලයේ විශ්‍රාම ගිය විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතාව කොච්චර වෙනසක් තිබෙනවාද කියලා. ගරු ඇමතිතුමනි, ඒ අය මේ රටේ අවුරුදු 25ක්, 30ක් සේවාවන් කරලා ඒ අයට ලොකු අසාධාරණයක් වෙලා තිබෙනවාය කියලා ඒ අය පෙන්වලා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මතක් කරන්න කැමැතියි, මෙන්න මෙය. අපේ තිලකරත්න විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂතුමාගේ වාර්තා අනුව ග්‍රාම සේවා නිලධාරි I පන්තියේ කෙනෙකුට 1997.01.01 දිනට වැටුප තිබෙන්නේ රුපියල් 11,160යි. ගරු ඇමතිතුමනි, 2006.01.01 වෙන කොට ඒ අයගේ වැටුප තිබෙන්නේ රුපියල් 18,887යි. ඒ අයට රුපියල් 7,726ක වැටුප් විෂමතාවක් තිබෙනවා. 2007 වර්ෂයේ එක්කෙනාට මේ ප්‍රශ්නය නැහැ. හැබැයි එක අවුරුද්දේ පරතරයට රුපියල් 7,000ක පමණ වැටුප් විෂමතාවක් තිබෙනවා. ඒ ග්‍රාම නිලධාරින්ට ලොකු අසාධාරණයක් වෙලා තිබෙනවා. මම තව කිහිප දෙනෙකු ගැන කියන්නම්. ඒ වාගේම තමයි 2006.01.01 දිනට පෙර ලිපිකරු I පන්තියේ අයට හම්බ වෙන්නේ රුපියල් 11,660යි. 2006.01.01 දිනට ඒ අයට රුපියල් 26,400 ගණනක වැටුපක් ලැබෙනවා. ඉතින් මේ වාගේ ලොකු වැටුප් විෂමතාවක් තිබෙනවා.

ඔබතුමා දන්නවා, මේ අය වාගේම අපි කවුරුත් වයසට යන අය බව. ගරු ඇමතිතුමනි, මේ අයට වැඩි පුර මුදලක් යන්නේ ඒ අයගේ සෞඛ්‍ය පහසුකම් වෙනුවෙනුයි. වයෝවෘද්ධ අයට, දරුවන් වෙන් වෙලා ගිහිල්ලා තනි වෙලා ඉන්න දෙමව්පියන්ට තමන්ගේ පළමුවැනි ජීවනෝපාය මේ විශ්‍රාම වැටුප විතරයි. තිබෙන ඉඩකඩම්, වෙනත් දේවල් ඔක්කෝම දරුවන්ට බෙදා හදා දීලා මේ විශ්‍රාම වැටුපෙන් ජීවත් වෙන අය අද විශාල පිරිසක් ඉන්නවා. මම දන්නවා, ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක් බව. ඒ වාගේම පළපුරුද්ද හා අත් දැකීම් තිබෙන කෙනෙකු හැටියට මේ ගැන වැඩි අවධානයක් යොමු කරන්න. මොකද එහෙම වුණොත් අපට පුළුවන් වෙනවා, මේ විශ්‍රාමිකයන්ට සහනයක් සලස්වන්න. ඒ අය බොහොම සුළු පිරිසයි ඉන්නේ. මුළු රටේම ලක්ෂ හතරහමාරක් විතර විශ්‍රාමිකයන් හිටියත් ඒ අයගෙන් 2006ට කලින් විශ්‍රාම වැටුප් හිමි වෙන වැඩි පුර කොටසක් මිය ගිහිල්ලා. ඒ නිසා තව ඉන්නේ බොහොම සුළු ප්‍රමාණයක් විතරයි. ඒ අය වෙනුවෙන් විශේෂ අවධානයක් යොමු කළොත් හොඳයි කියන එකයි මගේ පෞද්ගලික ඉල්ලීම.

ඒ විතරක් නොවෙයි. මම ඒ සියලු දෙනා වෙනුවෙන්ම මේ ඉල්ලීමත් කරන්න කැමැතියි. මේ අයත් කාලයක් තිස්සේ මේ ඉල්ලීම කරනවා. ඔබතුමාට මතක ඇති පසු ගිය ජනාධිපති මැතිවරණයේදී ජනාධිපතිතුමා අරලිය ගහ මන්දිරයට මේ අය ගෙන්වලා කිව්වා, "අපි මේ වැටුප් විෂමතාව ඉවත් කරන්නම්" කියලා. ඒ අය බලා ගෙන හිටියා, පසු ගිය අය වැයවලදී ඒ අයගේ වැටුප් විෂමතාව වෙනුවෙන් සහනයක් ලැබේවි කියලා. ඒක ලැබුණේ නැහැ. තමුන්නාන්සේට මතක ඇති, 2010 අය වැයේදිත් රුපියල් 750ක දීමනාවකුයි දුන්නේ. ඒ අය බලාපොරොත්තු වුණා, මේකේ සුළු හෝ වෙනසක් වෙයි කියලා. නමුත් ඒක වුණේ නැහැ.

මෙවර අය වැයේදිත් අතිගරු ජනාධිපතිතුමා මේ සභාවට ආවාම විශ්‍රාම වැටුප් ලබන අය ගැන සඳහන් කරලා තිබෙනවා. ඒකෙදිත් ඒ අයගේ වැටුප් විෂමතා වෙනුවට දීමනාවක් හම්බ වෙලා තිබෙනවා. ඒ රුපියල් 1,000 දීමනාව දෙපාරකටයි ඒ අයට ලැබෙන්නේ. අලුත් අයට රුපියල් 500ක දීමනාවක් ලැබෙනවා. මම හිතන්නේ, මේ දීමනාවෙන් සෑහීමකට පත් වෙන්න බැහැයි කියයි. ගරු ඇමතිතුමනි, මම මුලින් මතක් කළා වාගේ මේ අය රට වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරපු අයයි.

ඒ අය අද පසුතැවෙනවා. ඒ අය හුල්ලනවා. මීට කලින් කතා කරපු ගරු නවීන් දිසානායක ඇමතිතුමා කිව්වා, රජයේ සේවකයන්ගේ වැටුප් විෂමතාවන් ඉවත් කරන්න කටයුතු කරගෙන යනවාය කියා. ඒක බොහොම හොඳ දෙයක්. මොකද, රජයේ සේවකයා සම්පූර්ණයෙන්ම තෘප්තිමත් වෙන්නේ මේ වැටුපෙනුයි. මේ වැටුපෙන් තමයි ඒ අය ජීවත් වෙන්නේ. අමාත්‍යාංශයක ලේකම්වරයතුගේ ඉඳලා පහළම නිලධාරියා වන තෙක් ඒ අයට හොඳ වැටුපක් ලැබෙනවා නම් සමහර විට මේ දූෂණකාරී තත්ත්වයෙන් හුඟාක් දුරට ගොඩ වෙන්න පුළුවන්. අකාර්යක්ෂම රාජ්‍ය සේවය ගැන හුඟක් අය කතා කරනවා. පෞද්ගලික අංශය ගැන කතා කරනවා. හැබැයි, රාජ්‍ය සේවයේ නිලධාරියා තෘප්තිමත් නැත්නම් ඒ අයට ලැබෙන වැටුපෙන් සෑහීමකට පත් වෙන්නේ නැත්නම් ඒ අය වෙන වෙන ක්‍රමවල යෙදෙනවා. ඒක වළක්වන්න තිබුණා. රාජ්‍ය සේවයට දොස් කියනවා. එතැන හොර ගුහාවක්ය කියනවා; පගා ගන්නවාය කියනවා; කොමිෂන් ගහනවාය කියනවා. ඒ විධියේ රටේ නැති චෝදනා එල්ල වෙනවා. හැබැයි ඒ අයගේ ජීවිතවලට පොඩ්ඩක් එබිලා බැලුවොත් උදේ පාන්දර ඇවිල්ලා හවස හතර, පහ වනතෙක් ඒ අය කරන සේවය වෙනුවෙන් යම්කිසි දීමනාවක්, වැටුප් වර්ධකයක් දෙනවා නම් ඒක ඒ අයට ලැබිය යුතු වරප්‍රසාදයක්. කම්කරුවන් වෙනුවෙන් සටන් කරපු කෙනෙක් හැටියට මේ ගැන මට වඩා හොඳින් ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා දන්නවා. අලුතින් බඳවා ගන්නා අය වෙනුවෙන් එවැනි වැඩ පිළිවෙළක් කරනවා නම් ජීවිතයේ අවසාන භාගයේ පසු වන අවුරුදු 60, 70 පැනපු ඒ අය වෙනුවෙන් මේ යුතුකම ඉෂ්ට කරන්නය කියා මේ අවස්ථාවේදී මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, ඒ එක්කම මම තවත් කරුණක් මතක් කරනවා. එක්සත් ජාතික පක්ෂය හැටියට අපට ලොකු චෝදනාවක් තිබෙනවා, අපේ රජය කාලයේදී එක පියන් කෙනෙක්වත්, එක කම්කරුවෙක් තරම්වත් රාජ්‍ය සේවයට බඳවා ගත්තේ නැහැ කියා. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, එක්සත් ජාතික පක්ෂ රජය කාලයේදී යුඑන්පීකාරයින් රක්ෂාවලට බඳවා ගත්තේ නැහැ කියන එක. පක්ෂයක් හැටියට අදත් අපට ඒ චෝදනාව තිබෙනවා. හැබැයි, අපි අත්‍යවශ්‍ය සේවාවන් සඳහා බඳවා ගැනීම් කරලා තිබෙනවා. ලිපිකරු සේවයට දෙසිය ගණනක් බඳවා ගෙන තිබෙනවා. යතුරු ලේඛක සේවයට බඳවා ගෙන තිබෙනවා. ඉංජිනේරු සේවාවන්ට බඳවාගෙන තිබෙනවා. ඒ කාලයේ අපේ පැත්තේ හිටපු පී. දයාරත්න මහතා නියෝජනය කළ අමාත්‍යාංශයට හෙදියන් දෙදාහක් බඳවා ගෙන තිබෙනවා. නමුත් සමහරුන් කියන්නේ, එක්සත් ජාතික පක්ෂ රජය කාලයේදී කිසිම සේවාවකට බඳවා ගත්තේ නැහැ කියායි. දේශපාලන සම්බන්ධකම් අනුව කිසිම කෙනෙක් බඳවා ගත්තේ නැහැ. අපි නොවෙයි එහෙම බඳවා නොගත්තේ. මම හිතන හැටියට එහෙම බඳවා නොගන්න චක්‍රලේඛ නිකුත් කළේ ඇයි කියන එක ගරු ඇමතිතුමනි ඔබතුමා දන්නවා. එදා ගුවන් තොටුපළට බෝම්බ ගහලා, වරායට බෝම්බ ගහලා, එල්ටීටීඊ ත්‍රස්තවාදය තිබුණු ඒ කාලයේදී හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාලයේ, මුදල් අමාත්‍යාංශයේ වර්තමාන ලේකම්තුමා එදා එතුමියගේ ලේකම්තුමා හැටියට චක්‍රලේඛයක් නිකුත් කර තිබුණා, සියලු බඳවා ගැනීම් අත් හිටුවන්නය කියා. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ රජයේ එවකට හිටපු මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාත් ඒ චක්‍රලේඛය ඒ විධියටම අනුගමනය කළා. ඒ නිසා ඒකෙන් වැඩිම අවාසියක් වුණේ එක්සත් ජාතික පක්ෂය හැටියට අපේ පාක්ෂිකයන්ටයි; ඒ වාගේම මේ පැත්ත නියෝජනය කරන අපේ මන්ත්‍රීවරුන්ටයි. මේ ගැන මා විශේෂයෙන් මතක් කළේ හැමදාම අපට එල්ල වන මේ චෝදනාවෙන් අපි නිදහස් වෙන්න ඕනෑ නිසයි.

ගරු ඇමතිතුමනි, ඒ එක්කම තමුන්නාන්සේ දන්නවා ඇති, හිටපු රාජ්‍ය පරිපාලන ඇමතිවරයා හැටියට එදා වජිර අබේවර්ධන

මැතිතුමා මේ රටේ රාජ්‍ය සේවකයන් සඳහා වන නිවාස යෝජනා ක්‍රමයක් පටන් ගත් බව. දැන් ඒක ගාල්ලේ ඉදි කර තිබෙනවා. එතැන නිවාස ප්‍රමාණය 1,000කට වැඩියි. ගරු ඇමතිතුමනි ඔබතුමා ඒ ගැන දන්නවා ඇති. ලක්ෂ අටක්, නවයක්, දහයක් වාගේ ගණන්වලට ඒවා දෙන්න තමයි තීරණය කරලා තිබුණේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
තව මිනිත්තු දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම හිතන හැටියට අද මේ නිවාසවල වටිනාකම ඉහළ ගොස් තිබෙනවා. වර්ග අඩි 300, 400, 500, 700 වාගේ ප්‍රමාණයේ එක නිවාසයක් සඳහා විශාල ප්‍රමාණයේ තක්සේරුවක් කර තිබෙනවා. ඒ නිවාස ලක්ෂ 25, 30 සහ ලක්ෂ හතළිස් ගණන්වලට පවා තක්සේරු කර තිබෙනවා. හැබැයි ගරු ඇමතිතුමනි, මා හිතන්නේ නැහැ, රාජ්‍ය සේවකයෙකුට කවදාකවත් මේ නිවසක් මිල දී ගන්න පුළුවන් වෙයි කියා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne )
මම හිතන්නේ නැහැ, ලක්ෂ හත, අට වාගේ ගණන්වලට මේ නිවාස තිබේවිය කියා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ලක්ෂ නවය හමාරට, දහය හමාරට, එකොළහ හමාරට තමයි තිබෙන්නේ.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඊට වැඩි මිලකට තමයි ත්සේරු කර තිබෙන්නේ. ඔබතුමා කියන ඔය කරුණු ගැන මම බලන්නම්.

ඇත්ත වශයෙන්ම මේ ප්‍රමාණයට දෙන්න කියලා ඒ වෙලාවේ එහෙම තීන්දුවක් තිබුණා නම්, ඊට වඩා විශාල ප්‍රමාණයකින් වැඩි කරන්න කිසිම හේතුවක් නැහැ. ඒ අයට වියදම් වුණු මුදල වශයෙන් අපට මේ ගණන් දීලා තිබෙන්නේ ඒ අය තමයි. දැනට අපි එක ගෙයක්වත් විකුණුවේ නැහැ. දැන් අපි භාණ්ඩාගාරයත් එක්ක සාකච්ඡා කර ගෙන යනවා, ඒ මිලයට ගන්නා අයට යම් කිසි සහනයක් -පොලිය මත ණයක්- ලබා දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මට තත්පරයක කාලයක් ලබා දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තත්පරයක් දෙන්න බැහැ. මොකද, පිළිතුරු කථාව කරන්න ඇමතිවරු දෙදෙනෙක් ඉන්නවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු ඇමතිතුමනි, දැනටම ගෙවල් 18කට ඉල්ලුම් කරලා තිබෙනවා. ගෙවල් 18කට ඒ අයගෙන් advance අරගෙන තිබෙනවා. මා කියන්නේ මේ මුදල වැඩියි කියලායි. ඔබතුමා මැදිහත් වෙලා සහන මිලක් දෙන්න. රජයේ සේවකයන්ට රුපියල් ලක්ෂ 30ක, 40ක ගෙයක් ගන්න බැහැයි කියන එක ඔබතුමාත් දන්නවා, මමත් දන්නවා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
නිවාස ඉදි කරපු සමාගමත් එක්ක සාකච්ඡාවක් අහහරුවාදා තිබෙනවා. මේ කරුණ අපි සාකච්ඡා කරන්නම්.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මොකද, මේ සමාගම BOI පහසුකම් ලබා ගත්ත සමාගමක්. ඒ ගොල්ලෝ මුලදී පොරොන්දු වෙලා තිබෙනවා, ඒ ගණන්වලට දෙනවාය කියලා. එම නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ පෞද්ගලික අවධානය යොමු කරන්න කියලා මා බොහොම ගෞරවයෙන් ඉල්ලමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

[பி. ப. 5.06]

**ගරු සිල්වෙස්ත්‍රි අලාන්ටින් මහතා**
(மாண்புமிகு சில்வேஸ்திரி அலன்றின்)
(The Hon. Silvastrie Alantin)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இந்த மன்றிலே பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சின்மூலம் வட பகுதியிலே செயற்படுத்தப்படவேண்டிய சில விடயங்கள் குறித்துப் பேச விரும்புகின்றேன். நாட்டின் அபிவிருத்தியில் திட்டமிடலும் நிருவாக முகாமைத்துவமும் முதன்மையானவை. அந்த வகையில் நிருவாக முகாமைத்துவத்தை மையப்படுத்தும் பொது நிருவாகக் கட்டமைப்பையும் மாகாண சபைகளின் நிருவாகக் கட்டமைப்பையும் மேம்படுத்துவது அவசியமாகும். நாடு முழுவதும் இன்று ஒரே குடையின்கீழ் முகாமைத்துவம் செய்யப்படுகின்றது. ஆனால் வடக்கு, கிழக்கிலே நிருவாக முகாமைத்துவத்தில் இடர்பாடுகளும் குறைபாடுகளும் தொடர்ந்துகொண்டே இருக்கின்றன. இந்த நிலைமையினை

[ගරු සිල්වෙස්ත්‍රි අලන්ටින් මහතා]

நாம் விரைவாக மாற்றியமைக்க வேண்டும். அங்கே மீள் குடியேற்றப் பணிகளும் புனரமைப்புப் பணிகளும் மேலதிக பணிகளாக நடைபெற்றுக்கொண்டிருக்கின்றன. அழிவடைந்த பிரதேசங்களை மீளமைக்க வேண்டியுள்ளது. அதேபோல, தகர்ந்துபோயிருக்கும் சமூகக் கட்டமைப்புக்களை மீளமைப்ப துடன், ஒவ்வொரு தனிமனிதனையும் முன்னேற்ற வேண்டி யிருக்கிறது. இந்த நிலையில் வடக்கு, கிழக்கிலுள்ள அரச ஊழியர்கள் அத்தனை பேரும் தங்களை முழுமையாக அர்ப்பணித்துக் கடமையாற்றி வருகின்றனர். அவர்களுக்கு எனது நன்றியையும் பாராட்டுக்களையும் இந்தச் சந்தர்ப் பத்திலே தெரிவித்துக்கொள்கின்றேன்.

கடந்தகால யுத்த சூழ்நிலை காரணமாக பிரதேச செயலக உத்தியோகத்தர்கள், ஓய்வூதியத் திணைக்கள உத்தியோகத் தர்கள் போன்றோர் வெளி மாட்டங்களுக்குச் சென்று நிலைமை களைப் பார்வையிட முடியாத சூழல் இருந்தது. இனிவரும் காலங்களில் அனைத்து அரச உத்தியோகத்தர்களும் தங்களுக் குத் தேவையான பயிற்சிகளைப் பெற்றுக்கொள்வதற்கும் அரச அலுவலகங்களை விஸ்தரிப்பதற்குமான ஏற்பாடுகளைச் செயற் படுத்த வேண்டும். இதேவேளை, நீண்டகாலமாக வடபகுதியின் நிருவாகச் செயற்பாடுகள் ஒழுங்கமைக்கப்படாத நிலையில் இருந்த காரணத்தினால் தற்போது அவற்றைச் சீர்படுத்த வேண்டிய தேவை ஏற்பட்டுள்ளது. முக்கியமாக அடிமட்ட நிலையிலுள்ள மக்களின் நலன்களைப் பேணவும் அவர்களு டைய பிரச்சினைகளைக் கையாளும் வகையிலும் கிராம அலுவலர் வெற்றிடங்களை நிரப்பவேண்டியுள்ளது. அந்த வகையில் யாழ்ப்பாணம், கிளிநொச்சி, முல்லைத்தீவு போன்ற மாவட்டங்களில் கிராம அலுவலர் வெற்றிடங்கள் நிரப்பப்பட வேண்டிய நிலையிலுள்ளன. யாழ்ப்பாணத்தில் 111 கிராம அலுவலர் வெற்றிடங்களும் கிளிநொச்சியில் 35 கிராம அலுவலர் வெற்றிடங்களும் உடனடியாக நிரப்பப்பட வேண்டும். இதேபோன்று ஏனைய திணைக்களங்களிலுள்ள பணியாளர் வெற்றிடங்களும் நிரப்பப்பட வேண்டும். குறிப்பாக மகளிர் விவகார உத்தியோகத்தர்கள், முதியோர் உரிமைகள் மேம்பாட்டு உதவியாளர்கள், தொழில்நுட்ப உத்தியோகத் தர்கள், தேசிய மொழிகள் ஒருங்கமைப்பு அபிவிருத்தி உதவியாளர்கள் போன்ற ஆளணி வெற்றிடங்கள் காலியாகவே உள்ளன. கடந்த யுத்த காலங்களில் தகுதிநிலை கவனிக்கப் படாது சிற்றூழியர்கள் நியமிக்கப்பட்டனர். அவர்களுக்கு இதுவரை காலமும் நிரந்தர நியமனம் வழங்கப்படவில்லை. எனவே, இவர்களுடைய சேவைக்காலத்தைக் கருத்திற் கொண்டு விசேட தீர்மானத்தின்மூலம் அவர்களுக்குரிய நியமனம் வழங்கப்பட வேண்டும். அத்துடன், இந்த மாவட்டங்களிலுள்ள அலுவலர்களுக்குத் தமது திறனை வலுப்படுத்த முடியாத நிலை ஏற்பட்டது. எனவே, அவர்களுக்கு விசேட திறன் வலுப்படுத்தல் நிகழ்ச்சித்திட்டங்கள் தேவையாக உள்ளன. மேலும், கிளிநொச்சி, முல்லைத்தீவு போன்ற மாவட்டங்களில் சமுர்த்தித் திட்டம் செயற்படுத்தப்படல் வேண்டும். அதற்கான உத்தியோகத்தர்களும் நியமிக்கப்பட வேண்டும்.

யாழ். மாவட்டத்தில் தென்மராட்சிப் பிரதேச செயலாளர் பிரிவையும், கிளிநொச்சி மாவட்டத்தில் கரைச்சி பிரதேச செயலாளர் பிரிவையும் இரண்டு பிரதேச செயலாளர் பிரிவுகளாக உருவாக்க வேண்டும். அத்துடன், கிளிநொச்சி மாவட்டத்திலுள்ள 4 உதவி அரசாங்க அதிபர் பிரிவுகளும் பிரதேச செயலகங்களாகத் தரம் உயர்த்தப்பட வேண்டும். இதேபோன்று யாழ். மாவட்டத்திலுள்ள மருதங்கேணி உதவி அரசாங்க அதிபர் பிரிவு மற்றும் தீவகப் பகுதியிலுள்ள ஊர்காவற்றுறை, காரைநகர், நெடுந்தீவு போன்ற உதவி அரசாங்க அதிபர் பிரிவுகளும் பிரதேச செயலகங்களாகத் தரம் உயர்த்தப்பட வேண்டும். இவை தவிர, ஒழுங்கமைக்கப்பட்ட ஒரு மையத்தில் வடக்கு மாகாண சபை இயங்குவதற்கான ஏற்பாடுகள் செய்யப்பட வேண்டும். அதற்கான கட்டிடத் தொகுதி மற்றும் ஏனைய வளங்கள் என்பவற்றை ஒருங் கிணைத்து 'மாகாண சபை மையம்' ஒன்று உருவாக்கப்பட வேண்டும். இந்த மையத்தை மாங்குளத்தில் நிர்மாணிப்பதே பொருத்தமானதென அரசு தீர்மானித்துள்ளது. ஆகவே, அங்கு மாகாண சபை மையத்தை அமைப்பதற்கான நடவடிக்கை யினை விரைவில் மேற்கொள்வதற்கு ஆவன செய்ய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

வடக்கு மாகாண சபையிலுள்ள ஆளணிப் பற்றாக்குறை யினை நீக்குவதற்கு விசேடமாக நடவடிக்கையெடுக்கப்பட வேண்டும். இலங்கை நிர்வாக சேவை, இலங்கை கணக்காளர் சேவை, இலங்கை கல்விச் சேவை, இலங்கை பொறியியல் சேவை போன்ற சேவைகளில் உள்ள வெற்றிடங்களும், இணைந்த சேவை உத்தியோகத்தர், குடியேற்ற உத்தி யோகத்தர், காணி உத்தியோகத்தர் போன்ற ஏனைய உத்தியோகத்தர்களுக்கான வெற்றிடங்களும் நிரப்பப்பட வேண்டியுள்ளன. மேலும், யுத்தத்தினால் பாதிக்கப்பட்ட வட மாகாண சபைக்கு ஒதுக்கப்பட்டுள்ள 1,000 மில்லியன் ரூபாயினை 3,000 மில்லியன் ரூபாயாக அதிகரிப்பதற்கு நடவடிக்கையெடுக்கப்பட வேண்டும்.

மேலும், இந்த மன்றிலே வடக்கிலே மேற்கொள்ளப்பட வேண்டிய புனர்வாழ்வு நடவடிக்கைகள் பற்றிய எனது கவனத்தைச் சுருக்கமாக முன்வைக்கின்றேன்.

முக்கியமாக, அரசியல் காரணங்களுக்காகக் கைது செய்யப்பட்டு விடுவிக்கப்படுவோருக்கான புனர்வாழ்வு நடவடிக்கைகள் முழுமையாக்கப்பட வேண்டியுள்ளன. கௌரவ புனர்வாழ்வு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர் அவர்கள் யாழ்ப்பாணம், கிளிநொச்சி மாவட்டங் களுக்கு விஜயம்செய்து இவர்களுக்கு விசேட கடன் திட்டத்தை அறிமுகம் செய்துள்ளார். ஆனால், அத்திட்டம் நடைமுறைப் படுத்தப்படவேண்டிய நிலையில் உள்ளது. மேலும், வாழ்வாதார உதவி தேவைப்படுவோருக்கு விசேட புனர் வாழ்வு நடவடிக்கைகள் அவசியமாக உள்ளன. இவற்றுக்கு விசேட திட்டமொன்று வகுக்கப்பட வேண்டுமென நான் இந்த மன்றில் கேட்டுக்கொள்கின்றேன். வடக்கிலே போரின் காரணமாக உடல் உறுப்புக்களை இழந்த நிலையில் ஏறக்குறைய 6,000 பேர் இருப்பதாக இதுவரை கிடைக்கப் பெற்ற புள்ளிவிபரங்கள் கூறுகின்றன. இதில் இருபாலாரையும் சேர்ந்த இளையோர், சிறுவர், முதியோர் எனப் பல்வேறு தரப்பினரும் உள்ளடங்குகின்றனர். பாதிக்கப்பட்ட ஒரு சமூகமாக இவர்கள் தனித்துவிடப்படக் கூடிய அபாய நிலை உள்ளது. எனவே, நாம் இந்த நிலையை மாற்றியமைக்க வேண்டும். எனவே, இவர்களுக்கான நிரந்தர உதவித் திட்டத்தை அரசாங்கம் மேற்கொள்ளவேண்டுமென்று நான் இச்சந்தர்ப்பத்தில் அந்த மக்களின் சார்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

இதேபோன்று, அரசியல் கைதிகளாக உள்ளோரின் விடுதலையை விரைவுபடுத்துமாறும் கைதிகளுக்கான பாது காப்பை உத்தரவாதப்படுத்துமாறும் வலியுறுத்துகின்றேன். அரசியல் கைதிகளைப் பார்வையிடுவதற்காக அலைந்து சிரமப்படும் குறிப்பிட்ட குடும்பத்தினரின் நிலைமை யானது மிகவும் கவலைக்குரியதாக உள்ளது. ஆகவே, கைதிகளின் விடுதலையை விரைவுபடுத்துவதற்கான நடவடிக்கைகளை மேற்கொள்வதோடு, குறிப்பிட்ட குடும்பங்களின் நிலைமை

யையும் கருத்திற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். விடுதலையாகியவர்கள் தொழில்வாய்ப்பைப் பெறவும் தொழில் துறையில் ஈடுபடவும் காத்திருக்கின்றார்கள். இவர்களுக்கான வசதிகளை ஏற்படுத்தி, சமூகத்துடன் இணைப் பது அவசியமாகும். ஆகவே, மேற்குறிப்பிட்ட விடயங்களைக் கவனத்திற்கொண்டு உரிய ஏற்பாடுகளைச் செய்யவேண்டு மெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

[අ. භා. 5.12]

**ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා මේ අවස්ථාවේදී රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම රාජ්‍ය සේවාව සම්බන්ධව මේ සභාවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීතුමන්ලා සහ අමාත්‍යතුමන්ලා කරුණු රාශියක් ගෙන හැර පෑවා. රාජ්‍ය සේවය ජනතාව පිණිසයි කියලායි අතිගරු ජනාධිපතිතුමා කියන්නේ. සේවාලාභියාගේ හිතසුව පිණිස රාජ්‍ය සේවය ක්‍රියාත්මක විය යුතුයි කියලා අපේ ජනාධිපතිතුමා මහින්ද චින්තනයෙන් කියන කොට, අමාත්‍යතුමාත් ඇතුළුව අපේ අමාත්‍යාංශයේ සියලු දෙනාම ඒ නව පරිපාලන ක්‍රමවේදය තුළ ඵලදායී රාජ්‍ය සේවාවක් නිර්මාණය කරන්න සූදානම් වෙලා ඉන්නවාය කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

උතුරු නැඟෙනහිර සම්බන්ධව මේ සභාවේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් අදහස් ප්‍රකාශ කළා. මේ අවස්ථාවේදී මා ඒ සම්බන්ධයෙන් යමක් කියන්න ඕනෑ. යුද්ධයෙන් විනාශ වුණු උතුරු නැඟෙනහිර පළාතේ කඩා වැටී තිබුණු පරිපාලන ක්‍රමවේදය නැවත පණ ගන්වා, පරිපාලන සහ යටිතල පහසුකම් සංවර්ධනය තුළින් ඒ සේවාලාභී සත්කාරය පුළුල් කර, එය කාර්යක්ෂම කිරීමට අද අපට හැකියාව ලැබී තිබෙනවා. මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාට කියන්න අවශ්‍ය නැහැ, ඒ ප්‍රදේශයේ සියලුම දේපොළ විනාශ වෙලා, ඒ ප්‍රදේශයේ අවතැන් වූ හා නැවත පදිංචි කරන ලද ජනතාවට තමන්ගේ අනන්‍යතාව පෙන්වන්න පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද හැඳුනුම් පතක්වත් තිබුණේ නැති බව. එවැනි අවස්ථාවක අපේ අමාත්‍යාංශය හරහා පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සම්බන්ධ කරලා, ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සේවා සම්පාදනය කරලා, ඒ ජනතාවට යම් ආකාරයක සහනයක් ලබා දෙන්න අපට පුළුවන්කමක් ලැබුණා. ඒ තිබුණු දුරස්ථභාවය නැති කරලා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හරහා යම් කිසි කටයුත්තක් කරන්න පුළුවන් වීම ගැන අපි සතුටු වනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා කියන්න ඕනෑ නැහැ, ඒ බල ප්‍රදේශය පුරා සියලුම ගොඩනැඟිලි විනාශ වෙලා, කාර්යාල කඩා වැටිලා තිබුණු බව. 2011 අවුරුද්දේ මේ දක්වා ඒ බල ප්‍රදේශයේ විතරක් දැවැන්ත ලෙස ඉදි කිරීම් කරලා තිබෙනවා. පසු ගිය දවස්වල ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ජනතා අයිතියට පවරන වෙලාවේ අපට එම අවස්ථාවට සහභාගි වෙන්න පුළුවන්කමක් ලැබුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොළඹවත් නැති මට්ටමින් ගොඩනැඟිල්ලක් ඉදි කරලා ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් පරිත්‍යාග කරන්න අපට පුළුවන්කමක් ලැබීම ගැන අපි ඉතාමත් සතුටට පත් වනවා. ඒත් එක්කම මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැඟිල්ලත්, ඒ ආපනශාලා පරිශ්‍රයත් ජනතා අයිතියට පවරන්න ගිය වෙලාවේ එහි විශාල වෙනසක් අපි දැක්කා. ඒ බල ප්‍රදේශයේ නිලධාරින්ගේ සේවය පහසු කිරීම සඳහා අමාත්‍යාංශය හැටියට අපි විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැඟිල්ල ගත්තොත් ඒකේ ප්‍රතිසංස්කරණ කටයුතු කරලා, ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල තිබුණු අඩු පාඩු ටික හරි ගස්සලා, එහි සේවය කරන සේවකයන්ට යහපත් මානසිකත්වයකින් වැඩ කරන්න පුළුවන් වටපිටාවක් අපි සකස් කර දුන්නා. ඒ එක්කම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැටියට ගත්තොත් මේ මන්ත්‍රීතුමන්ලාට අපි කියනවා, කරෙයිනගර්, වාකරෙයි, අම්පාර, සායින්දමරුතු සහ තිරුක්කෝවිල් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සියල්ලම අපි ඉදි කරලා අවසන් කර තිබෙන බව.

යාපනය දිස්ත්‍රික්කයේ සේවා පියසවල් ගැන කථා කළොත් පේදුරුතුඩුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය ඇතුළේ කට්කෝවලම්, මරුතන්කර්නි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කුඩාපන්නි කියන සේවා පියසවල් ඉදි කර තිබෙනවා. ත්‍රිකුණාමල බල ප්‍රදේශයේ සේවා පියසවල් කිහිපයක් හදලා අවසන් කරන්න අපට පුළුවන්කම ලැබුණා. මඩකලපු ප්‍රදේශය ගත්තත් වාලච්චේනයි සහ වාකරෙයි බල ප්‍රදේශවල සේවා පියසවල් ටික අපිට හදලා අවසන් කරන්න පුළුවන්කම ලැබුණා. ඒ එක්කම අම්පාර බල ප්‍රදේශයේත් ඒ කටයුතු අපි කරලා තිබෙනවා. අපි රුපියල් මිලියන 300කට වැඩි මුදලක් වැය කරලා පසු ගිය වර්ෂයේත්, මේ වර්ෂය තුළත් මේ ගොඩනැඟිලි ටික සකස් කරලා දුන්නා.

අද බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා උතුරු වසන්තය, නැඟෙනහිර උදානය වැඩසටහන් යටතේ ඒ ප්‍රදේශවල මාර්ග පද්ධතිය සකස් කරලා, පාලම්, බෝක්කු ටික හරි ගස්සලා ඒ සියලු කටයුතු සකස් කර දුන්නා. ඒ වාගේම අපිට යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මඩකලපුව, වවුනියාව, ත්‍රිකුණාමලය, මුලතිව් සහ අම්පාර දිස්ත්‍රික්කවලට ඩබල් කැබ් රථ, ජීප් රථ සහ වෑන් රථ 61කට වැඩි ප්‍රමාණයක් ලබා දෙන්න පුළුවන්කම ලැබුණා. ලබන අවුරුද්ද වන කොට අපි මුලතිව් සහ කිලිනොච්චි යන දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඉදි කිරීම් ආරම්භ කරන්න සියලුම කටයුතු සූදානම් කරලා තිබෙන වෙලාවක් මේක. ඒ විතරක් නොවෙයි. උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ ගොඩනැඟිලි පහසුකම්, සේවා පියසවල්, රාජ්‍ය සේවකයන්ට අඩු පාඩුව තිබුණු පරිගණක පහසුකම් සමඟ ඒවාට අවශ්‍ය ලී බඩුත් ලබා දෙන්නට අපට පුළුවන් වුණා. ඒ නිලධාරින්ගේ නිල නිවාස, නිවාඩු නිකේතන, පුහුණු මධ්‍යස්ථානත් මේ වන කොට කඩිනමින් හදා අවසන් කරන්න අපට පුළුවන්කමක් ලැබුණා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ ගොඩනැඟිලි ජනතා අයිතියට පවරන වෙලාවේ ඒ බල ප්‍රදේශවලට ගියාම ඒ බල ප්‍රදේශයේ දේශපාලන නායකත්වය සහ පක්ෂ, විපක්ෂ ද්‍රවිඩ මන්ත්‍රීතුමන්ලා ඒ උත්සවවලට ඇවිල්ලා හිටියා අපිට මතකයි. ඒ බල ප්‍රදේශයේ ද්‍රවිඩ ජනතාවගේ පරිත්‍යාගශීලීකම, ආගන්තුක සත්කාර පිළිබඳව මේ අවස්ථාවේදී මම ඉතාමත් සතුටින් මතක් කරනවා. මම පළමුවන වතාවට තමයි ඒ බල ප්‍රදේශයට ගියේ. අපිව ඉතාමත් හොඳින් පිළි අරගෙන, සංස්කෘතික සන්දර්ශන පවත්වලා, ඒ සියලුම කටයුතු කරලා අපිත් එක්ක බොහොම සමඟියෙන් කටයුතු කිරීම පිළිබඳව මම මේ අවස්ථාවේ ඒ සියලුම දෙනාව ගෞරවයෙන් සිහිපත් කරනවා.

මම හිතනවා අපිට තිබෙන්නේ එකම අරමුණයි කියා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සියලු දෙනාම දේශපාලන වශයෙන් පක්ෂ, විපක්ෂ ලෙස බෙදී සිටියත් සියලු දෙනා එකම අරමුණක් වෙනුවෙනුයි කටයුතු කරන්නේ. ඒ තමයි ඒ ප්‍රදේශවල ජීවත් වන ජනතාව වෙනුවෙන් අපෙන් කෙරෙන්න පුළුවන් උපරිම සත්කාරය ලබා දීම. ඒ කටයුතුවලදී අපිත් එක්ක එකතු වෙච්ච පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීතුමන්ලාට මම මගේ ස්තුතිය හා ගෞරවය පුද කරනවා.

[ගරු විජය දහනායක මහතා]

අද මෙම ගරු සභාව තුළ කථා කළා, ඒ බල ප්‍රදේශයේ නිලධාරි හිඟය ගැන. අවුරුදු 30ක් පැවැති යුද්ධයක් අවසානයේ මේ රටේ දැවැන්ත වෙනසක් ඇති වෙන වෙලාවක් මේක. මේ කාල පරාසය ඇතුළේ ඒ සියලුම අඩු පාඩු අපට එක සැරේ අවසන් කරන්න පුළුවන්කමක් නැහැ. නමුත් අපි ඉතාම-

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, දැන් අවසාන කරන්න.

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට විනාඩි කිහිපයක් දෙන්න.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ඔබතුමාට වෙන් කර තිබුණේ eight minutes.

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
මට විනාඩි 15ක් වෙන් කරලා තිබුණා. මට විනාඩි කිහිපයක් දෙන්න.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
විනාඩියක් දෙන්නම්.

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
අපේ අමාත්‍යතුමා කිව්වා, උතුරු නැඟෙනහිර බල ප්‍රදේශයට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පත්වීම් විශාල ප්‍රමාණයක් ලබා දුන්නා කියලා. ඒ විතරක් නොවෙයි, භාරසියඅසූ ගණනක් ද්‍රවිඩ භාෂාවෙන් විතරක් බඳවා ගෙන තිබෙනවා. ඒ එක්කම කාර්යාල සේවක සේවය සඳහා 66 දෙනෙක් බඳවා ගෙන තිබෙනවා. ඒ 66 දෙනාම උතුරු නැඟෙනහිර පළාත්වලටයි ලබා දුන්නේ. ඒ 66 දෙනාම ද්‍රවිඩ අය. රියැදුරු පත්වීම් 28ක් උතුරු නැඟෙනහිරට ලබා දුන්නා. ඉන් 14 දෙනෙක් ද්‍රවිඩ භාෂාව කථා කරන අය. තරග විභාග, සම්මුඛ පරීක්ෂණ තියලා ඒ නිලධාරින් බඳවා ගැනීම තුළින් ඉක්මන් සේවාවක් ක්‍රියාත්මක කරන්න අපිට පුළුවන්කමක් ලැබුණා. ඒ සම්බන්ධව අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරින්ට මගේ ගෞරවය හා ස්තුතිය පුද කරනවා.

ඒ එක්කම අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වන ආකාරයට සේවාලාභියාගේ හිතසුව පිණිස රාජ්‍ය සේවාව ස්ථාපිත කරන්න අපි සූදානම් වෙච්ච වෙලාවේ මම හිතනවා ඒ කටයුත්තට සියලුම රාජ්‍ය සේවකයන් අපට ගොඩක් උදවු උපකාර කරයි කියලා.

අපේ අමාත්‍යාංශය පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා නොයෙක් නොයෙක් ආකාරයේ අදහස් ප්‍රකාශ කළා. අපේ ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා ග්‍රාම නිලධාරිවරුන් වැඩ කරන්නේ නැහැ කියලා. මම කියනවා ග්‍රාම නිලධාරිවරුන්ව දේශපාලනීකරණය කරලා ඒ අයගේ ගරුත්වය නැති කළේ එක්සත් ජාතික පක්ෂ රජය කාලයේය කියලා. අද අපි දකිනවා අපේ අමාත්‍යාංශය හරහා ඒ අයට නිදහසේ සේවය කරන්න පුළුවන් වාතාවරණයක් සලසා තිබෙන බව. ඒ ගැන මම අපේ ගරු අමාත්‍යතුමාට ස්තුතිය පුද කරනවා.

ඒ විතරක් නොවෙයි. අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා "දිවි නැඟුම" වැඩසටහන මේ රටේ ක්‍රියාත්මක කරන කොට දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරි මට්ටමට මේක ගමන් කරන කොට අපේ අමාත්‍යාංශයේ යන්ත්‍රණය තුළ විශාල සේවාවක් කරලා ඉලක්කගත ගමනක් යන්න අපට පුළුවන්කම ලැබෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Please conclude your speech. There are two Ministers to reply.

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
මගේ වෙලාව අඩු කරලා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මට තව විනාඩියක් ලබා දෙන්න.

ඒ එක්කම මම හිතනවා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සම්බන්ධවත් යමක් කිව යුතුයි කියලා.

පරිගණක තාක්ෂණය යොදා ගත් දකුණු ආසියාවේ ඉතාමත් සාර්ථක දෙපාර්තමේන්තුව හැටියට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තේරිලා තිබෙනවා. එම දෙපාර්තමේන්තුවේ සියලු දෙනාටම මේ අවස්ථාවේදී මගේ ගෞරව පූර්වක ස්තුතිය පුද කරනවා. ඒ එක්කම කියන්න ඕනෑ, විශ්‍රාම වැටුප් විසමතාවට යම් ආකාරයක සාධාරණයක් කරන්න අතිගරු ජනාධිපතිතුමා මෙවර අය වැයෙන් අවශ්‍ය පියවර අරගෙන තිබෙන බව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම රජයේ සේවකයන් සඳහා වැටුප් ලබා දීම සම්බන්ධව යම් පියවරක් අරගෙන තිබෙනවා. ඉංජිනේරු සේවාවේ වැටුප් සම්බන්ධව යම් පියවරක් අරගෙන තිබෙනවා. පොලීසිය සම්බන්ධව සහ දුබලතා විශ්‍රාම වැටුප් සම්බන්ධව යම් පියවරක් අරගෙන තිබෙනවා. මෙවර අය වැයෙන් සිත් ගන්නා සුළු සහන රැසක් ලබා දී තිබෙන අතිගරු ජනාධිපතිතුමාට අපේ ස්තුතිය පුද කරනවා.

මා මීට වැඩිය කාල වෙලාව ගන්නේ නැහැ. "මහින්ද චින්තන ඉදිරි දැක්ම" අනුව වෙනස් වන අලුත් ශ්‍රී ලංකාවට මුහුණ දීමටත් ඒ අභියෝගය ජය ගැනීමටත් අප අමාත්‍යාංශයේ අමාත්‍යතුමා, මා සහ ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරින් සූදානම් බව ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

[පි. ව. 5.22]

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, பொது நிருவாக, உள்நாட்டலுவல்கள் மற்றும் உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சுகளுக்கான நிதி ஒதுக்கீடுகள் பற்றிய குழுநிலை விவாதத்தில் உரையாற்றச் சந்தர்ப்பம் தந்தமைக்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். வடக்கு மாகாணத்தைப் பொறுத்தவரையில், இந்த இரு அமைச்சுக் களும் முக்கியத்துவம் வாய்ந்தனவாக அமைந்துள்ளன. பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சினூடாகத் தற்போது

மேற்கொள்ளப்பட்டுவரும் சில இடமாற்றங்கள் தமிழ் மக்கள் மத்தியில் சந்தேகத்தை ஏற்படுத்தியுள்ளன. மன்னார் மாவட்டத் துக்கு பெரும்பான்மை இனத்தைச் சேர்ந்த ஒருவர் அரச அதிபராக நியமிக்கப்பட்டுள்ளார். இதேபோல், யாழ்ப் பாணத்தில் சில பிரதேச செயலாளர்களாக பெரும்பான்மை இனத்தைச் சேர்ந்தவர்கள் நியமிக்கப்பட்டுள்ளனர். அரசாங்க சேவையைப் பொறுத்தவரையில் இடமாற்றங்கள் சாதாரண நடவடிக்கையாக இருந்தபோதிலும், வட பகுதியில் தற் போதுள்ள நிலையில் இத்தகைய நியமனங்கள் வழங்கப் பட்டமை அப்பகுதி மக்கள் மத்தியில் சந்தேகப் பார்வையைத் தோற்றுவித்துள்ளது. யுத்தம் காரணமாகக் கடந்த மூன்று தசாப்த காலமாகத் துன்பங்களையும் துயரங்களையும் தமிழ் மக்கள் அனுபவித்து வந்தனர். யுத்தத்தினால் தமிழ், சிங்கள சமூகங்களின் மத்தியில் சந்தேக உணர்வு இருந்துவந்தது. தற்போது யுத்தம் முடிவடைந்துள்ள நிலையில் இத்தகைய சந்தேக உணர்வு களையப்பட்டு வருகின்றது. தமிழ், சிங்கள மக்கள் ஒன்றிணைந்து வாழலாமென்ற நம்பிக்கை தற்போது துளிர்விட்டு வருகின்றது. இந்த நிலையில் அவசரப்பட்டு இவ்வாறான நியமனங்களையும் இடமாற்றங்களையும் வழங்குது தமிழ் மக்கள் மத்தியில் சந்தேகம் அதிகரிக்கவே வழிவகுக்கும். எனவே, சுமுகநிலை ஏற்பட்டு, இரு சமூகங்களுக் கிடையேயும் அந்நியோன்னிய உறவுகள் ஏற்படும்வரை இத்தகைய இடமாற்றங்களை மேற்கொள்ளாதிருப்பது நன்மை பயக்குமென்பதனை இந்த உயரிய சபையில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

யுத்தம் முடிவடைந்து இரண்டரை வருடங்கள் நிறை வடைந்துவிட்டபோதிலும் இன்னும் தமிழ் மக்களின் பிரச்சினைகளுக்கு உரிய தீர்வு காணப்படவில்லை. கடந்த மூன்று தசாப்த கால யுத்தத்தினால் சகலவற்றையும் இழந்த தமிழ் மக்கள் தற்போது தமது வாழ்வாதாரத்தைக் கட்டியெழுப்புவதற்காக முயன்று வருகின்றனர். இன்றைய சூழலில் அவர்கள் அனுபவித்த கஷ்ட, துன்பங்கள் மற்றும் இழப்புக்களுக்கு ஏற்றவாறு தீர்வொன்று வழங்கப்படுவது அவசியமாகும். இந்தத் தீர்வானது தமிழ் மக்களின் அபிலாஷைகளைப் பூர்த்திசெய்யும் வகையில் அமைய வேண்டும். அரசாங்கம் கடந்த ஜனவரி மாதம் 10ஆம் திகதி முதல் தமிழ்த் தேசியக் கூட்டமைப்புடன் பேச்சுவார்த்தைகளை நடத்தி வருகின்றது. இதுவரை 16 சுற்றுப் பேச்சுவார்த்தைகள் முடிவடைந்துள்ளபோதிலும் தீர்மானம் எதுவும் எட்டப்பட வில்லையென்பது கவலைக்குரிய விடயமாகும். இனப் பிரச்சினைத் தீர்வு தொடர்பிலான இந்தப் பேச்சுவார்தைகள் இதயசுத்தியுடன் நடைபெறுவதாகத் தெரியவில்லை. இந்த நிலையில் மாகாண சபைகளுக்குக் காணி அதிகாரம் வழங்குவது, அதற்குச் சட்டம், ஒழுங்கு போன்ற அதிகாரங்களை வழங்குவது, மற்றும் வடக்கு, கிழக்கு மாகாணங்களை இணைப்பது என்பவை தொடர்பில் சிக்கல்கள் இருப்பதாக அரசாங்கம் தெரிவித்துள்ளது. இந்த நிலையில் பேச்சுவார்த்தை என்பது அர்த்தபுஷ்டியுள்ளதாக அமையுமா என்பது தொடர்பில் தமிழ் மக்கள் மத்தியில் சந்தேகம் எழுந்துள்ளது. உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சின் மீதான குழுநிலை விவாதத்தில் இவ்விடயம் தொடர்பாக அரசாங்கத்தின் உறுதியான நிலைப்பாடு என்ன? என்பதை அறிவிக்குமாறு கேட்டுக்கொள்கின்றேன். இனப் பிரச்சினைத் தீர்வில் வடக்கு, கிழக்கு மாகாணங்களின் இணைப்பு, காணி அதிகாரம், சட்டம் ஒழுங்கு அதிகாரம் என்பவை இன்றிய மையாத விடயங்களாகும். இந்த விடயங்களில் அரசாங்கத் துக்குச் சிக்கல்கள் எழுமானால் பேச்சுவார்த்தை உரிய பலனைத் தருமா? என்கின்ற கேள்வி தமிழ் மக்கள் மத்தியில் எழும். எனவே, யுத்தத்தினால் உயிர் மற்றும் உறவுகளையும் உடைமைகளையும் இழந்து பரிதவித்து வாழும் தமிழ் மக்களுக்கு உரிய தீர்வினை வழங்க அரசாங்கம் முன்வர வேண்டும். தமிழ்த் தேசியக் கூட்டமைப்புடன் அரசாங்கம் காணும் இணக்கப்பாட்டுக்கு ஆதரவு வழங்கப்படுமென எமது கட்சியின் தலைவர் அறிவித்துள்ளார். எனவே, அரசாங்கம் தீர்வை நோக்கிய பயணத்தை முன்னெடுக்க வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

யாழ். குடாநாட்டில் பிரதேச செயலக மட்டத்தில் இடம்பெறும் அபிவிருத்திக்குழுக் கூட்டங்கள் மற்றும் ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களுக்கு எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் அழைக்கப்படுவதில்லை, அல்லது வேண்டாவெறுப்பாகவே அழைக்கப்படுகின்றனர். ஆனால், யுத்தத்தினால் பாதிக்கப்பட்ட யாழ். குடாநாடு உட்பட, வட பகுதியினை நாம் அனைவரும் ஒன்றிணைந்தே கட்டியெழுப்ப வேண்டும். இந்த விடயத்தில் அரசியல் சுயநலன்களுக்கு அப்பால் நாம் செயற்பட வேண்டும். ஆளும்தரப்பு எம்.பீ.க்களுக்கு மாத்திரம் அழைப்பை விடுத்து குறித்த கூட்டங்களை நடத்துவதால் எந்தப் பயனையும் நீங்கள் எட்டப்போவதில்லை. எனவே, ஒருங்கிணைப்புக் குழுக் கூட்டம் மற்றும் பிரதேச செயலக மட்டத்திலான அபிவிருத்திக் குழுக் கூட்டங்களுக்கு எதிர்த்தரப்புப் பாராளுமன்ற உறுப்பினர்களான எமக்கும் அழைப்புக்களை அனுப்ப வேண்டும். இவ்விடயம் குறித்து ஏற்கெனவே பொதுநிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சின் கவனத்துக்குக் கொண்டுவரப்பட்டுள்ளது.

யாழ்ப்பாணத்தில் உள்ள உள்ளூராட்சிச் சபைகளை எடுத்துக்கொண்டால், யாழ். மாநகர சபை உட்பட மூன்று சபைகளைத் தவிர ஏனைய சபைகள் தமிழ்த் தேசியக் கூட்டமைப்பினரின் வசம் உள்ளன. இந்தச் சபைகளின் செயற்பாடுகளைத் தங்குதடையின்றி மேற்கொள்ள உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சு ஒத்துழைப்பு வழங்க வேண்டும். ஏனெனில், உள்ளூராட்சிச் சபைகளுக்கு அமைச்சு ஒத்துழைப்பு வழங்காது இழுத்தடிப்பு மேற்கொள்ளு மானால் அப்பகுதி மக்களே பாதிக்கப்படுவார்கள். எனவே, அந்த மக்கள் பாதிக்கப்படுவதனை அனுமதிக்க முடியாது. யாழ்ப்பாண மாநகர சபையில் தற்பொழுது குழப்பநிலை ஏற்பட்டுள்ளது. ஆளும் கட்சி உறுப்பினர்கள் ஏனைய கட்சிகளுக்கு மாறும்நிலை ஏற்பட்டுள்ளது. எனவே, இவ்விடயம் குறித்தும் அமைச்சு கவனம் செலுத்துவதோடு, மாநகர சபையிலே ஏற்பட்டுள்ள குளறுபடிகளினால் மக்கள் பாதிக்காத வகையில் அதன் நடவடிக்கைகள் முன்னெடுக்கப் படுவதை உறுதிசெய்துகொள்ள வேண்டும்.

வட மாகாண சபை நிர்வாகத்தினால் வட பகுதியில் வீதி அமைப்பு உட்படப் பல அபிவிருத்தித் திட்டங்கள் மேற் கொள்ளப்பட்டு வருகின்றன. இத்தகைய செயற்பாடுகளை அதிகரிப்பதுடன், அந்த வேலைத்திட்டங்களையும் துரிதப் படுத்த வேண்டும். நன்றி.

[අ. භා. 5.28]

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා (පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா - உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சர்)
(The Hon. A.L.M. Athaulla - Minister of Local Government and Provincial Councils)

*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ආයතන ශක්තිමත් වෙන්න ඕනෑ කියන මතය මන්ත්‍රීවරු කිහිප දෙනෙක්

[ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා]

අද මේ ගරු සභාව තුළදී ප්‍රකාශ කළා. මා එතුමන්ලාට ස්තුතිවන්ත වනවා. පක්ෂ භේදයෙන් තොරව මේ ගරු සභාවේම මැතිඇමතිවරුන් පළාත් පාලන ආයතන ශක්තිමත් වන එකට agree වනවා. බලන්න, ඒ පළාත් පාලන ආයතන ශක්තිමත් කළේ අපි; අපේ අතිගරු ජනාධිපතිතුමා. හේතුව, පළාත් පාලන ආයතන ශක්තිමත් වන්න නම්, උතුරු නැඟෙනහිර පළාත් පාලන ආයතනවලට නිදහස් ඡන්දයක් තියන්න ඕනෑ. ජනතාව නිදහසේ ඡන්ද දීලා මන්ත්‍රීවරු සභාවකට එන්න ඕනෑ. ඒ සභාවට නිදහසේ කටයුතු ගෙන යන්න පුළුවන් වුණොත් විතරයි පළාත් පාලන ආයතන ශක්තිමත් වුණා කියා අපට කියන්න පුළුවන් වන්නේ.

හැබැයි, මේ මන්ත්‍රීවරු කිහිප දෙනෙකුට එක කාරණයක් අමතක වෙලා තිබෙනවා. මොකක්ද? පසු ගිය අවුරුදු 30ම මෙම පළාත් පාලන ආයතනවලට තරග කරන්න මිනිස්සු කැමැති වුණේ නැති බව. ඒ දවස්වල තරග කරපු අපේක්ෂකවරු වෙඩි තියලා මැරුවා; ජේවීපී එකෙන් මැරුවා; එල්ටීටීඊ එකෙන් මැරුවා; ත්‍රස්තවාදී කණ්ඩායම් විසින් වෙඩි තියලා මැරුවා. එදා යාපනයේ පළාත් පාලන ආයතනවලට නිදහසේ ඡන්දය ඉල්ලන්න අපට අවස්ථාවක් තිබුණේ නැහැ. එම නිසා ඒ පළාතේ පළාත් පාලන ආයතන කඩා වැටිලා ගියා. නැඟෙනහිර පළාතේත් ඒ වාගේම රටේ හැම තැනමත් මේ ප්‍රශ්නය තිබුණා.

අද ඒ ප්‍රශ්නය නැතිවීම ගැන අපේ මන්ත්‍රීවරු අගය කරනවාද? පළමුවෙන්ම අපි සියලු දෙනාම අපේ අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිය පුද කරන්න ඕනෑ. පළාත් පාලන ආයතන වේවා, පළාත් සභා වේවා ඒවාට නිදහස් ඡන්ද තියන්න ලොකුම අවස්ථාවක් අපේ අතිගරු ජනාධිපතිතුමා අපට ලබා දුන්නා. ඒවා අපි තමයි කර ගෙන යන්නේ. ඡන්දය නිදහසේ තිබුණා. පළාත් පාලන ආයතන 322කට අපි ඡන්දය පවත්වා තියෙනවා. මා හිතන විධියට මුලතිව් පළාත් පාලන ආයතන දෙකකට විතරයි ඡන්ද පවත්වන්න බැරි වුණේ. අනෙක් ඒවා ඔක්කොටම අපි ඡන්ද තිබ්බා. දැන් ඡන්දයෙන් තේරිලා මන්ත්‍රීවරු ඇවිත් ඉන්නවා. අපේ අතිගරු ජනාධිපතිතුමා මේ වැඩ පිළිවෙළ ශක්තිමත් කරන්න phase II හැටියට දැන් පටන් ගන්නවා.

එක්සත් ජාතික පක්ෂයෙන් නොවෙයි, අපේ ජනාධිපතිතුමා, අපේ ආණ්ඩුවෙන් තමයි එය කර ගෙන එන්නේ. ඒ පළාත් පාලන ආයතන නැත්නම්, ඒ මන්ත්‍රීවරු නැත්නම් කොහොමද කටයුතු කරන්නේ? පාරවල් හදන්නේ කොහොමද? Machinery ලබා දෙන්නේ කාටද? කාටද පාරවල් අවශ්‍ය වෙලා තිබුණේ? ඒ නිසා මේ පළාත් පාලන ආයතන ශක්තිමත් කරන්න ඕනෑ කියලා කථා කරන මන්ත්‍රීවරු පසු ගිය කාලය ගැනත් මතක් කර ගන්න ඕනෑ කියලා මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි.

ඒක විතරක් නොවෙයි, යූඑන්පී මන්ත්‍රීවරයෙක් මේ ගරු සභාවේදී ප්‍රකාශ කළා, පළාත් සභාවට දීපු සියලුම බලය ආපහු ගන්නවා කියලා. ඒක වැරදියි. නමුත් එදා 1988 එක්සත් ජාතික පක්ෂය ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කර ගෙන පළාත් සභාවලට දීපු බලයේ කිසි දෙයක් අපි ආපහු ගත්තේ නැහැ. එතුමන්ලා හරියට නොවෙයි වැඩ කරලා තිබෙන්නේ. උතුරු නැඟෙනහිර කට්ටිය බලය ඉල්ලුවා. හැබැයි, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ පුංචි රටපුරාටම පළාත් සභා දුන්නා. අපි ඒක ඉල්ලුවාද? වයඹ කට්ටිය ඉල්ලුවාද? බලන්න, පළාත් පාලන ආයතනවල පරිපාලනයත් ඒ පළාත් සභාවලට යනවා. ඒ ප්‍රශ්න ඔක්කෝටම වග කියන්න ඕනෑ එක්සත් ජාතික පක්ෂය.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

පළාත් සභාව හොඳ නැද්ද?

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

පළාත් සභා හොඳද, හොඳ නැද්ද කියලා අපි කථා කරමු. [බාධා කිරීමක්] හරි, වෙලාවක හම්බ වෙලා කථා කරමු. මේ මම කථා කරන වෙලාව.

මම මේ ගරු සභාවේ ප්‍රකාශ කරන්න ඕනෑ, මොන බලයක්ද පළාත් සභාවට දෙන්න ඕනෑ කියලා පක්ෂ භේදයෙන් තොරව අපි සියලු දෙනාම කථා කරන්න ඕනෑ බව. තමන්ගේ ඡන්ද වාසියට නොවෙයි මේ ගැන කථා කරන්න ඕනෑ. ඇත්තටම පොඩි රටකට අවශ්‍ය දේ මොකක්ද, පළාත් පාලන ආයතනවලට දෙන්න පුළුවන් බලය මොකක්ද, පළාත් සභාවලට දෙන්න ඕනෑ මොනවාද කියලා අපි විශ්වාසයෙන් හදවතින් කථා කරන්න ඕනෑ. දේශපාලන වාසියකට මෙතැන කථා කරලා වැඩක් නැහැ.

අපේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ කථා කළා. එතුමා අදහස් කීපයක් ඉදිරිපත් කළා. ඒක හොඳයි. අපේ අතිගරු ජනාධිපතිතුමාත් හිතනවා, ඒ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට motor cycles, three wheelers නොවෙයි, double cab වාහනයක් ලබා දුන්නොත් හොඳයි කියලා. එහෙම අදහසක් අපට තිබෙනවා. දැන් තමයි ඒ ආයතනවල මැතිවරණයක් පවත්වන්නවත් පුළුවන්කමක් අපට ලැබුණේ. යුද්ධය අවසන් කරලා, ඊට පස්සේ මුළු රටම සංවර්ධනය කර ගෙන ආවා.

අපේ අතිගරු ජනාධිපතිතුමායි, මේ සියලුම අමාත්‍යාංශයි සංවර්ධන කටයුතු කරන්නේ කොහේද? හැම ගමක්ම සංවර්ධනය කර ගෙන යනවා. පාරවල් හදන්නේ කොහේද? හැම ගමේම පාරවල් හදනවා. ඒ ඒ පළාත් පාලන ආයතන යටතේ තිබෙන පාරවල් හදනවා; විදුලිය දෙනවා. මේ වැඩ පිළිවෙළ සමානව කර ගෙන යන කොට මන්ත්‍රීවරුන්ගේ වැටුප් ආදී එතුමන්ලාට අවශ්‍ය දේවල්ද අපිට ලබා දෙන්න පුළුවන්. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාම කිව්වා, එක්සත් ජාතික පක්ෂය නොවෙයි, එස්එල්පී ආණ්ඩුව කාලයේ තමයි මේ මන්ත්‍රීවරුන්ට වැටුප් වැඩි කර දුන්නේ කියලා. ඇත්තටම ඉදිරියේදී කොට්ඨාස ක්‍රමය එන කොට මන්ත්‍රීවරුන්ට මේ තරම් එහාට මෙහාට දුවන්න අවශ්‍යතාවක් වන එකක් නැහැ. පොඩි කොට්ඨාසයක් තුළ මහ ජනතාවට සමීපව වැඩ කරන්න අවස්ථාවක් ලබා දෙන්න අපට පුළුවන්. ඒවා ගැන තමයි අපි කියන්න ඕනෑ; කථා කරන්න ඕනෑ. වැදගත් කාරණා තමයි අපි කථා කරන්න ඕනෑ.

පසු ගිය කාලයේ සිටි අපේ නායකවරු, රටේ නායක ධුරය ඉලක්ක කර ගෙන ඒ දවස්වල භාර ගන්න අමාත්‍යාංශය තමයි පළාත් පාලන අමාත්‍යාංශය. අපේ දිවංගත බණ්ඩාරනායක මැතිතුමා, ඒ වාගේම ප්‍රේමදාස මැතිතුමා සියලු දෙනාම ඒ අමාත්‍ය ධුරය ලබා ගත්තා. එදා ඒ වාගේ බලය තිබුණා. ඒ වාගේම ඒ පළාත් පාලන ආයතනවලට ඒ තරම් සේවාවක් එතුමන්ලා කළා. අපි මේ අවස්ථාවේදී එය මතක් කරන එක හොඳයි. හැබැයි, ඒ වාගේ ධුරයක් ඉලක්ක කර ගෙන නිකම් කථා කරලා වැඩක් නැහැ. ඒකට සජිත් ප්‍රේමදාස මැතිතුමාට රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉඩ දෙන්නෙත් නැහැ. හැබැයි, අපේ ආශීර්වාදය තිබෙනවා. අපේ ආශීර්වාදය එතුමාට තිබෙනවා. සජිත් ප්‍රේමදාස මැතිතුමාට අපේ ආශීර්වාදය තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉඩ දෙන්නේ නැහැ නේ කාටවත්. ඒකනේ විසඳන්න ඕනෑ. [බාධා කිරීමක්] එතැනනේ විසඳන්න ඕනෑ. [බාධා කිරීමක්] එහෙම නොවෙයි. ඒක වැරදි කථාවක්. දැන් මෙහෙම කිව්වාම රනිල් වික්‍රමසිංහ මහත්මයා ඔබතුමාට punishment එක දෙනවා. [බාධා කිරීමක්] ඔබතුමා සජිත් මහත්මයාගේ පැත්තේද? [බාධා කිරීමක්] නායකයා කවුද, කොයි පැත්තෙද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මමයි නායකයා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වාසි පැත්තට යන්නේ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
මගේ වෙලාව ගත වෙනවා. [බාධා කිරීමක්] අර පැත්ත, මේ පැත්ත නොවෙයි අපි බලන්නේ. අපි කවදාවත් එහෙම බලන්නේ නැහැ. හොඳ නායකත්වය මෙහේ තිබෙන විට, හොඳ නායකතුමන්ලා මෙහේ ඉන්න විට මොකටද ඔය පැත්තට එන්නේ? ඔය පැත්තේ නායකතුමන්ලා මොකක්ද මේ රටට කරලා තිබෙන්නේ? එකක් පෙන්වන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
විනාඩියක් දෙන්න කියන්න.

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 7,005,422,000

Question, "That the sum of Rs. 7,005,422,000, for Head 317, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 317, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure,
Rs. 3,099,500,000

Question, "That the sum of Rs.3,099,500,000, for Head 317, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 317, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 318.- UVA PROVINCIAL COUNCIL

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 9,458,826,000

Question, "That the sum of Rs. 9,458,826,000, for Head 318, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 318, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure,
Rs. 3,437,000,000

Question, "That the sum of Rs. 3,437,000,000, for Head 318, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 318, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 319.- SABARAGAMUWA PROVINCIAL COUNCIL

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 11,243,324,000

Question, "That the sum of Rs. 11,243,324,000, for Head 319, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 319, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 3,005,000,000

Question, "That the sum of Rs. 3,005,000,000, for Head 319, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 319, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 321.- EASTERN PROVINCIAL COUNCIL

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 11,385,066,000

Question, "That the sum of Rs. 11,385,066,000, for Head 321, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 321, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 4,184,000,000

Question, "That the sum of Rs. 4,184,000,000, for Head 321, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 321, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

"134 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 119,550,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය

134 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 130,950,000

"134 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 130,950,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

134 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 67,350,000

"134 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු. 67,350,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

134 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 38,550,000

"134 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු. 38,550,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

134 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**236 වන ශීර්ෂය.- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 66,100,000

"236 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු. 66,100,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

236 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 13,500,000

"236 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු. 13,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

236 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 134, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 119,550,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 134, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 130,950,000

"தலைப்பு 134, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 130,950,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 134, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 67,350,000

"தலைப்பு 134, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 67,350,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 134, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 38,550,000

"தலைப்பு 134, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 38,550,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 134, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 236.- அரச கரும மொழிகள் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -மீண்டுவருஞ் செலவு ரூபா 66,100,000

“தலைப்பு 236, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 66,100,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 236, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 13,500,000

“தலைப்பு 236, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 13,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 236, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 119,550,000, for Head 134, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 134, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 130,950,000

Question, "That the sum of Rs. 130,950,000, for Head 134, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 134, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 67,350,000

Question, "That the sum of Rs. 67,350,000, for Head 134, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 134, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 38,550,000

Question, "That the sum of Rs. 38,550,000, for Head 134, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 134, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 236.- DEPARTMENT OF OFFICIAL LANGUAGES

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 66,100,000

Question, "That the sum of Rs. 66,100,000, for Head 236, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 236, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 13,500,000

Question, "That the sum of Rs. 13,500,000, for Head 236, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 236, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

***එකල්හි වේලාව අ. භා. 6.00 වුයෙන්, පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය. කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2011 දෙසැම්බර් මස 12 වන සඳුදා.***

*அப்போது பி.ப. 6.00 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது. மீண்டும் கூடுவது 2011 டிசம்பர் 12, திங்கட்கிழமை.*

*It being 6.00 p.m., the Deputy Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Monday, 12th December, 2011.*

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Now, the Adjournment Motion to be moved by the Hon. Tharanath Basnayaka. - [*Interruption.*]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

What is your point of Order?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

This Adjournment Motion is *sub judice.* There is a case pending before the courts on this matter. Standing Order No. 84 (vi) states, I quote:

> “No member shall refer to any matter which is under adjudication by a court of law or to any matter on which a judicial decision is pending."

The case No. is: 1674 and a charge sheet has already been filed and the case is pending in courts. So, I do not think that the Hon. Member can take up this Motion in the House today.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Hon. Deputy Chairman of Committees, the gist of the Motion is, "What action has been taken in respect of the assault on Mr. Rajpal Abeynayake?". What has been asked by the Hon. Member in this Motion is about the action that has been taken in this regard. So, the Government has to reply. We are not going to discuss the merits of the case. The Government will reveal as to what action has been taken. The fact that there is a court case is different. But, we are not going to discuss the merits of this incident - I mean we are not going to go into - as to who did this, who is responsible and all that. Therefore, the Government can respond to this. This does not attract that particular Standing Order the Hon. Member has brought before you. It is not *sub judice* because we are not going to discuss a substantive issue in that fashion.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

The Hon. Member's Motion is not *sub judice*. - [*Interruption.*]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Hon. Deputy Chairman, the second paragraph of the Motion says, I quote:

> "මේ සම්බන්ධව ඔහු පොලීසිය වෙත පැමිණිලි කර තිබුණද මෙතෙක් කිසිවෙකු අත් අඩංගුවට ගෙන නොමැති අතර, ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කර නොමැති බවද සඳහන් කිරීමට සිදුව ඇත."

In fact, it is not correct to take up this Motion. You see, a case has been filed; a case number is also given and already bail has been granted to the suspect. You are talking about the merits of the case. When this Motion is taken up, the Members will talk about the merits of the case. It is very clear. The Government does not need to answer this. There is a case number and the case is pending before the courts. Therefore, it is *sub judice*. All what the Government can say is that there is a case; the suspect has been produced and he is released on bail. What more can the Government say on this? - [*Interruptio*n.] It is *sub judice.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Hon. Deputy Chairman, if there is anything that is *sub judice* in the speeches made, then, you are entitled to remove that from Hansard or warn the Members not to refer to matters which would become *sub judice* or which will affect the administration of justice.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

If there is anything *sub judice*, those portions will be expunged from the speeches of the Hon. Members. Hon. Tharanath Basnayaka, now you can move your Adjournment Motion.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Can I read this section again, Sir? - [*Interruption.*]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

No, I have already given the order. Hon. Tharanath Basnayaka, you carry on. - [*Interruption.*]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Sir, just give me one minute. I will just try to explain this. Standing Order No. 84 (vi) states, I quote:

> "No member shall refer to any matter which is under adjudication by a court of law to any matter on which a judicial decision is pending."

So, this matter is under adjudication by a court. Therefore, this is very clear. If you allow this, -

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

No, not any matter - [*Interruption.*] You have to understand this. We are not referring to the matter under adjudication. All the Hon. Member wants to know is, what action has been taken in respect of this assault. That is all.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

That means, we can talk about any case -

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

No, we are not talking about the case. - [*Interruption.*]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

I am raising this issue; I have given you the case number, a matter is pending before the courts and already the suspect is released on bail. This is what the Hon. Member is asking. - [*Interruption.*] So, the Hon. Deputy Chairman of Committees can give a ruling on this.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Member, you cannot discuss facts of the case; you can only discuss the action. Hon. Basnayaka, you can carry on with the Motion.

## "ලක්බිම නිවුස් " කර්තෘ රාජ්පාල් අබේනායක මහතා වෙත එල්ල වූ මැර ප්‍රහාරය
## "லக்பிம நியூஸ்" பத்திரிகை ஆசிரியர் திரு. ராஜ்பால் அபேநாயக்க மீதான குண்டர்களின் தாக்குதல்
## GOON ATTACK ON MR. RAJPAL ABEYNAYAKE, EDITOR OF "LAKBIMA NEWS"

**ගරු තාරානාත් බස්නායක මහතා**
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க )
(The Hon. Tharanath Basnayaka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ලක්බිම නිවුස්" පුවත් පතේ කර්තෘ ලෙස සේවය කරන නීතිඥ රාජ්පාල් අබේනායක මහතා 2011 දෙසැම්බර් 03වැනි දින නීතිඥවරුන්ගේ හමුවකට සහභාගි වෙමින් සිටියදී ඔහුගේ මාධ්‍යවේදී කටයුතු අභියෝගයට ලක් කරමින් මැර පිරිසක් විසින් ඔහුව ප්‍රහාරයකට ලක් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කොට යුක්තිය ඉටු කර දෙන ලෙස මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ සමස්ත ජනතාවට නිදහස ආරක්ෂා කර දෙන අතර මාධ්‍යවේදීන් කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. එතුමා මාධ්‍යවේදීන් පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙන නායකයෙක්. සෑම මාසයකටම වරක් ආයතන ප්‍රධානීන් සමඟ ඒ වාගේම අනෙකුත් නිලධාරීන් එක්ක ඉතාම මිත්‍රශීලීව සාකච්ඡා කරන නායකයෙක්. මාධ්‍යවේදීන් සහ රටේ නායකයා අතර මෙවැනි වූ සම්බන්ධතාවක් මා ප්‍රථම වතාවටයි දැක්කේ. ඉතිහාසයේ -පසු ගිය කාල සීමාව තුළ- කවර නායකයකුවත් මෙවැනි සම්බන්ධතාවක් ඇති කර ගෙන තිබුණේ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. රටේ ජනතාවට නිදහස ලැබෙන කොටම මාධ්‍යවේදීන් පිළිබඳවද එතුමා අවධානය යොමු කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය දවසේ වූ ඒ සිද්ධියේදී පුද්ගලයා කවුරු වුණත්, ප්‍රශ්නය කුමක් වුණත් -පුද්ගලික ප්‍රශ්නයක් වුණත්- ඒක නොවෙයි වැදගත් වන්නේ. මාධ්‍යවේදියකුට තමයි පහර දීලා තිබෙන්නේ. "මාධ්‍යවේදියා" කියන චරිතයට තමයි ප්‍රහාරය එල්ල කරලා තිබෙන්නේ. ඔහු විශේෂයෙන්ම කර්තෘ කෙනෙක්. මාධ්‍යවේදියා කියන චරිතය ඉතාම වටිනා වූ චරිතයක්. මේ රටේ විශේෂ වූ ස්ථානයක් අද මාධ්‍යවේදීන්ට ලැබී තිබෙනවා. යම්කිසි අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා නම් පුද්ගලයා කවුද, තරාතිරම මොකක්ද කියලා බලන්නේ නැතිව, පසු බට වන්නේ නැතිව නීතිය ක්‍රියාත්මක කරන්න කියලා මේ ගරු සභාවෙන් ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට පත් වුණාට පස්සේ විශේෂයෙන්ම මාධ්‍යවේදියාට දීලා තිබෙන නිදහස අපි දැක්කා. මේ රටේ සෑම මාධ්‍යවේදියකුටම පක්ෂයක් තිබෙනවා. නමුත් අතිගරු ජනාධිපතිතුමා රටේ නායකයා හැටියට ඒ සියලු දෙනා ඒක රාශි කර ගෙන එතුමන්ලාත් එක්ක මිත්‍රශීලීව කටයුතු කරනවා. අද මාධ්‍යවේදියාට උපරිම වශයෙන් නිදහස ලබා දී තිබෙනවා කියා මම හිතනවා.

ඉතිහාසය අපට මතකයි. ඉතිහාසයේ මාධ්‍යවේදියාට හිමි වෙලා තිබුණු ස්ථානය නැවත මතක් කරන්න ඕනෑ නැහැ. මෙතැන ඉඳලා ඒ දෙස ආපසු හැරී බලද්දී රටේ ඉහළම ස්ථානයක් අද මාධ්‍යවේදීන්ටත් ලැබී තිබෙන බව පෙනෙනවා. ඒ, අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය තුළයි. මෙවැනි සිද්ධීන් වන කොට මාධ්‍යවේදියා කියන චරිතය හෑල්ලුවට ලක් වෙනවා කියා මම හිතනවා. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා - [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාධ්‍යවේදියා කියන චරිතයට මේ කාල පරිච්ඡේදය තුළ විශේෂ වූ ස්ථානයක් ලබා දී තිබෙනවා; වටිනාකමක් ලබා දී තිබෙනවා. උදාහරණයක් ගනිමු. කුමාරසිරි හෙට්ටිගේ මැතිතුමා හිටපු ප්‍රවීණ මාධ්‍යවේදියෙක්. එතුමා අද හොඳ ස්ථානයක ඉන්නවා. ගරු විමල් වීරවංශ අමාත්‍යතුමා ගන්න. එතුමා අද ප්‍රබල ඇමතිවරයෙක්. ඩලස් අලහප්පෙරුම හිටපු මාධ්‍යවේදියා අද ප්‍රබල ඇමතිවරයෙක්. එවැනි චරිතවලට අද සුවිශේෂ ස්ථානයක් ලැබිලා තිබෙනවා.

අද මාධ්‍ය වෙනුවෙන්, මාධ්‍යවේදියා වෙනුවෙන් මෙවැනි ආකාරයට නිදහස ලබා දෙන කොට, ඒ වරප්‍රසාද ලැබෙන කොට මෙවැනි සිද්ධි දාමයන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මෙවැනි දේවල් ඇති වීම පිළිබඳව අපි කනගාටුවට පත් වෙනවා. ඒ නිසා මම මේ ගරු සභාවෙන් ඉල්ලන්නේ මේ සිද්ධියට සම්බන්ධ පුද්ගලයා කවුරු වුණත්, තරාතිරම මොකක් වුණත් අසාධාරණයක් වෙලා තිබෙනවා නම් නීතිය ක්‍රියාත්මක කරලා අවශ්‍ය කටයුතු කරන්න කියලායි.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී තාරානාත් බස්නායක මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව ස්ථිර කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මම ප්‍රථමයෙන්ම සන්තෝෂ වෙනවා. ඒ වාගේම ඒ මන්ත්‍රීතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා.

රාජ්පාල් අබේනායක මහතා ප්‍රවීණ මාධ්‍යවේදියෙක්; මේ රටේ සම්මානනීය මාධ්‍යවේදියෙක්. ඔහු ඉරිදා ජාතික පුවත් පතක කර්තෘවරයෙක්. ඔහු මීට කලින් ලංකාවේ පැරණිම පුවත් පතක් වන "Sunday Observer" පුවත් පතේ ප්‍රධාන කර්තෘ හැටියට සේවය කළා. ඊටත් කලින් ඔහු "The Sunday Times" පුවත් පතේ නියෝජ්‍ය කර්තෘ හැටියට සේවය කළා. ඔහු නීතිඥයෙක් හැටියට උපාධිය ලබා ගෙන, පසුව මාධ්‍යවේදියෙක් හැටියට ලංකාවේ උසස්ම මාධ්‍යවේදී සම්මානයෙන් පිදුම් ලැබූ පුද්ගලයෙක්. මේ මාධ්‍යවේදියා ගැන මම සඳහන් කරන්නම ඕනෑ. "ඩී.ජේ. සිරිවර්ධන විශේෂ කුසලතා සම්මානය" ලබා ගන්න ඔහුට පුළුවන් වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ඔහු මේ රටේ අධිකරණය ගැන කථා කරලා, අධිකරණය ගැන ලියලා උසස්ම සම්මානයක් ලෙස හඳුන්වන "Hector Jayawardena Gold Medal" එක ලබා ගෙන තිබෙනවා. එතුමා ඉතාම අහිංසක, අවංක, මේ රට ගැන කැක්කුමක් ඇති මාධ්‍යවේදියෙක්. ඉරිදා පුවත් පතක කර්තෘවරයෙක් හැටියට ඔහු ගැන මේ රටම දන්නවා. ඔහුට තර්ජනය කරලා පහර දුන්නාට පස්සේ දවස් ගණනාවක් නීතිය ක්‍රියාත්මක කරන්නේ නැතුව, කිසි කෙනෙක් අත් අඩංගුවට ගන්නේ නැතුව සිටියා. ඔහු රෝහලේ ප්‍රතිකාර ලබමින් සුවය ලබන්න අවශ්‍ය පසු බිම හදන වෙලාවේත් ඒ මාධ්‍යවේදියාට අධිකරණයෙන්, එහෙම නැත්නම් නීතියෙන් කිසිම සහයෝගයක් ලැබුණේ නැති නිසා තමයි අපේ මේ සහෝදර මන්ත්‍රීතුමා මාධ්‍යයට කරන සහයෝගයක් සහ ගෞරවයක් හැටියට ක්‍රියාත්මක වෙලා මේ වෙනුවෙන් ඉදිරිපත් වන්නේ. ඒ නිසා මේ කාරණය ගැන අපි බලන්නට ඕනෑ. ඔහු මේ රටේ මාධ්‍යවේදියෙක් හැටියට සිටියදීයි මෙම ප්‍රහාරයට ලක් වුණේ. එම නිසා මේ අවස්ථාවේදී අපි නිහඬව ඉන්න එක වැරැදියි. ඔහුට පහර දීම සම්බන්ධව අපට කිසිසේත් එකඟ වෙන්නට බැහැ. අපි ඒ සිද්ධිය හෙළා දකිනවා.

ඒ විතරක් නොවෙයි. මෙය හොඳ දෙයක් නොවෙයි. මේකට නිහඬව හිටියොත් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් කවදා හරි මේ ගැන කනගාටු වන්නට සිද්ධ වෙයි. ඒ වාගේම ඔහු එම උත්සවයට සහභාගි වන්නේ එම උත්සවය සම්ප්‍රදායානුකූලව නීතිඥයන් සඳහා වන උත්සවයක් නිසායි. නීතිඥයකු හැටියට, උපාධිධාරියකු හැටියට එදින රාත්‍රියේ ඔහු ඒකට අවශ්‍ය සියලුම ආරාධනා පත්‍රත්

එක්ක සහභාගි වුණු කෙනෙක්. ඔහුට සිදු වූ අසාධාරණයට නීතිය ක්‍රියාත්මක වෙන්න තිබුණු වෙලාවේ, විශාල වශයෙන් විදේශ බලවේග එක්ක නියැලී සිටින මේ රටේ කිහිප දෙනෙක් එතැන සිටි අනෙකුත් අය හාස්‍යයට ලක් කරමින් කටයුතු කළා. ඒ අය ගුටි කාපු මේ මාධ්‍යවේදියා දිහා බලා ගෙන සිටියා මිස කිසිම දෙයක් කළේ නැති එක ගැන අපි කනගාටු වෙනවා; අපි එය හෙළා දකිනවා. ඒ නිසා මාධ්‍ය වෙනුවෙන්, මාධ්‍යවේදීන් වෙනුවෙන් රාජ්පාල් අබේනායක මහතාට සාධාරණයක් ඉෂ්ට කර දෙන ලෙස ඇමතිවරයා හැටියට ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. අපේ මාධ්‍යවේදීන්ට නැවතත් එවැනි දේවල් සිද්ධ කරන්න ඉඩ නොතබන ලෙසත් ඉල්ලා සිටිමින් මම මේ යෝජනාව ස්ථිර කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next is the Hon. Sujeewa Senasinghe.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, how many minutes have I got?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You have about seven minutes.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අපේ තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ඉතා හිත් වේදනාවෙනුයි කථා කළේ. එතුමාගේ පත්තරයේ වැඩ කරන මහත්මයෙක් තමයි මේ රාජ්පාල් මහත්මයා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එතුමාගෙන් පළිගන්න ස්වරූපයක් අපටත් පේනවා. රටේ නීතිය ක්‍රියාත්මක වන්නේ නැත්නම් අපත් එතුමාට සහයෝගය දෙනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තමයි මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම වග කියන්න ඕනෑ. අපත් කියන්නේ විශේෂයෙන් මාධ්‍යවේදීන් සම්බන්ධයෙන් මේ රටේ නීතිය ක්‍රියාත්මක වන්නේ නැහැ කියලායි.

2007.01.24 දින සිට මේ දක්වා ඝාතනයට ලක්වූ මාධ්‍යවේදීන්ගේ ලැයිස්තුව මම ඉදිරිපත් කරනවා. ඒ ලැයිස්තුවට අනුව ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන් සංඛ්‍යාව 11යි. 2007.01.24 "සුඩර්ඔලි" පත්‍රයේ සුබ්‍රමනියම් සුකිර්තරාජා, ත්‍රිකුණාමලයේදී; 2007.04.16 "නිලම්" පුවත් පතේ කර්තෘ සුබාෂ් චන්ද්‍රභෝෂ්; 2007.05.03 "උදයන්" පුවත් පතේ සුරේෂ් කුමාර් සහ රංජිත් කුමාර් යාපනයේදී; 2007.07.02 ලක්මාල් ද සිල්වා බොරලැස්ගමුවේදී; 2007.08.01 මරියතුස් මනෝජන්රාජ් යාපනයේදී; 2007.08.16 සතාසිවම් බාස්කරන් යාපනයේදී; 2007.08.2 "නමුදු ඊළනාඩු" පුවත් පතේ කළමනාකාර අධ්‍යක්ෂ සින්නතම්බි සිවමහාරාජා; 2008.05.28 "එම්ටීවී", "සිරස", "ශක්ති" ටී.වී. වාර්තාකරු පී. දේවකුමාර් යාපනයේදී; 2008.10.06 "සිරස" මාධ්‍යවේදී රශ්මි මොහොමඩ් මරා ගෙන මැරෙන බෝම්බකරුවකුගේ බෝම්බ ප්‍රහාරයකින් අනුරාධපුරයේදී; 2009.01.08 "ද සන්ඩේ ලීඩර්" කර්තෘ සහ "ටයිම්" හා "අවුට්ලුක්" වාර්තාකරු ලසන්ත වික්‍රමතුංග අත්තිඩියේදීත් ඝාතනය වුණා.

මේ ඝාතනයන් මේ ආණ්ඩුව යටතේයි සිදු කෙරුණේ. මන්ත්‍රීතුමා හරියටම හරි. ආණ්ඩුවට විරුද්ධව ලියන මාධ්‍යවේදීන්ට කිසිම සමාවක් නැහැ. ඒ වාගේම පහර දීමට ලක් වූ මාධ්‍යවේදීන් සංඛ්‍යාව 28යි.

2007.01.06 "රවිර" මාධ්‍යවේදී තිස්ස රවීන්ද්‍ර බණ්ඩාරට හෝමාගම පොලිස් නිලධාරින් පහරදීම, 2007.01.09 "හරය" පුවත් පතේ මාධ්‍යවේදී අජිත් සෙනෙවිරත්නට සහ බීබීසී මාධ්‍යවේදී ඥානසිරි කොත්තිගොඩට පහර දීම, 2007.01.28 "තිනකුරල්" පුවත් පතේ කේ.පී. මොහාන්ට කොළඹ කොටුවේ දී පහර දීම, 2008 ජනවාරි මස ජාතික රූපවාහිනියේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ චන්ද්‍රසේකරට සිය කාර්යාලය තුළ දීම පහර දීම, 2008.01.10 මාධ්‍යවේදී වික්ටර් සෝමවීරට බිංගිරියේදී පහරදීම, 2008.01.16 "සිරස" ප්‍රාදේශීය මාධ්‍යවේදී යූ.එස්.ඒ. බණ්ඩාරට ඔක්කම්පිටියේදී පහර දීම, 2008.01.25 රූපවාහිනී ප්‍රවෘත්ති අංශයේ සේවය කළ මාධ්‍යවේදී ලාල් හේමන්ත මහවෙලගේට අතුරුගිරියේදී පහර දීම, 2008.01.28 "තිනකරන්" පුවත් පතේ සුහයිබ් එම්. කාසිම්ට කොළඹ දී පහර දීම, 2008.02.28 අයිටීඑන් නාලිකාවේ පංකජ සංකල්පට මාතරදී පහර දීම, 2008.05.09 "වාරා උරෙයිකල්" කර්තෘ එම්.අයි රහ්මතුල්ලාට කාත්තන්කුඩි හිදී පහර දීම, 2008.05.19 නිදහස් මාධ්‍යවේදී ජව්ෆර් ඛාන්ට කාත්තන්කුඩි හිදී පහර දීම, 2008.05.19 "සිරස" කැමරා කණ්ඩායමට කිරිබත්ගොඩදී පහර දීම, 2008.05.22 "ද නේෂන්" නියෝජ්‍ය කර්තෘ හා ආරක්ෂක තොරතුරු වාර්තාකරු කීත් නොයාර්ට දෙහිවලදී පහර දීම, 2008.06.05 කාත්තන්කුඩි හිදී මාධ්‍යවේදී එම්.එච්.සී. ජලීස්ට පහර දී කැමරා පැහැර ගැනීම, 2008.06.30 ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලයේ නාමල් පෙරේරාට සහ මහේන්ද්‍ර රත්නවීරට නාරාහේන්පිට දී පහර දීම, 2008.07.18 සාර්ක් සමුළුවට පෙර කොළඹ 2 ග්ලෙනි වීදියේ තාවකාලික නිවාස කඩා දැමීම ආවරණය කිරීම සඳහා ගිය "ඩේලි මිරර්" පුවත් පතේ මාධ්‍යවේදී යොහාන් පෙරේරාට සහ ඡායාරූප ශිල්පී ප්‍රදීප් දිල්රුක්ෂනට නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරින් විසින් පහර දීම, 2008.08.04

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මහතාගේ මැරයන් විසින් "සිරස" නාලිකාවේ තුෂාර සාලිය රණවකට සහ වරුණ සම්පත්ට කැලණියේ දී පහර දීම, 208.08.28 කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ උද්ඝෝෂණය ආවරණය කිරීමට ගිය "ලංකාදීප" පුවත් පතේ මාධ්‍යවේදිනී යමුනා හර්ෂිනී,-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Azwer, what is the point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, he is referring to an Hon. Minister of this House, involving him in that attack. This is about Rajpal Abeynayake. මොන හැල්ලක් කියනවාද කියලා මම දන්නේ

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

නැහැ. ඒ පිළිබඳව මොනවාද කරන්නේ කියන එකයි මාධ්‍ය ඇමතිතුමාගෙන් අපි අහන්නේ. මේවා ඔක්කොම දන්නවා. රාජ්පාල්ට කැත විධියට පහර දුන්නා. කෝ මේ media?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Azwer, that name will be expunged. Hon. Sujeewa Senasinghe, you carrry on.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ඡායාරූප ශිල්පී ජානක ගලප්පත්තිට සහ රූපවාහිනී මාධ්‍යවේදී දූෂාන්ත මනෝජ්ට වෛද්‍ය ශිෂ්‍යයන් විසින් පහර දීම, 2008.11.29 විශේෂ පොලිස් ඇඳිරි නීතිය අවස්ථාවක මඩකලපුවේ දී ප්‍රාදේශීය මාධ්‍යවේදියෙකුට පහර දීම, 2008.11.29 "රිවිර" කර්තෘ උපාලි තෙන්නකෝන්ට යතුරු පැදිවලින් පැමිණි පුද්ගලයන් විසින් ගම්පහ දී පහර දීම, 2009.06.01 මාධ්‍යවේදී පෝද්දල ජයන්තට පහර දී බරපතළ තුවාල සිදු කිරීම ආදී වශයෙන් මාධ්‍යවේදීන්ට පහර දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාධ්‍යවේදීන් පැහැර ගෙන යාමේ සිද්ධීන් 6යි. 2007.02.15 "තිනකුරල්" හා "වාලම්පුරි" යන පුවත් පත්වල සේවය කළ සුබ්‍රමනියම් රාමචන්ද්‍රන් වඩමාරච්චි හිදී පැහැර ගෙන යාම, 2007.11.17 "උදයන්" මාධ්‍යවේදී වඩිවේල් නිමල්රාජා යාපනයේදී පැහැර ගෙන යාම, 2008.06.22 මාධ්‍යවේදී තිරුවෙල්වම් තිරුකුමාරන් දෙහිවලදී පැහැර ගෙන යාම, 2006.08.28 මාධ්‍යවේදී නඩරාජා ගුරුපරන් ගල්කිස්සේදී පැහැර ගෙන යාම, 2009.08.27 "ලංකා ඊ-නිවුස්" මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැළිගොඩ පැහැර ගෙන යාම, 2010.01.24 " ලංකා ඊ-නිවුස්" මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැළිගොඩ දෙවන වරටත් පැහැර ගෙන යාම ආදී වශයෙන් පැහැර ගෙන යාම් සිදු වී තිබෙනවා.

අත් අඩංගුවට පත්වීම් 13ක් සිදු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 2007.03.07 අන්තර්ජාල වෙබ් අඩවි සංස්කාරවරයෙකු වන ජේ.එස්. තිස්සනායගම් ත්‍රස්තවාදී විමර්ශන ඒකකය විසින් අත් අඩංගුවට ගැනීම, 2007.11.28 "ද සන්ඩේ ලීඩර්" පුවත් පතේ මාධ්‍යවේදී අශෝක් ප්‍රනාන්දු අත් අඩංගුවට ගැනීම. 2007.06.23 "උදයන්" පුවත් පතේ මාධ්‍යවේදී කේ. කුමාරදාස් යාපනයේදී අත් අඩංගුවට ගැනීම, 2007.10.24 "ද සන්ඩේ ලීඩර්" මාධ්‍යවේදී ආතර් වාමනන් අපරාධ විමර්ශන අංශය විසින් අත් අඩංගුවට ගැනීම, 2008.08.26 "අයිටීඑන්" නිෂ්පාදක නාගලිංගම් කෙනියුඩසන් දෙහිවලදී අත් අඩංගුවට ගැනීම, 2008.02.12 "ඒපී පුවත් සේවයේ" ඡායාරූප ශිල්පී ගැමුණු අමරසිංහ අත් අඩංගුවට ගැනීම, 2008.03.08 නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ ක්‍රියාකරුවෙකු වූ එස්. සිවකුමාර් ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් අත් අඩංගුවට ගැනීම, 2008.06.30 ඉන්දීය මාධ්‍යවේදී අලි එක්රාම් ගාල්ලේ ක්‍රිකට් ක්‍රීඩාංගණය තුළ මාධ්‍ය ආවරණයේ නිරතව සිටියදී අත් අඩංගුවට ගැනීම, 2008.11.30 "දෙරණ" රූපවාහිනියේ මාධ්‍යවේදී පින්සිරි පෙරේරා දෙහිවලදී අත් අඩංගුවට ගැනීම, 2008 නොවැම්බර් මස ත්‍රස්ත විමර්ශන අංශය මඟින් "වෙට්ට්‍රි එෆ් එම් " සාමාන්‍යාධිකාරී, ඒ.ආර්. වාමලෝෂනන් අත් අඩංගුවට ගැනීම, 2010.01.28 "ලංකා" පුවත් පතේ කර්තෘ චන්දන සිරිමල්වත්ත අත් අඩංගුවට ගැනීම, 2010.03.1 "ද බොටම් ලයින්" සහ "ඒපී" ආරක්ෂක තොරතුරු වාර්තාකරු මාධ්‍යවේදී රුවන් වීරකෝන් අත් අඩංගුවට ගැනීම සිදු වෙලා තිබෙනවා.

ඊළඟට, මාධ්‍යවේදීන්ට සිදු කළ වෙඩි තැබීම් මම කියන්නම්. 2008.09.08 "තිනකරන්" පුවත් පතේ මඩකලපුව වාර්තාකරු රාධිකා තේවකුමාර්ට වෙඩි තබා තුවාල සිදු කිරීම.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

What is the point of Order, Hon. Azwer?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Mr. Deputy Chairman of Committees, this is a Debate on the Adjournment Motion. If a Member is speaking, his speech must have substance. What he is doing is, reading out a list of names, which is against the Standing Orders. Sir, you cannot allow him to go on like this. He can join the Department of Archaeology - he will be given a good job there, I think - not to act as a Member of Parliament. Shame! Where are the UNP and the JVP Members?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

That is not a point of Order. Hon. Sujeewa Senasinghe, you carry on.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් “Daily News” පුවත් පතේ headlines තුනක් පළ වෙලා තිබුණා. භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මහතාගේ ඝාතනය ගැන වාර්තාවක් එක පුවත් පතකවත් තිබුණේ නැහැ. මන්ත්‍රීතුමා කියන කාරණය හරි. මේ ආකාරයෙන් මාධ්‍යවේදීන්ට පහර දීම, මාධ්‍යවේදීන් ඝාතනය කිරීම ආදී වශයෙන් මාධ්‍යවේදීන්ට විශාල ලෙස හිරිහැර කරන ලෝකයේ තිබෙන බරපතළම රට බවට මේ රට පත් වෙලා තිබෙනවා. අනිවාර්යයෙන්ම මේ රටේ ජනාධිපතිතුමා සහ මේ ආණ්ඩුව ඒ ගැන වග කියන්න ඕනෑ. ඒ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට අපිත් සහාය දෙනවා. මේ මහත්මයා වැඩ කරන්නේ තිලංග සුමතිපාල මහත්මයාගේ පත්තරේ වෙන්න පුළුවන්. තිලංග සුමතිපාල මහත්මයාට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

විශාල ලෙස අඩන්තේට්ටම් කරනවා, එතුමාගේ පුවත් පත බව දැන දැනම. [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Azwer, what is the point of Order?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එතුමාට අනිවාර්යයෙන්ම

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
My foot! Sir, he says that the President is responsible for that. Sir, either he must withdraw that or it must be expunged. - [*Interruption.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Now, I call upon the Hon. Minister to reply. - [*Interruption.*]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, the Hon. Minister will give me a few minutes to speak.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Five minutes will be enough for me.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Okay, there is time.

Sir, unashamedly, Rajpal Abeynayake, who is a renowned journalist and an award-winning media personnel, was attacked. Some names of media personnel have been mentioned. Hon. Thilanga Sumathipala, I am also a journalist. I started my life as a journalist in the "Thinakaran" newspaper of Lake House. Sir, I am only asking this. Leaving aside the case; leaving aside the fact that the assailant is evading arrest by the police, about 50 lawyers, most of them green lawyers, are going and pleading for them. None of the people have the audacity to - [*Interruption.*] මොන point of Order එකක්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sujeewa Senasinghe, what is your point of Order?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, what is the Hon. Member talking about? The person has been released on bail. The Hon. Member is leading somewhere else; either he has gone

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

or he does not know what he is talking about. - [*Interruption.*] There are no facts. He is making remarks, which are utter rubbish. Sir, that is *sub judice.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! If there is anything against the Standing Orders, that will be expunged. Hon. Azwer, you carry on.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Rajpal Abeynayake is still in the General Hospital, in Ward No. 6. The Hon. Keheliya Rambukwella and I went there. - [*Interruption.*] Where are those people? That is what I am asking. Have the free media personnel got a conscience? I am asking you. මේ නිදහස් මාධ්‍යවේදීන්ට හෘදය සාක්ෂියක් තිබෙනවාද? ඇයි මේ ගොල්ලන් කාඩ්බෝඩ් අල්ලා ගෙන ඉන්න Fort Railway Station එකට යන්නේ නැත්තේ? කෝ බාහු? රාහු කාලයක්ද ඇවිල්ලා තිබෙන්නේ?

Sir, I bring to your notice another matter. According to Chapter 78 of the Prisons Ordinance, a convicted prisoner cannot talk to the media; he cannot even gesticulate. That is exactly what Sarath Fonseka is doing daily. He is violating all the Ordinances and Regulations; he launches into a tirade against the Government and the President. I ask the Hon. Minister to bring that to the notice of the Hon. Minister of Justice and the Commissioner-General of Prisons and stop that. If that is allowed, all the prisoners - they are asking us - must also be given the right and the liberty to speak out. He has been convicted. What can we do? That was a court judgment, Sir.

Thank you.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Now, allow the Hon. Minister to reply.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெகுசன ஊடக, தகவல் அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media and Information)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂයේ ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා නම් ලැයිස්තුවක් කියවා ගෙන ගියා. මේ

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

වාගේ නම් ලැයිස්තු ගැන කතා කරනවා නම් ඉතිහාසයේ හිටපු රිචඩ් ද සොයිසා, තේවිස් ගුරුගේ, සාගරිකා ගෝමස් ආදී චරිත ගණනාවක් ගැන කතා අපට කරන්න පුළුවන්. එතුමාට වුවමනාව තිබුණේ ඒ නම් ලැයිස්තුව කියවන එක නම්, වෙන තැනකට ගිහින් -පෙළපාළියක යන කොට- එතුමාට ඒක කියවන්න තිබුණා. ඒ වාගේම ඒකට රාජ්පාල් අබේනායකගේ නමත් එක්කාසු කරලා කියෙව්වා නම් මේ ප්‍රශ්නය මේ ආකාරයෙන් මතු වෙන්නේ නැහැ.

විශේෂයෙන්ම ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වශයෙන් මටත්, ඒ වාගේම රජයටත් වග කීමක් තිබෙනවා, මාධ්‍යවේදියකුට යම් කරදරයක්, අකටයුත්තක් සිද්ධ වුණා නම් ඒ වෙනුවෙන් කතා කරන්න. එහෙම කතා කිරීමේ අයිතිය අපි කාටත් තිබෙනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ නම්වලින් සියයට 90ක්ම උතුරු නැඟෙනහිර පළාත්වල ඒවා. මේ රටේ අවුරුදු තිහක යුද්ධයක් තිබුණා. අපි පිළිගත් කරුණක්, සාධකයක් තමයි නොයෙකුත් දේශපාලන කණ්ඩායම් එකින් එක හැප්පුණු බව. ඒ වාගේම නොයෙකුත් ත්‍රස්තවාදී කණ්ඩායම් එකින් එක හැප්පුණා. එවැනි අවස්ථාවල රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේදී යම් යම් ප්‍රශ්න මතු වුණා. ඒක සත්‍යයක්. ඒ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට තමයි එදා ජනාධිපතිතුමා මුල් තැන දුන්නේ. ගරු මන්ත්‍රීතුමා කියැවූ නම් ලැයිස්තුවෙන් සියයට 97ක්ම, සියයට 98ක්ම යුද්ධයත් සමඟ බැඳිච්ච, මේ රටේ තිබුණු ත්‍රස්තවාදයත් එක්ක ගැටගැහිච්ච වැඩ පිළිවෙළේ ප්‍රතිඵලයක් හැටියට කියවන්න සිද්ධ වෙච්ච නම්. ඒ විධියට තමයි අපි ඒක දකින්නේ.

ඒ කාලය තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීම තියා, ඒ වෙනුවෙන් කථා කිරීමට අයිතියක්වත් තිබුණේ නැති බව ඔබතුමන්ලා දන්නවා. ඒක ඇත්ත. වර්තමානයේ තත්ත්වය ඊට වඩා වෙනස්. විශේෂයෙන්ම වර්තමානයේ විපක්ෂයේ ඔබතුමන්ලා හන්දි ගානේ පෙළපාළි යනවා. නිදහස් මාධ්‍ය පෙරමුණු අරගෙන නොයෙකුත් පෙළපාළි ගිහින් උද්ඝෝෂණ කරනවා. ඒ සියලු දේ සාධාරණීකරණය කරනවා. නමුත් තමන්ට විරුද්ධව මතයක් ඉදිරිපත් කරන කෙනකුට ප්‍රහාරයක් එල්ල කළාම ඒක හාස්‍යයට ලක් කරලා, හෑල්ලුවට ලක් කරලා පැත්තකට දමනවා. මොකක්ද මේ ප්‍රතිපත්තිය? එදා ඒ මාධ්‍යවේදියාට පහර දෙන කොට මානව හිමිකම් ගැන කථා කරන, මාධ්‍යවේදීන්ට ප්‍රහාර එල්ල කරන කොට පාරට බැහැලා පෙළපාළි යන, ඒ වෙනුවෙන් හඬක් නඟපු, ඒ වෙනුවෙන් අධිකරණයට ගිය උදවිය අහක බලා ගෙන හිනා වෙවී හිටියා. එතැන මොකක්ද තිබෙන සාධාරණය? කොළ, නිල්, රතු පාට අනුව, ඒ පක්ෂ අනුව, ගන්නා වූ තීන්දු තීරණ තේමාව මේ අය වෙනස් කරනවා නම් එතැන තිබෙන ප්‍රතිපත්තිය මොකක්ද? පැහැදිලිවම ඒ ප්‍රතිපත්තිය පක්ෂග්‍රාහී, ආණ්ඩු විරෝධී ප්‍රතිපත්තියක් ගොඩ නඟන වැඩ පිළිවෙළක්. නීතිඥවරුන්ගේත්, කොළ, නිල්, රතු පාට තිබෙනවා. ඒ අය මානව හිමිකම් ගැන උසාවි යනවා. මානව හිමිකම් ගැන පිටු ගණන් ලියනවා; පත්තර පුරවනවා. ඒ සියල්ල කරනවා.

මේ රටේ "දිනමිණ" "ඩේලිනිවුස්" පත්තර දෙක හැර පුවත් පත් සහ සඟරා 154ක් ලියා පදිංචි වෙලා තිබෙනවා. පුවත් පත්, සියලු සඟරා, සෙනසුරාදා සහ ඉරිදා තිබෙන ප්‍රධාන පුවත් පත් 14 ගත්තොත් -රජයේ පුවත් පත් දෙක පැත්තක තියන්න- ඒවා මන්ත්‍රීවරුන් ගැන, ඇමතිවරුන් ගැන, දේශපාලන නායකයන් ගැන, රටේ නායකයා ගැන, ඔවුන්ගේ දරු පවුල් ගැන ඔවුන්ගේ භාර්යාවන් ගැන රෙදි ගැළවෙන්න ලියනවා. එහෙම ලියලා කියනවා, මාධ්‍ය නිදහස නැහැයි කියලා. මම දන්න විධියට එදා "Voet Lights" කියන සඟරාවේදී විරුද්ධ මතයක් ඉදිරිපත් කළ පමණින්ම, ශීලාචාර මිනිසුන් හැටියට ඒ විරුද්ධ මතයට විරුද්ධව කටයුතු කරන්න, කථා කරන්න, වෙනත් මතයක් ඉදිරිපත් කරන්න අවස්ථාවක් තිබියදී, අතින් පයින් ගුටි බැට දෙන කොට, එතැන හිටපු අනෙක් අය සියලු දෙනාම ඔහුව හාස්‍යයට ලක් කරලා යන එකේ සාධාරණය කුමක්ද? ඒ ප්‍රතිපත්තිය කුමක්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා තමන්ට වුවමනා ආකාරයෙන් ජාතික වශයෙන් ගොඩ නඟන ප්‍රතිපත්ති හෝ ස්ථාවරයන් වෙනස් කරන්න එපා කියන එක මම බොහොම පැහැදිලිව කියනවා. මාධ්‍යවේදියකු මොන දේශපාලන න්‍යායක්ද දරන්නේ, ඔහුගේ මතවාදය කුමක්ද කියන එක පැත්තක තියලා ඔහුගේ වෘත්තියට නිදහස ලබා දිය යුතුය කියන තැන අප සියලු දෙනාම ඉන්නවා.

ගරු මන්ත්‍රීතුමා කියපු විධියේ අභ්‍යන්තර සට්ටන, ඒ සියල්ල අවසානයි. දැන්වත් ශීලාචාර ශිෂ්ටාචාර මිනිසුන් හැටියට, විශේෂයෙන්ම නීතිය පසිඳලන කණ්ඩායම් හැටියට -උසාවියේ සාධාරණය ඉෂ්ට කරන කණ්ඩායම් හැටියට -ඒ ස්ථානයේ දී එවැනි තත්ත්වයකට ලක් වූ කෙනකු වෙනුවෙන් හඬක් නඟන්නට අඩු ගණනේ මෙවැනි යෝජනාවක්වත් ගෙන ඒම සම්බන්ධයෙන් අපේ ගරු තාරානාත් බස්නායක මන්ත්‍රීතුමාටත්, එය ස්ථිර කළ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාටත් අපි ස්තුතිවන්ත වනවා. මෙවැනි අවස්ථාවක පාට, පක්ෂ, ජාති, ආගම්, කුල භේදයකින් තොරව ගත යුතු ක්‍රියා මාර්ග ගත යුතුය කියන මතයක් ගොඩ නැඟීම අප කාගේත් වගකීමක් සහ යුතුකමක්ය කියන එක ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනවා.

***එකල්හි වේලාව අ.භා.6.30 වුයෙන් නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2011 නොවැම්බර් මස 29 වන දින සභා සම්මුතිය අනුව, 2011 දෙසැම්බර් මස 12 වන සඳුදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 6.30 மணியாகிவிடவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது 2011 நவம்பர் 29ஆந் திகதிய தீர்மானத்திற்கிணங்க, 2011 டிசம்பர் 12, திங்கட்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது*

*It being 6.30 p.m.,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 9.30 a.m. on Monday, 12th December, 2011, pursuant to the Resolution of Parliament of 29th November, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of  Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an  annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.